# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

---

[සහතිකය සටහන් කළේ **2006** මාර්තු මස **31** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 1,000.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 57.50 යි.

පටුන

වගන්තිය පිටුව

1. ලුහුඬු නාමය. 1

I වන පරිච්ඡේදය

ආදායම් බද්ද පැනවීම

2. ආදායම් බද්ද පැනවීම. 1

II වන පරිච්ඡේදය

බදු නියම කළ හැකි ආදායම

3. බදු නියම කළ හැකි ආදායම. 2

4. .සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ 3

5. ඉඩම සහ එහි ඇති වැඩිදියුණු කිරීම්වල හෝ යම් වාසස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම. 7

6. ඉඩම් සහ ඒවායේ වැඩිදියුණු කිරීම් කුලියට දීමෙන් ඇති වන ලාභ හෝ අදායම. 7

III වන පරිච්ඡේදය

ආදායම් බද්දෙන් නිදහස් කිරීම

7. ඇතැම් තැනැත්තන් (පුද්ගලයන් හැර) ඔවුන් ලබන ලාභ සහ ආදායම්වල මුළු ප්‍රමාණය හෝ ඉන් යම් කොටසක් මත, ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 7

8. ඇතැම් නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ ඇතැම් ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 18

9. ලැබුණු ඇතැම් පොලී ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 25

10. ඇතැම් ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 27

11. ඉඩම් සහ ඒවායේ වැඩි දියුණු කිරීම් වලින් ලැබෙන ඇතැම් ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම 30

වගන්තිය පිටුව

12. ඇතැම් සහනාධාර ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 32

13. ආදායම් බද්දෙන් විවිධ නිදහස් කිරීම. 32

14. යම් වාසික ආගන්තුකයකුගේ ඇතැම් ලාභ හා ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම 38

15. ශ්‍රී ලංකාවෙන් පිටතදී උපයන ලද ලාභ සහ ආදායම නිදහස් කිරීම. 39

16. කෘෂිකාර්මික ව්‍යාවසායකින් ලැබෙන ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 39

17 යම් නිශ්චිත ව්‍යාවසායකින් යම් සමාගමකට ලැබෙන ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම 40

18. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ඇතැම් ව්‍යාවසාය ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 43

19. සුළු පරිමාණ යටිතල පහසුකම් ව්‍යාවසායයන් ආදායම් බද්දෙන් නිදහස් කිරීම. 43

20. යම් නව කාර්මික ව්‍යාවසායක ලාභ සහ ආදායම නිදහස් කිරීම 44

21. නැවත ස්ථානගත කරන ලද යම් ව්‍යාවසායක ලාභ සහ ආදායම නිදහස් කිරීම 46

22. පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියුක්ත යම් සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම 47

23. යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම 48

24. සංචාරකයන් සඳහා වලව් නිවාස හෝ විශේෂ සංවර්ධිත බංගලා සැපයීමේ ව්‍යාපාරයෙහි නියුක්ත යම් තැනැත්තකු ආදායම් බද්දෙන් නිදහස් කිරීම 51

IV වන පරිච්ඡේදය

**ලාභ හෝ ආදායම නිශ්චය කිරීම**

25. ලාභ සහ ආදායම නිශ්චය කිරීමේදී ඉඩ දිය යුතු අඩු කිරීම් 51

26. ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී ඉඩ නොදිය යුතු අඩුකිරීම් 67

වගන්තිය පිටුව

27. යම් අනේවාසික සමාගමක් විසින් දරනු ලබන ප්‍රධාන කාර්යාල වියදම් අඩු කිරීම 76


V වන පරිච්ඡේදය

**මුළු ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කිරීම**

28. ව්‍යවස්ථාපිත ආදායම ආගනණය කිරීමේ පදනම 77

29. ලාභ බෙදා වෙන්කිරීම 79

30. මුළු ව්‍යවස්ථාපිත ආදායම 79

31. දරුවකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම ඔහුගේ දෙමව්පියකුගේ අදායමට එකතු කළ යුතු බව 80


VI වන පරිච්ඡේදය

**තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කිරීම**

32. තක්සේරු කළ හැකි ආදායම ගණන් බැලීමේ දී මුළු ව්‍යවස්ථාපිත ආදායමින් කරනු ලබන අඩු කිරීම 80


VII වන පරිච්ඡේදය

**බදු අය කළ හැකි ආදායම නිශ්චය කිරීම**

33. බදු අය කල හැකි ආදායම. 89

34. සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් දීමනාවක්. 90


VIII වන පරිච්ඡේදය

**සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ**

35. සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ. 98

වගන්තිය පිටුව

IX වන පරිච්ඡේදය

## සමහර ලාභ සහ ඒ ලාභවලින් ලත් ලාභාංශ සම්බන්ධයෙන් බදු පැනවීමට අදාළ විශේෂ විධිවිධාන


36. ආණ්ඩුවේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් වෙත සතු කරන ලද දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන වන්දිය මත වූ පොලිය සම්බන්ධයෙන් බදු අය කිරීමට අදාළ විශේෂ විධිවිධාන 101

37. ඇතැම් තැන්පතු ගිණුම මත ගෙවිය යුතු පොළියෙන් ආදායම් බදු අඩුකර ගැනීම 102

38. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම් හවුල් ව්‍යාපාර සහ පුද්ගල මණ්ඩල විසින් දෙන ලද ණය පිළිබඳ පොලිය මත ආදායම් බදු අනුප්‍රමාණය 104

39. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමකට හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවිය යුතු රාජ්‍ය භාගය මත ආදායම් බදු අනුප්‍රමාණය 105

40. නිර්වාසිකයකු යම් නිශ්චිත කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ සේවයෙහි නියුක්ත කිරීමෙන් ලබන්නා වූ ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණ 105

41. යම් අක්වෙරළ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවකින් උපචිත වන යම්විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක ලාභ සහ අදායම මත ආදායම් බදු අනුප්‍රමාණ 106

42. ඇතැම් අපනයනවලින් ශ්‍රී ලංකාවේදී ප්‍රතිතකරුට හෝ ප්‍රතිලාභියාට උපචිත වන ලාභ සහ ආදායම් මත ආදායම් බදු අනුප්‍රමාණ 106

43. අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඇතැම් ව්‍යවසායවලින් උපචිත වන ලාභ සහ ආදායම් මත ආදායම් බදු අනුප්‍රමාණ 107

44. යම් කොටසක් හෝ කොටස් බලපත්‍රයක් විකිණීම මත ආදායම් බදු අනුප්‍රමාණ 107

වගන්තිය පිටුව


45. සමාගමක් නොවන තැනැත්තකු විසින් කරගෙන යනු ලබන ඇතැම් ව්‍යවසායවල ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය 108

46. සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන ඇතැම් ව්‍යවසායවල ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය 110

47. විශේෂඥතාවට පත් නිවාස බැංකුවලට අදාල ආදායම් බදු අනුප්‍රමාණය 110

48. බදුවලින් නිදහස් කාලය ඉකුත් වූ පසු ඇතැම් සමාගම්වලට අදාළ වන්නා වූ ආදායම් බදු අනුප්‍රමාණය 111

49. 46 වන වගන්තියට අනුකූලව බදු අයකල ලාභවලින් ගෙවූ ලාභාංශ මත ආදායම් බදු අනුප්‍රමාණය 111

50. නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක් නොවන තැනැත්තන්ගේ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය 112

51. යම් නිශ්චිත ව්‍යවසායක් ආරම්භ කරන සමාගමක් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය 112

52. යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙන යන්නා වූ සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය 112

53. අපනයන ලාභ සහ ආදායම් කෙරෙන් ලාභාංශ සම්බන්ධයෙන් ආදායම් බදු අනුප්‍රමාණය 113

54. ඇතැම් ලාභාංශ මත ආදායම් බදු අනුප්‍රමාණ 115

55. ශ්‍රී ලංකාවට පිටතින් ලැබුණු ලාභාංශ සඳහා ආදායම් බදු අනුප්‍රමාණය 116

56. යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සැළකුණු අපනයන සම්බන්ධයෙන් වූ ආදායම් බදු ප්‍රමාණය 116

වගන්තිය පිටුව


57. යම් වාසික සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුල සිදුකරන ලද සේවාවන්ගෙන් ලැබෙන ලාභ සහ අදායම් සම්බන්ධයෙන් මුළු ආදායම් අනුප්‍රමාණය 118

58. ඇහලුම් අපනයන කරුවන්ට ඇතැම් සේවා සැපයීමෙන් ලැබෙන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය 118

59. නැවකින් නැවකට මාරු කිරීමේ නියෝජ්‍යායතන ගාස්තු වලින් ලබන්නාවූ ලාභාංශ මත වූ බදු අනුප්‍රමාණය 119

60. අර්ථ නිරූපනය 120


## X වන පරිච්ඡේදය

## සමාගම්


61. යම් වාසික සමාගමක් විසින් ගෙවීමට යටත් ආදායම් බද්ද 122

62. යම් නිර්වාසික සමාගමක් විසින් ගෙවීමට යටත් ආදායම් බද්ද 124

63. ඇතැම් ලාබාංශ ලබාගන්නා සමාගමේ තක්සේරු කල හැකි ආදායමේ කොටසක් නොවන බව 124

64. තම කොටස්කරුවන් සමග කරන ගණුදෙනු වලින් ලැබෙන සමාගමක ලාභ 125

65. යම් ලාභාංශයකින් බද්දක් අයකර ගැනීමට වාසික සමාගමකට හිමිකම ඇති බව 125

66. ඇතැම් බෙදා හරිනු නොලැබූ ලාභ බෙදාහරිනු ලැබූ ලෙස සැලකිය යුතු බව 127

67. සමාගමක ලාභ සහ ආදායම සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් නතුකර ගන්නා අවස්ථාවක අදාල වන විධිවිධාන 130

68. මේ පරිච්ඡේදයේ විධිවිධාන පුණ්‍යායතන ආදියට අදාල නොවිය යුතු බව 130

වගන්තිය පිටුව

XI වන පරිච්ඡේදය

**විශේෂ අවස්ථා**

අ-දරුවෝ


69. දරුවකුගේ ආදායම තක්සේරු කිරීම 130

ආ - භාරගැනුම්කරුවෝ, භාරකරුවෝ හා පොල්මඃකරුවකු යනාදීහු

70. භාරගැණුම්කරුවන් සහ භාරකරුවන් විසින් වාර්ථා සැපයිය යුතු බව සහ බදු ගෙවීමට ඔවුන් යටත් වන බව 131

71. අබලතාවයකට පත් තැනැත්තකුගේ භාරකාරයකු ආදායම් බද්ද ගෙවීමට යටත් බව 132

72. මියගිය තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු ගෙවීමට පොල්මඃකරුවකු යටත්වන බව 133

73. පොල්මඃකරුවන් විසින් සැපයිය යුතු වාර්තා හා පොල්මඃකරුවන් හා අර්ථලාභීන් බදු අයකර ගනු ලැබීමට යටත් බව 134

74. හවුල් භාරකරු සහ පොල්මඃකරුවෝ 135

ඇ-ඒකක භාර

75. සෑම ඒකක භාරයක්ම සමාගමක් වශයෙන් සැලකිය යුතු බව 135

ඈ-හවුල් ව්‍යාපාර

76. හවුල් ව්‍යාපාරයක ආදායම තක්සේරු කිරීම 136

77. ඇතැම් අවස්ථාවල දී හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කළ යුතු බව 139

78. හවුල් ව්‍යාපාර මත අයකල යුතු බදු 140

ඉ-වාසික භාවය

79. වාසිකභාවය යන්නේ අදහස් වන්නේ කුමක්ද යන වග 141

වගන්තිය පිටුව

ඊ-නිර්වාසික තැනැත්තන්ගේ බැඳීම්

80. නිර්වාසි තැනැත්තන්ගේ ඇතැම් ලාභ අයකර ගනු ලැබිය හැකි බව 143

81. නිර්වාසික තැනැත්තකු වෙනුවෙන් තක්සේරු කරනු ලැබිය හැකි තැනැත්තෝ 144

82. ඇතැම් නිර්වාසික තැනැත්තන්ගේ බැඳීම් 144

83. ඇතැම් ව්‍යාපාරවල ලාභ ලැබීම් වල ප්‍රතිශතයක් ලෙස ගණනය කල යුතු බව 146

84. අපනයන නිෂ්පාදන විකිණීමෙන් නිර්වාසික තැනැත්තකුට ලැබෙන ලාභ 146

85. නිර්වාසික තැනැත්තන්ගේ ඇතැම් ලාබ ආදායම් බද්දට යටත් වීම 147

86. ඇතැම් අවස්ථාවලදී නිර්වාසික තැනැත්තන් ආදායම බද්දෙන් නිදහස් කිරීම සහ ඇතැම් නිර්වාසික තැනැත්තන් අඩුකල අනුප්‍රමාණ අනුව ආදායම් බදු ගෙවීමට යටත් වීම 147

උ-නැව් කටයුතු සහ ගුවන් කටයුතු

87. නිර්වාසික නැව් හිමියන්ගේ හෝ නැව් කුලියට ගන්නන්ගේ ලාභ 148

88. නැවක ප්‍රධානයා අනුයෝජිතයකු බව 148

89. ආදායම් බද්ද ගෙවීම හිහව ඇති විට ආපසු යාත්‍රා කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම. 148

90. නිර්වාසික ගුවන්යානා අයිතිකරුවන්ගේ හා ගුවන්යානා කුලියට ගන්නන්ගේ ලාභ 149

91. නිර්වාසික ගුවන් යානා අයිතිකරුවන්ගේ සහ කුලියට ගන්නනගේ ලාභාවලට 87 (2) වන, 88 වන සහ 89 වන වගන්ති අදාල වීම 151

ඌ-රක්ෂණය

92. රක්ෂණ සමාගම්වල ලාභ නිෂ්චය කිරීම 152

| වගන්තිය | | පිටුව |
|---|---|---|

එ-ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලිය යනාදිය


| | | |
|---|---|---|
| 93. | ඇතැම් ණය මත ලැබෙන පොලිය, ලාභ සහ ආදායම ලෙස සළකනු ලැබිය යුතු බව | 153 |
| 94. | ඇතැම් රාජ්‍ය භාග ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු බව | 154 |
| 95. | ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලී යනාදියෙන් ආදායම් බදු අඩුකර ගැනීම | 154 |
| 96. | යම් විදේශීය විනෝද ක්‍රීඩකයන් ට හෝ ශිල්පීන්ට කරන ලද ගෙවීම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම | 156 |


ඒ- ද්විත්ව බදු අය කිරීම්වල දී සහන


| | | |
|---|---|---|
| 97. | ද්විත්ව බදු සහන සඳහා වන ගිවිසුම් වල බලපෑම. | 158 |
| 98. | ශ්‍රී ලංකාවේ ආදායම් බදු සම්බන්ධයෙන් දෙනු ලබන සහන | 160 |


ඔ-විවිධ කරුණු


| | | |
|---|---|---|
| 99. | විශේෂ ලාභ හෝ ආදායම් මාර්ග සම්බන්ධයෙන් වූ විධිවිධාන අදාළ කිරීම | 162 |
| 100. | රක්ෂණයෙන් ලැබෙන ඇතැම් ලැබීම් කෙසේ සලකනු ලැබිය යුතු ද යන වග | 162 |
| 101. | සමාජශාලාවල හා වෙළෙඳ සමිති ආදියෙහි ආදායම නිශ්චය කිරීම | 163 |
| 102. | රාජ්‍ය නොවන සංවිධානවල ලාභ සහ ආදායමෙන් ආදායම් බදු අයකළ යුතු බව | 164 |
| 103. | ඇතැම් ගනුදෙනු හා බැහැර කිරීම සැලකිල්ලට නොගත යුතු බව | 165 |
| 104. | ආශ්‍රිත ව්‍යවසාය අතර සිදුවන ගණුදෙනුවලින් උපචිත වන ලාභ සහ ආදායම හෝ පාඩු අසම්බන්ධිත මිළ සැළකිල්ලට ගෙන තීරණය කළ යුතු බව | 166 |


ඕ-ඛනිජ තෙල් සෙවීම සහ කැනීම


| | | |
|---|---|---|
| 105. | ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ ඛනිජතෙග් කැනීමේ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ සහ ආදායම නිශ්චය කිරීම | 167 |

වගන්තිය පිටුව

XII වන පරිච්ඡේදය

වාර්තා යනාදිය

106. වාර්තා හා තොරතුරු ආදිය සැපයිය යුතු බව 168

107. හවුල්කරුවන් ආදීන් විසින් විගණන වාර්තා සැපයිය යුතු බව. 175

108. වාර්තාවල හා වෙනත් ලේඛනවල ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය ඇතුළත් විය යුතු බව. 179

109. වෙනත් තැනැත්තන්ගේ ගණනට ලබාගත් හෝ වෙනත් තැනැත්තන්ට ගෙවනු ලැබූ ආදායම් පිළිබඳව වාර්තා සැපයීය යුතු බව. 180

110. ගෙවිය යුතු කුලී පිළිබඳ වාර්තා පදිංචිකරුවකු විසින් සැපයිය යුතු බව. 181

111. නවාතැන්කරුවන් හා නේවාසිකයන් පිළිබඳ වාර්තා. 181

112. වාර්තා සැපයීම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයක් නියම කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට ඇති බලය. 181

XIII වන පරිච්ඡේදය

ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම

113. ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම. 183

XIV වන පරිච්ඡේදය

සේවා යොජකයන් විසින් සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමිකයන් ආදායම් බද්ද අඩු කිරීම

114. සේවායෝජකයන් විසින් සේවා ආදායම් බද්ද අඩු කළ යුතු බව. 184

115. සේවායෝජකයන් විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමක් කළයුතු බව 184

116. ආදායම් බදු වක්‍ර අදාළ කිරීම. 185

වගන්තිය පිටුව


117. විශේෂ අනුප්‍රමාණ අනුව බදු අඩු කිරීම. 187

118. සේවා යෝජකයන්ට විධාන. 189

119. සේවා යෝජකයන් විසින් නිසි වාර්තා තබා ගත යුතු බව. 190

120. ආදායම් බද්ද අඩු කිරීමෙන් පසු සේවා යෝජකයන් සතු කාර්ය 191

121. නොගෙවන ලද හෝ වැඩියෙන් ගෙවන ලද ආදායම් බදු මුදල් විධිමත් කිරීම. 192

122. අවශ්‍ය අඩුකිරීම නොකරනු ලබන විට සේවා නියුක්තයා විසින් දැන්වීමක් කල යුතු බව. 192

123. අඩු කරන ලද ආදායම් බද්ද සේවා යෝජකයන්ගේ වත්කම් වල කොටසක් නොවිය යුතු බව. 193

124. ආදායම් බද්ද අඩු කිරීම හෝ ගෙවීම් පැහැර හැරීම. 193

125. සේවායෝජකයන් පිළිබඳ තක්සේරු කිරීම නිකුත් කිරීම. 194

126. අභියාචනා. 195

127. පැහැර හැරීම සඳහා දණ්ඩනය. 196

128. පැහැර හැරීම මත දණ්ඩනය. 197

129. ගෙවන ලද බද්ද සඳහා බැර කිරීම. 198

130. ආකෘති සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම. 198

131. අර්ථ නිරූපණය. 198


XV වන පරිච්ඡේදය

## ආණ්ඩුවේ ආයතනයක් විසින් ආදායම් බදු ගෙවීමට අදාල විධිවිධාන


132. ආණ්ඩුවේ ආයතනයක් විසින් එහි සේවා නියුක්තයන්ගේ ආදායම් බදු ගෙවීම. 201

## XVI වන පරිච්ඡේදය

## බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවනු ලබන පොලියෙන් ආදායම් බදු අඩුකර ගැනීම


133. බැංකු සහ මූල්‍ය ආයතන විසින් ආදායම් බදු අඩුකල යුතු බව. 202

134. සුරැකුම්පත්, භාණ්ඩාගාර බැඳුම්කර ආදිය මත ලැබෙන පොලිය මත බදු අඩුකර ගැනීම. 205

135. ආදායම් බදු අඩු කිරීම සඳහා සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගම් 205

136. අඩුකරනු ලැබූ බදු වෙනුවෙන් බැර. 206

137. ද්විතියික වෙළෙඳපල ගනුදෙනු මත මතිමාත්‍ර බැර කිරීම. 207

138. රඳවා ගැනීමේ බද්දට යටත් පොලී මත ගෙවා ඇති ආදායම් බද්ද ආපසු ගෙවීම 207

139. 133 වන හෝ 136 වන වගන්ති යටතේ පොලී ආදායමෙන් අඩුකිරීම් සිදු කරන අවස්ථාවක විධාන නිකුත් කිරීම. 208

140. ආදායම් බදු අඩු කිරීම පිළිපදින බැංකු සහ මූල්‍ය ආයතන සතු කාර්ය. 210

141. බදු ගෙවීම මගහැරීම සම්බන්ධ දණ්ඩන. 210

142. ආදායම් බදු අඩු කිරීම පැහැර හැරීම. 211

143. බැංකු සහ මූල්‍ය ආයතන වෙත තක්සේරු කිරීම නිකුත් කිරීම. 212

144. අභියාචන. 213

145. පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය. 214

146. පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය සහ පොලිය. 215

147. අර්ථ නිරූපණය. 215

වගන්තිය පිටුව

148. ආදායම් බදු අය කරනු ලැබිය හැකි තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය. 215

149. ලියාපදිංචි සමුපකාර සමිති සමාගම් ලෙස සලකන බව. 215

150. බැංකු සහ මුල්‍ය ආයතන ලියාපදිංචි කිරීම. 216

XVII වන පරිච්ඡේදය

නිශ්චිත තැනැත්තන් විසින් ගෙවන ලද නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකර ගැනීම

151. නිශ්චිත තැනැත්තන් ලියාපදිංචි කිරීම. 216

152. කුලී, බදු කුලී හෝ වෙනත් සමාන ගෙවීම්වලින් ආදායම් බදු අඩු කර ගැනීමට යටත් වන තැනැත්තන් ලියාපදිංචි කිරීම. 216

153. නිශ්චිත තැනැත්තන් විසින් නිශ්චිත ගාස්තුවලින් අදායම් බදු අඩුකර ගත යුතු බව. 217

154. මේ පරිච්ඡේදය යටතේ නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකිරීම සම්බන්ධයෙන් XVI පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු බව. 218

XVIII වන පරිච්ඡේදය

පදිංචිය සඳහා හැර, යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවනු ලබන කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම

155. කුලී, බදු කුලී යනාදිය ගෙවන තැනැත්තන් විසින් ආදායම් බදු අඩුකරගත යුතු බව. 218

156. XVI වන පරිච්ඡේදයේ විධිවිධාන මේ පරිච්ඡේදයට අදාළ විය යුතු බව. 219

XIX වන පරිච්ඡේදය

ආණ්ඩුවේ ආයතනයක් විසින් තොරතුරු සැපයූ අයට ගෙවනු ලබන ත්‍යාග මුදල්වලින් සහ ආණ්ඩුව විසින් යම් තැනැත්තකුට ගෙවනු ලබන දඩ මුදල්වල කොටස්වලින් සහ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද ලොතරැයි ත්‍යාගවලින් සූදු සහ ඔට්ටු ඇල්ලීමේ දිනුම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම

157. ත්‍යාග හෝ දඩ හෝ ලොතරැයි දිනුම් ආදිය ගෙවන ආණ්ඩුවේ ආයතනයක් හෝ තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ආදායම් බදු අඩුකර ගත යුතු බව. 220

වගන්තිය පිටුව

158. මේ පරිච්ඡේදය යටතේ යම් XVII අඩු කිරීම් සම්බන්ධයෙන් XVII පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු බව. 220

159. ලොතරැයි, ඔට්ටු ඇල්ලීම් සහ සූදු කටයුතු කර ගෙන යන තැනැත්තන් ලියාපදිංචි කිරීම. 223


XX වන පරිච්ඡේදය

**කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද යම් වාර්ෂිකයකින් හෝ රාජ්‍ය භාගයකින් හෝ ගෙවන ලද යම් කළමනාකරණ ගාස්තුවකින් හෝ ගෙවන ලද ඊට සමාන ගාස්තුවකින් ආදායම් බදු අඩු කිරීම**

160. වාර්ෂික රාජ්‍ය භාග කළමනාකරන ගාස්තු හෝ ඊට සමාන ගෙවීම් කරන තැනැත්තන් විසින් ආදායම් බදු අඩු කිරීම 223

161. XVI වන පරිච්ඡේදයේ විධිවිධාන මේ පරිච්ඡේදයට අදාළකර ගැනීම. 224


XXI වන පරිච්ඡේදය

**ඇතැම් අර්ථසාධක අරමුදල්වල රඳවා ගැනීම**

162. නිශ්චිත අර්ථසාධක අරමුදලක, දායකයාගේ බැරට තිබෙන මුදලින් සියයට පහළොවක් එම මුදල් වෙනුවෙන් ගෙවිය යුතු බද්ද ගෙවීමට රඳවාගත යුතු බව. 225


XXII වන පරිච්ඡේදය

**තක්සේරු කිරීම**

163. තක්සේරු කිරීම් සහ අතිරේක තක්සේරු කිරීම් 225

164. තක්සේරු දැන්වීම 229


XXIII වන පරිච්ඡේදය

**අභියාචන**

අ - කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන

165. කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන. 230

වගන්තිය පිටුව

ආ – සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනා

166. සමාලෝචන මණ්ඩලයෙහි සංයුතිය 234

167. සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන කිරීම. 235

168. කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන යොමු කළ හැකි බව. 236

169. සමාලෝචන මණ්ඩලය විසින් අභියාචන විභාග කිරීම සහ තීරණය කිරීම. 236

ඇ - අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන

170. නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනය. 238

XXIV වන පරිච්ඡේදය

තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩන

171. තක්සේරුකරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව. 241

172. සාවද්‍ය වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනය. 241

XXV වන පරිච්ඡේදය

පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල්

173. පැහැර හරිනු ලැබූ බද්ද හා එයට එකතු කරනු ලබන මුදල් 242

174. බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් දඩුවම් 247

XXVI වන පරිච්ඡේදය

බදු අයකර ගැනීම

175. බද්දට දඩ ආදිය ඇතුළත් විය යුතු බව 247

වගන්තිය පිටුව


176. බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව. 248

177. පැහැර හරින්නා වෙත දැන්වීම. 249

178. තහනම් කොට විකිණීමෙන් බද්ද අය කර ගැනීම. 251

179. අයකර ගැනීම සඳහා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය 253

180. ණය ආදියෙන් බද්ද අයකර ගැනීම 255

181. බද්ද මුදලින් ගෙවීම වෙනුවට ආණ්ඩුවට නිශ්චල දේපළ පැවරීම 258

182. පැහැර හරින ලද බදු සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අය කර ගත යුතු බව. 258

183. හවුල්කරුවකුගේ පැහැර හරිනු ලැබූ හවුල් බද්ද ව්‍යාපාරයේ වත්කම් වලින් අයකර ගත යුතු බව. 261

184. දරුවකුගේ ආදායමෙන් බදු අයකර ගැනීම 261

185. අර්ථලාභියකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද භාරකරුවකුගෙන් අයකර ගැනීම 261

186. අර්ථලාභියෙකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද පොල්මෑකරුගෙන් අයකර ගැනීම. 261

187. ඇතැම් අවස්ථාවල ද ත්‍යාග බද්ද ත්‍යාග ලාභියාගෙන් අය කර ගත යුතු බව. 262

188. ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් බදු අය කර ගැනීම. 262

189. බදුඅයකර ගැනීමේ මාර්ගවලින් එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම. 263

190. බදුඅයකර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සතු බලය. 263

191. ඈවර කරනු ලබන පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරයන්ගේ වගකීම. 263

192. කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම. 264

193. ඇතැම් අවස්ථානුගත කරුනුවලදී වසර පහක් ඉකුත්වීමෙන් පසුව නඩු පවරනු නොලැබිය යුතු බව. 264

වගන්තිය පිටුව

XXVII වන පරිච්ඡේදය

විවිධ කරුණු

194. අත්සන හා දැන්වීම භාර දීම. 264

195. දැන්වීම, තක්සේරු කිරීම් ආදියෙහි වලංගුතාවය. 265

196. හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල් කරු ක්‍රියා කල යුතු බව. 266

197. සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියාකල යුතු බව. 266

198. බෙලහීන වූ හෝ නිර්වාසික තැනැත්තෙක් වෙනුවට කවරකු විසින් ක්‍රියාකළ හැකිද යන බව. 267

199. නියෝජිතයා ආරක්ෂා කිරීම. 267

XXVIII වන පරිච්ඡේදය

ආපසු ගෙවීම

200. වැඩිපුර ගෙවනු ලැබූ බද්ද ආපසු ගෙවිය යුතු බව. 268

201. ඇතැම් අවස්ථාවලදී ආපසු ගෙවන මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලිය. 271

XXIX වන පරිච්ඡේදය

වැරදි සහ දණ්ඩන

202. වාර්තා සැපයීම පැහැර හැරීම, සාවද්‍ය වාර්තා සැපයීම ආදිය සම්බන්ධයෙන් දඬුවම්. 271

203. රහස්‍යතාවය කඩකිරීම හා වෙනත් කාරණා වැරදි වන බව. 275

204. වංචාව ආදිය සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන. 275

205. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක් හෝ වරදකරු කිරීමක් නොතකා බදු ගෙවිය යුතු බව. 277

206. නඩු පැවරීම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ඇතිව විය යුතු බව. 277

වගන්තිය පිටුව

207. ප්‍රකාශ සහ ලේඛන සාක්ෂ්‍යයේදී ආවේශ්‍ය කිරීම. 278

XXX වන පරිච්ඡේදය

පරිපාලනය

208. නිලධරයෝ. 278

209. නිල රහස්‍යතාවය. 279

210. දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල. 286

211. කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු සපයන්නන්ට ත්‍යාග පිරිනැමිය හැකි බව. 287

XXXI වන පරිච්ඡේදය

පොදු කාරණා

212. නියෝග. 287

213. ආකෘති. 288

214. ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය. 288

215. ව්‍යාපාර ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය. 291

216. අනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව. 293

XXXII වන පරිච්ඡේදය

අර්ථ නිරූපණය

217. අර්ථ නිරූපනය 293

XXXIII වන පරිච්ඡේදය

2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම

218. 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම. 304

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 01/2006.

**2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන පරිච්ඡේදය

ආදායම් බද්ද පැනවීම

2. (1) 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම, ඒ තක්සේරු වර්ෂය සඳහා සෑම තැනැත්තකුගේම ලාභ සහ ආදායම වෙනුවෙන් ආදායම් බද්ද — ආදායම් බද්ද පැනවීම.

(අ) ඒ තක්සේරු වර්ෂය තුළදී ශ්‍රී ලංකාවෙහි වාසිකව සිටි තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට කොතැනක වුවද ඇති වන ලාභ හා ආදායම් සම්බන්ධයෙන් ද ;

(ආ) වෙනත් සෑම තැනැත්තකුම සම්බන්ධයෙන් වූ විට, ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන හෝ ලාභ හා ආදායම් සම්බන්ධයෙන් ද,

මේ පනතේ පළමුවන, දෙවන, තුන්වන, හතරවන හා පස්වන උපලේඛනවල සඳහන් උචිත අනුප්‍රමාණ අනුව, මේ පනතේ විධිවිධානවලට යටත්ව, අය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතෙහි කාර්ය සඳහා “ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන හෝ ලාභ හා ආදායම යන්නට” ශ්‍රී ලංකාවෙහිදී කරනු ලැබූ සේවාවන්ගෙන් හෝ, ශ්‍රී ලංකාවෙහි වූ දේපළවලින් හෝ, කෙලින්ම නැතහොත් අනුයෝජිතයකුගේ මාර්ගයෙන් හෝ ශ්‍රී ලංකාවෙහිදී කරනු ලැබූ ව්‍යාපාරික කටයුත්තකින් හෝ ලැබුණු සියලුම ලාභ හා ආදායම ඇතුළත් වේ.

## II වන පරිච්ඡේදය

### බදු නියම කළ හැකි ආදායම

බදු නියම කළ හැකි ආදායම.

**3**. මේ පනතේ කාර්ය සඳහා "ලාභ සහ ආදායම" නැතහොත් "ලාභ" හෝ "ආදායම" යන්නෙන්—

(අ) පවත්වාගෙන යනු ලැබූ හෝ කරගෙන යනු ලැබූ කාලසීමාව කෙතරම් කෙටි වුව ද, යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන ලාභ ;

(ආ) යම් සේවා නියුක්තියකින් ලැබෙන ලාභ ;

(ඇ) ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක කාර්ය සඳහා පදිංචි වී නොසිටිනතාක් දුරට, අයිතිකරු විසින් හෝ අයිතිකරු වෙනුවෙන් හෝ පදිංචිව සිටිනු ලබන යම් ඉඩමක හා ඒ ඉඩමෙහි වැඩිදියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම ;

(ඈ) මේ වගන්තියේ (අ) (ආ) හෝ (ඇ) ඡේද යටතේ ලාභ හා ආදායම නිශ්චය කිරීමේදී ගණන් ගනු නොලැබේ නම් පදිංචිකරු විසින් කුලී නොගෙවා ප්‍රයෝජන ගනු ලැබූ යම් ඉඩමක හා ඒ ඉඩමෙහි වැඩිදියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම, නැතහොත් ඒ ඉඩම හා වැඩිදියුණු කිරීම්වලට ගෙවන ලද කුලිය ශුද්ධ වාර්ෂික වටිනාකමට වඩා අඩු වන අවස්ථාවක ඒ එක් එක් අවස්ථාවේදී පදිංචිකරුගේ ආදායම වශයෙන් සැලකිය යුතු කුලිය ඉක්මවා සිටින ඒ ශුද්ධ වාර්ෂික වටිනාකමෙහි අතිරික්තය ;

(ඉ) ලාභාංශ, පොලී හෝ වට්ටම් ;

(ඊ) අයවීම් හෝ වාර්ෂිකයන් ;

(උ) කුලී, රාජ්‍යභාග හෝ අධිමිල ;

(ඌ) ලොතරැයියකින්, ඔට්ටු ඇල්ලීමෙන් හෝ සූදු ක්‍රීඩාවකින් දිනුම් ලැබීම ;

(එ) රාජ්‍ය නොවන සංවිධානයක් සම්බන්ධයෙන් වන විට, ප්‍රදාන, පරිත්‍යාග හෝ දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් එම සංවිධානය වෙත ලැබෙන යම් මුදලක් ; සහ

(ඒ) අනියම් හා අනාවර්ත ස්වභාවයක ලාභ හැර, වෙනත් කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන ආදායම,

අදහස් වේ.

4. (1) යම් සේවා නියුක්තියකින් ලැබෙන ලාභවලට— සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ

(අ) සේවායෝජකයකුගෙන් හෝ වෙනත් තැනැත්තන්ගෙන් ලැබුණ ද, උද්ගත වුව ද—

(i) යම් වැටුපක්, වේතනයක්, දීමනාවක්, නිවාඩු පඩියක්, ගාස්තුවක්, විශ්‍රාම වැටුපක්, කොමිස් මුදලක්, ප්‍රසාද මුදලක්, පාරිතෝෂිකයක්, අමතර ලැබීමක් හෝ තම සේවා නියුක්තියෙහි යෙදී සිටින අතරතුර සේවා නියුක්තයකු විසින් ලබාගන්නා වූ මුදලින් වූ එවැනි වෙනත් ගෙවීමක් ;

(ii) යම් නිවාඩු ගමන් බලපත්‍රයක නැතහොත් යාන පත්‍රයක වටිනාකම ඇතුළුව, සේවා නියුක්තයා හෝ සේවා නියුක්තයාගේ භාර්යාව නැතහොත් ස්වාමිපුරුෂයා හෝ දරුවකු හෝ දෙමවුපියන්ගෙන් කෙනකු හෝ ලබන යම් ප්‍රතිලාභවල වටිනාකම ;

(iii) සේවා නියුක්තයාගේ හෝ සේවා නියුක්තයාගේ භාර්යාවගේ නැතහොත් ස්වාමිපුරුෂයාගේ හෝ දරුවාගේ හෝ දෙමවුපියන්ගෙන් කෙනෙකුගේ ප්‍රතිලාභය සඳහා වෙනත් යම් තැනැත්තකුට කරනු ලබන යම් ගෙවීමක් ;

(ආ) යම් සේවා නියුක්තයකුට, සේවායෝජක විසින් කිසිදු අයකිරීමක් නොමැතිව දෙනු ලැබූ යම් වාහන පහසුකමක වටිනාකම හෝ එවැන්නක් මිලදී ගැනීම සඳහා එලෙස දෙනු ලැබූ යම් මුදලක් ;

(ඇ) (i) යම් විශ්‍රාම පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීමේ දී ලැබුණු යම් මුදලක් ;

(ii) යම් සේවා නියුක්තයකු විශ්‍රාම ගැනීමේ දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ, අර්ථසාධක අරමුදලකින් ඔහුගේ දායක මුදල නියෝජනය වන කොටස හැර, එම සේවා නියුක්තයාට ගෙවනු ලැබූ යම් මුදලක් ;

(iii) (අ) යම් පරිපාලිත අර්ථසාධක අරමුදලකට යම් සේවා නියුක්තයකු විසින් ගෙවන ලද දායක මුදල් නියෝජනය කරන යම් කොටසක් ; සහ

(ආ) යම් පරිපාලිත අර්ථසාධක අරමුදලකට 1968 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සේවායෝජක විසින් ගෙවන ලද දායක මුදල් ද, ඒ දායක මුදල් මත උපචිත පොලිය ද සම්බන්ධයෙන් ඒ සේවායෝජක විසින් සියයට පහළොව බැගින් වූ ප්‍රමාණයක් මත බදු ගෙවන ලද්දේ නම්, සේවායෝජක විසින් ගෙවන ලද ඒ දායක මුදල හා උපචිත පොලිය නියෝජනය කරන ඒ මුදලෙහි යම් කොටසක්,

නොවන, ඒ පරිපාලිත අර්ථසාධක අරමුදලින් ඒ සේවා නියුක්තයාට ගෙවන ලද යම් මුදලක් ;.

(iv) යම් ධුරයක් හෝ සේවා නියුක්තියක් අහිමිවීම සඳහා වන්දි වශයෙන් ලැබුණු යම් මුදලක් ;

(v) 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනතින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් ගෙවන ලද යම් මුදලක් ;

(ඈ) සේවායෝජක විසින් කුලියක් නොමැතිව සපයනු ලැබූ යම් වාසස්ථානයක කුලී වටිනාකම හෝ සේවා යෝජකයකු විසින් කුලී වටිනාකමට අඩු කුලියකට වාසස්ථානයක් සපයනු ලබන අවස්ථාවක, ඒ කුලිය ඉක්මවා ඇති කුලී වටිනාකමෙහි අතිරික්තය,

ඇතුළත් වේ.

මේ ඡේදයේ කාර්ය සඳහා, යම් වාසස්ථානයක කුලී වටිනාකම-

(i) 5 වන වගන්තියෙහි අර්ථකථනය කොට ඇති ශුද්ධ වාර්ෂික වටිනාකමට අයිතිකරු විසින් ගෙවනු ලබන වරිපනම් හා අලුත්වැඩියා කිරීම් සහ වෙනත් වියදම් වෙනුවෙන් ඒ ශුද්ධ වාර්ෂික වටිනාකමට සියයට තිස්තුනයි තුනෙන් එකක් එකතු කළ විට ලැබෙන මුදල ; හෝ

(ii) ඒ වාසස්ථානය සඳහා ගෙවන ලද දළ ගෙවල් කුලිය,

යන මේ ප්‍රමාණ දෙකින් වඩා වැඩි ප්‍රමාණය විය යුතු ය :

එසේ වුවද,

(අ) (අ) ඡේදයේ සඳහන් ලාභවල එකතුව රුපියල් එක්ලක්ෂ පනස් දහසක් නොඉක්මවන අවස්ථාවක, රුපියල් එක් ලක්ෂ විසිදහසකට වැඩි කුලී වටිනාකමේ යම් අතිරික්තයක් ; සහ

(ආ) (අ) ඡේදයේ සඳහන් ලාභවල එකතුව රුපියල් එක්ලක්ෂ පනස්දහසකට වැඩිවන අවස්ථාවක, රුපියල් එක් ලක්ෂ අසූ දහසකට වැඩි කුලී වටිනාකමේ අතිරික්තයක්,

නොසලකා හැරිය යුතු ය ;

(ඉ) සේවායෝජකගෙන් හෝ සේවායෝජක වෙනුවෙන්, එම සේවා නියුක්තියට අදාළව වෙනත් තැනැත්තකුගෙන් නොමිලයේ හෝ එම කොටස්වල එවකට පවත්නා වෙළෙඳපළ වටිනාකමට වඩා අඩු මිලකට, ප්‍රතිලාභයක් ලෙස කෙලින්ම හෝ කොටස්, මනාප ක්‍රමයක් යටතේ ලැබුණු ඒ සමාගමේ කොටස් බැහැර කරන අවස්ථාවේ දී ඒවායේ වටිනාකම,

යම් කොටසක් බැහැර කරන අවස්ථාවේ දී එහි වටිනාකම යන්නෙන්, ඒ කොටස අත්කර ගැනීමේ පිරිවැය ඉක්මවූ—

(i) විකිණීමක් සම්බන්ධයෙන් වන විට, එය විකුණන දිනයේ දී එහි විකුණුම් මිල හෝ වෙළෙඳපොළ වටිනාකම යන මෙයින් වඩා ඉහළ වටිනාකම ;

(ii) විකිණීමෙන් හැර අන්‍යාකාරව බැහැර කරන අවස්ථාවක, එම කොටස එසේ බැහැර කරන දිනයේ දී පැවැති එහි වෙළෙඳපළ වටිනාකම ;

(iii) එම කොටස විකිණීමෙන් හෝ බැහැර කිරීමෙන් තොරව සේවා නියුක්තියකු සේවා නියුක්තියේ යෙදීම නතර වූ අවස්ථාවක, එම කොටස බැහැර කරන ලද දිනය සේ සලකනු ලබන, ඔහු ඒ සේවායෝජකගේ සේවා නියුක්තියේ සිටි අවසන් දිනට එම කොටසෙහි වෙළෙඳපොළ වටිනාකම,

අදහස් වේ:

එසේ වුවද, ඒ සේවා යෝජකගේ සේවා නියුක්තියේ යෙදී සිටිය දී සේවා නියුක්තයා මියගිය විටක, එම කොටසක වටිනාකම ශූන්‍ය විය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා එම විකිණීම හෝ බැහැර කරනු ලැබීම හෝ සේවා නියුක්තිය නතරවීම සිදුවූයේ යම් තක්සේරු වර්ෂයක දී ද, ඒ වර්ෂයේ දී මීට ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව උද්ගත වන සේවා නියුක්ති ලාභවලින්, එම ලාභ ඒ තක්සේරු වර්ෂය සඳහා VII වන පරිච්ඡේදයේ අර්ථානුකූලව වූ එකම බදු අයකළ හැකි ආදායම යන පදනම මත ආදායම් බදු අයකළ යුතු අතර, එම බද්ද මේ පනතේ XIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව අයකර ගත යුතු ය :

එසේ වුව ද, එම කොටස බැහැර කිරීමට සේවායෝජක සාධක නොවූ අවස්ථාවක, ඒ සේවා නියුක්තයා එම සේවා නියුක්ති ලාභයෙන් අයවිය යුතු බද්ද මේ පනතේ XIII වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, "යම් ප්‍රතිලාභයක වටිනාකම" යන්න එවැනි යම් ප්‍රතිලාභයක් ලැබුණ හෝ උද්ගත වන්නා වූ පුද්ගලයකු සම්බන්ධයෙන් යෙදෙන විට-

(අ) ඒ ප්‍රතිලාභයේ වෙළෙඳ වටිනාකම පහසුවෙන් නිසැකව දැනගනු ලැබිය හැකි අවස්ථාවක, ඒ වෙළෙඳ වටිනාකම ; හෝ

(ආ) ඒ ප්‍රතිලාභයේ වෙළෙඳ වටිනාකම පහසුවෙන් නිසැකව දැනගනු ලැබිය නොහැකි හෝ ඒ ප්‍රතිලාභයෙහි වෙළෙඳ වටිනාකමක් නොමැති අවස්ථාවක, ඒ ප්‍රතිලාභය ලබාගැනීමෙහි ලා වෙනත් පුද්ගලයකු විසින් දරනු ලැබිය යුතු වූ වියදම,

ඉන් අදහස් වේ :

එසේ වුවද, ඒ ප්‍රතිලාභයේ වෙළෙඳ වටිනාකම හෝ ඒ ප්‍රතිලාභය ලබාගැනීමෙහි ලා වෙනත් යම් පුද්ගලයකු විසින් දරනු ලැබිය යුතු වූ වියදම කෙරෙහි සැලකිලිමත්ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් ප්‍රතිලාභයක් මත තබනු ලැබිය යුතු වටිනාකම නිශ්චය කරනු ලැබිය හැකි අතර, ප්‍රතිලාභයක් සම්බන්ධයෙන් වටිනාකමක් එසේ නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ වටිනාකම, ඒ ප්‍රතිලාභයේ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතු ය.

**5**. (1) අලුත්වැඩියා කිරීම් හා වෙනත් වියදම් සඳහා සියයට විසිපහක අඩුකිරීම්වලට යටත්ව, යම් ඉඩමක හා ඒ ඉඩමෙහි ඇති වැඩි දියුණු කිරීම්වල හෝ යම් වාසස්ථානයක හෝ ශුද්ධ වාර්ෂික වටිනාකම, (කුලීනිවැසියා වරිපනම් ද, අයිතිකරු අලුත්වැඩියා කිරීම්වල වියදම් ද, ගෙවන අවස්ථාවක) වසරින් වසර ගත් කල කුලීනිවැසියා විසින් එම ඉඩමට හා වැඩිදියුණු කිරීම්වලට හෝ වාසස්ථානයට හෝ ගෙවනු ලබන්නේ යයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි කුලිය අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය.

ඉඩම සහ එහි ඇති වැඩිදියුණු කිරීම්වල හෝ යම් වාසස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම.

(2) පළාත් පාලන ආයතනයක් විසින් වරිපනම් නියම කිරීමේ කාර්ය සඳහා යම් ඉඩමක හා ඒ ඉඩමෙහි වැඩිදියුණු කිරීම්වල හෝ වාසස්ථානයක හෝ වාර්ෂික වටිනාකම නිශ්චය කරනු ලැබුවේ යම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයෙහි ඒ ඉඩමෙහි හා වැඩිදියුණු කිරීම්වල නැතහොත් වාසස්ථානයෙහි වාර්ෂික පළාත් පාලන ආයතනය විසින් කරනු ලැබූ තක්සේරු කිරීම් නිරවද්‍ය ලෙස පෙන්නුම් කොට නොමැති බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නේ නම් මිස, ඒ වාර්ෂික වටිනාකමින් සියයට විසිපහක් අලුත්වැඩියා කිරීම් හා වෙනත් වියදම් වෙනුවෙන් අඩු කළ විට, එය ශුද්ධ වාර්ෂික වටිනාකම විය යුතු ය.

**6**. ඉඩම් සහ ඒවායේ වැඩිදියුණු කිරීම් බදු දීමෙන් ඇතිවන ආදායම හෝ ලාභ, ලබාගත හැකි හා අයකර ගත හැකි දළ කුලී මුදලින් අයිතිකරු විසින් දැරිය යුතු වූ වරිපනම් අඩු කර, අලුත්වැඩියා කිරීම්වල වියදම් අයිතිකරු භාරගෙන ඇති අවස්ථාවක ශේෂයෙන් සියයට විසිපහක් අඩු කළ පසු ඉතිරි වන මුදල විය යුතු නමුත්, එය එවැනි ඉඩම් හා ඒවායේ වැඩි දියුණු කිරීම් සම්බන්ධයෙන් අයකර ගත හැකි කුලිය තත්කාලයේ බලපවත්නා යම් නීතියක් මගින් සීමාකර නොමැති අවස්ථාවකදී, කුලී මුදලක් ලබාගත නොහැකි හෝ අයකර ගත නොහැකි යම් කාලයක් සඳහා අදාළ විධිවිධාන සැලසීමෙන් 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ අර්ථානුකූලව පදිංචිකරුගේ ආදායම වන යම් කොටසක් එයින් අඩු කිරීමෙන් පසු ඉතිරිවන ශුද්ධ වාර්ෂික වටිනාකමේ ප්‍රමාණයට, අඩු නොවිය යුතු ය.

ඉඩම් සහ ඒවායේ වැඩිදියුණු කිරීම් කුලියට දීමෙන් ඇති වන ලාභ හෝ ආදායම.

## III වන පරිච්ඡේදය

## ආදායම් බද්දෙන් නිදහස් කිරීම

7. (අ) (i) ලෝක සංචාරක සංවිධානයේ ;

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් වූ හා ඒ සංවිධානය විසින් හෝ එය වෙනුවෙන් පරිහරණය කරනු ලබන්නා වූ ශ්‍රී ලංකාවෙහි පිහිටි යම් ඉඩමක හා ඒ ඉඩමෙහි වැඩි දියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම ඇතුළුව ඒ සංවිධානයේ ;

ඇතැම් තැනැත්තන් (පුද්ගලයන් හැර) ඔවුන් ලබන ලාභ සහ ආදායම්වල මුළු ප්‍රමාණය හෝ ඉන් යම් කොටසක් මත, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

(iii) ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ;

(iv) ආසියානු සංවර්ධන බැංකුවේ;

(v) ජාත්‍යන්තර මුදල් සංස්ථාවේ;

(vi) සංවර්ධන මුදල් සංස්ථාවට ප්‍රදානය කරන ලද යම් ණය මුදලක් මත වූ පොලිය සහ වෙනත් අයකිරීම් වෙනුවෙන් යෙදෙන ලාභ සහ ආදායම වන්නා වූ, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව හෝ අමාත්‍යවරයා විසින් අනුමත කළ වෙනත් යම් ජාත්‍යන්තර හෝ විදේශ සංවිධානයක;

(vii) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකාර ආයතනයේ;

(viii) 1979 අංක 23 දරන මහවැලි අධිකාරය පනතින් පිහිටුවන ලද මහවැලි අධිකාරය මගින් වෙන්කරන ලද්දා වූ සහ පාලනය කරන ලද්දා වූ—

(i) බී කලාපයේ 2 වන සහ 3 වන උප කලාපවල ; සහ

(ii) ජී කලාපයේ,

ජනපදිකයන්ගේ යහපත සඳහා යුරෝපීය ආර්ථික හවුලේ මූල්‍යාධාර ඇතිව පිහිටුවනු ලැබූ භාර අරමුදලේ;

(ix) රතුකුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුවේ ;

(x) ඇමෙරිකා එක්සත් ජනපදයේ විදේශීය පුද්ගලික ආයෝජන සංස්ථාවේ ;

(xi) ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ;

(xii) ලෝක සංරක්ෂණ සංගමයේ ;

(xiii) පොදු රාජ්‍ය මණ්ඩලීය සංවර්ධන සංස්ථාවේ ;

(xiv) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත ඉන්දු ශ්‍රී ලංකා පදනමේ ;

(xv) යුරෝපීය ආයෝජන බැංකුවේ ;

(xvi) 1988 නොවැම්බර් මස 2 වන දින ඩෙන්මාර්ක, පින්ලන්ත, අයිස්ලන්ත, නෝර්වේ සහ ස්විඩීන් රාජ්‍යයන් අතර එළඹුණු ගිවිසුමට අනුව පිහිටුවනු ලැබූ නෝර්ඩික් සංවර්ධන අරමුදලේ,

(xvii) ද නොඩික් ආයෝජන බැංකුවේ ;

ලාභ සහ ආදායම ;

(ආ) (i) (276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සභාව පනත මගින් පිහිටුවන ලද සංස්ථාගත නීති අධ්‍යාපන සභාවේ;

(ii) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ;

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ;

(iv) 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා පුස්තකාල සේවා මණ්ඩලයේ;

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ නැතහොත් පිහිටුවනු ලදැයි සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක;

(vi) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතින් හෝ ඒ පනත යටතේ හෝ පිහිටුවනු ලැබූ පොල් සංවර්ධන අධිකාරියේ, පොල් පර්යේෂණ මණ්ඩලයේ සහ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ;

(vii) (431 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා රජයේ නිලධරයන්ගේ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක හෝ යෝජනා ක්‍රමයක;

(viii) පලාත් පාලන සේවය සඳහා ස්ථාපනය කරන ලද යම් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක හෝ යෝජනා ක්‍රමයක ;

(ix) හුදෙක් විද්‍යාත්මක පර්යේෂණ කාර්ය සඳහා යම් ලිඛිත නීතියකින් පිහිටුවනු ලැබූ පොදු ස්වරූපයක් ගත් යම් ආයතනයක් හෝ භාරයක් ;

(x) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනත යටතේ පිහිටුවනු ලැබූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ;

(xi) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ;

(xii) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත යටතේ පිහිටුවනු ලැබූ කාර්මික තාක්ෂණ ආයතනයේ;

(xiii) 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ;

(xiv) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ 57(1) වන වගන්තිය යටතේ සංස්ථාපිත යම් සංචාරක ස්ථාන අධිකාරියක;

(xv) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ;

(xvi) ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ සහ ආදායම වන්නා වූ ද, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මගින් පිහිටුවන ලද මුදල් මණ්ඩලයේ;

(xvii) සමූපකාර ව්‍යාපාරයට අදාළ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිලිමත්ව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන යම් ව්‍යාපාරයකින් සමූපකාර සමිතියක් ලබන ලාභ සහ ආදායම වන්නා වූ ද, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරනු ලැබූ යම් සමිතියක් වන්නා වූ ද, සාමාජිකයන්ගෙන් බහුතර සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ වාසිකයන් වන්නා වූ ද යම් සමිතියක, වෙනත්

ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයකු වන්නේ යම් ලියාපදිංචි කළ සමිතියක ද, ඒ සමිතියේ සාමාජිකත්වය නිශ්චය කිරීමේ කාර්යය සඳහා, ඒ වෙනත් ලියාපදිංචි කළ සමිතියේ එක් එක් සාමාජිකයා එකී ලියාපදිංචි කළ සමිතියේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(xviii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පදනම ආයතනයේ ;

(xix) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාවෙහි ;

(xx) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි ;

(xxi) 1961 අංක 31 දරන ආයුර්වේද පනතින් පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය සභාවෙහි ;

(xxii) 1970 අංක 7 දරන හෝමියෝපති පනතින් පිහිටුවන ලද හෝමියෝපති සභාවෙහි ;

(xxiii) 1971 අංක 9 දරන ශ්‍රී ලංකා කායික වෛද්‍යවරුන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා කායික වෛද්‍යවරුන්ගේ සංගමයෙහි ;

(xxiv) 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරයන්ගේ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරුවරයන්ගේ ආයතනයෙහි ;

(xxv) 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවෙහි ;

(xxvi) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි ;

(xxvii) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමයෙහි ;

(xxviii) (i) අන්තර් ජාතික මෙහෙයුම් කටයුතුවල නිරත වූ ;

(ii) යම් සමාගමකට අයිති වූ හෝ සමාගම් විසින් කුලියට ගනු ලැබූ ; සහ

(iii) 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 30 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ කරන ලද තීරණයක හේතුවෙන් ලංකාවේ නැවක් ලෙස සලකනු ලබන්නා වූ,

නැවකින්, 1982 අංක 17 දරන සමාගම් පනතේ VIII වන කොටස යටතේ ලියාපදිංචි කරන ලද යම් සමාගමකට ශ්‍රී ලංකාවේ වරායකට හෝ වරායකින් ඒ නැවේ මගීන්, තැපැල්, ඇති කරන සතුන් සහ බඩු ප්‍රවාහනය කිරීමෙන් ඒ සමාගමට උද්ගත වන ලාභ සහ ආදායම නොවන උද්ගත වන;

(xxix) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයෙහි;

(xxx) 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතනය පනතින් පිහිටුවන ලද ජාත්‍යන්තර දඹල ආයතනයෙහි;

(xxxi) 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ඒ පනතින් හෝ ඒ පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක;

(xxxii) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ;

(xxxiii) 1985 අංක 2 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල පනතින් පිහිටුවන ලද බලශක්ති සංරක්ෂණ අරමුදලෙහි;

(xxxiv) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතින් පිහිටුවන ලද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ;

(xxxv) 1963 අංක 11 දරන මුදල් පනත යටතේ පිහිටුවන ලද සමූපකාර සංවර්ධන අරමුදලේ ;

(xxxvi) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ;

(xxxvii) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදලේ ;

(xxxviii) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ ;

(xxxix) 1982 අංක 22 දරන ශ්‍රී ලංකා මිනින්දෝරුවරයන්ගේ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරුවරයන්ගේ ආයතනයේ ;

(xl) 1972 අංක 15 දරන රසායන විද්‍යා ආයතන (ශ්‍රී ලංකා) පනතින් සංස්ථාගත කරන ලද රසායන විද්‍යා (ශ්‍රී ලංකා) ආයතනයේ ;

(xli) 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ;

(xlii) 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතින් පිහිටුවන ලද කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ;

(xliii) 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකාර මණ්ඩල පනත මගින් පිහිටුවන ලද උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ ;

(xliv) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ;

(xlv) 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්‍යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ;

(xlvi) (439 අධිකාරය වූ) රබර් පර්යේෂණ ආඥා පනත යටතේ පිහිටුවන ලද රබර් පර්යේෂණ මණ්ඩලයේ ;

(xlvii) 1990 අංක 35 දරන බුද්ධ ශාසන අරමුදල පනතින් පිහිටුවන ලද බුද්ධ ශාසන අරමුදලේ ;

(xlviii) 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනත මගින් පිහිටුවන ලද ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ ;

(xlix) 1981 අංක 3 දරන ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ ;

(l) 1971 අංක 38 දරන මුදල් පනතේ IV වන කොටස යටතේ පිහිටුවන ලද තේ, රබර් සහ පොල් සඳහා වූ ස්ථායිකරණ අරමුදලේ ;

(li) (96 වන අධිකාරය වූ) භාර ආඥා පනත යටතේ සංස්ථාගත කරන ලද ජනසවිය භාරකාර අරමුදලේ ;

(lii) 1979 අංක 26 දරන ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ;

(liii) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයෙහි ;

(liv) 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ;

(lv) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ;

(lvi) 1997 අංක 28 දරන බණ්ඩාරනායක කෞතුකාගාර කමිටුව (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද බණ්ඩාරනායක කෞතුකාගාර කමිටුවේ ;

(lvii) 1992 අංක 33 දරන පතල් හා ඛණිජ පනත මගින් පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය;

(lviii) 2003 අංක 39 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පිළිබඳ පනත යටතේ පිහිටුවනු ලැබූ කළමනාකරණ සංස්ථාවෙහි;

(lix) 2000 අංක 21 දරන, ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනයෙහි,

ලාභාංශවලින් සහ පොලීවලින් ලැබෙන ලාභ හෝ ආදායම නොවන ලාභ සහ ආදායම;

(ඇ) (i) යම් පළාත් පාලන ආයතනයක් හෝ ආණ්ඩුවේ ආයතනයක් සතු වී ඇති හෝ ආයතනය විසින් පාලනය කරනු ලබන හෝ යම් භාරයක හෝ වෙනත් දෙයක ආදායම වන්නා වූ ද, ඒ පළාත් පාලන ආයතනයට හෝ ආණ්ඩුවේ ආයතනයට අර්ථලාභී හිමිකමක් නොමැති ආදායම වන්නා වූ ද ආදායම හැර ; සහ

(ii) 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගනු ලැබූ හෝ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ යම් වෙළෙඳ ව්‍යාපාරයක, අවස්ථාවෝචිත පරිද, ඒ අත්කර ගැනීමේ හෝ සතුකර ගැනීමේ දිනයෙන් ආරම්භ වන යම් කාලපරිච්ඡේදයක් සඳහා වූ ලාභ සහ ආදායම හැර,

යම් පළාත් පාලන ආයතනයක හෝ ආණ්ඩුවේ ආයතනයක ආදායම ;

(ඇ) (i) යම් විදේශීය රටක ආණ්ඩුවක් විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත මුදලින්, බඩුවලින්, සේවාවලින් හෝ වෙනත් යම් ආකාරයකින් දෙනු ලැබූ ආධාරවලින් ඒ විදේශීය රටෙහි ආණ්ඩුව විසින් කෙළින්ම හෝ ඒ ආණ්ඩුවේ නියෝජිත ආයතනයක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් ලබාගත් ලාභ සහ ආදායම වන්නා වූ, ඒ විදේශීය රටෙහි ආණ්ඩුවේ ලාභ සහ ආදායම ;

(ii) චීන මහජන සමූහාණ්ඩුවේ ආණ්ඩුව විසින් හෝ ඒ ආණ්ඩුවේ යම්කිසි නියෝජ්‍යායතනයක් විසින් හෝ නැව් අයිතිකරුවකු හෝ නැව් කුලියට ගන්නා වශයෙන් ව්‍යාපාරයකින් ලැබුවා වූ ද, ඒ ආණ්ඩුව හා ශ්‍රී ලංකා ආණ්ඩු අතර ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක සඳහන්ව ඇත්තා වූ ද ලාභ සහ ආදායම වන්නා වූ ඒ ආණ්ඩුවේ හෝ නියෝජ්‍යායතනයේ ලාභ සහ ආදායම ;

(ඉ) (i) පුණ්‍යායතනයක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක ලාභ, හුදෙක් ඒ ආයතනයේ පුණ්‍ය කාර්යයක් සඳහා යොදවනු ලබන්නේ නම් හා,

(අ) ඒ ආයතනයේ මූලික කාර්යය සැබැවින්ම ක්‍රියාත්මක කරන අතරතුර කරගෙන යනු ලබන ව්‍යාපාරයක් හෝ ඒ ව්‍යාපාරය හා සම්බන්ධ කටයුතු ප්‍රධාන වශයෙන් ඒ ආයතනයේ අර්ථලාභීන් විසින් ඉටු කරනු ලබන්නේ නම්; හෝ

(ආ) ඒ ආයතනය ශ්‍රී ලංකාණ්ඩුවෙන් ආධාර ලබන්නේ නම් සහ මේ ඡේදයේ සඳහන් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම් සහ එහි ව්‍යාපාරය අනියම් ස්වභාවයක ව්‍යාපාරයක් නම්,

ඒ පුණ්‍යායතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක ලාභ වන්නා වූ ලාභ සහ ආදායම;

(ii) (අ) එවැනි පුණ්‍යායතනයක් විසින් පාලනය කරනු ලබන යම් පොදු පූජනීය ස්ථානයක් සහ එහි භූමියෙහි ද;

(ආ) භුදෙක් ඒ පුණ්‍යායතනයේ යම් කාර්යයක් සඳහා ඒ පුණ්‍යායතනය විසින් හිමිකර ගනු ලැබ, වාසයට ගෙන ඇති ස්ථානයක හෝ භූමියක ද ;

ශුද්ධ වාර්ෂික වටිනාකම වන්නා වූ ඒ පුණ්‍යායතනයේ ලාභ සහ ආදායම;

(iii) ඒ පුණ්‍යායතනය විසින් පාලනය කරනු ලබන පොදු පූජනීය ස්ථානයට, 1815 මාර්තු මස 2 වන දිනට පෙර රාජකීය ප්‍රදානයක් හෝ වෙනත් ප්‍රදානයක් මගින් තෑගි කරනු ලැබූ යම් දේපළකින් ලැබෙන ලාභ සහ ආදායම, ඒ ප්‍රදානය කරනු ලැබුවේ යම් කාර්ය සඳහා ද ඒ කාර්යයෙහිලා ඒ ලාභ සහ ආදායම පාවිච්චි කරනු ලබන තාක්දුරට, ඒ දේපළින් ලැබෙන ලාභ සහ ආදායම වන්නා වූ ඒ පුණ්‍යායතනයේ ලාභ සහ ආදායම;

(ථ) වෙළෙඳ නැව් අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි කරන ලද යොට් යාත්‍රා සහ විනෝද යාත්‍රා සේවයක් පවත්වාගෙන යාම සඳහා වූ යම් ව්‍යවසායක් –

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයන් විසින් හෝ මුළු කොටස් ප්‍රමාණයම ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයන්ට අයත් සමාගමක් විසින් හෝ නිර්වාසික සමාගම් විසින් හෝ පවත්වාගෙන යන්නේ නම්, සහ;

(ii) අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම්,

ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම;

(උ) (i) 1978 අංක 1 දරන ටවර්හෝල් රඟහල පදනම පනත මගින් පිහිටුවන ලද ටවර්හෝල් රඟහල පදනමේ;

(ii) 1960 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත මගින් පිහිටුවන ලද මධ්‍යම සංස්කෘතික අරමුදලේ; සහ

(iii) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජනාධිපති අරමුදලේ,

ලාභ සහ ආදායම,

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ඇතැම් නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ ඇතැම් ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

8. (1) (අ) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධුරයෙන් යම් තැනැත්තකුට ලැබෙන පඩිනඩි, විශ්‍රාම වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ ;

(ආ) (i) ජනරජය යටතේ ඒකාබද්ධ අරමුදලින් යම් වැටුප් ලබන ධුරයක් දරන යම් පුද්ගලයකුට;

(ii) පාර්ලිමේන්තුව විසින් යම් රාජ්‍ය සංස්ථාවකට වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලින් සම්මත කරනු ලබන මුදල්වලින් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසකින්, සේවා නියුක්තිය වෙනුවෙන් පඩිනඩි හෝ විශ්‍රාම වැටුප හෝ එම ලාභ ගෙවන රාජ්‍ය සංස්ථාවක් වන යම් රාජ්‍ය සංස්ථාවක යම් සේවා නියුක්තයකුට ;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) ව්‍යවස්ථාව යටතේ යම් පළාතක් සඳහා පත්කරන ලද ආණ්ඩුකාරවරයාට ;

(iv) යම් පළාත් සභාවක යම් මන්ත්‍රීවරයකුට ;

(v) යම් පළාත් සභාවක යම් සේවා නියුක්තයකුට හෝ යම් පළාත් රාජ්‍ය සේවයක යම් නිලධරයකුට ;

(vi) යම් පළාත් පාලන ආයතනයක යම් සභිකයකුට ;

(vii) යම් පළාත් ආයතනයක යම් සේවා නියුක්තිකයකුට ;

(viii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද හෝ පිහිටුවනු ලදැයි සළකනු ලබන යම් විශ්ව විද්‍යාලයක යම් සේවා නියුක්තයකුට ;

(ix) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සේවා නියුක්තයකුට ;

(x) සියලුම සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍යවරයකු විසින් හෝ පත්කරනු ලබන මණ්ඩලයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක් වන, යම් පනතක් මගින් හෝ යම් පනතක් යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක සාමාජිකයකුට හෝ සේවා නියුක්තයකුට ;

ගෙවන නිල පඩිනඩි වලින් හරි අඩක් ;

(ඇ) යම් තැනැත්තකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් (ආ) ඡේදයෙහි සඳහන් පුද්ගලයකු හෝ සේවා නියුක්තයකු ආණ්ඩුකාරවරයා හෝ සාමාජිකයකු වශයෙන් මේ පනත ආරම්භ වීමට පෙර හෝ පසුව හෝ වුවද ඉටු කරන ලද ඉකුත් සේවා සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ලැබුණු එවැනි යම් විශ්‍රාම වැටුපක් හෝ 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් සේවා නියුක්තියෙන් ලැබුණු යම් ලාභ ;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක් විසින් ඒ ව්‍යවසායේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන විද්‍යාඥයකු, කාර්මික ශිල්පියකු, විශේෂඥයකු හෝ උපදේශකයකු වන යම් පුද්ගලයකුගේ ශ්‍රී ලංකාවේ දී ඇතිවන පඩිනඩි හා ශ්‍රී ලංකාවේ දී ඇති නොවන යම් ආදායමක් ;

එසේ වුවද ව්‍යවසායක සේවයෙහි නියුක්ත කරනු ලැබූ පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයා ඒ ව්‍යවසායේ ස්වකීය සේවා නියුක්තිය නතර කළ දිනය හෝ ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් ගිවිසුමකින් දෙන ලද බදු නිදහස අවසාන වන දිනය යන මේ දින දෙකෙන් කලින් එළඹෙන දිනයෙන් පසු, ඒ පුද්ගලයාගේ පඩි නඩි ආදායම් බද්දෙන් නිදහස් කරනු නොලැබිය යුතු ය ;

(ඉ) ශ්‍රී ලංකාවේ දී ඇතිවන තිල පඩිනඩි හා ශ්‍රී ලංකාවේ ඇති නොවන හෝ ශ්‍රී ලංකාවෙන් ලබා නොගත් යම් ආදායමක්-

(i) වෙනත් යම් රටක ආණ්ඩුවක (කිනම් නාමයකින් හෝ පදවි නාමයකින් හඳුන්වනු ලැබුව ද) ශ්‍රී ලංකාවේ සිටින රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයාගේ ;

(ii) (i) වන අනුඡේදයේ සඳහන් කරනු ලැබූ එවැනි යම් රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයකුගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු, කොන්සල්වරයකු හෝ වෙළඳ කොමසාරිස්වරයකු සහ කොන්සල්වරයකු හෝ වෙළඳ කොමසාරිස්වරයකුගේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඒ කොන්සල්වරයා හෝ වෙළඳ කොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ඒ තැනැත්තා විසින් නියෝජනය කරන රටේ නේවාසික ශ්‍රී ලංකාවේ අනුරූප නිලධරයකු ඒ රට විසින් ඒ ආකාරයෙන් ම බද්දෙන් නිදහස් කරනු ලබන හෝ ලැබිය හැකි බවට අමාත්‍යවරයා සෑහීමට පත්ව නිදහස් කිරීම ඔවුන් කෙරෙහි අදාළ විය යුතු බව ප්‍රකාශ කරන්නේ නම් :

එසේ වුවද යම් තැනැත්තෙක් ශ්‍රී ලංකාව තුළ වෙන යම් සේවා නියුක්තියක් හෝ වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වා ගෙන යන්නේ නම් හෝ කරගෙන යන්නේ නම් ඒ තැනැත්තා සම්බන්ධයෙන් නිදහස් කිරීම අදාළ නොවිය යුතු ය ;

(iii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයක් මගින් හෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුවේ සිවිල් විෂය ආධාර වැඩසටහන මගින් හෝ (කාර්මික ආධාර අංශය ඇතුළුව) කොළඹ ක්‍රම සංවිධානය මගින් හෝ ආසියා පදනම මගින් හෝ සමාකාර ස්වභාවයක් ඇති බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් සංවිධානයක් මගින් හෝ ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබුවා වූ ද යම් විශේෂඥයකුගේ, උපදේශක වරයකුගේ, කාර්මික ශිල්පියකුගේ හෝ නිලධරයකුගේ වූද-

(අ) අවස්ථාවෝචිත පරිදි එවැනි යම් සංවිධානයක්, වැඩසටහනක් හෝ පදනමක් හෝ වෙනත් යම් සංවිධානයක් මගින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ප්‍රදාන

හෝ වෙනත් ආධාර වශයෙන් සපයන ලද අරමුදල්වලින් ගෙවිය යුතු වූ වේතන හෝ ප්‍රධාන පඩි නඩි ; හෝ

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ගෙවනු නොලබන්නා වූ වේතන හෝ ප්‍රධාන පඩිනඩි ද ;

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි හා එහි විශේෂිත නියෝජ්‍යායතන හෝ කොළඹ ක්‍රම සංවිධානයෙහි හෝ සමාකාර ස්වභාවයක් ඇති බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් සංවිධානයක, කාර්මික සහයෝගිතා වැඩපිළිවෙළවල් අතුරින් කිසිවක් යටතේ ශ්‍රී ලංකාවට එවනු ලැබූ යම් විදේශීය අභ්‍යාසලාභියකුගේ ;

(v) ශ්‍රී ලංකාවේ වාසය කරන්නා වූ ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් නිලධරයකුගේ ;

(vi) ශ්‍රී ලංකාණ්ඩුවේ ඉල්ලීම පිට හෝ එකඟත්වය ඇතිව ශ්‍රී ලංකාවේ සිටින ශ්‍රී ලංකාවේ නොවන වෙනත් රටක නාවුක, යුද්ධ හෝ ගුවන් හමුදාවක සාමාජිකයකුගේ ;

(vii) සේවා නියුක්තිය ආරම්භ වීමේ දිනයට පෙරාතුවම වූ තුන් මසකට වැඩි වන කාලයක් ශ්‍රී ලංකාවේ පදිංචිව සිටි තැනැත්තන් නොවන, (vi) වන අනුඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් නාවික, යුද්ධ හෝ ගුවන් හමුදාවල ශ්‍රී ලංකාවේ සිටින සාමාජිකයන්ගේ යම් කාර්යයක් හා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සේවයෙහි නියුක්ත කරනු ලැබූ හෝ ශ්‍රී ලංකාවට පැමිණ, ශ්‍රී ලංකාව නොවන යම් රටක ආණ්ඩුව විසින් යම් සිවිල් තත්ත්වයකින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තකුගේ ; සහ

(viii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූද ආසියා පදනම විසින් හෝ ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල විසින් හෝ ශ්‍රී ලංකාවේ කාර්මික සහයෝගිතාව සලස්වනු ලබන එහි වැඩසටහනක දී පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය විසින් හෝ පොදු රාජ්‍ය සංවර්ධන සංස්ථාව විසින් ශ්‍රී ලංකාවෙහි සේවයේ නියුක්ත කරනු ලැබුවා වූද යම් තැනැත්තකුගේ :

එසේ වුවද, (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, හෝ (v) වන අනුඡේදවල සඳහන් යම් තැනැත්තකුගේ ශ්‍රී ලංකාවේදී ඇති වන හෝ ශ්‍රී ලංකාවෙන් ලබාගනු ලබන වෙනත් ආදායම් සම්බන්ධයෙන්, ඒ තැනැත්තා ආදායම් බද්දට යටත්වීම, නිර්වාසික තැනැත්තකු බද්දට යටත් වන්නාක් මෙන් විය යුතු ය ;

(ඊ) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හෝ ඒ සංවිධානයේ විශේෂිත නියෝජ්‍යායතනයක් විසින් විශේෂඥයකු, කාර්මික ශිල්පියකු හෝ නිලධරයකු වශයෙන් සේවයේ නියුක්ත කරනු ලැබූ යම් ශ්‍රී ලංකා පුරවැසියකුගේ නිල පඩි නඩි ;

(උ) ලෝක සංචාරක සංවිධානය, ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය, කොළඹ ක්‍රමය කාර්යාංශය, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, රතුකුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුව, ලෝක සංරක්ෂණ සංගමය හෝ යුරෝපීය ආයෝජන බැංකුව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ යම් පුද්ගලයකුගේ නිල පඩි නඩි ;

(ඌ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුට, රාජකාරි භාරගැනීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට හෝ පිටරට වූ ඔහුගේ නිවසට යෑමට හෝ විශ්‍රාම යැමේදී හෝ අන්‍යාකාරයකින් හෝ වුවද ස්වකීය සේවය අවසන් කරනු ලැබීමේදී ශ්‍රී ලංකාවෙන් ආපසු යැමට හැකිවන පරිදි දෙන ලද යම් ගමන් බලපත්‍රයක හෝ යාන පත්‍රයක වටිනාකම, නැතහොත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඒ තැනැත්තාගේ භාර්යාවට හෝ පුත්‍රයකුට, දුවකට හෝ ඔහුගේ හෝ ඇගේ පිටරට ඇති නිවසට යාම සඳහා හෝ එම තැනැත්තාගේ සේවය අවසන් කරනු ලැබීමේදී ශ්‍රී ලංකාවෙන් ආපසු යැමට හෝ දෙන ලද යම් ගමන් බලපත්‍රයක හෝ යාන පත්‍රයක වටිනාකම ;

(එ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්වකීය සේවා නියුක්තිය හා සම්බන්ධයෙන් යම් සේවා නියුක්තයකු විසින් කරනු ලබන ගමන් වෙනුවෙන්, සේවායෝජයකු විසින් ස්වකීය සේවා නියුක්තයාට ගමන්, යැපීම් හෝ ලැගුම් ගැනීම සඳහා දෙනු ලබන යම් දීමනාවක් ;

(ඒ) ශ්‍රී ලංකාවේ වාසික යම් පුද්ගලයකු විසින් හෝ යම් පුද්ගලයකුට, යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවෙන් පිටත කරගෙන

යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් සේවා නියුක්තයකදී-

(i) ඔහු විසින් තක්සේරු වර්ෂය තුළදී කරන ලද සේවාවක් ; හෝ

(ii) ඔහු විසින් හෝ ඔහුගේ හෝ ඇයගේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව විසින් කරන ලද පසුගිය සේවාවන්,

සම්බන්ධයෙන්, විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද පඩි නඩි හෝ ඔහුට හෝ ඇයගේ ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට අත්වන විශ්‍රාම වැටුප ඒ පුද්ගලයාට ශ්‍රී ලංකාවේදී ගෙවනු ලබන්නේ නම් හෝ ඒ පඩිනඩි හෝ විශ්‍රාම වැටුප, (සාධාරණ වියදම් යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන, ඒ පුද්ගලයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටතදී වියදම් කරන ලද යම් මුදලක් අඩු කර) ඔහු විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, ඒ පඩි නඩි හා විශ්‍රාම වැටුප ;

(ඔ) යම් සේවා නියුක්තයකු පදිංචි ස්ථානයේ සිට වැඩ කරන ස්ථානයට හෝ ඔහු වැඩ කරන ස්ථානයේ සිට ඔහුගේ පදිංචි ස්ථානයට හෝ ගමන් කිරීම සඳහා සේවා යෝජකයකු විසින් ඒ සේවා නියුක්තයාට සපයන ලද මෝටර් කෝච් රථයකින් නොමිලේ ප්‍රවාහනය කිරීමේ වටිනාකම ;

(ඕ) යම් අර්ථසාධක අරමුදලකින්, විශ්‍රාම වැටුප් අරමුදලකින් හෝ 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් යම් සේවා නියුක්තයකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ගෙවනු ලැබුවා වූ මුදලෙහි, ඒ අරමුදලේ කරනු ලැබූ ආයෝජනවලින් 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා ඒ අරමුදලට ව්‍යුත්පන්න වූ ආදායම නියෝජනය කරනු ලබන කොටස ;

(ක) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ඇති කරන ලද යම් සමාගමක යම් සේවා නියුක්තියකින් යම් සේවා නියුක්තයකු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔහුට ගෙවන ලද 4 (1) වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන්, අවස්ථාවෝචිත පරිදි, යම් රාජ්‍ය සංස්ථාවක, හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතනයක, 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සේවා කාලයට ආරෝපණය කරනු ලබන යම් මුදල් කොටසක් ;

(ග) යම් රාජ්‍ය සංස්ථාවක යම් සේවා නියුක්තියකින් යම් සේවා නියුක්තයකු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔහුට ගෙවනු ලබන 4 (1) වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් මුදලක, ඒ සේවා නියුක්තයාගේ ඒ රාජ්‍ය සංස්ථාවේ 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ සේවා කාලයට ආරෝපණය කළ හැකි කොටස ;

(ච) (i) කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව එම සේවා යෝජකයා විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති සියලුම සේවා නියුක්තයන්ට ඒකාකාරී ලෙස අදාළ වන යෝජනා ක්‍රමයකට අනුකූලව එම සේවා නියුක්තයා ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ ; හෝ

(ii) කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට අනුකූලව එම සේවා නියුක්තයාගේ සේවය අහිමිවීමේ,

ප්‍රතිඵලයක් වශයෙන්, යම් ධුරයක් හෝ රැකියාවක් අහිමිවීම සඳහා වන්දි මුදලක් වශයෙන් එම සේවා නියුක්තයාට ගෙවන ලද යම් මුදලකින් රුපියල් මිලියන දෙකක් නොඉක්මවන යම් කොටසක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් කිසිවක්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ තත් කාර්ය සඳහා 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර කරන ලද ඉල්ලීමක් මත, 1994 දෙසැම්බර් මස 31 වන දිනට පෙර, ගිවිසුමකට එළඹී ව්‍යවසායක් නොවන යම් ව්‍යවසායක් සමඟ හෝ ව්‍යවසායක් විසින්,—

(අ) සේවා නියුක්ත ගිවිසුමකට ඇතුළත් වූ ද ; නැතහොත්

(ආ) ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබ, සේවයෙහි නියුක්ත කරනු ලැබූවා වූ ද

පුද්ගලයකුට හෝ ඔහු සම්බන්ධයෙන් හෝ අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ අතුරු විධානයේ සහ (2) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුවද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ ඒ ගිවිසුම යටතේ ප්‍රදානය කෙරෙන ආදායම් බද්දෙන් නිදහස් වීම වෙනුවට ආදායම් බද්දට යටත්වීමට මනාපය පළ කර තිබෙන ව්‍යවසායක් විසින් ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයේ යොදවා ගනු ලැබ සිටින තැනැත්තකුගේ, ඒ තැනැත්තා ඒ ව්‍යවසායේ සේවා නියුක්තිය අවසාන කරන දිනය හෝ එම මනාපය නිසා නොවේ නම් එම ව්‍යවසාය සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද ආදායම් බද්දෙන් නිදහස් වීමේ අවසාන විය හැකිව තිබූ දිනය යන දින දෙකින් වඩා කලින් එළඹෙන දිනය දක්වා, ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

ලැබුණු ඇතැම් පොලී ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**9**. (අ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ ආණ්ඩුවේ ආයතනයකට හෝ තත් කාලයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින යම් වානිජ බැංකුවකට හෝ වෙනත් යම් ව්‍යවසායකට දෙන ලද ණයක්, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය යැයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්, එකී ණය වෙනුවෙන් ඒ සමාගමට, හවුල් ව්‍යාපාරයට හෝ පුද්ගල මණ්ඩලයට උපචිත වන පොලිය ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට විදේශ ව්‍යවහාර මුදලින් දෙන ලද ණයක් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්, ඒ ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද යම් සුරැකුමකින්, නෝට්ටුවකින් හෝ කුපනයකින් ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට උපචිත වන පොලිය ;

(ඇ) යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවෙන් පිටත අයිතිව තිබූ විදේශීය ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමෙන් ඔහු විසින් ලබාගන්නා මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද කොන්දේසිවලට අනුකූලව තැන්පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව වානිජ බැංකුවක ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් විවෘත කරන ලද විශේෂ ගිණුමක ඔහුගේ බැරට ඇති මුදල් මත උපචිත වන පොලිය ;

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වානිජ බැංකුවක, යම් විශේෂිත බැංකුවක විවෘත කරන ලද යම් ගිණුමක විදේශ ව්‍යාහාර මුදලින් ඔහුගේ බැරට ඇති මුදල් මත ඒ තැනැත්තාට උපචිත වන පොලිය ;

(ඉ) ඇමරිකන් ඩොලර් වලින් වටිනාකම නියම කෙරෙන ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන යලි ගොඩනැංවීමේ බැඳුම්කරවල ආයෝජනය කරන මුදල් මත යම් තැනැත්තකුට උපචිත වන පොලිය ;

(ඊ) ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ඇමෙරිකන් ඩොලර්වලින් වටිනාකම නියම කෙරෙන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කරන මුදල් මත යම් තැනැත්තකුට උපචිත වන පොලිය ;

(උ) යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග විදේශීය ව්‍යවහාර මුදල්වලින් යම් තැනැත්තකුගේ බැරට ඇති මුදල් මත ඔහුට උපචිත වන පොලිය ;

(ඌ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි හෝ (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥා පනත මගින් පිහිටුවන ලද ලංකා බැංකුවෙහි හෝ 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් පිහිටුවන ලද මහජන බැංකුවෙහි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවෙහි හෝ 2003 අංක 15 දරන පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත එස් එම් ඊ බැන්ක් ලිමිටඩ් සහ ලංකා පුත්‍ර ඩිවලප්මන්ට් බැන්ක් ලිමිටඩ් හෝ 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද කිසියම් බැංකුවක පවත්වාගෙන යනු ලබන තැන්පතු ක්‍රමයකින්, තක්සේරු වර්ෂයේ පළමුවන දිනයේ දී වයස අවුරුදු පනස් නවයකට වැඩි වූ ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ ද, නේවාසිකයකු වූ ද, යම් පුද්ගලයකුට එම තක්සේරු වර්ෂයක දී උපචිත වූ හෝ හටගත් පොළියෙන් රුපියල් දෙලක්ෂයකට වැඩි නොවන යම් කොටසක් ;

(එ) යම් තැනැත්තකු විසින් මිල දී ගන්නා ලද, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් නිකුත් කරනු ලැබුවා වූ ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කරයකින් එම තැනැත්තාට උපචිත වන හෝ උපදින පොලිය හෝ වට්ටම ;

(ඒ) යම් පුණ්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යන්නා වූ නිවාසයක දී ළමයින්, වැඩිහිටියන් හෝ ආබාධිත අය සඳහා ආයතනික රැකවරණය සැලසීමේ කාර්ය වෙනුවෙන්ම, එම පුණ්‍ය ආයතනයට යම් තක්සේරු වර්ෂයක් තුළ දී උපචිත වන පොලිය, එම තක්සේරු වර්ෂය තුළ දී අදාල කරගනු ලබන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක දී, එම පුණ්‍ය ආයතනයට උපචිත වන පොලිය,

අදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ඇතැම් ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**10**. (1) (අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 1993 නොවැම්බර් මස 11 වන දිනට ප්‍රථමයෙන් කරන ලද්දා වූ ඉල්ලීමක් මත 1994 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රථමයෙන් ඇතිකර ගත් ගිවිසුමක් වන, ගිවිසුමක් ඇති කරගනු ලැබූ සමාගමක් විසින්—

(i) ඒ ගිවිසුමේ නියමයන් යටතේ ඒ සමාගමේ ලාභ සහ ආදායම, ආදායම බද්දෙන් නිදහස් කරනු ලබන්නේ යම් කාලයක් සඳහා ද, ඒ කාලය තුළ හෝ ඉන් පසු එක් අවුරුද්දක් ඇතුළත ඒ සමාගමේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායමෙන් යම් තැනැත්තකුට ගෙවනු ලබන යම් ලාභාංශයක් ;

(ii) 53 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ශ්‍රී ලංකාවේ නේවාසික නොවන යම් තැනැත්තකුට ගෙවනු ලබන යම් ලාභාංශයක් ;

(ආ) ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක ඒකක දරන්නකුට ඒ ඒකක භාරයෙන් හෝ අන්‍යොන්‍ය අරමුදලින් බදු කළ හැකි ආදායමින් ගෙවන ලද යම් ලාභාංශයක් ;

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ ඇති ප්ලැග්ෂිප් සමාගමක් විසින් ඒ ගිවිසුමේ නියමය යටතේ ඒ සමාගමේ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන්

නිදහස් කර ඇති කාලය තුළ හෝ ඉන් පසුව එක් අවුරුද්දක් ඇතුළත ඒ සමාගමේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායමින් යම් කොටස් හිමියකුට ගෙවනු ලබන යම් ලාභාංශයක්.

මේ ඡේදයෙහි "ප්ලැග්ෂිප් සමාගම" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමක් ඇතිකර ගෙන ඇත්තා වූ ද, ඒ ගිවිසුමට අනුකූලව ඒ ගිවිසුමේ සඳහන් කාලය ඇතුළත ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද ව්‍යවසායේ ප්‍රයෝජනය සඳහා—

(i) යම් ගොඩනැගිල්ලක් මිලදී ගැනීම හෝ ඉදිකිරීම හෝ යම් ඉඩමක්, පිරියත, යන්ත්‍රෝපකරණ හෝ ගෘහ භාණ්ඩ මිල දී ගැනීම ; සහ

(ii) (i) අනුඡේදයෙහි ඇතුළත් කර නොමැති යම් වත්කමක් අත්කර ගැනීම සඳහා,

අමෙරිකානු ඩොලර් මිලියන පණහකට නොඅඩු හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලක් ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කර ඇත්තා වූ ද යම් සමාගමක් අදහස් වේ ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 1995 නොවැම්බර් මස 8 වන දින හෝ ඉන් පසුව ගිවිසුමකට එළඹ ඇති සමාගමක් විසින් ඒ ගිවිසුමේ නියමය යටතේ ඒ සමාගමේ ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර ඇති කාලය තුළ හෝ ඉන් පසුව එක් අවුරුද්දක් ඇතුළත හෝ ඒ සමාගමේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායමින් යම් කොටස් හිමියකුට ගෙවනු ලබන යම් ලාභාංශයක් ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග යම් ගිවිසුමකට එළඹ ඇති සමාගමක් විසින්, ගෙවන හා නොගෙවන රෝගීන් උදෙසා අභ්‍යන්තර හා බාහිර ප්‍රතිකාර සඳහා පහසුකම් සහිත රෝහලක් පවත්වාගෙන යාමෙන් ඒ සමාගමට

ලැබෙන ලාභවලින්, ඒ රෝහලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂයෙන් ආරම්භව ගණන් බැලූ අවුරුදු පහක කාලයක් ඇතුළත ගෙවනු ලැබූ යම් ලාභාංශ ;

(ඊ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට ඇතුළත්ව ඇත්තා වූ ද ;

(ii) 1992 අංක 33 දරන පතල් සහ ඛණිජ පනත යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ඒ සමාගම වෙත පවරා දී ඇත්තා වූ ද,

සමාගමක 1998 මාර්තු මස 19 වන දින අංක 1019/13 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් අවසන් වරට සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 24 වන වගන්තිය යටතේ සාදන ලද 1995 අංක 1 දරන නියෝගවල 2 වන නියෝගයේ (IV) වන ඡේදයේ තවදුරටත් වූ අතුරු විධානයේ (අ) අනුඡේදයට අනුව තීරණය කරනු ලබන අනුප්‍රමාණය අනුව එහි ලාභ සහ ආදායමින් බදු අය කළ යුතු වන කාලසීමාව තුළ හෝ ඉන් පසු එක් වර්ෂයක් තුළ එහි 3(අ) වගන්තියේ අර්ථානුකූලව වූ ලාභවලින් ඒ සමාගමේ යම් කොටස් හිමියකුට ගෙවන ලද යම් ලාභාංශයක් ;

(උ) 2000, අංක 38 දරන දේශීය ආදායම් පනතේ 15 වන, 17 වන, 18 වන, 18අ වන, 19 වන, 20 වන, 20අ වන, 21වන, 21අ වන, 21ආ වන, 21ඇ වන, 21ඈ වන, 21ඉ වන, 21ඊ වන, 21උ වන හෝ 21 ඌ වන වගන්ති යටතේ හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8(අ) (xxxviii) වන, 15 වන, 16අ වන, 16ආ වන, 16ඇ වන, 16ඈ වන, 17අ වන, 17ඇ වන, 17ඈ වන, 17ඒ වන 17ඒඒ වන, 17ඔ වන, 17ඔඔ වන, 17ඕ වන, 17 ක වන, 18 වන, 19 වන, 20 වන, 20අ වන, 20ආ වන, 20ඈ වන, 21 වන, 22 වන, 22අ වන, 22ආ වන, 22ඇ වන, 22ඈ වන, 22ඈඈ වන, 22ඈඈඈ වන වගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ ආදායම් බද්දෙන් නිදහස් සහ 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව උද්ගත වන සමාගමක ලාභ හා ආදායමෙන් එම විධිවිධාන අතුරෙන් යම් විධිවිධානයක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද කාලසීමාව ඇතුළත හෝ ඉන්පසුව එක් අවුරුද්දක් ඇතුළත හෝ ඒ සමාගමේ කොටස් හිමියකුට ගෙවනු ලබන යම් ලාභාංශයක් ;

(ඌ) සමාගමක් විසින් පිළිවෙලින් (අ), (ඇ), (ඈ), (ඉ), (ඊ) හෝ (උ) ඡේදවල සඳහන් ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙන කාලසීමාව තුළ ඒ සමාගම ලැබූ එවැනි සෑම ලාභාංශයකින් ඒ සමාගමක කොටස් හිමියකුට ගෙවන ලද ලාභාංශයක්, ඒ දෙවනුව සඳහන් ලාභාංශය ගෙවනු ලැබුවේ ඒ සමාගම විසින් පළමුව සඳහන් ලාභාංශය ලැබූ යම් තක්සේරු වර්ෂයක් තුල නම් හෝ ඉන්පසු එක් වර්ෂයක් ඇතුළත නම් ;

(එ) පිළිවෙලින් (අ), (ඇ), (ඈ), (ඉ) හෝ (උ) ඡේදවල සඳහන් ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇත්තේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව තුළ හෝ ඉන් පසු අවුරුදු දෙකක් ඇතුළත කෙලින්ම හෝ අතරමැදි සමාගම් දෙකක් හෝ වැඩි ගණනක් මගින් යම් සමාගමකට ලැබුණු පිළිවෙලින් (අ), (ඇ), (ඈ), (ඉ), (ඊ) හෝ (උ) ඡේදයෙහි සඳහන් වන යම් ලාභංශයකින් ඒ සමාගම කොටස් හිමියකුට ගෙවන ලද යම් ලාභාංශයක් ඒ පළමු සඳහන් ලාභාංශය ගෙවනු ලැබුවේ දෙවනුව සඳහන් ලාභාංශය ලැබූ යම් තක්සේරු වර්ෂය ඇතුළත නම් හෝ ඉන් පසු එක් වර්ෂයක් ඇතුළත නම්,

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදවල විධිවිධාන, 2002 නොවැම්බර් මස 06 වන දින හෝ එදිනට පසු ඇතුළත් වී ඇති සහ එම ඡේදවල සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් 2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ගෙවන ලද යම් ලාභාංශ කෙරෙහි අදාළ නොවිය යුතු ය ; නැතහොත්

(ආ) (1) වන උපවගන්තියේ (උ) ඡේදයේ සඳහන් කර ඇත්තා වූ ද, 2002 නොවැම්බර් මස 6 වන දින හෝ එදිනට පසු නිදහස් කිරීමක් සඳහා සුදුසුකම් ලැබුවා වූ ද යම් සමාගමක් විසින්, 2004 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ගෙවනු ලැබූ යම් ලාභාංශයකට, එම ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ඉඩම් සහ ඒවායේ වැඩි දියුණු කිරීම් වලින් ලැබෙන ඇතැම් ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

11. (1) (අ) පුද්ගලයකුට අයිති වන්නා වූ ද, ඔහු හෝ ඔහු වෙනුවෙන් හෝ පදිංචිව සිටින්නා වූ ද, එකකට වැඩි නොවූ වාසස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම ;

(ආ) වරිපනම් කාර්ය සඳහා එක් එක් වාසස්ථානය වෙන වෙනම තක්සේරු කරනු ලැබූ වාසස්ථාන දෙකකට හෝ ඊට වැඩි ගණනකට පරිවර්තනය කරන ලද නිවාසයක් වන්නා වූ නිවාසයක, එක් එක් වාසස්ථානයෙන් ලැබෙන ආදායම වන නිවාසයක අයිතිකරුට-

(i) ඒ වාසස්ථානයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක් දහසක් නොඉක්මවන්නේ නම්, ඒ පරිවර්තනය කරනු ලැබ තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම, එළඹෙන තක්සේරු වර්ෂ පහ සඳහා උපචිත වන ආදායම; හෝ

(ii) ඒ වාසස්ථානයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක්දහසක් ඉක්මවන නමුත් වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නේ නම්, ඒ පරිවර්තනය කරනු ලැබූ තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ තුන සඳහා උපචිත වන ආදායම ;

(ඇ) පුද්ගල මණ්ඩලයකට අයත් වන්නා වූද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ කාර්ය සඳහා ක්‍රීඩාවක් වශයෙන් පිළිගත් යම් ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන අරමුණ වන්නා වූ ද, ඒ මණ්ඩලය විසින් ඒ අරමුණ සඳහා යෙදාගනු ලබන්නා වූ ද යම් ඉඩමක් සහ එහි වැඩි දියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම,

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) නිවස හුදෙක් වාසික කාර්ය සඳහා යොදාගෙන ඇත්නම්, ඒ නිවස ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂයට හා ඉන් ඉක්බිතිවම එළඹෙන අනුක්‍රමික තක්සේරු වර්ෂ හතර සඳහා, ඒ නිවසේ අයිතිකරුට උපචිත වන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය :

එසේ වුවද, එම නිවසේ බිම් ප්‍රමාණය වර්ග අඩි එක්දහස් පන්සියයක් හෝ ඊට අඩු වන අවස්ථාවක, ඒ නිවස ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂයට හා ඉන් ඉක්බිතිවම එළඹෙන අනුක්‍රමික තක්සේරු වර්ෂ හය සඳහා, එම නිවසේ අයිතිකරුට උපචිත වන ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "අයිතිකරු" යන්නට හවුල් අයිතිකරුවෙක් ද ඇතුළත් වේ.

ඇතැම් සහනාධාර ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**12**. සහනාධාරයක් හෝ ප්‍රදානයක් වශයෙන් යම් තැනැත්තකුට-

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ප්‍රාග්ධන අරමුදලෙන් ;

(ආ) (437 වන අධිකාරිය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුලෙන් ;

(ඇ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් ;

(ඈ) ධීවර බෝට්ටු, නාවික යන්ත්‍ර, ධීවර ආම්පන්න සහ වෙනත් ධීවර උපකරණ ඒ තැනැත්තා විසින් මිලදී ගැනීම සඳහා ධීවර විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් ;

(ඉ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත මගින් පිහිටුවන ලද අපනයන සංවර්ධන අරමුදලෙන් ;

(ඊ) වෙනත් යම් කෘෂිකාර්මික පැලෑටි වගා කිරීම හෝ නැවත වගා කිරීම සඳහා වෙනත් යම් යෝජනා ක්‍රමයක් යටතේ ;

(උ) යන්ත්‍ර නවීකරණය සඳහා 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන මෝල් සංවර්ධන අරමුදලින්,

ගෙවන ලද යම් මුදලක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ආදායම් බද්දෙන් විවිධ නිදහස් කිරීම.

**13**. පහත දැක්වෙන දෑ ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය, එනම්:—

(අ) ශ්‍රී ලංකාවෙහි වාසික යම් පුද්ගලයකු විසින් යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන ගිය හෝ කරගෙන ගිය යම් රක්ෂාවක දී හෝ ඔහු විසින් කරන ලද සේවා වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂයේ දී විදේශ ව්‍යවහාර

මුදලින් උපයා ගන්නා ලද පඩිනඩි (සාධාරණ පෞද්ගලික වියදම් යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන, ඒ පුද්ගලයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත වියදම් කරන ලද යම් මුදලක් අඩුකර) ඔහු විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, ඒ පඩිනඩි;

(ආ) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, හෝ රක්ෂාවක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන යම් වාසික සමාගමක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, හෝ රක්ෂාවක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන අතරතුර දී,—

(i) ඒ සමාගම හෝ හවුල් ව්‍යාපාරය විසින් ඒ තක්සේරු වර්ෂයේ දී ශ්‍රී ලංකාවෙන් පිටතදී (යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් සඳහා ඉටුකරන ලද සේවාවන් ද ඇතුළුව) ඉටුකරන ලද සේවා වෙනුවෙන් ; සහ

(ii) ශ්‍රී ලංකාවේදී තැනූ හෝ නිෂ්පාදිත යම් භාණ්ඩ හෝ ශ්‍රී ලංකාවට ආනයනය කළ යම් භාණ්ඩවලට කිසිම ආකාරයකින් සම්බන්ධ නොවන යම් අක්වෙරළ ව්‍යාපාර වෙනුවෙන්,

ඉටුකරන ලද සේවාවන් සම්බන්ධයෙන් ඒ සමාගම විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් හෝ ඒ තක්සේරු වර්ෂය තුළ, විදේශීය ව්‍යවහාර මුදලින් උපයන යම් ලාභ සහ ආදායම, (ශ්‍රී ලංකාවෙන් පිටත දී එම සමාගම හෝ හවුල් ව්‍යාපාරය විසින් දරන ලද සාධාරණ වියදම් වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසුව) බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබිණි නම්, ඒ ලාභ සහ ආදායම;

(ඇ) ශ්‍රී ලංකාව තුල දී හෝ ඉන් බැහැරව යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකාවෙන් බැහැරව යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට, ඒ පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යන්නා වූ හෝ ක්‍රියාත්මක කරන්නා වූ යම් වෘත්තීමය සේවාවන් ලබා දීමෙන් කිසියම් සේවාවක් සැපයීමේ හේතුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් උපයා ගත් ලාභ සහ ආදායම් ද, ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුව මගින් ඒ පුද්ගලයාට හෝ හවුල්කරුට ශ්‍රී ලංකාවට පිටතින්

ප්‍රේෂනය කර ඇත්නම්, කොමසාරිස් ජනරාල් විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ඒ පුද්ගලයා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැරව සේවා සපයන ලද අවස්ථාවක දී ශ්‍රී ලංකාවෙන් බැහැරව දරන ලද පුද්ගලික වියදම සඳහා වූ සාධාරණ මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසු ඉතිරි ඒ ලාභ සහ ආදායම ;

(ඇ) ශ්‍රී ලංකාවේ වාචික යම් සමාගමක් විසින්, වෘත්තීයක් කරගෙන යාම මත හෝ ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළින් ශ්‍රී ලංකාවෙන් බැහැරව වූ යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ශ්‍රී ලංකාවෙන් බැහැරව සපයන ලද සේවාවක් වෙනුවෙන්, විදේශීය ව්‍යාපාර මුදලින් උපයාගත් ලාභ සහ ආදායම් ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුවක් මගින් ඒ ලාභ සහ ආදායම් ඒ සමාගම වෙත ප්‍රේෂණය කර ඇති විට එම ලාභ සහ ආදායම ;

(ඉ) යම් විශ්ව විද්‍යාලයක, විද්‍යාලයක, පාඨශාලාවක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක ඉගෙනීම ලබන තැනැත්තකුට ශිෂ්‍යත්වයකින්, අනු ශිෂ්‍යත්වයකින්, ආධාර ශිෂ්‍යත්වයකින් හෝ සමාන අධ්‍යාපනික පරිත්‍යාගයකින් උපචිත වන ආදායම ;

(ඊ) මරණ පාරිතෝෂිකයන් වශයෙන් හෝ, මරණය හෝ තුවාල සිදුවීම් සම්බන්ධයෙන් වන්දියක් වශයෙන් ලබාගත් යම් ප්‍රාග්ධන මුදලක් ;

(උ) එක්සත් රාජධානියේ මහා රාජිනියගේ හමුදාවල සාමාජිකයන්ට හෝ හිටපු සාමාජිකයන්ට දෙනු ලබන තුවාල හා අශක්නුතා විශ්‍රාම වැටුප් ;

(ඌ) එක්සත් ජනපද ආණ්ඩුවේ අශක්නුතා විශ්‍රාම වැටුප් ;

(එ) රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමෙන් යම් තැනැත්තකුට උපචිත වන 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ යම් ලාභ හා ආදායම් ;

(ඒ) මැණික් හා ස්වර්ණාභරණ විකිණීමෙන් විදේශ ව්‍යවහාර මුදල්වලින් මුදල් භාරගැනීමට ශ්‍රී ලංකා මහබැංකුව විසින් බලය පවරන ලද තැනැත්තකුට, විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන ලාභ සහ ආදායමේ කොටස ;

(ඔ) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රදානයක් වශයෙන් යම් තැනැත්තකු විසින් ලද යම් ත්‍යාග මුදලක් ;

(ඕ) යම් තැනැත්තකු විසින් කරන ලද නව නිපැයුමක් හෝ භාරගන්නා ලද යම් පර්යේෂණයක් පිළිගැනීමක් වශයෙන් ආණ්ඩුව විසින් කරන ලද ප්‍රදානයක් ලෙස ඒ තැනැත්තා විසින් ලබාගත් ත්‍යාග මුදලක් ;

(ක) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලින් තැනැත්තකු විසින් ලද යම් මුදලක් ;

(ග) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල පනතින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදලින් තැනැත්තකු විසින් ලද යම් මුදලක් ;

(ච) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශීය සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය ලබාදෙනු ලැබූ හෝ සලසා දෙනු ලැබූ යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙන් එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයකට එකී කාර්යාංශය විසින් ගෙවන ලද යම් මුදලක රුපියල් තුන්දහස නොඉක්මවන කොටස ;

(ජ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සලසා දෙනු ලැබූ හෝ ලබා දෙනු ලැබූ යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙන් යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ලබාගත් මුදලක රුපියල් තුන්දහසක් නොඉක්මවන කොටස ;

(ට) අවස්ථාවෝචිත පරිදි ලලිත කලා, සාහිත්‍ය හෝ ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයාගෙන් කලින් ලබාගත් ලිඛිත අනුමතය ඇතිව කරන ලද ප්‍රදානයක් වන්නා වූ, ලලිත කලා, සාහිත්‍ය හෝ ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි තම විශිෂ්ඨත්වය පිළිගැනීමෙහි ලා ප්‍රදානයක් හෝ ප්‍රදාන වශයෙන් යම් පුද්ගලයකු විසින් භාරගන්නා ලද රුපියල් එක්ලක්ෂයක් නොඉක්මවන්නා වූ යම් මුදලක් හෝ මුදල්වල එකතුව වන කොටස ;

(ඩ) ආණ්ඩුව විසින් පිහිටුවන ලද සහ භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති "සුදු නෙළුම් ව්‍යාපාරය" විසින් යම් වාණිජ බැංකුවක තැන්පත් කර ඇති යම් මුදලක් මත සුදු නෙළුම් ව්‍යාපාරයට උපචිත වන යම් පොලියක් හෝ වට්ටමක් ;

(ණ) යම් සමාගමක් විසින් නිකුත් කරනු ලැබ, යම් තැනැත්තකු විසින් දරනු ලබන්නා වූ ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළකරන ලද යම් නිල ලැයිස්තුවක විකිණීම සිදුකරන අවස්ථාවන් වන විට ලැයිස්තුගත කර ඇත්තා වූ ද, යම් බැඳුම්කරයක්, ණයකරයක් හෝ වෙනත් ණය සාධන පත්‍රයක් ඒ තැනැත්තා විසින් විකිණීමෙන් ඔහුට උද්ගත වන්නා වූ හෝ උපචිත වන්නා වූ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව යම් ලාභ සහ ආදායම් ;

(ත) යම් ඒකක භාරයක්, අන්‍යෝන්‍ය අරමුදලක් හෝ යම් ව්‍යවසාය ප්‍රාග්ධන සමාගමක් නොවන යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට, 2005 අංක 5 දරන මුදල් පනතේ 7 වන වගන්තිය යටතේ කොටස් ගනුදෙනු බද්ද අයකරනු ලැබ ඇති, යම් කොටසක්, කොටසකට ඇති අයිතියක්, ප්‍රසාද කොටසක් හෝ කොටස් අධිකාර පත්‍රයක්, විකිණීමෙන් ලැබෙන හෝ උපචිත වන යම් ලාභ හෝ ආදයම ;

(ද) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් තක්සේරු වර්ෂයක දී ඒ සංගමය විසින් ඉටුකරන ලද සේවාවන් සම්බන්ධයෙන් හෝ ක්‍රීඩා, පනතේ අර්ථානුකූල යම් ක්‍රීඩාවකට සහභාගි වන අතරතුර ඒ තක්සේරු වර්ෂයේ දී විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම් ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද යුක්ති සහගත වියදම් යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන මුදලක් අඩු කිරීමෙන් පසු ඒ සංගමය විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබුවහොත්, ඒ ලාභ සහ ආදායම ;

(න) ශ්‍රී ලංකාව තුළ පවත්වන ලද සහ ශ්‍රී ලංකාවෙන් පිටතින් පැමිණි තරගකරුවන් සහභාගි වන කිසියම් ක්‍රීඩාවකට හෝ මලල ක්‍රීඩා ඉසව්වකට තරගකරුවකු, නිලධරයකු හෝ සංවිධායකයකු ලෙස සහභාගී වීමෙන් යම් තැනැත්තකු හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් ලබා ගන්නා ලද ලාභ සහ ආදායම්—

මේ ඡේදයේ කාර්ය සඳහා :—

(i) "සංවිධායක" යන්නෙන් නියෝජනය කරන ලද රටක කිසියම් ක්‍රීඩා හෝ මලල ක්‍රීඩා ඉසව්වක්

පැවැත්වීම පිළිබඳ පාලන කටයුතු කරන පුද්ගල මණ්ඩලයක් වන්නා වූ යම් පුද්ගල මණ්ඩලයක එකඟත්වය ලැබීමෙන් හෝ එහි එකඟත්වය ඇතිව නම් කරන ලද පුද්ගල මණ්ඩලයකින් හෝ එක් පුද්ගලයකුගෙන් හෝ ඊට වැඩි පුද්ගලයින් ගනනකගෙන් හෝ එක් කණ්ඩායමකින් හෝ ඊට වැඩි කණ්ඩායම් ගනනක් විසින් ඒ ඉසව්ව නියෝජනය කරන රටේ තත්කාලයේ බලපවත්නා කිසියම් නීතියකට අනුකූලව පිහිටුවන ලද යම් පුද්ගල මණ්ඩලයක්, සංස්ථාවක්, සංස්ථාවක් නොවන ආයතනයක් අදහස් වෙන අතර යම් ඉසව්වක් පැවැත්වීම පාලනය කරන රීති සාදන යම් පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ ; සහ

(ii) "තරඟකරුවකු" යන්නෙන් කිසියම් ක්‍රීඩා හෝ මලල ක්‍රීඩා ඉසව්වකට අදාළව, යම් ඉසව්වකට සහභාගී වන යම් කණ්ඩායමක් සහ තනි පුද්ගලයෙකු ලෙස හෝ යම් කණ්ඩායම් සාමාජිකයකු ලෙස කිසියම් ඉසව්වකට සහභාගි වන්නා වූ යම් පුද්ගලයකු අදහස් වේ ;

(ප) යම් තක්සේරු වර්ෂයක් තුල දී අවුරුදු හැටට එළඹෙන හෝ කලින් තක්සේරු වර්ෂයක දී වයස අවුරුදු හැටට එළඹ ඇති යම් පුද්ගලයකුට, යම් බැංකුවකින් හෝ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් රක්ෂණ සමාගමකින් මිලදී ගත් සහ ජීවිත කාලය සඳහා හෝ අවුරුදු දහයට අඩු නොවන කාලයක් සඳහා වූ ද, එම වාර්ෂිකය මිලදී ගැනීමේ දී ගෙවන ලද මුදල හෝ මුදල් වල සම්පූර්ණ ප්‍රතිශ්ඨාව සඳහා ආපසු ගෙවීමක් වශයෙන් උපචිත වන්නා වූ ද, යම් වාර්ෂිකයක් ;

(බ) සමාගමකට ප්‍රදානය කරන ලද යම් ණයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බැංකුවකට ලැබෙන පොලිය, ප්‍රදානය කරන ලද මුළු මුදල -

(i) එම සමාගම 20 වන වගන්තියේ සඳහන් සමාගමක් වන අවස්ථාවක, එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ සඳහන් ආකාරයට ආයෝජනය කර ඇති විට දී ; හෝ

(ii) එම සමාගම 21 වන වගන්තියේ සඳහන් සමාගමක් වන අවස්ථාවක, එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් වියදමක් සපුරාලීමට භාවිත කර ඇති විට දී ;

(ම) 1978 අංක 4 දරන ජාතික රාජ්‍ය සභාවේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග, 2004 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ගිවිසුමකට ඇතුළත් වී ඇති සමාගමකින්, එම ගිවිසුමේ නියම යටතේ එම සමාගමේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර තිබූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන්, අනේවාසික තැනැත්තකුට ලැබුන රාජ්‍ය භාගය:

එසේ වුව ද, එම ගිවිසුමේ නියම යටතේ ආදායම් බද්දෙන් නිදහස් කිරීම වෙනුවට ආදායම් බදු ගෙවීමට එම සමාගම කැමැත්ත ප්‍රකාශ කරන අවස්ථාවක, මේ ඡේදය මගින් ප්‍රදානය කර ඇති ආදායම් බද්දෙන් නිදහස් කිරීම, එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමක් නොකලේ නම් සමාගමේ ලාභ සහ ආදායම් බද්දෙන් නිදහස් කළ හැකිව තිබූ කාලසීමාව සම්බන්ධයෙන්, එම සමාගමෙන් යම් අනේවාසික තැනැත්තකුට ලැබුන රාජ්‍යභාගය සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

(ය) දළ මුදල රුපියල් පන් ලක්ෂයකට වැඩි නොවන යම් ලොතරැයි දිනුමක්.

යම් වාසික ආගන්තුකයකුගේ ඇතැම් ලාභ හා ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

14. (1) යම් වාසික ආගන්තුකයකුගේ-

(අ) ශ්‍රී ලංකාවේ උද්ගත වන්නා වූ හෝ ව්‍යුත්පන්න වන්නා වූ ලාභ සහ ආදායම් නොවන ; සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටකින් විදේශ ව්‍යවහාර මුදල් වලින් ඔහු වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල් තැන්පත් කිරීම සඳහා වාණිජ බැංකුවක ඔහු විසින් විවෘත කරන ලද යම් ගිණුමක ඔහුගේ බැරට ඇති මුදල්වලින් උපචිත වන,

ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා වාසික ආගන්තුකයකු යන්නෙන්, 1979 අංක 6 දරන වාසික ආගන්තුකයන් (බදු නිදහස් කිරීම) පනත යටතේ බදු නිදහසක් ප්‍රදානය කර ඇති තැනැත්තකු අදහස් වේ.

ශ්‍රී ලංකාවෙන් පිටතදී උපයන ලද ලාභ සහ ආදායම නිදහස් කිරීම.

**15**. මෙ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවේ අනේවාසිකයකු වන එහෙත් ශ්‍රී ලංකාවට පැමිණ එහි නැවතී සිටින යම් පුද්ගලයකු විසින්, එම පුද්ගලයා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදි සහ නැවතී සිටින සම්පූර්ණ කාලය තුළ ඔහු ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටක යන රටවල් දෙකේම පුරවැසියකු නම්, ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයන ලද ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

කෘෂිකාර්මික ව්‍යවසායකින් ලැබෙන ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**16**. (1) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන්නා වූ කිසියම් කෘෂිකාර්මික ව්‍යවසායකින් යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ලබන ලාභ සහ ආදායම, 2006 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වසර පහක කාලයක් තුළ දී එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ "කෘෂිකාර්මික ව්‍යවසාය" යන්නෙන්-

(අ) යම් කෘෂිකාර්මික නිෂ්පාදන, උද්‍යාන හෝ යම් කිරි නිෂ්පාදන, නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා වූ ව්‍යවසායක් ;

(ආ) තේ නිෂ්පාදනය සඳහා වූ ව්‍යවසායක් හැර, වෙළෙඳපල සඳහා යම් නිෂ්පාදනයක් සකස් කිරීමේ දී (අ) ඡේදයේ සඳහන් කරන ලද කිසියම් නිෂ්පාදනයක ආකෘතිය, හැඩය හෝ භෞතික ස්වභාවය හෝ පෙනුම වෙනස් කිරීමේ කාර්ය සඳහා පිරිසිදු කිරීම, ප්‍රමාණගත කිරීම, වර්ග කිරීම, ශ්‍රේණිගත කිරීම, ශීත කිරීම, ජීවානුහරණය කිරීම, ඇසිරීම, ඡේදනය කිරීම, භාජනවල ඇසිරීම සඳහා වූ ව්‍යවසායක්;

(ඇ) යම් නිෂ්පාදනයකට (අ) ඡේදයේ සඳහන් කරන ලද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නිෂ්පාදිතයකට පරිවර්තනය කිරීම සඳහා වූ යම් ව්‍යාවසායක්,

අදහස් වේ.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා සහ තේ දළු නිෂ්පාදනය සහ එයින් තේ නිෂ්පාදනය කරන්නා වූ ව්‍යාවසායක් සම්බන්ධයෙන් වන විට, එසේ නිෂ්පාදනය කරන ලද තේ දළු විවෘත වෙළෙඳපොලේ ඒ විකුණුම් අවස්ථාවේ පවතින මිලට තේ නිෂ්පාදනය සඳහා විකුනනු ලැබ ඇති බවට සැලකිය යුතු අතර, තේ දළු නිෂ්පාදනයෙන් ලැබෙන ලාභ සහ ආදායම එසේ විකිණීමෙන් ලැබුන ලාභ සහ ආදායම බවට සැලකිය යුතු ය.

යම් නිශ්චිත ව්‍යාවසායකින් යම් සමාගමකට ලැබෙන ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17. (1) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් සමාගමක් විසින් පවත්වාගෙන යනු ලැබුවා වූ ද (2) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිත ව්‍යාවසායකින් එම සමාගමේ (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායම්, එම ව්‍යාවසාය වාණිජ කටයුතු ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකකට නොවැඩි කාලයක් වූ යම් තක්සේරු වර්ෂයක සිට හෝ ව්‍යාවසාය ලාභ ලැබීම ආරම්භ වන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට යන කාලසීමා දෙකෙන් කලින් එළඹෙන දින සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාලසීමාවක් සඳහා, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "නිශ්චිත ව්‍යාවසාය" යන්නෙන්—

(අ) (i) එවැනි ව්‍යාවසායක ආයෝජනය කරන ලද රුපියල් මිලියන පනහක අවම ආයෝජනයක් සහිතව 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර සංස්ථාගත කරන ලද ; හෝ

(ii) එවැනි ව්‍යාවසායක ආයෝජනය කරන ලද රුපියල් මිලියන දහයක අවම ආයෝජනයක් සහිතව සංස්ථාගත කරන ලද,

සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාවසායක් වන්නා වූ සහ කෘෂිකර්මාන්තය, කෘෂි පිරිසැකසුම් කිරීම, කාර්මික හා යාන්ත්‍රික

මෙවලම් නිෂ්පාදනය, යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය, විද්‍යුතය, සම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය හෝ තොරතුරු තාක්ෂණය සහ සමාන්තර සේවාවල යෙදී සිටින ව්‍යවසායක් ;

(ආ) නියමිත මාර්ගෝපදේශකවලට අනුකූල වන්නා වූ සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් ආයෝජන නිර්නායක යටතේ සුදුසුකම් ලත් සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන යම් නාමෝපගත ව්‍යාපෘතියක්; සහ

(ඇ) රුපියල් මිලියන දෙසියපනකට වඩා වැඩි ආයෝජනයක් සහිතව සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පුරෝගාමී ස්වභාවයෙන් යුක්තවන්නා වූ ව්‍යවසායක්,

අදහස් වේ.

(3) (අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් පුරෝගාමී ව්‍යවසායක රුපියල් මිලියන එක්දහසකට අඩු නොවන ආයෝජනයක් ඇති යම් සමාගමක් සඳහා පහත දැක්වෙන I වන තීරයේ දක්වා ඇති අවම ආයෝජනය සිදුකර ඇත්නම් නිදහස් කිරීමේ කාලසීමාව වනුයේ II වන තීරයේ සඳහන් අනුරූප කාලසීමාව වේ.

| *I වන තීරය (රුපියල් මිලියන)* | *II වන තීරය අවුරුදු* |
|---|---|
| 1000 සිට 2499 | 08 |
| 2500 සහ ඉහළ | 10 |

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ආයෝජන මුදල, අපනයන ප්‍රවර්ධන ගම්මාන සමාගමකට අදාළ නොවිය යුතු ය ;

(ඇ) (2) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිත ව්‍යවසායකින් ලැබෙන ආදායමට අමතරව වෙනත් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයකින් ආදායම් ලබන සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ වගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති

නිදහස් කිරීම අදාළ වනුයේ ඒ උපවගන්තියේ සඳහන් පරිදි නිශ්චිත ව්‍යවසායෙන් ලැබෙන ලාභ සමග ආදායම සම්බන්ධයෙන් පමණකි.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "කෘෂිකර්මාන්තය" යන්නෙන් කවර හෝ වර්ගයකට අයත් ශාක වර්ග, ඉඩම්වල වගා කිරීම, මසුන් ඇති කිරීම හෝ කුකුල් ගොවිපළ, පශු වෛද්‍ය හා කෘතිම ප්‍රජනන සේවා සහ වෙනත් සහාය සේවා ඇතුළු සතුන් ඇති කිරීම ;

(ආ) "කෘෂි පිරි සැකසුම්" යන්නෙන් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදන හෝ මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් කිරීම අදහස් වන නමුත්, විශාල ප්‍රමාණයෙන් කලු තේ සැකසුම් කිරීම සහ මත්පැන් නිෂ්පාදනය කිරීම ඊට ඇතුළත් නොවේ ;

(ඇ) "සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන" යන්නෙන් උද්දේශිත අපනයන ඇතුළුව (තොග වශයෙන් වූ කලු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි සහ අලුත් පොල් හැර) යම් භාණ්ඩ අදහස් වන අතර, යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යවසායෙන් ලැබෙන මුළු පිරිවැටුමෙන් සියයට අසූවකට නොඅඩු ප්‍රමාණයක් සාම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය කිරීමෙන් හෝ උද්දේශිත අපනයනය කිරීමෙන් ලැබෙන අවස්ථාවක ;

(ඈ) "උද්දේශිත අපනයනය" යන්නෙන් (තොග වශයෙන් වූ කලු තේ, ක්‍රෙප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි සහ අලුත් පොල් හැර) යම් වෙළෙඳ ද්‍රව්‍ය වැඩිමනක් නිෂ්පාදනය කිරීමකින් හෝ සෑදීමකින් තොරව යම් අපනයන කරුවකුට යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් නිෂ්පාදනය කිරීම හෝ සාදා සැපයීම, නැතහොත් සාම්ප්‍රදායික නොවන යම් භාණ්ඩයක් අපනයනය කිරීම සඳහා නිපදවීම, සෑදීම හෝ ඇසිරීම සඳහා නිපදවීම හෝ සෑදීම සහ සැපයීම අදහස් වේ.

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ඇතැම් ව්‍යවසාය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**18.** (1) යම් සමාගමක් විසින් (2) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිත ව්‍යවසායකින්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම හැර) ලාභ සහ ආදායම, එම සමාගම විසින් එම ව්‍යවසායෙහි කරන ලද ආයෝජනය රුපියල් මිලියන එක්දහසකට අඩු නොවන්නේ නම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් තීරණය කරනු ලැබිය හැකි, අවුරුදු හයකට නොඅඩු එහෙත් අවුරුදු දොළහකට නොවැඩි කාලසීමාවකට, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය. එම කාලසීමාව, එම ව්‍යවසාය විසින් ලාභ ඉපයීම් ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට හෝ එම ව්‍යවසාය වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට අවුරුදු දෙකකට වඩා පසු නොවන යම් තක්සේරු වර්ෂයක සිට, යන මෙයින් කලින් එළඹුන දිනයේ සිට ගණන් බලනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "නිශ්චිත ව්‍යවසාය" යන්න යම් සමාගමකට අදාළව යෙදෙන විට, එයින් ඒ සමාගම විසින් කරගෙන යන්නා වූ ද, අමාත්‍යවරයා විසින් ජාතික ආර්ථිකයෙහි යහපත සැලකිල්ලට ගෙන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි, යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ යම් ක්‍රියාකාරකමක යෙදී සිටින්නා වූ ද, ව්‍යවසායක් අදහස් වේ.

සුළු පරිමාණ යටිතල පහසුකම් ව්‍යවසායයන් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**19.** (1) (2) වන උපවගන්තියේ සඳහන් නිශ්චිත ව්‍යවසායකින් යම් සමාගමක් ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම, ඒ සමාගම ලාභ ඉපයීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට හෝ එහි වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකකට වඩා පසු නොවන යම් තක්සේරු වර්ෂයක සිට යන මෙයින් කලින් එළඹෙන දිනයේ සිට අවුරුදු පහක කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් සමාගමකට අදාළව, "නිශ්චිත ව්‍යවසාය" යන්න යෙදෙන විට, ඒ සමාගම විසින් කරගෙන යන්නා වූ ද විදුලිබල උත්පාදනය, සංචාරක ව්‍යාපාරය, විනෝද ක්‍රීඩා, ගුදම් ගතකිරීම හා ශීත ගබඩා, කුණු කසල එකතු කිරීම හෝ බැහැර කිරීම, නිවාස ඉදිකිරීම හෝ රෝහල් ඉදිකිරීම යන යටිතල පහසුකම් සංවර්ධනයෙහි යෙදී සිටින්නා වූ සහ එම ව්‍යවසාය ආරම්භ කිරීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත එහි ආයෝජනය කළ මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දහයකට නොඅඩු එහෙත් රුපියල් මිලියන පනහකට නොවැඩි වන්නා වූ ද, ව්‍යවසායක් අදහස් වේ.

යම් නව කාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායමේ නිදහස් කිරීම.

**20**. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායකින්, යම් සමාගමකට ලැබෙන 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව, එහෙත් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් නොවන්නා වූ, කිසියම් ලාභ සහ ආදායම, (3) වන උපවගන්තිය සහ (4) වන උපවගන්තියට අනුකූලව තීරණය කරනු ලබන කාලය තුලට වැටෙන සෑම තක්සේරු වර්ෂයක් සඳහා, ම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, යම් සමාගමකට සහ යම් තක්සේරු වර්ෂයකට අදාලව "නව ව්‍යවසායක්" යන්නෙන් –

(අ) එම සමාගම විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද;

(ආ) කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්ක වලින් පිටත යම් ප්‍රදේශයක පිහිටියා වූ ද මේ වගන්තියේ දෙවන උපලේඛනයේ "අ" කොටසේ හෝ "ආ"කොටසේ නිශ්චිතව දැක්වෙන්නා වූ ද;

(ඇ) 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර –

(i) එම ව්‍යවසාය කෘෂිකාර්මික ව්‍යවසායක් වන අවස්ථාවක, එම ව්‍යවසායේ භාවිතය සඳහා යම් පිරියත, යන්ත්‍රෝපකරණ, ගෘහභාණ්ඩ, ගොඩනැගිලි හෝ ඉඩම් සඳහා ආයෝජනය කරන ලද මුදල; හෝ

(ii) එම ව්‍යවසාය, කෘෂිකාර්මික ව්‍යවසායක් නොවන වෙනත් ව්‍යවසායක් වන අවස්ථාවක, එම ව්‍යවසායේ භාවිතය සඳහා යම් පිරියත, යන්ත්‍රෝපකරණ, ගෘහභාණ්ඩ හෝ ගොඩනැගිලි සඳහා ආයෝජනය කරන ලද මුදල,

රුපියල් මිලියන තිහකට නොඅඩු වන්නා වූ ද;

(ඇ) කලින් පැවති ව්‍යවසායක් කැඩීමෙන් හෝ ප්‍රතිනිර්මානය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවනු නොලැබුවා වූ ද;

(ඉ) 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර යම් අවස්ථාවක, දී සහ ඉන්පසු එම තක්සේරු වර්ෂය තුලදිම සේවයේ නියුක්තව සිටි සේවක සංඛ්‍යාව –

(i) එම ව්‍යවසාය, තොරතුරු තාක්ෂණය ලබා දෙන සේවාවන් සපයන කඩදාසි මත මුද්‍රණය කිරීමේ හෝ යම් ඇසුරුම් ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීමේ හෝ ව්‍යවසායක් වන විට, පනහකට නොඅඩු වන්නා වූ ද;

(ii) එම ව්‍යාවසාය ඉහත (i) ඡේදයේ සඳහන් ව්‍යාවසායක් නොවන වෙනත් ව්‍යාවසායක් වන විට, දෙසීයකට නොඅඩු වන්නා වූ ද,

ව්‍යාවසායක් අදහස් වේ.

(3) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව ආයෝජනය කරන ලද මුදල, මෙහි පළමුවන උපලේඛනයේ 1 වන තීරයේ යම් සටහනක නිශ්චිතව දැක්වෙන පරාසය තුළට වැටෙන අවස්ථාවක, ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ කාලසීමාව, එහි අනුරූප සටහනෙහි :–

(අ) ඒ උපවගන්තියේ සඳහන් කරන ලද ව්‍යාවසායක් මෙහි දෙවන උපලේඛනයේ 'අ' කොටසේ සඳහන් කරන ලද යම් පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ පිහිටා ඇති අවස්ථාවක දී II වන තීරයේ (අ) අනුතීරය තුළ ; සහ

(ආ) ඒ උපවගන්තියේ සඳහන් කරන ලද ව්‍යාවසායක් මෙහි දෙවන උපලේඛනයේ 'ආ' කොටසේ සඳහන් කරන ලද යම් පරිපාලන දිස්ත්‍රික්කයක් තුල පිහිටා ඇති අවස්ථාවක දී II වන තීරයේ (ආ) අනුතීරය තුල,

නිශ්චිතව දැක්වෙන කාලසීමාව විය යුතු ය.

## පළමුවන උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* | |
|---|---|---|
| *ආයෝජනය කරන ලද මුදල රුපියල් මිලියන වලින්* | *කාලසීමාව අවුරුදු වලින්* | |
| | "අ" උපතීරය | "ආ" උපතීරය |
| 30 ට වැඩි එහෙත් 50 ට නොවැඩි | 5 | 7 |
| 50 ට වැඩි එහෙත් 100 ට නොවැඩි | 6 | 8 |
| 100 ට වැඩි | 8 | 10 |

දෙවන උපලේඛනය

| "අ" කොටස | "ආ" කොටස |
|---|---|
| ගම්පහ හෝ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කවල මායිමේ කොටසක් සමග මිශ්‍ර වනුයේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක මායිමක කොටසක් ද, එම පරිපාලන දිස්ත්‍රික්කය. | –"අ" කොටසේ නිශ්චිතව දැක්වෙන යම් පරිපාලන දිස්ත්‍රික්කයක්; සහ –ගම්පහ සහ කොළඹ පරිපාලන දිස්ත්‍රික්ක, හැර වෙනත් යම් පරිපාලන දිස්ත්‍රික්කයක්. |

(4) (3) වන උපවගන්තියේ පළමුවන උපලේඛනයේ II වන තීරයේ (අ) අනුතීරයෙහි හෝ (ආ) අනුතීරයෙහි නිශ්චිතව දැක්වෙන කාලසීමාව-

(අ) (1) වන උපවගන්තියේ සඳහන් නව ව්‍යාවසාය, ඇතුළත් වූ ගනුදෙනු වලින් ලාභ ලැබීම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භය; හෝ

(ආ) යම් ව්‍යාවසායක් වානිජ මෙහෙයුම් ආරම්භ කළ තක්සේරු වර්ෂය ආරම්භවීමේ සිට ගණන් බලනු ලබන අවුරුදු තුනකට වඩා වැඩි නොවන කාලයක දී යෙදෙන තක්සේරු වර්ෂයේ ආරම්භය,

යන දෙකෙන් කලින් එළඹෙන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට ආරම්භ විය යුතු ය.

නැවත ස්ථානගත කරන ලද යම් ව්‍යාවසායක ලාභ සහ ආදායම නිදහස් කිරීම.

**21**. (1) (2) වන උපවගන්තියේ සඳහන් නැවත ස්ථානගත කරන ලද යම් ව්‍යාවසායකින්, යම් සමාගමකට ලැබෙන, 3 වන වගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූලව, එහෙත් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් නොවන්නා වූ, ලාභ සහ ආදායම, (3) වන උපවගන්තියට අනුකූලව තීරණය කරනු ලබන අවුරුදු පහක කාලයක් ඇතුළත සෑම තක්සේරු වර්ෂයක් සඳහාම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, යම් සමාගමකට සහ (1) වන උපවගන්තියේ සඳහන් යම් තක්සේරු වර්ෂයකට අදාළව "නැවත ස්ථානගත කරන ලද ව්‍යාවසායක්" යන්නෙන් –

(අ) 2005 නොවැම්බර් මස 1 වන දිනට පෙර කොළඹ හෝ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්ක ඇතුළත යම් ස්ථානයක එම සමාගම විසින් පවත්වාගෙන යනු ලැබුවා වූ ද, පුද්ගලයන් සියයකට නොඅඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්තව සිටින්නා වූ ද ;

(ආ) කොළඹ සහ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්ක වලින් පිටත යම් ස්ථානයක නැවත පිහිටුවනු ලබන්නා වූ ද, 2008 මාර්තු 31 දිනට පසුව එළඹෙන දිනයක් නොවන දිනයක ආරම්භ වී, එම තක්සේරු වර්ෂය පුරාම –

(i) එම ව්‍යාපාරය පවත්වාගෙන යාම; සහ

(ii) 2005 නොවැම්බර් මස 1 වන දින වන විට සේවයේ නියුක්තව සිටි පුද්ගලයන් සංඛ්‍යාවට වඩා අඩු නොවන සංඛ්‍යාවක් සේවයේ යෙදවීම; සහ

(ඇ) එම සමාගම නැවත ස්ථානගත කිරීමේ දී දැරීමට සිදු වූ වියදම රුපියල් මිලියන සියයට වඩා අඩු නොවන්නා වූ ද,

ව්‍යාපාරයක් අදහස් වේ.

(3) (1) වන උපවගන්තියේ සඳහන් අවුරුදු පහක කාලසීමාව, නැවත ස්ථානගත කරන ලද ව්‍යාපාරය වානිජ මෙහෙයුම් ආරම්භ කළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට ආරම්භ විය යුතු ය.

පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියුක්ත යම් සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**22.** (1) පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල පමණක් යෙදෙන නව ව්‍යාපාරයක් ආරම්භ කරන්නා වූ සහ ඒ ව්‍යාපාරය ආරම්භ කර එක් වර්ෂයක් ඇතුළත රුපියල් මිලියන දෙකකට නොඅඩු මුදලක් එහි ආයෝජනය කරන්නා වූ යම් සමාගමක් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම නොවන) ලාභ සහ ආදායම, ඒ ව්‍යාපාරය ලාභ ඉපයීම ආරම්භ කරන තක්සේරු වර්ෂයේ සිට හෝ එම ව්‍යාපාරය වාණිජ කටයුතු ආරම්භ කරන දින පටන් ගණන් බලන අවුරුදු දෙකකට වඩා පසු නොවූ යම් තක්සේරු වර්ෂයක සිට යන මෙයින් කලින් එළඹෙන දින සිට අවුරුදු පහක කාලයකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "පර්යේෂණ සහ සංවර්ධන" යන්නෙන්, (නිෂ්පාදනවල හෝ සාමාන්‍ය පර්යේෂණ භාණ්ඩවල තත්ව පාලනය, උපකරණ, සමාජ විද්‍යා හෝ මානව විද්‍යා, පර්යේෂණ, සාමාන්‍ය දත්ත එකතු කිරීම්, කාර්යක්ෂම සමීක්ෂණ හෝ කළමනාකරණ අධ්‍යයන සහ වෙළෙඳපොළ පර්යේෂණ හෝ අලෙවි ප්‍රවර්ධනය යන කරුණු

හැර) ද්‍රව්‍ය, උපකරණ, නිෂ්පාදන, ඵලදාව හෝ ක්‍රියා පිළිවෙත්, නිෂ්පාදනය කිරීමේ හෝ වැඩි දියුණු කිරීමේ ප්‍රයෝජන සඳහා උපයෝගී කර ගැනීමේ අරමුණ ඇතිව, විද්‍යාත්මක හෝ තාක්ෂණික ක්ෂේත්‍රයේ සිදු කරනු ලබන යම් ක්‍රමවත් හෝ පරිශ්‍රමශීලී අධ්‍යයනයක් අදහස් වේ.

යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**23**. (1) යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක (25 වන වගන්තියේ (7) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූල ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබූ ලාභ සහ ආදායම් හැර), 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායම් ඒ සමාගම විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරන්නා වූ හා ඒ ආයෝජනය—

(අ) පුරෝගාමී ස්වභාවයේ ව්‍යාපෘතියක් වන සහ අගය එකතුවීම හා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය වීම ඒ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලය වන ව්‍යාපෘතියක යෙදී සිටින ;

(ආ) තොරතුරු තාක්ෂණ ව්‍යාපාරයක් වන ව්‍යාපෘතියක යෙදී සිටින ; හෝ

(ඇ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නිශ්චය කොට දක්වනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපෘතියක යෙදී සිටින,

සමාගමක සාමාන්‍ය කොටස් මිල දී ගැනීම සඳහා කරන නිශ්චිත ආයෝජනයක් ලෙස හඳුනා ගැනෙන ආයෝජනයක් වන හා ඒ ආයෝජනය, නව ව්‍යාපාර සඳහා බීජ ප්‍රාග්ධනය සැපයුමකින් හෝ ආරම්භක ප්‍රාග්ධන සැපයුමකින් හෝ මුල් අවධියේ මූල්‍යකරණ පහසුකම් සැපයුමකින් මූල්‍ය පහසුකම් සැපයීම වන්නේ නම්, ඒ සමාගමේ වාණිජ ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට අවුරුදු පහක කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:—

එසේ වුව ද—

(i) අවදානම් ප්‍රාග්ධන සමාගම 2003 අප්‍රේල් 1 වන දිනට ප්‍රථම වාණිජ ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොමැති විය යුතු ය ; තව ද

(ii) නිශ්චිත ආයෝජනය, ප්‍රථම ආයෝජනය කරන අවස්ථාව වන විට ආශ්‍රිත සමාගමක් වන සමාගමකට අදාළ ව කරන ලද්දක් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා තිබෙන බදු නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස, එම අවදානම් ප්‍රාග්ධන සමාගම විසින්—

(අ) වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂයේ සිට දෙවන වර්ෂයේ අවසානයේ දී හෝ ඊට පෙර, එකී දෙවන වර්ෂය ඇතුළත, ඒ සමාගමේ මුළු හිමිකම් ප්‍රාග්ධනයේ ප්‍රමාණයෙන් සියයට හතළිහකට නොඅඩු ප්‍රමාණයක් ;

(ආ) වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂයේ සිට තුන්වන වර්ෂය අවසානයේ දී හෝ ඊට පෙර එකී තුන්වන වර්ෂය ඇතුළත, එම සමාගමේ මුළු හිමිකම් ප්‍රාග්ධනයේ ප්‍රමාණයෙන් සියයට අසූවකට නොඅඩු ප්‍රමාණයක් ;

(ඇ) වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂයේ සිට හතරවන හා පස්වන වර්ෂවල අවසානයේ දී හෝ ඊට පෙර එකී හතරවන හා පස්වන වර්ෂ ඇතුළත, එම සමාගමේ මුළු හිමිකම් ප්‍රාග්ධන ප්‍රමාණයෙන් සියයට අසූවකට නොඅඩු ප්‍රමාණයක් ,

(1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන යම් ව්‍යාපෘතියක ආයෝජනය කරනු ලැබ තිබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තිය යටතේ නිදහස් කිරීම් ඉල්ලා සිටි සමාගමක් මේ උපවගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, හෝ වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ වර්ෂය හා ඉන් පසුව එළඹෙන වර්ෂය තුළ ලාභාංශ ප්‍රකාශකර ඇත්නම් හෝ යම් වර්ෂයක් තුළ දී කරන ලද සම්පූර්ණ නිශ්චිත ආයෝජනවලින් සියයට විස්සකට වැඩි ප්‍රමාණයක් එම අවදානම් ප්‍රාග්ධන සමාගමේ ආශ්‍රිත සමාගම් එකක හෝ ඊට වැඩි ප්‍රමාණයක සිදුකර ඇත්නම්, මේ වගන්තිය මගින් සලසා දෙන ලද නිදහස් කිරීම ඉවත් කරගන්නා අතර අදාළ වර්ෂ සඳහා තක්සේරු නිකුත් කරනු ලැබේ.

(3) විදේශීය සමාගම්වල ද ආයෝජනය කරනු ලැබිය හැකි අතර, එම ආයෝජන ඒ සමාගම වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂයේ සිට පිළිවෙළින් දෙවන වර්ෂයේ එම සමාගමේ හිමිකම් ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි නොවන සහ තුන්වන වර්ෂයේ සහ ඉන් පසු වර්ෂවල එම සමාගමේ හිමිකම් ප්‍රාග්ධනයෙන් සියයට විස්සකට

වැඩි නොවන අවස්ථාවක, ඒ සමාගම වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ දෙවන තක්සේරු වර්ෂයේදී සහ ඉන් පසුව එම ආයෝජනය මේ වගන්තියේ කාර්ය සඳහා නිශ්චිත ආයෝජනයක් ලෙස සැලකිය යුතු ය.

(4) එම සමාගම වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂය ද ඇතුළුව, ප්‍රථම, අවුරුදු තුන ඇතුළත මේ වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියමිත අවම ආයෝජන ප්‍රමාණය ඉක්මවන හිමකම් ප්‍රාග්ධන ප්‍රමාණයක් ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය හැකි අතර, එම ආයෝජනය නිශ්චිත ආයෝජනයක් ලෙස සැලකිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා, වාණිජ ව්‍යාපාර කටයුතු ආරම්භ කළ තක්සේරු වර්ෂය වන්නේ, අවදානම් ප්‍රාග්ධන සමාගමේ නිකුත් කළ හිමකම් ප්‍රාග්ධන රුපියල් මිලියන සියයක් බවට පත් වූ වර්ෂය වන අතර 2008 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාණිජමය ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමකට එය අදාළ නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා:—

"ආශ්‍රිත සමාගමක්" යන්නෙන් මවු සමාගමක් සහ එහි සියලුම පාලිත සමාගම් ඇතුළත් වන සමාගම් සමූහයක් තුළ පිහිටි යම් සමාගමක් ඇතුළත් වන අතර, එම මවු සමාගම විසින් පාලිත සමාගමේ අධ්‍යක්ෂවරුන් වැඩි ප්‍රමාණයක් පත්කිරීම මගින් හෝ එම පාලිත සමාගම කොටස් ප්‍රාග්ධනයේ නාමික වටිනාකමින් භාගයකට වැඩි ප්‍රමාණයක් දැරීම මගින් එම මවු සමාගම විසින් පාලිත සමාගම පාලනය කරනු ලැබීම අදහස් වේ ;

"අක්‍රිය" යන්නෙන්, වාණිජ මෙහෙයුමක් කරගෙන යාමට අපොහොසත් වීමක් අදහස් වේ ;

"ඌන ක්‍රියාකාරිත්වය" යනුවෙන් අනුක්‍රමික තක්සේරු වර්ෂ දෙකකට නොඅඩු වන්නා වූ කාලයක් සඳහා ක්‍රියාකාරී ලෙසින් පාඩුවක් දැරීම අදහස් වේ ;

"අවදානම් ප්‍රාග්ධන සමාගම" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, රුපියල් මිලියන එක් සියයක අවම නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයක් ඇත්තා වූ ද (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල නිශ්චිතව සඳහන් පරිදි වූ ව්‍යාපෘතියක් හා සම්බන්ධව කොටස් ප්‍රාග්ධන ආයෝජන සැපයීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින්නා වූ ද—

(අ) අදාළ ආයෝජන කෙෂ්ත්‍රයෙහි නියමිත පළපුරුද්ද ඇති කළමනාකරණ සමාගමක් සමග තාක්ෂණික සේවා ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ ; හෝ

(ආ) විදේශීය අවදානම් ප්‍රාග්ධන සමාගම් සහ අවශ්‍ය වෘත්තීය අවදානම් ප්‍රාග්ධන කළමනාකරණ පළපුරුද්ද සහිත වෙනත් දේශීය කාර්ය මණ්ඩලයක්, විසින් පුහුණු කරනු ලැබූ වෘත්තිය කාර්ය මණ්ඩලයක සිය සේවා නියුක්තියෙහි ඇත්තා වූ ද,

සමාගමක් අදහස් වේ.

සංචාරකයන් සඳහා වලව් නිවාස හෝ විශේෂ සංවර්ධිත බංගලා සැපයීමේ ව්‍යාපාරයෙහි නියුක්ත යම් තැනැත්තකු ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

**24**. (1) (2) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන පරිදි වූ ව්‍යාපාරයක නියුක්ත යම් තැනැත්තකුගේ 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල (ප්‍රාග්ධන වත්කම විකිනීමෙන් ලැබූ යම් ලාභ සහ ආදායම් නොවන) ලාභ සහ ආදායම්, ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තා ලාභ ඉපයීම ආරම්භ කරන තක්සේරු වර්ෂයෙන් ආරම්භ වන අවුරුදු තුනක කාලසීමාවකට හෝ වාණිජ කටයුතු ආරම්භ කළ දිනයේ සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකකට වඩා පසුව නොවන යම් තක්සේරු වර්ෂයකින් ආරම්භ වන අවුරුදු තුනක කාලසීමාවකට යන මෙයින් පළමුව එළඹෙන කාලසීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.

(2) ලියාපදිංචි කිරීමේ දින සිට අවුරුදු දහයක කාලයක් සඳහා, වලව් නිවාසවල හෝ විශේෂ සංවර්ධිත බංගලාවල සංචාරකයන්ට නවාතැන් පහසුකම් ලබාදීම සඳහා වූ යෝජනා ක්‍රමය යටතේ, 2003 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය සමග ලියාපදිංචි වූ යම් තැනැත්තකුට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

## IV වන පරිච්ඡේදය

### ලාභ හෝ ආදායම නිශ්චය කිරීම

ලාභ සහ ආදායම නිශ්චය කිරීමේදී ඉඩ දිය යුතු අඩු කිරීම්.

**25**. (1) (2) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, යම් ප්‍රභවයකින් ලැබෙන යම් තැනැත්තකුගේ ලාභ හෝ ආදායම නිශ්චය කිරීමේ කාර්ය සඳහා පහත සඳහන් දැ ඇතුළුව, ඒ ලාභ හෝ ආදායම ඉපයීමේදී ඒ තැනැත්තා විසින් දරන ලද සියලු පිටයාම් සහ වියදම් අඩු කරනු ලැබිය යුතු ය—

(අ) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවකදී එම තැනැත්තා විසින් අත්කර ගන්නා ලද, ඉදිකරන ලද හෝ

එකලස් කරන ලද පහත දැක්වෙන වත්කම් පාවිච්චි කිරීමේ දී ගෙවීයාමෙන් උද්ගත වන ක්ෂයවීම සඳහා වූ දීමනාවක්—

(i) එම තැනැත්තා විසින් අත්කර ගත් උපකරණ කොටස් සහ පරිසනක මෘදුකාංග ඇතුලු තොරතුරු තාක්ෂණ උපකරණ සහ ගණන් බැලීමේ උපකරණ, අවස්ථාවෝචිත පරිදි, එම උපකරණ කොටස් සහ පරිසනක මෘදුකාංග අත්කර ගැනීමේ වියදම වර්ෂයකට සියයට විසිපහක අනුප්‍රමාණයට ;

(ii) එම තැනැත්තා විසින් අත්කරගත් යම් මෝටර් වාහනයක් හෝ ගෘහ උපකරණ, එසේ අත්කර ගැනීමේ වියදම මත සියයට විස්සක අනු ප්‍රමාණයට ;

(iii) (i) සහ (ii) වන අනුඡේදවල සඳහන් කර නොමැති වෙනත් යම් යන්ත්‍රෝපකරණ හෝ උපකරණ සහ (v) වන අනුඡේදයේ සඳහන් නොවන, එම තැනැත්තා විසින් අත්කර ගත් හෝ එකලස් කරන ලද යම් පිරියත, එසේ අත්කර ගැනීමේ හෝ එකලස් කිරීමේ වියදම මත වර්ෂයකට සියයට දොළහමාරක අනුප්‍රමාණයට ;

(iv) එම තැනැත්තා විසින් ඉදිකරන ලද යම් පාලමක්, දුම්රිය මාර්ගයක්, ජලාශයක්, විදුලි බලය හෝ ජලය බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් සහ මුදල් අයකරන පාරක් හෝ එම වත්කම් ඉදිකර ඇති තැනැත්තකුගෙන් අත්කරගත් එවැනි වත්කම්, අවස්ථාවෝචිත පරිදි ඉදිකිරීමේ හෝ අත්කර ගැනීමේ වියදම මත වර්ෂයකට සියයට හයයි තුනෙන් දෙකක අනුප්‍රමාණයට ;

(v) යම් සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ලක්, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත මගින් පිහිටුවනු ලැබූ, නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබුවා වූ ද, වාණිජ ඒකකයක් ලෙස භාවිතා කිරීම සඳහා ඉදිකරන ලදුව අත්කර ගත්තා වූ ද, සභාධිපත්‍ය දේපලකට යම් ඒකකයක් හෝ යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් සඳහා එම ගොඩනැගිල්ල භාවිතා කළ තැනැත්තකුගෙන් අත්කර ගත් යම් (හෝටල් ගොඩනැගිලි සංකීර්ණයක් ඇතුළුව) හෝටල්

ගොඩනැගිල්ලක් හෝ (කාර්මික ගොඩනැගිලි සංකීර්ණයක් ඇතුළුව) යම් කාර්මික ගොඩනැගිල්ලක් අවස්ථාවෝචිත පරිදි, ඉදිකිරීමේ වියදම හෝ අත්කර ගැනීමේ වියදම මත සියයට හයයි තුනෙන් දෙකක අනුප්‍රමාණය :

එසේ වුව ද

(අ) එසේ අත්කරගත් මෘදුකාංග, ශ්‍රී ලංකාවේ සාදන ලද මෘදුකාංග වන අවස්ථාවක, අනුප්‍රමාණය, අත්කරගැනීමේ පිරිවැය මත සියයට සියයක් විය යුතු ය ;

(ආ) අත්කරගත් යම් පිරියත හෝ යන්ත්‍රෝපකරන, සෞඛ්‍ය රැකවරණ ලබාදීමේ, කඩදාසි මත මුද්‍රණය කිරීමේ, මැනික් කැපීම සහ ඔප දැමීම, වාණිජ කාර්යය සඳහා යම් ද්‍රව්‍යයක් ඇසිරීම, වී කෙටීම හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් ව්‍යාපාරයක භාවිතා කරනු ලබන අවස්ථාවක දී, අනු ප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැය මත $33\frac{1}{3}$ක් විය යුතු ය ;

එසේම තවදුරටත් මෙම ඡේදයේ (i), (ii), (iii) හෝ (iv) වන අනුඡේදවල සඳහන් යම් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ඉහතින් ම වූ තක්සේරු වර්ෂවල දී ක්ෂයවීම සඳහා ප්‍රදානය කරන ලද දීමනා සම්පූර්ණ ප්‍රමාණය, එම තැනැත්තාගේ එම වත්කම, අවස්ථාවෝචිත පරිදි, අත්කර ගැනීමේ වියදමට හෝ ඉදිකිරීමේ වියදමට හෝ එකලස් කිරීමේ වියදමට සමාන නම්, එම ප්‍රාග්ධන වත්කම සම්බන්ධයෙන් එම තැනැත්තාට මේ ඡේදයේ ඉහතින් ම වූ විධිවිධාන යටතේ කිසිදු අඩු කිරීමක් සඳහා අවසර නොදිය යුතු ය ;

(ආ) (i) ඒ තැනැත්තා විසින් කරගෙන යන වෙළෙඳාමක දී හෝ ව්‍යාපාරයක දී ඔහු ප්‍රයෝජනයට ගන්නා යම් නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා ඔහුගේ නමින් බලපත්‍රය ලබාගැනීම පිණිස ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, ඔහු විසින් කරන ලද ගෙවීමකින් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් ;

(ii) ඒ තැනැත්තා විසින් අත්කරගන්නා ලද කීර්ති නාමය හැර අස්පර්ශනීය වත්කම් කිසිවක් අත්කර ගැනීමේ පිරිවැයෙන් දහයෙන් එක් කොටසකට සමාන මුදල් ප්‍රමාණයක් :

එසේ වුව ද ඊට පෙරාතුවම වූ තක්සේරු වර්ෂවල දී අඩු කරන ලද මුදල් ප්‍රමාණවල එකතුව එම ගෙවූ මුදලට සමාන වන්නේ නම්, එවැනි යම් ගෙවීමක් වෙනුවෙන් මේ ඡේදයේ විධිවිධාන යටතේ යම් අඩු කිරීමක් කිසිම තැනැත්තකු වෙනුවෙන් නොකළ යුතු ය ;

(ඇ) ඒ ලාභ හෝ ආදායම ඉපයීමේ දී ඒ තැනැත්තා විසින් පාවිච්චි කරනු ලබන යම් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ක්ෂයවීම සඳහා කිසිදු දීමනාවක් අඩු කළ නොහැකි නම් ඒ වත්කම අලුත් කිරීම සඳහා ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක් ;

(ඈ) ලාභ සහ ආදායම ඉපයීමේ දී යොදන ලද යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම, ගොඩනැගිලි, ආම්පන්න, භාජන හෝ භාණ්ඩ අලුත්වැඩියා කිරීම (අලුත් කිරීම නොව) සඳහා ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක් :

එසේ වුව ද, පරිශ්‍ර කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ ඡේදය යටතේ අඩු කළ හැකි මුදල, ඒ පරිශ්‍රය අලුත් වැඩියා කිරීමට අදාල වනතාක් දුරට, ඒ පරිශ්‍රය වෙනුවෙන් ඒ සමාගමට ලැබිය හැකි, දළ කුලියෙන් සියයට විසිපහකට වැඩි නොවිය යුතු ය :

(ඉ) ලාභ නිශ්චය කරනු ලබන කාලසීමාව ආරම්භ වීමට පෙරාතුව යම් බොල් ණයක් හෝ අඩමාන ණයක් අයවිය යුතුව හා ගෙවිය යුතුව තිබුණේ වුව ද යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක්, රක්ෂාවක් හෝ සේවානියුක්තියක් සම්බන්ධයෙන් ඒ ලාභ නිශ්චය කරනු ලබන කාලසීමාව තුළ එම තැනැත්තා විසින් දරා ඇති බොල් ණය වලට සමාන මුදලක් හා ඒ කාලසීමාව තුළ බොල් බවට පත්ව ඇතැයි ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයට අඩමාණ ණය වෙනුවෙන් සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් මුදලක් :

එසේ වුවද, බොල් ණය හෝ අඩමාන ණය වෙනුවෙන් කලින් කපා හරින ලද හෝ ඉඩ දෙන ලද මුදල්වලින් ඒ කාලසීමාව තුළ අයකර ගනු ලැබූ සියලු මුදල්, මේ පනතේ කාර්ය සඳහා ඒ කාලසීමාව තුළ ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන්, රක්ෂාවෙන් හෝ සේවා නියුක්තියෙන් ලැබූ ලැබීම් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ අතුරු විධානයේ කාර්ය සඳහා, අයකර ගනු ලබන මුදල් යන්නට, ඇස්තමේන්තු කළ අඩුකිරීමක් වශයෙන් කලින් අවසර දී ඇති අඩමාණ ණය මුදලක්, එම කාලසීමාවේ අවසාන දිනයේදී අඩු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඊ) ඒ තැනැත්තා විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු පොලී ;

(උ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් විශ්‍රාම වැටුප්, අර්ථසාධක හෝ ඉතිරිකිරීමේ අරමුදලට, නැතහොත් අර්ථසාධක හෝ ඉතිරිකිරීමේ සංගමයට, සේවායෝජකයකු විසින් ගෙවනු ලබන යම් දායක මුදලක් ;

(ඌ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ලාභ සහ ආදායම නිශ්චය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද, ඒ කාලසීමාව සම්බන්ධයෙන් ඒ තැනැත්තා යම් පළාත් සභාවක් විසින් පනවනු ලැබූ යම් ප්‍රඥප්තියක් යටතේ ගෙවිය යුතු වූ ද බද්දක් :

එසේ වුව ද, එසේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවා නොමැති බව යම් තක්සේරුවක් කරන අවස්ථාවේ දී තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, ඒ බද්ද සම්බන්ධයෙන් යම් අඩුකිරීමකට ඉඩ දීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත්, අඩුකිරීමක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ යම් බද්දක් සම්බන්ධයෙන් ද ඒ බද්ද, තක්සේරුව, අදාළ වන ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක කාලසීමාවක් ඇතුළත ගෙවා ඇති බව තක්සේරුකරුට පෙනී යන අවස්ථාවක, ඒ ගෙවීම සම්බන්ධයෙන්, එම ගෙවීමෙන්

මාස දොළහක් අතරතුර කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත සහ ඔහු විසින් නියම කරනු ලබන පරිදි යම් ඔප්පු කිරීමක් සැපයීම මත 171 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, ඒ අඩුකිරීමට ඉඩ දෙමින් ඔහු විසින් සංශෝධිත තක්සේරුවක් කළ යුතු ය. තව ද, 200 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, එම සංශෝධිත තක්සේරුවේ ප්‍රතිඵලයක් වශයෙන් ගෙවා ඇතැයි සොයා ගනු ලබන යම් බද්දක් ආපසු ගෙවනු ලැබිය යුතු ය ;

(එ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් ඉහළ ශ්‍රේණියට නැංවීම සඳහා යම් විද්‍යාත්මක, කාර්මික, කෘෂිකාර්මික හෝ වෙනත් යම් පර්යේෂණ කරගෙන යාමෙහිලා ඒ තැනැත්තා විසින් දරන ලද ප්‍රාග්ධන වියදම් ඇතුළුව වියදම් ;

(ඒ) ඒ තැනැත්තා විසින් –

(i) වගා කිරීම හෝ සත්ව පාලනය සඳහා යම් ඉඩමක් විවෘත කිරීමෙහිලා ;

(ii) කවර හෝ විස්තරයකට අයත් පැලැටි ඒ ඉඩමෙහි වගා කිරීමෙහිලා ;

(iii) ඒ ඉඩමේ ඇති කිරීම සඳහා පශු සම්පත් හෝ කුකුළන් මිල දී ගැනීමෙහිලා; හෝ

(iv) මසුන් ඇති කිරීම සඳහා වැව් හෝ පොකුණු තැනීම හෝ යම් මිරිදිය ජලාශ පිරිසිදු කිරීම හා පිළියෙළ කිරීම සහ අවස්ථාවෝචිත පරිදි ඒ වැව්, පොකුණු හෝ මිරිදිය ජලාශවල ඇති කිරීම සඳහා මසුන් මිල දී ගැනීමෙහිලා,

දරන ලද වියදම් ;

(ඔ) තමාගේ වෙළෙඳාම. ව්‍යාපාරය, වෘත්තීය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාගේ සේවයෙහි නියුක්ත වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලංකාව තුළ ගමන් සඳහා සැබැවින් දරන ලද වියදම් :

එසේ වුව ද, යම් තැනැත්තකුට –

(i) මේ පනතේ XIV පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩුකිරීමේ කාර්යය සඳහා එම නිලධරයාගේ

පාරිශ්‍රමිකයට මේ පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) අනුඡේදයේ අතුරු විධානය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රතිලාභයක වටිනාකම ඇතුළත් කර ඇත්නම් මිස, ඔහු විසින් ඔහුගේ වෙළෙඳාමේ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රැකියාවේ කාර්යය සඳහා අර්ධ වශයෙන් භාවිත කරන සහ ඔහු විසින් සේවයේ නියුක්ත කරන ලද යම් විධායක නිලධරයකුගේ හෝ එම සංවිධානයේ විධායක නොවන අධ්‍යක්ෂවරයකුගේ ගෘහස්ථ හෝ පෞද්ගලික කාර්යය සඳහා අර්ධ වශයෙන් භාවිතා කරන වාහනයකට අදාළව දරන ලද වියදම් සම්බන්ධයෙන් ;

(ii) අවස්ථාවෝචිත, පරිදි යම් සේවානියුක්තයකුට හෝ විධායක නොවන අධ්‍යක්ෂවරයකුට හෝ එම තැනැත්තා විසින් පවත්වාගෙන යන වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවක සේවා සපයන එහෙත් සේවා නියුක්තයකු නොවන යම් තැනැත්තකුට හෝ සපයා ඇති වාහනය පළමුවන වාහනය නොවන්නේ නම්, එම සේවානියුක්තිකයාට හෝ විධායක නොවන අධ්‍යක්ෂවරයාට හෝ එම වෙනත් පුද්ගලයාට වාහන එකකට වැඩි ප්‍රමාණයක් සපයා ඇති අවස්ථාවක, එම වාහනයකට අදාළව දරන ලද වියදම් සම්බන්ධයෙන් ;

(iii) යම් තැනැත්තකුගේ සේවානියුක්තයකු නොවන්නා වූ ද එම තැනැත්තා විසින් පවත්වාගෙන යන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවක සේවා ලබා නොදෙන යම් තැනැත්තකු වෙත වාහනයක් සපයා ඇති අවස්ථාවක, එම වාහනයට අදාළව දරන ලද වියදම් සම්බන්ධයෙන් ;

(iv) XIV වන පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩු කිරීමේ කාර්යය සඳහා ව්‍යාපාරික නොවන කටයුත්තක් සඳහා එම වාහනය පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ වටිනාකම කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබූ පරිදි එම සේවා නියුක්තිකයාගේ පාරිශ්‍රමිකයට ඇතුළත් කර ඇත්නම් හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව ප්‍රතිපූරණය කරන ලද මුදල එම සේවායෝජකයා විසින් පවත්වාගෙන යන වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තීය හෝ රැකියාවට අදාළව අවසර දිය හැකි ගමන් වියදම් පමණක් නම් හැර, එම වියදම් සඳහා හිමිකම් පෑමට සේවායෝජකයා විසින් අවසර දී ඇති

සේවානියුක්තිකයකුට අයත් වාහනයකට අදාළ යම් වියදමක් ප්‍රතිපූර්ණය කිරීමට අදාළව දරන ලද වියදම් සම්බන්ධයෙන් —

(i) (ii) (iii) අනුඡේදවල සහ මේ අනුඡේදයේ කාර්යය සඳහා "දරන ලද වියදම්" යන්නට, වාහනයකට අදාළව, යම් බදු කුලියක් හෝ වෙනත් කුලී ගෙවීමක් හෝ වාහනයක් අත්කර ගැනීමේ වියදම හෝ එම වාහනය අත්කර ගැනීමේදී දැරීමට සිදු වූ මූල්‍යකරණ පිරිවැය ඇතුළත් නොවේ ; සහ

(v) ඒ තැනැත්තාගේ සේවයෙහි නියුක්ත වෙනත් යම් තැනැත්තකු විසින්, ඒ වෙනත් යම් තැනැත්තාගේ පදිංචි ස්ථානය සහ ඔහුගේ සෙවා ස්ථානයත්, සේවා ස්ථානය සහ තම පදිංචි ස්ථානයත් අතර කරන ලද යම් ගමන් කිරීම් හේතුකොටගෙන ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදම් වෙනුවෙන්,

මේ ඡේදයෙහි ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය ;

(ඕ) සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම පිහිටුවීමෙහි හෝ ඈවර කිරීමෙහි ලා දරන ලද වියදම ;

(ක) ඒ තැනැත්තාගේ සේවකයන් ඔවුන්ගේ සේවා ස්ථානයටත්, සේවා ස්ථානයෙනුත් ප්‍රවාහනය කිරීම සඳහා වූ කෝච් රථයක් යෙදවීමේ දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් ;

(ග) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව නතර කිරීම නිසා යම් සේවා නියුක්තයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම මත, ඒ සේවා නියුක්තකයාට පාරිතෝෂිතයක් ගෙවීමේ දී, ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් ;

(ච) මේ ඡේදයේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, තම සේවාවන් අවසන් වීම මත සේවා නියුක්තයන්ට පාරිතෝෂික ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් අරමුදලකට, ඒ තැනැත්තා විසින් කරන ලද යම් වාර්ෂික ගෙවීමක් ;

(ජ) යම් වාණිජ ස්ථානයක් ඒ තැනැත්තාට කුලියට දීම හෝ බදු දීම සම්බන්ධයෙන්, ඒ තැනැත්තා විසින් තැනැත්තකුට අත්තිකාරම් මුදලක් නොවන එකවර ගෙවන ලද යම් මුදලක් සම්බන්ධයෙන් වන විට, වර්ෂයේ බදු කුලිය ගෙවිය යුතු මාස ගණන හා බද්ද සංයුක්ත වන මුළු මාස ගණන අතර අනුපාතය, යට කී එකවර ගෙවන ලද මුදලේ යම් කොටසක් එකී එකවර ගෙවන මුදලට සමානුපාතික වේද, ඒ කොටස ;

(ට) යම් තැනැත්තකු විසින් කරගෙන යන යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක සේවයේ නියුක්ත කර සිටින සේවා නියුක්තයකු, යම් පිළිගත් ආයතනයක පුහුණු කිරීම—

(i) ඒ පුහුණුව ආරම්භ කිරීමට පූර්වයෙන් ඒ ඒ සේවා නියුක්තයා විසින් ඉටුකරන ලද කාර්යයන්ට ඒ පුහුණුව සෘජුවම අදාළ වන බව ;

(ii) ඒ වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ එම සේවා නියුක්තයාගේ නිපුණතා හෝ කාර්යය සාධනය ඉහළ නැංවීම සඳහා ඒ පුහුණුව අත්‍යාවශ්‍ය බව ;

(iii) ඒ වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ඒ පුහුණුව අවශ්‍ය බව,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, ඒ පුහුණුව සඳහා ඒ තැනැත්තා විසින් දරන ලද වියදම ;

මේ ඡේදයේ කාර්යය සඳහා —

"පුහුණුව" යන්නට යම් සම්මන්ත්‍රණයකට හෝ වැඩ මුළුවකට සහභාගිවීම ඇතුළත් වේ ;

"සේවා නියුක්තයා" යන්නට යම් වෘත්තියක් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකු ඇතුළත් වේ ;

(2) (1) වන වගන්තියේ ඡේද දෙකක් හෝ ඊට වැඩි ගණනක් යටතේ යම් තැනැත්තකු යම් පිටයාමක් හෝ වියදමක් සම්බන්ධයෙන් අඩු කිරීමකට හිමිකම් ලබන අවස්ථාවක, යම් ප්‍රභවයකින් ඒ තැනැත්තා ලබන ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී, එවැනි එක් ඡේදයක් යටතේ පමණක් ඒ තැනැත්තාට අඩු කිරීමකට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(3) (අ) යම් වෙළෙඳාමක. ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ සහ ආදායම ඉපයීමෙහි ලා යම් තැනැත්තකු විසින් පාවිච්චි කරන ලද යම් ප්‍රාග්ධන වත්කම් ඔහු විසින් බැහැර කරන හා අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රාග්ධන වත්කම්වල, අත්කර ගැනීමේ පිරිවැයට හෝ ඉදිකිරීමේ පිරිවැයට සමානවන සම්පූර්න මුදල් ප්‍රමාණයක් ඒ ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් ක්ෂයවීම සඳහා දීමනාවක් වශයෙන් ප්‍රදානය කර ඇති අවස්ථාවක, ඒ බැහැර කිරීම, වෙළෙඳාම, ව්‍යාපාරය හෝ වෘත්තිය පවත්වා ගෙන යන අතරතුර නැතහොත් එය නතර කරනු ලැබූ විට හෝ නතර කරනු ලැබීමෙන් පසු සිදු වුව ද, ඒ බැහැර කිරීමෙන් ලැබුණ සම්පූර්ණ මුදල, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී, ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලැබීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(ආ) යම් තැනැත්තකු විසින් කර ගෙන යනු ලැබූ හෝ පවත්වා ගෙන යනු ලැබූ යම් වෙළෙඳමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ හා ආදායම් ඉපයීමෙහි ලා ඔහු විසින් පාවිච්චි කරනු ලැබූ යම් ප්‍රාග්ධන වත්කමක්, ඒ තැනැත්තා විසින් බැහැර කරන හා ඒ ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කර ඇති නමුත් ඒ දීමනාවේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රාග්ධන වත්කම අත් කර ගැනීමේ පිරිවැයට හෝ ඉදිකිරීමේ පිරිවැයට අඩුවන අවස්ථාවක, ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරිමේ පිරිවැය සහ ඒ ප්‍රාග්ධන වත්කම වෙනුවෙන් ප්‍රදානය කර ඇති ක්ෂයවීම සඳහා වූ මුළු දීමනාව අතර වෙනසට වැඩියෙන් ඒ බැහැර කිරිමෙන් ලැබෙන මුදලෙහි අතිරික්තය, ඒ බැහැර කිරීම, වෙළෙඳාම, ව්‍යාපාරය හෝ වෘත්තිය පවත්වා ගෙන යන අතරතුර හෝ එය නතර කරනු ලැබීමෙන් පසුව හෝ සිදු වුව ද, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලාභ සහ ආදායම් නිශ්චය කිරීමේ දී ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරායේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලැබීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද ඒ වෙනස, බැහැර කිරීමෙන් ලත් මුදල ඉක්මවන්නා වූ අවස්ථාවක, එම අතිරික්තය ආදායම උපදවීමෙහිලා දරනු ලැබූ වියදමක් වශයෙන්, (1) වන උපවගන්තියේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතුය :

එසේ වුව ද, තවදුරටත් මේ ඡේදයේ කිසිවක් –

(i) සමාගමක් බවට හරවන ලද තනිව හෝ හවුල් ව්‍යාපාරයක් ආකාරයෙන් යම් තැනැත්තකු විසින් කරගෙන යන්නා වූ ව්‍යාපාරයක්, ප්‍රාග්ධන වත්කමක් එම සමාගමට පැවරීම සඳහා ;

(ii) යම් ප්‍රාග්ධන වත්කමක් ඒ තැනැත්තා විසින් බැහැර කරනු ලබන්නේ නම්, එසේ බැහැර කිරීමෙන් ලත් මුළු මුදල ඒ ප්‍රාග්ධන වත්කම බැහැර කිරීමෙන් වසරක් ඇතුළත, ඔහු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තිය හෝ රක්ෂාවක ආදායම් උපදවීම සඳහා ප්‍රතියෝජනය කළහොත්, එම ප්‍රාග්ධන බැහැර කිරීම සඳහා,

අදාළ නොවිය යුතු ය.

(ඇ) මේ පනත යටතේ මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් ආදායම් බද්දෙන් නිදහස් ලාභ හෝ ආදායම ලබන යම් ව්‍යවසායක් කරගෙන යන තැනැත්තකු විසින්, ඒ ව්‍යවසායේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන යම් ප්‍රාග්ධන වත්කමක් ඔහු විසින් බැහැර කරනු ලබන අවස්ථාවක, (අ) ඡේදය හා (ආ) ඡේදය යටතේ නිශ්චය කරන ලද ප්‍රමාණයට හා සමාන ප්‍රමාණයක් මත ඒ තැනැත්තා ආදායම් බද්දට යටත් විය යුතු ය.

(4) මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව, පොලී වශයෙන් උපදින ආදායම පිට යාම හෝ වියදම් සඳහා කිසිම අඩු කිරීමක් නොමැතිව, ලැබුණේ වුව ද නොවුව ද, අයවීමට ඇති පොලියේ මුළු ප්‍රමාණය විය යුතු ය :

එසේ වුව ද –

(අ) යම් පොලියක් ගෙවා නොමැති බව සහ එය අයකර ගත නොහැකි බව යම් තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, ඒ පොලිය ඇතුළත් යම් තක්සේරුවකින් 171 වන වගන්තියේ විධිවිධාන කුමක් වුව ද, ගෙවා නොමැති බවට හා අයකර

ගත නොහැකි බවට පෙන්වා ඇති ඒ ඇතුළත් කරන ලද පොලී ප්‍රමාණය අඩු කරනු ලැබිය යුතු ය. නැතහොත් ඒ පොලී වෙනුවෙන් ආදායම් බද්ද ගෙවා ඇත්නම්, ඒ බද්ද ගෙවනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද, ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත ලිඛිතව කරනු ලබන හිමිකම් පෑමක් මත ඒ බද්ද ආපසු ගෙවිය හැකි ය ;

(ආ) යම් තක්සේරු වර්ෂයකදී ණය මුදලක් සම්බන්ධයෙන් අයවීමට ඇති යම් පොලියක් ලැබී නොමැති හා ඒ පොලිය අයකරගත නොහැකිවීමට ඉඩ ඇති අවස්ථාවක, පොලිය අයවීමට ඇති තැනැත්තා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද අයකළ හැකි ලාභ හා ආදායමෙන් ඒ පොලිය අත්හරිනු ලැබිය හැකි ය ;

(ඇ) (ආ) ඡේදය යටතේ තක්සේරුවකින් අත්හරිනු ලැබූ යම් පොලියක් ඊට පසු ලැබ ඇති බව සහ ඒ පොලිය සම්බන්ධයෙන් ආදායම් බදු ගෙවා නොමැති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කළ හැකි කාලය සීමා කරමින් 163 වන වගන්තියේ (5) වන උපවගන්තියේ කුමක් සඳහන්ව ඇත ද ඒ පොලිය ඇතුළත් කොට තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකි ය.

(5) යම් ප්‍රාග්ධන වත්කමක් වෙනුවෙන් (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ, (ආ) ඡේදයේ (ඇ) හෝ, (ඈ) හෝ, යටතේ කිසිම අඩුකිරීමක්-

(අ) යම් තැනැත්තකු—

(i) 3 වන වගන්තියෙහි (අ) ඡේදයේ අර්ථානුකූලව සම්පූර්ණ ලාභ සහ ආදායම හෝ ලාභවල සහ ආදායමෙහි කොටසක් හෝ ආදායම් බද්දෙන් නිදහස් කර ඇති යම් ව්‍යාවසායකට එම ප්‍රාග්ධන වත්කම් කුලියට දී ඇත්නම් ; හෝ

(ii) එම ප්‍රාග්ධන වත්කම අත්කර ගන්නා ලද්දේ වෙනත් යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාගේ පවුලේ යම් සාමාජිකයකු විසින් හෝ

තමාගේ පවුලේ යම් සාමාජිකයකු විසින් වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සමග හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් ව්‍යවසායක පාවිච්චි කිරීම සඳහා එම ප්‍රාග්ධන වත්කම කුලියට දී ඇත්නම් ; හෝ

(ආ) යම් තැනැත්තකු ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගන්නා ලද්දේ වෙනත් යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා සමග හෝ ඒ තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු සමග හෝ පළමු කී තැනැත්තා විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් ව්‍යවසායක, ඒ තැනැත්තා ඒ ප්‍රාග්ධන වත්කම යොදවන්නේ යොදවයි නම්,

ඒ තැනැත්තාට ඉඩ ලබා නොදිය යුතු ය :

එසේ වුව ද, යම් තැනැත්තකු ප්‍රාග්ධන වත්කම් කුලියට දීමේ ව්‍යාපාරය කරගෙන යන සමාගමක් වන්නේ නම් එවැනි තැනැත්තකු විසින් කුලියට දෙන ලද ප්‍රාග්ධන වත්කම් කිසිවක් සම්බන්ධයෙන් (අ) ඡේදයේ (1) වන අනුඡේදයේ විධිවිධාන කිසිවක් අදාළ නොවන්නේ ය.

(6) එක් කලත්‍රයකු විසින් පහත සඳහන් අයුරු, එනම් :—

(අ) අනෙක් කලත්‍රයා විසින් ; හෝ

(ආ) අනෙක් කලත්‍රයා හවුල්කරුවකු වන හවුල් ව්‍යාපාරයක් විසින්,

පවත්වාගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළඳාමකදී, ව්‍යාපාරයකදී, වෘත්තියකදී හෝ රක්ෂාවකදී ඉටුකරන ලද සේවාවලින් ලබාගන්නා ලද ලාභ සහ ආදායම, අනෙක් කලත්‍රයාගේ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) යම් ප්‍රාග්ධන වත්කමකට අදාළව "ක්ෂයවීම සඳහා දීමනාව" යන්නෙන්, ඒ වත්කම සම්බන්ධයෙන්—

(i) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ ;

(ii) 2000 අංක 38 දරන දේශීය ආදායම් බදු පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ආආ) හෝ (ඇ)ඡේද යටතේ ; හෝ

(iii) 1979 අංක 28 දරන දේශීය ආදායම් බදු පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ(අ), (ආ), (ඇ) (ඈ), (ඉ,) (ඉඉ), (ඉඉඉ), හෝ (ඉඉඉඉ) ඡේද යටතේ,

අඩු කළ හැකි දීමනාවක් අදහස් වේ ;

(ආ) වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට අදාළව "ප්‍රාග්ධන වත්කම" යන්නෙන්. ඒ වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තීයෙහි හෝ රක්ෂාවෙහි ආදායම ඇති කිරීමේ කාර්යය සඳහා උපයෝගී කරගනු ලබන යම් පිරියතක්, යන්ත්‍ර සවිකිරීමේ උපකරණ, මෙවලම්, භාණ්ඩ හෝ උපකරණ හෝ එම වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි කාර්යයක් සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ලක් හෝ අදහස් වේ ;

(ඇ) යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමට අදාළව "ලැබුණු මුදල්" යන්නෙන්—

(i) බැහැර කිරීම විකිණීමක් මගින් වන අවස්ථාවක, එම වත්කමෙහි විකුණුම් මිල ; හෝ

(ii) බැහැර කිරීම විකිණීමක් නොවන වෙනත් ආකාරයක බැහැර කිරීමක් වන අවස්ථාවක, බැහැර කළ අවස්ථාවේ එම වත්කමෙහි වෙළෙඳපොළ වටිනාකම,

යන මෙයින් ඒ ප්‍රාග්ධන වත්කමට බැහැර කිරීම මත 2002, අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ අයකරනු ලැබිය හැකි එකතු කළ අගය මත බද්දේ ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, ඒ විකුණුම් මිලෙහි හෝ වෙළෙඳපල වටිනාකමෙහි ඇතුළත් කර තිබුණේ නම් ඒ බද්දේ ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, ඒ විකුණුම් මිලෙන් හෝ වෙළෙඳපල වටිනාකමෙහි අගයෙන් අඩු කිරීමෙන් පසු ලැබෙන මුදල අදහස් වේ;

(ඈ) යම් තැනැත්තකු විසින් යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමට අදාළ ව, "බැහැර කිරීම" යන්නට—

(i) ඒ තැනැත්තා විසින් ඒ වත්කම විකිණීම, හුවමාරු කිරීම හෝ කවර වූ වෙනත් ආකාරයකින් පැවරීම ද ;

(ii) එම තැනැත්තා විසින් එම වත්කම ඉවතලීම ද ;

(iii) එම තැනැත්තා විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද, ලාභ සහ ආදායම නිශ්චය කිරීමේදී ක්ෂයවීම සඳහා දීමනාවක් අඩු කළ හැකි වන්නා වූ ද, යම් ව්‍යවසායක, එම වත්කම පාවිච්චි කිරීම ඒ තැනැත්තා විසින් නතර කිරීම ද,

ඇතුළත් වේ ;

(ඉ) "සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ල" යන්නෙන්, වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක සේවයෙහි නියුක්ත විධායක නිලධරයකු විසින් පදිංචි නිවාසයක් ලෙස පාවිච්චියට ගනු ලබන්නක් නොවන, එම වෙළඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි කාර්යයන් සඳහා පාවිච්චියට ගැනීම පිණිස ඉදිකරන ලද, ගොඩනැගිල්ලක් අදහස් වේ ;

(ඊ) (i) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පාවිච්චි කරනු ලැබුවා වූ ද, ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කරනු ලැබුවා වූ ද, යම් ප්‍රාග්ධන වත්කමක් එම තැනැත්තා විසින් විකුණනු ලබන්නා වූ ද එම තැනැත්තා විකිණීමෙන් ලත් මුළු මුදල් විකිණීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත එම වෙළඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ පාවිච්චි කරනු ලැබීමට යම් අලුත් ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම උදෙසා යොදා ගනු ලැබූ විට, එසේ අත්කර ගැනීමේ සැබෑ පිරිවැය සහ විකුණනු ලැබුවා වූ වත්කම් විකිණීමෙන් ලබන ලාභ අතර වෙනස ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ අනුඡේදයේ කාර්ය සඳහා යම් ප්‍රාග්ධන වත්කමකට අදාළව විකිණීමෙන් ලබන ලාභ, යනු-

(අ) ඒ වත්කම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, අත්කර ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීමේ පිරිවැය ; සහ

(ආ) ඒ ප්‍රාග්ධන වත්කම සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද ක්ෂයවීම සඳහා වූ සම්පූර්ණ දීමනාව,

අතර වෙනස ඉක්මවන, ඒ වත්කම විකිණීමෙන් ලත් මුදලෙහි අතිරික්තය විය යුතු ය ;

(ii) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක,

වෘත්තියක හෝ රක්ෂාවක පාවිච්චි කිරීම සඳහා ඒ තැනැත්තා විසින් මිලට ගැනීමෙන් නොවන වෙනත් ආකාරයකින් යම් පිරියතක්, යන්ත්‍රයක්, හෝ සවිකිරීම්, අත්කර ගනු ලබන අවස්ථාවක, ඒ පිරියත, යන්ත්‍රය හෝ සවිකිරීම් අත්කර ගැනීමේ පිරිවැය ඒ අත්කර ගැනීමේ දිනයෙහි ඒ පිරියතෙහි, යන්ත්‍රයෙහි හෝ සවිකිරීම්වල වෙළෙඳපොළ වටිනාකම විය යුතු ය ;

(iii) තනිවම හෝ වෙනත් අය සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් පුද්ගලයකු විසින් කරගෙන යන ව්‍යාපාරයක් (ප්‍රාග්ධන වත්කම්ද ඇතුළුව) පවරාගනු ලැබීම පිණිස සංස්ථාපිත සමාගමක් විසින්, ඒ පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යන එම ව්‍යාපාරයේ ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගත් විටක දී එසේ අත්කර ගත් එක් එක් ප්‍රාග්ධන වත්කමෙහි පිරිවැය, ඒ පුද්ගලයාට හෝ හවුල් ව්‍යාපාරයට එම වත්කම සම්බන්ධයෙන් ක්ෂයවීම සඳහා ප්‍රදානය කරනු ලැබූ දීමනාවක් මුදලින් අඩු කරනු ලැබූ මුදල ඒ පුද්ගලයා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් ඒ ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ පිරිවැය ලෙස, සලකනු ලැබිය යුතු ය. තව ද, එම සමාගම විසින් එම ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීමේ දිනය ඒ පුද්ගලයා විසින්, හෝ හවුල් ව්‍යාපාරය විසින් ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය ;

(iv) යම් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීමට හෝ ඉදිකිරීමට හෝ අදාළව ගෙවන ලද යෙදවුම් බද්ද සඳහා බැර ඉල්ලා සිටීම පිණිස 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ යම් තැනැත්තකුට හිමිකම තිබෙන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැයෙහි හෝ ඉදිකිරීමේ පිරිවැයෙහි ඒ යෙදවුම් බද්ද ඇතුළත් කරනු නොලැබිය යුතු ය ;

(v) කල්බදු තොගවල කොටසක් වශයෙන් කල්බදු ව්‍යාපාරයේ දී භාවිත කරනු ලබන යම් වත්කමක් කල්බදු ස්කන්ධයෙන් පිටතට හෝ එම වත්කමෙහි ගැණුම්කරු වෙත මාරු කිරීම මගින්, එම වත්කම බැහැර කරනු ලබන අවස්ථාවක, එම බදු ගිවිසුම යටතේ අදාළ ගැණුම්කරුගෙන් ලැබිය යුතු සියළුම මුදල්, එම ව්‍යාපාරයෙන් ලැබුණ ලාභ සහ ආදායම ගණනය කිරීමේදී බදු අයකළ හැකි ලැබීම් ලෙස සලකනු

ලැබිය හැකි බවට තක්සේරුකරු සෑහීමට පත්වන පරිදි එම බදු දීමනාකරු විසින් ඔප්පු කරන්නේ නම් මිස, එම වත්කම එසේ මාරු කරනු ලබන අවස්ථාවේදී එහි වෙළෙඳපොළ වටිනාකම බදු දීමනාකරුගේ වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් ලැබුන දෙයක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(vi) යම් තැනැත්තකු බදු ගිවිසුමක් යටතේ යම් වත්කමක් ලබාගෙන අදාළ කල්බදු වාරික යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවක වියදම් වශයෙන් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් වශයෙන් පෙන්වීමට ඉඩ දී ඇති අවස්ථාවක, එම තැනැත්තා විසින් එම වත්කම මත ගෙවන ලද කල්බදු වාරික හැර එම වත්කම බැහැර කිරීමෙන් ලැබෙන මුදල, එම බදු ගැනුම්කරුගේ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රැකියාවෙන් ලැබුණ මුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(vii) තමා විසින් වෙළෙඳාමක දී ව්‍යාපාරයක දී, වෘත්තියක දී හෝ රැකියාවක දී භාවිත කළ යම් වත්කමක් යම් බදු ගැනුම්කරුවකු විසින් අත්කරගෙන ඇති අවස්ථාවක බදු ගිවිසුම අවසාන වීමෙන් අනතුරුව, එම අත්කර ගැනීම මේ වගන්තිය යටතේ යම් ක්ෂයවීමේ දීමනාවක් ලැබීමට සුදුසුකම් ලබන අත්කර ගැනීමක් ලෙස සලකනු නොලැබිය යුතු අතර, එම බදු ගිවිසුම යටතේ එම බදු ගැනුම්කරු විසින් එම වත්කම් ප්‍රාග්ධන, වටිනාකම ආපසු ගෙවීමේ ප්‍රමාණයට එම බදු ගැනුම්කරු වෙත ක්ෂයවීම සඳහා මුදල් ප්‍රදානය කර ඇති වත්කමක් ලෙස, එම වත්කම සලකනු ලැබිය යුතු ය.

**26**. (1) යම් ප්‍රභවයකින් යම් තැනැත්තකු ලබන ලාබ හෝ ආදායම නිශ්චය කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් දෑ වෙනුවෙන් අඩු කිරීමකට ඉඩ නොදිය යුතු ය :—

ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී ඉඩ නොදිය යුතු අඩුකිරීම්.

(අ) එම තැනැත්තාගේ වාසස්ථානය සහ ඔහුගේ ව්‍යාපාරික හෝ සේවා නියුක්ති ස්ථානය අතර ගමන් කිරීමේ වියදම් ඇතුළුව ගෙදර දොර සහ පෞද්ගලික වියදම් ;

(ආ) 25 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඉ) සහ (උ) යන ඡේදවල සඳහන් වියදම් නොවන, සිය සේවා නියුක්තියට අදාළව දරන ලද වියදම් ;

(ඈ) ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකට, (ඈ) ඡේදයේ සඳහන් ව්‍යාපාරයක් නොවන, යම් ව්‍යාපාරයකට, වෘත්තියකට, හෝ රක්ෂාවකට අදාළව, හුදෙක්ම —

(i) යම් භාණ්ඩයක හෝ බඩුවක අපනයන වෙළෙඳාම නංවාලීම ; හෝ

(ii) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම සඳහා යම් සේවාවන් සැපයීම,

සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන්වල දී දරන ලද වියදම් නොවන, ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම් ;

(ඈ) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ලංකා සංචාරක මණ්ඩලය අනුමත කළ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම් හැර, සංචාරකයන් සඳහා යම් හෝටලයක් ක්‍රියාත්මක කිරීමේ ව්‍යවසායක යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී කරන ලද යම් වියදමක් ;

(ඉ) ඒ තැනැත්තා විසින් පවත්වාගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් වෙළඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට අදාළව ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සේවා නියුක්තයකු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ දරන ලද සංග්‍රහ වියදම් ;

(ඊ) ඒ තැනැත්තා විසින් ඔහුගේ විධායක නිලධරයාට ගෙවනු ලබන සංග්‍රහ දීමනාව ;

(උ) ඒ ලාභ හෝ ආදායම් නිපදවීමේ කාර්යය සඳහා වියදම් කරන ලද මුදලක් නොවන ඒ තැනැත්තාගේ වියපැහැදම් හෝ ගෙවීම ;

(ඌ) ඒ තැනැත්තා විසින් දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ යම් වියදමක් නැතහොත් ප්‍රාග්ධන නැතිවීයාමක් ;

(එ) ඒ තැනැත්තා විසින් කරන ලද යම් වැඩිදියුණු කිරීම්වල වියදම ;

(ඒ) රක්ෂණ හෝ හානි පූර්ණ රක්ෂණ ගිවිසුමක් යටතේ ලැබුණු මුදල 1979 අංක 28 දරන පනතේ 89 වන වගන්තිය යටතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 95 වන වගන්තිය යටතේ හෝ මේ පනතේ 100 වන වගන්තිය යටතේ එම වෙළඳාමෙන් ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හො රැකියාවෙන් ලැබුණ ලැබීමක් ලෙස සලකනු නොලැබේ නම් එවැනි ගිවිසුමක් යටතේ අයකර ගත හැකි යම් මුදලක් ;

(ඔ) ඒ ලාභ සහ ආදායම නිපදවීමේ කාර්යය සඳහා පදිංචියට නොගන්නා ලද හෝ පරිහරණය නොකරන ලද යම් ස්ථානයක් හෝ ස්ථානයක කොටසක් සම්බන්ධයෙන් වූ කුලිය හෝ වියදම ;

(ඕ) එම තැනැත්තා විසින්—

(i) ද්විත්ව බදු ගෙවීම් වැළැක්වීම පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇතිකර ගනු ලැබූ ගිවිසුමක් වලංගුව ඇති යම් රටක ආදායම් බද්ද, අති බද්ද, අධි බද්ද හෝ ඒ බදුවලට සමාන ස්වභාවයක යම් බද්දක් (97 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි ශ්‍රී ලංකාවේ ආදායම් බද්ද සම්බන්දයෙන් බැර කිරීමට ඉඩ හරිනු ලැබූ උපරිම මුදල ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද, ඒ ප්‍රමාණය හැර) එසේ ද්විත්ව බදු ගෙවීම වැළැක්විම පිණිස ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඇතිකර ගනු ලැබූ ගිවිසුම වලංගුව ඇති ඒ රටේ ආදායම් බද්ද හෝ අති බද්ද හෝ අධි බද්ද හෝ ඒ බදුවලට සමාන ස්වභාවයක බද්දක් වශයෙන් ; හෝ

(ii) ශ්‍රී ලංකාවේ ආදායම් බද්ද ; හෝ

(iii) යම් නියමිත බද්දක් හෝ අයකිරීමක් ; සහ

(iv) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත යටතේ අයකරන ලද යම් ආර්ථික සේවා ගාස්තුවක් ;

(v) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ IIIඅ පරිච්ඡේදය යටතේ අයකරනු ලැබූ මූල්‍ය සේවා මත වූ එකතු කළ අගය මත බද්දක් ;

(vi) 2005 අංක 5 දරන මුදල් පනතේ පළමුවන උපලේඛනයේ iv වන අයිතමය යටතේ අයකරනු ලැබූ යම් සමාජ වගකීමේ බද්දක් ,

වශයෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක්.

මේ ඡේදයෙහි කාර්ය සඳහා බද්දක් හෝ අයකිරීමක් නියම කරන යම් නියෝගයක්, එම නියෝගය කරනු ලැබූ දිනයට පූර්වයෙන් වූ දිනයක සිට ක්‍රියාත්මක විය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය හැකි ය ;

(ක) එම තැනැත්තා විසින් ගෙවන ලද යම් වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ රාජ්‍ය භාගයක් ;

(ග) 25 වගන්තියේ (1) වන උපවගන්තියෙහි (උ) ඡේදය යටතේ ඉඩ දෙන ලද ගෙවීම් නොවන යම් විශ්‍රාම වැටුපකට, අර්ථසාධක අරමුදලකට, ඉතිරි කිරීමකට, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපකට හෝ වෙනත් සමිතියට හෝ අරමුදලකට එම තැනැත්තා විසින් කරන ලද ගෙවීම ;

(ච) යම් තැනැත්තකුගේ සේවා නියුක්තයකුට හෝ ඒ සේවා නියුක්තයාගේ කාලත්‍රයාට, දරුවකුට හෝ මවුපියන්ගෙන් කෙනකුට යම් වාසස්ථානයක් සැලසීමෙහිලා ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, 4 වන වගන්තියේ අර්ථානුකූලව ඒ සේවා නියුක්තයාගේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභවල ඇතුළත් වන්නා වූ වාසස්ථානයේ කුලී වටිනාකම ඉක්මවන අවස්ථාවක —

(i) 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡෙදය යටතේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ වසරකට රුපියල් හය ලක්ෂයකට නොඅඩු යම් සේවා නියුක්තයකුට අදාළව දරන ලද යම් වියදමක අතිරික්තයකින් දෙකෙන් එක් කොටසක් ; සහ

(ii) 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ සේවානියුක්තියෙන් ලැබෙන ලාභ වසරකට රුපියල් හය ලක්ෂයකට වැඩි යම් සේවා නියුක්තයකුට අදාළව දරන ලද යම් වියදමක අතිරික්තයකින් හතරෙන් තුනක් .

මේ ඡේදයේ කාර්යය සඳහා "වියදම" යන්නට සේවා යෝජකයා විසින් දරනු ලැබුවා වූ ද, කුලිය, බදු කුලිය, වරිපනම්, අළුත්වැඩියා කිරීම්, පවත්වාගෙන යාමට හෝ එම වාසස්ථානයට කෙලින්ම හෝ විශේෂයෙන් අදාළ වන වෙනත් වියදම් ද ඇතුළත් වේ ;

(ජ) (i) යම් ගිවිසුමක් යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් පහෙන් එකකට සමාන වූ මුදලක් ඉක්මවන්නා වූ ද 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් අමතර කොටස් සහ පරිගණක මෘදුකාංග ඇතුළු තොරතුරු තාක්ෂණ උපකරණ සහ ගණන් බැලීමේ උපකරණ හැර, යම් මෝටර් රථ, ගෘහභාණ්ඩ, පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ; සහ

(ii) යම් ගිවිසුමක් යටතේ ගෙවිය යුතු සම්පූර්ණ බදු කුලියෙන් හතරෙන් එකකට සමාන වූ මුදලක් ඉක්මවන්නා වූ ද, 25 වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන්, අමතර කොටස් සහ පරිඝනක මෘදුකාංග ඇතුළුව තොරතුරු තාක්ෂණ උපකරණ සහ ගණන් සෑදීමේ උපකරණ

සම්බන්ධයෙන් ඔහු විසින් ඇතුළත් වූ මූල්‍ය බදු කුලී ගිවිසුමක් යටතේ ගෙවන ලද බදු කුලියේ කොටස ;

(ට) 35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් මුදලක් ගෙවීම සඳහා යම් සංචිතයකට හෝ ප්‍රතිපාදනයකට පවරන ලද 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ච) ඡේදයෙහි සඳහන් යම් වාර්ෂික ගෙවීමක් නොවන) යම් මුදලක් ;

(ඩ) අවදානම් ප්‍රාග්ධන සමාගමක්, යම් ඒකක භාරයක් හෝ යම් අන්‍යොන්‍ය අරමුදලක් නොවන්නා වූ ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කළමනාකරණය සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් ඒ තැනැත්තා විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු යම් මුදලක කොටසක් වන-

(i) රුපියල් දසලක්ෂයක්, හෝ ලාභ සහ ආදායම නිශ්චය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ

කාලසීමාව තුළ එම වෙළඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලබන පිරිවැටුමෙන් සියයට එකක් යන දෙකකින් කවර හෝ අඩු මුදල ; හෝ

(ii) ඒ ප්‍රතිෂ්ඨාව වශයෙන් සියලු අවස්ථාගත කරුණු කෙරෙහි සැලකිල්ල ඇතිව සාධාරණ සහ වාණිජ වශයෙන් යුක්තිසහගත යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන යම් මුදලක්

යන දෙකින් කවර හෝ වැඩි මුදල සම්බන්ධයෙන් .

මේ ඡේදයේ කාර්ය සඳහා යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සහ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් "පිරිවැටුම" යන යෙදුමෙන්, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණ හෝ ලැබිය යුතු යම් මුදලක් හැර, ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යාමෙහිලා හෝ ක්‍රියාත්මක කිරීමෙහිලා ඒ කාලසීමාව තුළ ඇතුළත් වූ ගනුදෙනුවලින් හෝ ඉටුකරන ලද සේවාවක් සඳහා හෝ ලැබුණු හෝ ලැබිය යුතු මුළු මුදල අදහස් වේ ;

(ණ) යම් සේවා නියුක්තියකුගේ නිවසේ දී භාවිත කිරීම සඳහා යම් තැනැත්තකු විසින් එම සේවා නියුක්තයාට සපයන ලද යම් වත්කමකට අදාළ යම් වියදමක් හෝ පිටයාමක් ;

(ත) එම තැනැත්තා විසින් දේපළ දෙන ලද අවස්ථාවේ එහි වෙළෙඳපොළ වටිනාකමට වඩා අඩු මිලකට, යම් සේවා නියුක්තයකුට දෙන ලද චංචල හෝ නිශ්චල දේපළකට අදාළ යම් වියදමක් හෝ පිටයාමක් ;

(ද) යම් තැනැත්තකු විසින් යම් සේවා නියුක්තයකුට ප්‍රදානය කරනු ලැබුවා වූ ද, අයකර ගත නොහැකි ණයක් ලෙස පසුව අත්හැර දමනු ලැබුවා වූ ද ණයකට, වෙනත්, අත්තිකාරමකට හෝ වෙනත් ණයකට අදාල වියදමක් හෝ පිටයාමක් ;

(න) යම් භාණ්ඩ හෝ බඩුවල අපනයන වෙළෙඳාමට අදාළව පමණක් හෝ විදේශ විනිමයවලින් මුදල් ගෙවීම සඳහා වූ යම් සේවයක් සැලසීමට අදාළව පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත දී

දරන ලද වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වූ වියදම් හැර, එම තැනැත්තා විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට අදාළව එම තැනැත්තාගේ වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් ගාස්තුවලින් හරි අඩක් ;

(ප) ලාභය සහ ආදායම සම්බන්ධයෙන් අනේවාසික සමාගමක, යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලැබුණ ව්‍යවස්ථාපිත ආදායම ගණන් බලනු ලැබූ යම් කාලසීමාවකදී දරන ලද ප්‍රධාන කාර්යාල වියදම්වල ස්වභාවයෙන් යුක්ත වූ වියදම් වන, එම සමාගම විසින් ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද යම් වෙළෙඳාමකදී හෝ ව්‍යාපාරයක දී දරන ලද යම් වියදමක්.

මේ ඡේදයේ කාර්යය සඳහා "ප්‍රධාන කාර්යාල වියදම්" යන යෙදුමට මේ පනතේ 27 වගන්තියේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

(බ) යම් පාලක සමාගමක, (මෙහි මින් මතු 'පළමුව සඳහන් පාලිත සමාගම' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් පාලිත සමාගමක් විසින් එම පාලක සමාගමෙන් හෝ (මෙහි මින්මතු 'දෙවනුව සඳහන් පාලිත සමාගම හෝ පාලිත සමාගම්' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් පාලිත සමාගමකින් හෝ පාලිත සමාගම්වලින් ලබාගත් යම් ණයක් සම්බන්ධයෙන්, යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු වන පොලිය, පළමුව සඳහන් කල පාලිත සමාගම නිෂ්පාදකයකු වන අවස්ථාවක, එම තක්සේරු වර්ෂය අවසානයේ දී, පළමුව සඳහන් කළ පාලිත සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල එකතුවේ තුන් ගුනයකට සමාන එකී ණය මුදලෙහි යම් කොටසකට අනුරූප වන පොලිය ඉක්මවන විට, එම පොළියෙහි අතිරික්තය:

එසේ වුව ද පළමුව සඳහන් පාලිත සමාගම නිෂ්පාදකයකු නොවන අවස්ථාවක, "නිකුත් කල කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල එකතුවේ තුන් ගුනයකට සමාන" යන වචනවලට ඒ ඡේදයේ වූ සඳහන වෙනුවට "නිකුත් කල කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල එකතුවේ හතර ගුනයකට සමාන" යන වචනවලට වූ සඳහනක් ලෙස ආදේශ කරනු ලැබූ ලෙසින් අදාල විය යුතු ය.

මේ ඡේදයේ-

(i) "පාලිත සමාගම්" සහ "පාලක සමාගම්" යන යෙදුම්වල දී, 1982 අංක 17 දරන සමාගම් පනතින් ඒවාට දී ඇති එම අදාල අර්ථය ම තිබිය යුතු ය ;

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පාලිත සමාගමක් පිරිවැටුමෙන් සියයට පනහකට වඩා වැඩි ප්‍රමාණයක් එම පාලිත සමාගමේ නිෂ්පාදන විකිණීමෙන් ලැබුණේ නම්, එම තක්සේරු වර්ෂයට අදාළව, පළමුව සඳහන් පාලිත සමාගම "නිෂ්පාදකයකු" ලෙස සලකනු ලැබිය යුතු ය ;

(iii) "සංචිත" යන්නට කිසියම් වත්කමක් නැවත තක්සේරු කිරීමෙන් උද්ගත වන සංචිත ඇතුලත් නොවේ ; සහ

(iv) "පිරිවැටුම" පාලිත සමාගමක යම් තක්සේරු වර්ෂයකට අදාලව, ඒ පාලිත සමාගම විසින් නිෂ්පාදනය කරන ලද නිෂ්පාදනවලින් ඒ තක්සේරු වර්ෂය තුල කරන ලද සෑම විකිණීමකින්ම :—

(අ) (i) යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමකදී ලත් මුළුමුදල, ඇතුළත් කරන ලද යම් මුදල් ප්‍රමාණයක් ;

(ii) පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක දී, හෝ ඒ තක්සේරු වර්ෂයේ දී සමාගමක අදාල පිරිවැටුමට ඇතුලත් කරනු ලැබ ඇත්තාවූ මුදලක් ලෙස ඒ තක්සේරු වර්ෂය තුලදී දරන ලද යම් බොල්ණය ප්‍රමානයක්, සහ

(iii) එකතු කල අගය මත වූ බදු නියෝජනය කරන මුදලක් ලෙසින් යම් මුළු මුදල් ප්‍රමාණයක ඇතුලත් කරන ලද යම් මුදලක් , සහ

අඩු කිරීමෙන් පසුව ; සහ

(ආ) යම් පෙරාතුව වූ වර්ෂයක දී බොල්ණය කපා හැරීම හෝ අත් හැරීමේ හේතුව මත ඒ තක්සේරු වර්ෂය තුළ ලැබුනු යම් මුදලක් එයට එකතු කිරීමෙන් පසුව, සත්‍ය ලෙස ලබාගත් හෝ ලබා නොගත්තා වූ ද, ලැබිය හැකි වූ ද, මුළු ප්‍රමාණය අදහස් වේ.

(2) (අ) (i) යම් තැනැත්තකුගේ සේවයෙහි නියුක්ත විධායක නිලධරයකු නොවන නිලධරයකු විසින් , තත් කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් ; සහ

(ii) යම් තැනැත්තකුගේ සේවා නියුක්තයන් ඔවුන් වැඩ කරන ස්ථානයේ සිට හෝ එම ස්ථානයට, ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන මෝටර් කෝච් රථයක්,

සම්බන්ධයෙන් හැර, තම වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ කාර්යය සඳහා ගමන් කිරීම පිණිස පාවිච්චි කරනු ලබන යම් වාහනයක් සම්බන්ධයෙන්, යම් තක්සේරු වර්ෂයක් සඳහා ; සහ

(ආ) යම් තැනැත්තකුගේ, නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ වාසස්ථානයෙහි ඒ නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ පාවිච්චිය සඳහා සපයනු ලැබූ යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම්, උපකරණ හෝ භාණ්ඩ සම්බන්ධයෙන්,

වැහැරීම සහ ගෙවීයාම නිසා ක්ෂවීම සඳහා හෝ එය අලුත් කිරීම සඳහා යම් මුදලකට හෝ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (ඈ) ඡේදය යටතේ යම් දීමනාවකට හෝ (අ) සහ (ආ) ඡේදවල සඳහන් එවැනි යම් වාහන, පිරියත, යන්ත්‍ර, සවිකිරීම්, උපකරණ හෝ දේවල් සම්බන්ධයෙන් යම් කුලියක් හෝ වාර්ෂික ගෙවීමක් සඳහා යම් අඩු කිරීමකට, යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක්, රක්ෂාවක් පවත්වා ගෙන යන්නා වූ හෝ කරගෙන යන්නා වූ කිසිම තැනැත්තකුට හිමිකම නොතිබිය යුතු ය.

(3) ඉඩමක සහ එහි වැඩි දියුණු කිරීම්වල වාර්ෂික වටිනාකමින් හෝ කුලියෙන් ඇති වන ලාභ හෝ ආදායම නිශ්චය කිරීමේ දී, ස්ථාන කුලියට දීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන සමාගමක් සම්බන්ධයෙන් හැර, අවස්ථාවෝචිත පරිදි, 5 වන වගන්තියෙහි හෝ 6 වන වගන්තියෙහි අවසර දී ඇති පිටත යාම් සහ වියදම් සඳහා මිස. පිටත යාම් සහ වියදම් සම්බන්ධයෙන් අඩු කිරීම, නොකළ යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ඒ තැනැත්තා ලබන ව්‍යවස්ථාපිත ආදායම ආගණනය

කිරීමේ දී, යම් වියදමක් ඒ වියදම දරනු ලැබූ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත ගෙවනු ලැබුවහොත් මිස, ඒ කිසි වියදමක් වෙනුවෙන් **25** වන වගන්තිය හෝ මෙම වගන්තිය හෝ **27** වන වගන්තිය යටතේ අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, එකී අවුරුදු තුනක කාලයක් ඉකුත්වීමෙන් පසුව ද ඒ වියදමේ සමස්තය හෝ ඒ වියදමේ යම් කොටසක් නොගෙවා ඉතිරි ව තිබෙන අවස්ථාවක මේ පනතේ වෙනත් විධිවිධානවලට එරෙහිව කුමක් සඳහන් වුව ද, එසේ අඩුකරන ලද සමස්තය හෝ ඒ කොටස අඩු කරමින් ඕනෑම අවස්ථාවක තක්සේරුවක් කළ හැකි වන්නේ ය.

යම් අනේවාසික සමාගමක් විසින් දරනු ලබන ප්‍රධාන කාර්යාල වියදම් අඩු කිරීම.

**27**. (1) ශ්‍රී ලංකාවේ යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් අනේවාසික සමාගමක් විසින් ප්‍රධාන කාර්යාල වියදම් වශයෙන් යම් වියදමක් දරනු ලබන අවස්ථාවක දී-

(අ) එම වියදම් ප්‍රමාණයට ; හෝ

(ආ) සමාගමේ ලාභයෙන් හෝ ආදායමෙන් සියයට දහයකට සමාන මුදලට හෝ,

යන දෙකින් වඩා අඩු මුදලකට සමාන මුදලක්, එම වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ ලාභවලින් සහ ආදායමින් අඩු කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා අනේවාසික සමාගමක් සම්බන්ධයෙන් සහ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට "ප්‍රධාන කාර්යාල වියදම්" යන්නෙන්-

(අ) එම සමාගමේ ශ්‍රී ලංකාවෙන් පිටත යම් කාර්යාලයක සේවයේ නියුක්ත හෝ සමාගමේ කටයුතු කලමනාකරණය කරන සෑම සේවා නියුක්තයකුගේ ම සහ සේවයේ නියුක්ත වෙනත් සෑම තැනැත්තකුගේ ම, සේවා නියුක්තියෙන් ලැබෙන සම්පූර්ණ ලාභවල මුලු එකතුව හා එම සේවා නියුක්තයන්ගේ සහ තැනැත්තන්ගේ මුළු ගමන් වියදම් සංයුක්ත වන්නා වූ ; සහ

(ආ) (i) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් ; සහ

(ii) සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී සලකා බැලීම සාධාරණ බවට සහ වානිජ වශයෙන් යුක්ති

සහගත බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි විධායක සහ සාමාන්‍ය පරිපාලන කටයුතුවලට සම්බන්ධ වෙනත් සියලු කාරණා,

ඇතුළත් වූ, එම සමාගම විසින් හෝ සමාගම වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද විධායක හා සාමාන්‍ය පරිපාලන වියදම් අදහස් වේ.

V වන පරිච්ඡේදය

## මුළු ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කිරීම

**28**. (1) සෑම තැනැත්තකුගේ ම බදු නියම කල යුතු සෑම ලාභ සහ ආදායම් ප්‍රභවයකින් ම එක් එක් තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම, ඒ ලාභ හෝ ආදායම් ප්‍රභවවල සන්තකය ඔහුට නැතිව ගිය ද, නැතහොත් ඒ ප්‍රභවවලින් ආදායම ලැබීම නතර වුවද එය නොතකා ඒ තක්සේරු වර්ෂය තුළ දී ඒ ප්‍රභවවලින් ඔහු විසින් ලබන ලද්දා වූ හෝ ඔහුගේ ප්‍රයෝජනයට ඇති වූ නැතහොත් උපචිත වූ ලාභවල හෝ ආදායමෙහි මුළු මුදල විය යුතු ය.

ව්‍යවස්ථාපිත ආදායම ආගනණය කිරීමේ පදනම.

(2) යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් වූ ගිණුම්, විධානයෙහි නිශ්චිත වශයෙන් නියම කරනු ලබන යම් කාලසීමාවක් සඳහා සකස් කල යුතු බවට මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් විධාන කරනු ලබන අවස්ථාවක යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ප්‍රභවයෙන් උද්ගත වන ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂය තුල දී අවසන් වන කාලසීමාවේ ලාභවල මුදල් ප්‍රමාණය මත ආගනණය කළ යුතු බවට ඔහු විසින් වැඩිදුරටත් විධාන කලහැකි ය.එසේ වුව ද වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් යම් තැනැත්තකුගේ ව්‍යවස්ථාපිත ආදායම යම් නිශ්චිත කාල සීමාවක් සඳහා ලද ගිණුමකට යොමු කිරීමෙන් ආගණනය කරනු ලැබ ඇත්තා වූ සහ ඉන් අනතුරුව එළඹෙන වර්ෂයේ ද අනුරූප කාලසීමාව සඳහා ගිණුමක් සෑදීමට ඒ තැනැත්තා පැහැර හරින අවස්ථාවක, ඒ පැහැර හැරීම සිදු වූයේ, යම් තක්සේරු වර්ෂයක් සඳහා ද එම තක්සේරු වර්ෂය සහ ඉන් අනතුරුව එළඹෙන තක්සේරු වර්ෂ දෙක යන අවස්ථා දෙකම සඳහා ඒ ප්‍රභවයෙන් උද්ගත වූ, ව්‍යවස්ථාපිත ආදායම, විෂය සම්බන්ධයෙන් වූ අවස්ථාගත කරුණු අනුව, සාධාරණ සහ යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන යම් පදනමක් මත ආගනණය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙන ලද විධානයක් කවර හෝ අවස්ථාවක දී වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය:

එසේම තවදුරටත් එවැනි යම් විධානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් වෙනස් කරනු ලැබ ඇත්තා වූ හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, ඒ විධානය දෙනු ලැබුවේ යම් ප්‍රභවයක් සම්බන්ධයෙන් ද, ඒ ප්‍රභවයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට ගිණුම් සාදනු ලැබූ ලෙසට ආගනණය කරනු ලැබිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය.

(3) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වාගෙන යන හෝ කරගෙන යන සෑම තැනැත්තකු විසින් ම (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව එක් එක් වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනයෙහි අවසන් වන එක් එක් අනුපූර්ව මාස දොළහක කාලසීමාව සඳහා ඒ වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් පිළියෙල කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද යම් තැනැත්තකු-

(අ) වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වාගෙන යාම හෝ කරගෙන යාම යම් තක්සේරු වර්ෂයක් තුළ දී ආරම්භ කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් එම වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව ආරම්භ කල දිනෙන් ආරම්භව එම තක්සේරු වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා එම වෙළෙදාමෙහි, ව්‍යාපාරයෙහි වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් පිළියෙල කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වාගෙන යාම හෝ කරගෙන යෑම යම් තක්සේරු වර්ෂයක් තුළ දී අවසාන කරනු ලබන අවස්ථාවක, එම තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස පළමුවන දිනයෙන් ආරම්භව එසේ අවසාන කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා එම තැනැත්තා විසින් එම වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව කටයුතු කිරීමට එම තැනැත්තාට නොහැකි වන අවස්ථාවක, එම විධිවිධානවලට අනුව කටයුතු කිරීමට තමාට නොහැකි වීම පිළිබඳ හේතු දක්වමින් එම තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කල යුතු ය. එම දැන්වීමෙහි දක්වා ඇති හේතු පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වුවහොත් ඔහු විසින් විධානයක් කිරීමෙන් ඒ විධානයෙහි නිශ්චිත යම් කාලසීමාවක් සඳහා ඒ වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි නැතහොත් රක්ෂාවෙහි ගිණුම් පිළියෙල කරන ලෙස විධාන කළ හැකි අතර ඒ විධානය අනුව කටයුතු කිරීම ඒ තැනැත්තන්ගේ කාර්යය විය යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද යම් විධානයක්, ඕනෑම අවස්ථාවක දී ඔහු විසින් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.

**29**. යම් තක්සේරු වර්ෂයක් හෝ වෙනත් කාලසීමාවක් සඳහා යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක නැතහොත් සේවා නියුක්තියක ලාභ හෝ අලාභ නිශ්චය කරනු ලැබීම පිණිස ගිණුම් පිළියෙල කරනු ලැබූ යම් කාලසීමාවක් සඳහා ලාභ හෝ අලාභ නිශ්චිත කාලසීමාවකට බෙදීම හා බෙදා වෙන්කිරීම නැතහොත් එම ලාභ හෝ අලාභ හෝ ඒවායේ බෙදා වෙන් කරනු ලැබූ කොටස් හෝ එකතු කිරීම අවශ්‍ය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එලෙස බෙදීම සහ බෙදා වෙන් කිරීම හෝ එකතු කිරීම නීත්‍යානුකූල විය යුතු ය. ලාභ බෙදා වෙන්කිරීම.

ගිණුම් පිළියෙල කරනු ලැබූ යම් කාල සීමාවක් සඳහා ලාභ හෝ අලාභ බෙදා වෙන් කිරීම එම ලාභ හෝ අලාභ එම කාල සීමාව තුළ එක සමානව ලැබුණේ ය යන පදනම මත කළ යුතු ය.

**30**. යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම, බදු අය කරනු ලබන්නේ යම් ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ද ඒ සෑම ලාභ සහ ආදායම් ප්‍රභවයකින් ම, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමෙහි එකතුව විය යුතු ය. මුළු ව්‍යවස්ථාපිත ආදායම,

දරුවකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම ඔහුගේ දෙමව්පියකුගේ ආදායමට එකතු කල යුතු බව.

**31**. තක්සේරු වර්ෂයක් සඳහා වාසික පුද්ගලයකුගේ දරුවකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම-

(අ) ඔහුගේ දෙමාපියන්ගේ විවාහය තක්සේරු වර්ෂයේ දී පවතී නම් ඔහුගේ පියාගේ ; නැතහොත්

(ආ) ඔහුගේ දෙමාපියන්ගේ විවාහය ඒ තක්සේරු වර්ෂයේ දී නොපවති නම් ඔහු නඩත්තු කරන්නා වූ ද, ඔහු ජීවත්වන්නේ මව් පිය දෙදෙනාගෙන් යම් කෙනකු සමග ද, ඒ තැනැත්තා වන්නා වූ ද මවගේ හෝ පියාගේ,

මුළු ව්‍යවස්ථාපිත ආදායමට එකතු කළ යුතු අතර එය මවගේ හෝ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නිසි බලය ඇති අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ යථා පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් හෝ යටතේ භාර්යාව ඇයගේ ස්වාමි පුරුෂයාගෙන් වෙන්ව වාසය කරන්නේ නම් හෝ වෙන් වීම ස්ථිර වශයෙන්ම සිදු විය හැකි අවස්ථානුගත කරුණු සහිතව ස්වාමිපුරුෂයා සහ භාර්යාව ඇත්ත වශයෙන්ම වෙන්ව සිටිත් නම් මේ වගන්තියේ කාර්ය සඳහා විවාහය නොපවතින්නේ යයි සලකනු ලැබිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

## තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කිරීම

තක්සේරු කළ හැකි ආදායම ගණන් බැලීමේ දී මුළු ව්‍යවස්ථාපිත ආදායමින් කරනු ලබන අඩු කිරීම.

**32**. (1) (සමාගමක් නොවන) යම් තැනැත්තකු ගේ තක්සේරු කළ හැකි ආදායම ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

(අ) 133 වන වගන්තිය හෝ 135 වන වගන්තිය යටතේ ආදායම් බදු අඩු කරනු ලැබ තිබෙන, පොලීවලින් ලත් ව්‍යවස්ථාපිත ආදායම ;

(ආ) 65 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආදායම් බදු අඩු කරනු ලැබ තිබෙන, ලාභාංශ බෙදා දෙන සමාගමෙන් කෙළින්ම හෝ වෙනත් යම් සමාගමක් මගින් ලැබුණ ලාභාංශවලින් ලත් ව්‍යවස්ථාපිත ආදායම ; සහ

(ඇ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් මත හෝ (417 වන අධිකාරය වූ) භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් මත හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් මත සිදු වූ ද්විතීය වෙළෙඳපළ ගණුදෙනුවක් සම්බන්ධයෙන් යම් පුද්ගලයකුට උපදින හෝ උපචිත වන පොලියෙන් සහ ප්‍රාථමික වෙළෙන්දකුගෙන් 134 වන වගන්තිය යටතේ බදු අඩු කරනු ලැබූ පොළියෙන් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම,

හැර මේ වගන්තියේ සඳහන් අඩුකිරීම්වලට යටත්ව ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම විය යුතු ය :

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි 133 වන වගන්තියේ හෝ 65 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආදායම් බදු අඩු කරනු ලැබ පොලීවලින් හෝ ලාභාංශවලින් යම් තැනැත්තකු විසින් ලබාගන්නා ලද ආදායම යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමේ දී ඒ වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් ලත් ආදායමක් ලෙස ලබා ඇත්නම්, පොලියෙන් හෝ ලාභාංශවලින් ලත් ඒ ආදායම ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් විය යුතු ය :

එසේම තවදුරටත් (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ වූ යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් මත හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාන්ඩාගාර බිල්පතක් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පතක් පිළිබඳ යම් ප්‍රාථමික වෙළෙඳපළ ගනුදෙනුවකදී 134 වන වගන්තිය යටතේ බදු අඩු කරනු ලැබූ තිබෙන, සමාගමක් වන හෝ අන්‍යාකාර වූ ප්‍රාථමික අලෙවිකරුවකුට ලැබුණු හෝ උපචිත වූ පොලිය, අදාළ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා 3 වන වගන්තිය යටතේ යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් වූ ලැබීම ලෙස නොසැලකිය යුතු ය.

(2) යම් ප්‍රාථමික අලෙවිකරුවකුගේ තක්සේරු කළ හැකි ආදායමට ඔහු ලබා ඇති හෝ ඔහුට උපචිත වී ඇති පොලී ආදායම-

(අ) 134 වන වගන්තිය යටතේ, එම මුළු පොලී මුදලෙන් බදු අයකරගෙන ඇති අවස්ථාවක ; සහ

(ආ) එම පොලී ආදායම, අවස්ථාවෝචිත පරිදි 134 වන වගන්තියේ සඳහන් (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද සුරැකුම්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර හා සම්බන්ධ ප්‍රාථමික වෙළෙඳපල ගනුදෙනුවක් වෙනුවෙන් ඒ ප්‍රාථමික අලෙවිකරුට උපචිත වී හෝ උද්ගත වී ඇති අවස්ථාවක,

ඇතුළත් නොවිය යුතු ය.

මේ උප වගන්තියේ සහ (1) වන උපවගන්තියේ කාර්ය සඳහා—

"පොලී ආදායම" යන්නෙන් මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සුරැකුම්පතක් හෝ සාධන පත්‍රයක් නිකුත් කරන්නකු විසින් එම සුරැකුම් පත්‍රයේ හෝ වෙනත් සාධන පත්‍රයේ කල්පිරීමේ කාලසීමාවට අතිරික්තව එය දරන්නා විසින් එම සුරැකුම්පත හෝ වෙනත් සාධන පත්‍රය දරා සිටීමේ කාලසීමාවට අනුපාතිකව එම සුරැකුම්පත හෝ සාධන පත්‍රය නිකුත් කරන්නා විසින් ලබා දී ඇති පොලී හෝ වට්ටම් පිළිබඳ සමානුපාතික ප්‍රමාණයක් අදහස් වේ ;

"ප්‍රාථමික වෙළෙඳපොළ ගනුදෙනුව" යන්නෙන් (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් නැතහොත් (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් එම සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර මුලින් ම නිකුත් කරනු ලැබූ අවස්ථාවේ දී යම් වට්ටම් මුදලක් හෝ පොලී මුදලක් ගෙවීමට යටත්ව යම් ප්‍රාථමික වෙළෙන්දකු විසින් මිලදී ගැනීම අදහස් වේ ; සහ

"ද්විතීය වෙළෙඳපොළ ගනුදෙනුව" යන්නෙන් මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) අනුඡේදයේ සඳහන් යම් සුරැකුම්පතක් හෝ වෙනත් සාධන පත්‍ර අත්කර ගෙන ඇති යම් ප්‍රාථමික වෙළෙන්දකු විසින් ඒවා විකිණීම හෝ එම සුරැකුම්පත් මුලින් නිකුත් කිරීමෙන් පසුව හෝ ඒවා අත්කර ගැනීමේ දින සිට එක් දිනකට වැඩි කාලයක් සඳහා එම සුරැකුම්පත් හෝ සාධන පත්‍ර දැරීමෙන් පසු නැවත මිලදී ගැනීමෙන් හෝ ආපසු නැවත මිලදී ගැනීම අදහස් වේ.

(3) යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට –

(අ) යම් රාජ්‍ය ආයතනයකින්, XIX පරිච්ඡේදයට අනුකූලව ආදායම් බදු අඩුකරගෙන තිබෙන -

(i) තොරතුරු සපයන්නකු වශයෙන් තිළිණ ගෙවීමේ ක්‍රමයක් යටතේ ඒ තැනැත්තාට ලැබුණු යම් තෑගි මුදලක් ; හෝ

(ii) යම් දඩ මුදලක කොටසක් බෙදාහැරීම සඳහා වූ යෝජනා ක්‍රමයක් යටතේ ඒ තැනැත්තාට ලැබුණ දඩ මුදල් කොටසක් ; සහ

(ආ) 157 වන වගන්තිය යටතේ බදු අඩුකරගෙන තිබෙන යම් ලොතරැයි ත්‍යාගයකින් හෝ සූදු ක්‍රීඩාවෙන් හෝ ඔට්ටු ඇල්ලීමෙන් දිනා ගත් යම් මුදලක් ; සහ

(ඇ) 36 වන වගන්තිය යටතේ ආදායම් බදු අඩුකර ගනු ලැබුවා වූ ද රජයේ දෙපාර්තමේන්තුවක් හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත සතු කරන ලද යම් නිශ්චල හෝ චංචල දේපළ සම්බන්ධයෙන් ගෙවනු ලැබුවා වූ වන්දි මුදලක් මත ලැබුණ පොළිය,

ඇතුළත් කරනු නොලැබිය යුතු ය.

(4) (එම ඡේදයේ (xvii) අනුඡේදයේ සඳහන් යම් ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් හැර) 7 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට—

(අ) 133 වන වගන්තිය යටතේ බදු අඩු කරනු ලැබ ඇති යම් පොළියක් ; හෝ

(ආ) 65 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බදු අඩු කරනු ලැබ ඇති යම් ලාභාංශයක්,

ඇතුළත් නොවේ.

(5) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන්–

(අ) 25 වන වගන්තිය යටතේ අඩු කළ නොහැකි වූ පොලියක්, වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ රාජ්‍ය භාගයක් වශයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා එම තැනැත්තා විසින් ගෙවනු ලබන මුදල් මේ වගන්තියේ කාර්යය සඳහා, පොලිය යන්නට 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (X) වන ඡේදයේ සඳහන් අතිරික්තය ඇතුළත් නොවේ.

එසේ වුව ද –

(i) ඒ තැනැත්තාගේ නම, ශ්‍රී ලංකාවේ ලිපිනය සහ ආදායම් බදු ලිපිගොනුවක් (ඇත්නම්) එහි අංකය ඇතුළත් වන ගෙවීම සඳහා වූ වලංගු ලදුපතක්, මුදල ගෙවූ තැනැත්තා විසින් නිකුත් කර ඇති බවට හෝ ගෙවීම සිදු කිරීමට පෙර හෝ ගෙවීම සිදුකළ අවස්ථාවේදී මේ පනත යටතේ බදු අඩු කරනු ලැබ ඇති බවට තක්සේරුකරු සෑහීමට පත්වන්නේ නම් මිස, ගෙවන ලද යම් මුදලක් සම්බන්ධයෙන් කිසිදු අඩුකිරීමක් සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය ;

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ උපවගන්තිය යටතේ ගෙවනු ලබන සහ අඩු කළ හැකි යම් මුදලක් එම වර්ෂය සඳහා සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම ඉක්මවන අවස්ථාවක, මේ වගන්තියේ කාර්යය සඳහා එම අතිරික්තය එම වර්ෂය තුළ වෙළෙඳාමකින් සිදු වූ පාඩුවක් සඳහා ක්‍රියා කරන ආකාරයට සලකනු ලැබිය යුතු ය

(iii) එම තැනැත්තා විසින් වාර්ෂිකයක් ලෙස යම් මුදලක් ගෙවනු ලබන අවස්ථාවක එම වාර්ෂිකය ගෙවනු ලබන්නේ –

(අ) දික්කසාද දීමනා හෝ නඩත්තු ගෙවීමක් වශයෙන් අධිකරණයේ ආඥාවක් යටතේ නම් මිස ;

(ආ) යථා පරිදි ලියා අත්සන් කරන ලද කසාදයෙන් වෙන්වීමේ ඔප්පුවක් යටතේ තම කලත්‍රයාට නම් මිස ; හෝ

(ඇ) සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව මුදලින් හෝ මුදල් වටිනාකමින් ගෙවනු ලබන්නේ නම් මිස,

එම වාර්ෂිකය සම්බන්ධයෙන් කිසිදු අඩුකිරීමක් සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය ;

(iv) එම තැනැත්තා විසින් පොලී වශයෙන් යම් මුදලක් ගෙවනු ලබන අවස්ථාවක, එම පොලිය ගෙවනු ලබන්නේ යම් නෛතික හෝ ගිවිසුම් වගකීමක් යටතේ –

(අ) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති යම් බැංකුවකට හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් මූල්‍ය සමාගමකට ; හෝ

(ආ) මේ ඡේදයේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් පිළිගනු ලබන වෙනත් යම් තැනැත්තකුට,

නම් මිස, එම පොලිය සම්බන්ධයෙන් කිසිම අඩුකිරීමක් සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය :

එසේ වුවද එම පොලිය මෙම පනත යටතේ ආදායමක් ලෙස එම පොලිය ලැබූ තැනැත්තා ප්‍රකාශයට පත්කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වී ඇති අවස්ථාවක, එම තැනැත්තා පිළිගත් තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා "පොලිය" යන යෙදුමෙන් යම් ණය මුදලක් මත ගෙවනු ලබන හා එම මුදල් –

(i) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා හෝ මිලදී ගැනීම සඳහා හෝ නැතහොත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යම් ඉඩම් ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා ;

(ii) ඔහු විසින් පවත්වාගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවක යෙදවීම සඳහා ;

යොදවා ගනු ලබන පොලියක් අදහස් වේ ;

(ආ) මේ වගන්තිය යටතේ කලින් වර්ෂයෙන් ඉදිරියට ගෙන එනු ලැබුවා වූද, මේ වගන්තිය යටතේ කලින් අඩු කරනු නොලැබුවා වූ ද, යම් පාඩුවක සහ (අ) ඡේදයේ ඇති අතුරු විධානයේ (ii) වන ඡේදය යටතේ යම් උද්දේශීය පාඩුවක්ද ඇතුළුව, යම් ව්‍යාපාරයකින්, වෙළෙඳාමකින්, වෘත්තියකින් හෝ රැකියාවකින් ලාභදායක වූයේ නම් මේ පනත යටතේ තක්සේරු කළ හැකි වූ ද යම් තැනැත්තකු විසින් යම් ව්‍යාපාරයකින්, වෙළෙඳාමකින්, වෘත්තියකින් හෝ රැකියාවකින් දරන ලද පාඩුවේ ප්‍රමාණය, වෙළඳාමකින් (ප්‍රාග්ධන පාඩුවක් හැර) පාඩුවේ ප්‍රමාණය, එම තැනැත්තා විසින් අනුමත ගණකාධිකාරිවරයකු විසින් සහතික කරන ලද ගිණුම් ප්‍රකාශයකින් සනාථ කරන ලද, එම වර්ෂය සඳහා—

(i) (2) උපවගන්තියේ සඳහන් පොලියෙන් සහ ලාභාංශවලින් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම ;

(ii) (3) උපවගන්තියේ සඳහන් යම් පොලී ආදායමක් ; සහ

(iii) (4) උපවගන්තියේ සඳහන් යම් තෑගි මුදලක්, දඩයක කොටසක්, යම් ලොතරැයි දිනුමක සහ ගෙවිය යුතු වන්දි මුදලක් මත වූ පොලියක්,

හැර ඉතිරි සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමින් සියයට තිස්පහක උපරිම සීමාවක් දක්වා අඩුකර ගනු ලැබිය යුතු අතර, එසේ අඩුකර ගත නොහැකි යම් පාඩුවක් ඊළඟ තක්සේරු වර්ෂය සඳහා සහ ඉන් ඉදිරියටත් ගෙන යා හැකි ය :

එසේ වුව ද

(අ) මේ පනතේ 44 වන වගන්තියේ සඳහන් සමාගමක කොටස්, අයිතිවාසිකම් හෝ අධිකාර පත්‍ර බැහැර කිරීම මත සිදු වූ කිසිම පාඩුවක් මේ ඡේදය යටතේ අඩු කළ හැකි පාඩුවක් නොවිය යුතු ය ;

(ආ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, එම පුද්ගලයාගේ මරණය සිදු වූ තක්සේරු වර්ෂයෙන් ඔබ්බට හෝ සමාගමක් සම්බන්ධයෙන් වන විට හෝ වෙනත් මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ තැනැත්තා ඇවර කිරීම සිදුකෙරුණු තක්සේරු වර්ෂයෙන් ඔබ්බට, එම පාඩුව ඉදිරියට ගෙන යා නොහැකි විය යුතු ය ;

(ඇ) යම් තැනැත්තකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් බවට ප්‍රකාශයට පත්කරනු ලැබ හෝ විනිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, බංකොලොත්භාවයට පත් වූ හෝ බුන්වත් භාවයට පත් වූ දිනයට පෙරාතුව සිදු වූ කිසිම පාඩුවක එසේ බුන්වත් භාවයට පත්වීම ප්‍රකාශයට පත්කිරීමෙන් පසු උපචිත වන ආදායමෙන් අඩු කරනු නොලැබිය යුතු ය ;

(ඈ) අන්තිම කැමැති පත්‍රයක් මගින් හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව සිදු වූ අනුප්‍රාප්තියකින් නොවන අන්‍යාකාරයකින් අයිතියේ වෙනසක් සිදුවී තිබෙන සමාගමක් විසින් දරන ලද පාඩුවක්, ඒ පාඩුව දරනු ලැබූ එම සමාගමෙහි, වෙළෙඳාමෙහි හෝ ව්‍යාපාරයේ ව්‍යවස්ථාපිත ආදායමෙන් හැර, අඩු කරනු ලැබිය නොහැකි විය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා අඩු කිරීම සඳහා හිමිකම කියා සිටින තක්සේරු වර්ෂයේ ඕනෑම වේලාවක දී සමාගමක නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක්, එම පාඩුව විඳිනු ලැබූ තක්සේරු වර්ෂයේ ඕනෑම වේලාවක දී නොදැරූ තැනැත්තන් විසින් ඍජුවම හෝ නාමිකයකු මගින් හෝ දරනු ලබන අවස්ථාවක එම සමාගමේ අයිතියෙහි වෙනසක් සිදු වී ඇති ලෙස සලකනු ලැබේ.

(6) (අ) මේ පනතේ 16 වන වගන්තිය හෝ 17 වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ 19 වන වගන්තිය 20 වන වගන්තිය හෝ 21 වන

වගන්තිය හෝ 22 වන වගන්තිය හෝ 23 වන වගන්තිය හෝ 24 වන වගන්තිය හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 17 වන වගන්තිය 18 වන වගන්තිය, 19 වන වගන්තිය, 20 වන වගන්තිය, 21අ වගන්තිය, 21ආ වගන්තිය, 21ඇ වගන්තිය, 21ඈ වගන්තිය, 21ඉ වගන්තිය, 21ඊ වගන්තිය, 21උ වගන්තිය, හෝ 21ඌ වගන්තිය හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 16ඈ වගන්තිය හෝ 17අ වගන්තිය හෝ 17ඇ වගන්තිය හෝ 17ඈ වගන්තිය හෝ 17උ වගන්තිය හෝ 17ඌ වගන්තිය හෝ 17ඒ වගන්තිය හෝ 17ඒඒ වගන්තිය හෝ 22අ වගන්තිය හෝ 22ආ වගන්තිය හෝ 22ඇ වගන්තිය හෝ 22ඈ වගන්තිය හෝ 22ඈඈ වගන්තිය හෝ 22ඈඈඈ වගන්තිය හෝ 22ඈඈඈඈ වගන්තිය යටතේ හෝ යම් ව්‍යාවසායක ලාභ සහ ආදායම,නිදහස් කරන ලද කාලසීමාව ලෙස මේ ඡේදයෙහි සඳහන් කරනු ලබන යම් කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස්ව තිබුණ අවස්ථාවක එම නිදහස් කිරීම අදාළවීම අවසන් වූ තක්සේරු වර්ෂයේ දී-

(i) ඒ ව්‍යාවසාය පවත්වාගෙන යන තැනැත්තාගේ මුලු ව්‍යවස්ථාපිත ආදායමෙන්, නිදහස් කරන ලද කාලසීමාව තුළදී යම් තක්සේරු වර්ෂයකදී ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාවසායේ දී කරන ලද අලාභවල එකතුව ;

(ii) ඒ ව්‍යාවසායෙහි ඒ අලාභය සිදුවූයේ යම් තක්සේරු වර්ෂයක දී ඒ තක්සේරු වර්ෂයට පසු එළඹෙන නිදහස් කරන ලද කාලසීමාවේ දී යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ඒ ව්‍යාවසායෙහි ලාභ සහ ආදායමෙන් එම අතිරික්තය අඩු කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි සඳහන් අලාභ ශේෂයෙහි මුළු ප්‍රමාණයට හෝ ඉන් යම් කොටසක් (අ) ඡේදයේ සඳහන් තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ නොහැකි වන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් ඒ මුළු ප්‍රමාණය හෝ කොටස අඩු කිරීමෙන් පසු ඉතිරිවන යම් ශේෂයක් වේ නම්, ඒ ශේෂය ඒ තක්සේරු වර්ෂයට ඉනික්බිතිව වූ තක්සේරු වර්ෂයේදී ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාවසායේ දී දරන ලද අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම අලාභය (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සලසා ඇති ආකාරයට අඩු කරනු ලැබිය යුතු ය.

(7) යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්. වෘත්තියකින් හෝ රක්ෂාවකින් අත්වන අලාභයක මුදල් ප්‍රමාණය මේ පනතෙහි වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් අත්වන අලාභයක මුදල් ප්‍රමාණය මේ පනතෙහි වෙළෙඳාමකින් වෘත්තියකින් හෝ රක්ෂාවකින් අත්වන ලාභ නිශ්චය කිරීම සඳහා ඇති ආකාරයෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(8) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් දරුවකුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මවගේ හෝ පියාගේ හෝ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම් සමග එකතු කරනු ලැබ එහි කොටසක් වශයෙන් සලකනු ලැබූ අවස්ථාවක, මේ වගන්තියේ විධිවිධාන යටතේ ඒ දරුවාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය හැකි යම් මුදලක් වේ නම් එය මවගේ හෝ පියාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය.

## VII වන පරිච්ඡේදය

## බදු අය කළ හැකි ආදායම නිශ්චය කිරීම

**33**. (1) යම් තක්සේරු වර්ෂයකදී ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකුගේ හෝ පුණ්‍යායතනයක බදු අය කළ හැකි ආදායම- බදු අය කල හැකි ආදායම.

(අ) රුපියල් තුන් ලක්ෂයක දීමනාවක් ; සහ

(ආ) 34 වන වගන්තිය යටතේ ඒ තැනැත්තාට හෝ ආයතනයට හිමිකම් ඇති යම් දීමනාවක,

එකතුව එයින් අඩු කිරීමෙන් පසු, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ හෝ ඒ ආයතනයේ තක්සේරු කළ හැකි ආදායම විය යුතු ය :

එසේ වුවද භාරකරුවකු, දේපළ භාරගන්නකු, පොල්මඃකරුවකු හෝ ඇවරකරුවකු වන යම් පුද්ගලයකුට, ඒ භාරකරු දේපළ භාරගන්නකු, පොල්මඃකරුවකු හෝ ඇවරකරු වශයෙන් ඔහුගේ බදු අය කළ හැකි ආදායම නිශ්චය කිරීමේදී (අ) ඡේදයෙහි සඳහන් දීමනාවක් අඩු කිරීමට ඔහුට හිමිකම නොලැබිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා (වාසික පුද්ගලයකු හෝ පුණ්‍යායතනයක් නොවන) යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායම, ඒ ආදායමෙන් 34 වන වගන්තිය යටතේ ඔහුට හෝ ආයතනයට හිමිකම් ඇති යම් දීමනාවක් අඩු කිරීමෙන් පසුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ හෝ ඒ ආයතනයේ තක්සේරු කළ හැකි ආදායම විය යුතු ය.

සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් දීමනාවක්.

**34**. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැලකෙන සෑම සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන් ම, ඒ සුදුසුකම් ලබන ගෙවීමට සමාන ප්‍රමාණයක දීමනාවක් (4) වන උපවගන්තියේ වන විධිවිධානවලට යටත්ව 33 වන වගන්තියේ කාර්ය සඳහා අඩු කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියෙහි "සුදුසුකම් ලබන ගෙවීමක්" යන්නෙන්-

(අ) යම් තැනැත්තකු විසින් අනුමත පුණ්‍යායතනයකට මුදලින් කරන ලද ත්‍යාගයක් ;

(ආ) (i) ශ්‍රී ලංකා ආණ්ඩුවට ;

(ii) පළාත් පාලන ආයතනයකට ;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන යම් උසස් අධ්‍යාපන ආයතනයකට ;

(iv) 1981 අංක 74 දරන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතින් පිහිටුවන ලද බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට සහ ඒ පනතින් හෝ ඒ පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයකට ;

(v) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට ;

(vi) පළාත් පාලන ආයතනයක් විසින් පිහිටුවනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අරමුදලකට ;

(vii) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධනය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඇති කොට පරිපාලනය කරනු ලබන සෙවන අරමුදලට ;

(viii) පළාත් සභාවක් විසින් පිහිටුවනු ලැබ, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අරමුදලකට,

මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන ලද ත්‍යාගයක් :

එසේ වුව ද මුදලින් හැර අන්‍යාකාරයකින් කරන ලද යම් පරිත්‍යාගයක රුපියල් මිලියන දෙකක් ඉක්මවා යන කොටසක් වේ නම් එම කොටසකින් සුදුසුකම් ලබන ගෙවීමක් සංයුක්ත නොවන බව සැලකිය යුතු ය.

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සංවර්ධන සැලැස්මක ඇතුළත් යම් ව්‍යාපෘතියක් සඳහා යම් තැනැත්තකු විසින්-

(i) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව ; සහ

(ii) අමාත්‍යවරයා විසින් ඒ අනුමතය දෙන ලද අවස්ථාවේ දී ආණ්ඩුවේ සංවර්ධන ප්‍රමුඛතා කෙරෙහි සැලකිලිමත්ව ඒ අනුමතය දෙනු ලැබුවේ නම් සහ, ඒ නියම හා කොන්දේසි සඳහන් කරනු ලැබුවේ නම්, ඒ අනුමතයට, නියම හා කොන්දේසිවලට අනුකූලව දරනු ලැබුවේ නම්,

එසේ දරන ලද වියදම් ;

(ඇ) ස්වයං රැකියාවල නියුතු වූ තැනැත්තන් සඳහා වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් තත්කාර්යය සඳහා අනුමත කරන ලද්දා වූ ද අර්ථසාධක අරමුදලකට දායක මුදල් වශයෙන් යම් පුද්ගලයකු විසින් ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් ;

(ඉ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලකට හෝ විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ පරිපාලිත අර්ථසාධක අරමුදලකට හෝ පුද්ගලයකු විසින් ගෙවන ලද යම් දායක මුදල් ඒ දායක මුදල් ගෙවන ලද්දේ 8 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් පඩිනඩිවලින් කොටසක් නොවන්නේ නම් ඒ දායක මුදල් :

එසේ වුවද කරන ලද එම දායක මුදල එම පඩිනඩිවලින් සියයට දොළහක් ඉක්මවන්නා වූ අවස්ථාවක, එසේ ඉක්මවා යන කොටසින් සුදුසුකම් ලබන ගෙවීමක් සංයුක්ත නොවන බව සැලකිය යුතු ය.

(ඊ) යම් තැනැත්තකු විසින්-

(i) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතින් පිහිටුවන ලද කාර්මික තාක්ෂණ ආයතනයට ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පදනම් ආයතනයට ;

(iii) 1978 අංක 1 ටවර් හෝල් රඟහල පදනම පනතින් පිහිටුවන ලද ටවර් හෝල් රඟහල පදනමට ;

(iv) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට ;

(v) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනතින් පිහිටුවන ලද එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමට ;

(vi) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයට ;

(vii) 1982 අංක 7 දරන ජාත්‍යන්තර දඹල ආයතන පනතින් පිහිටුවන ලද ජාත්‍යන්තර දඹල ආයතනයට ;

(viii) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට ;

(ix) 1994 අංක 11 දරන විද්‍යාව හා විද්‍යා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතින් පිහිටුවන ලද නවීන තාක්ෂණික විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයට ;

(x) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ;

(xi) 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පනතින් පිහිටුවන ලද ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයට,

මුදලින් කරන ලද ත්‍යාගයක් ;

(උ) යම් තක්සේරු වර්ෂයකදී ගෙවන ලද—

(i) අවුරුදු තුනකට නොඅඩු කාලසීමාවක් තුළ වාර්ෂිකව වාරිකය ගෙවිය යුතු (හුදු පරිත්‍යාග රක්ෂණ ඔප්පුවක් නොවන) ජීවිත රක්ෂණ ඔප්පුවක් සඳහා ;

(ii) වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් සඳහා,

ගෙවිය යුතු උපචිත වී තිබෙන, ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද එවැනි යම් ඔප්පුවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත දී ගෙවන වාරික නොවන යම් වාරික ;

(ඌ) රුපියල් මිලියන පනහකට නොඅඩු පිරිවැයක් සහිත වූ ද යම් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා යම් තැනැත්තකු විසින් දරන ලද වියදම :

එසේ වුව ද, (1) වන උපවගන්තියේ කාර්යය සඳහා මේ ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමක්, ඒ චිත්‍රපටයේ නිෂ්පාදනය සම්පූර්ණ කළ තක්සේරු වර්ෂයේ දී කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා –

චිත්‍රපටයක් නිෂ්පාදනය හා සම්බන්ධ "වියදම" යන යෙදුමට ඒ චිත්‍රපටය නිෂ්පාදනය සම්පූර්ණ කළ දිනයේ සිට දවස් අනූවක කාලසීමාවක් ඇතුළත, එම චිත්‍රපටය ප්‍රවර්ධනය කිරීම සඳහා දරන ලද යම් වියදමක් ඇතුළත් වේ ;

"චිත්‍රපටය" යන්නෙන් කවර හෝ ආකාරයකින් නැතහොත් ආකෘතියකින් නිපදවා ඇති චලන රූපයක් ශ්‍රව්‍යදෘශ්‍යව ඉදිරිපත් කිරීමක් වන්නා වූ ද තිරයක් මතට ප්‍රක්ෂේපණය කිරීමෙන් ප්‍රදර්ශනය කිරීම සඳහා වන්නා වූ ද ඉදිරිපත් කිරීමක්,

අදහස් වේ.

(එ) (ඒ) ඡේදයේ සඳහන් ණය මුදලකින් නොවන යම් පුද්ගලයකු විසින් නිවසක් ඉදිකිරීම හෝ මිලදී ගැනීම සඳහා දරන ලද යම් වියදමක්, මේ අවස්ථා දෙකෙන් කවර අවස්ථාවකදී වුව ද එය ඒ පුද්ගලයා 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඉදිකළ හෝ මිලදී ගත් පළමු නිවස විය යුතු ය ;

(ඒ) යම් පුද්ගලයකු විසින්, නිවසක් ඉදිකිරීම සඳහා හෝ මිල දී ගැනීම සඳහා වූ යම් අනුමතිය ලත් නිවාස ණය මුදලක මුල මුදල ආපසු ගෙවීම සඳහා දරන ලද යම් වියදමක්, මේ අවස්ථා දෙකින් කවර අවස්ථාවකදී වුව ද, එය ඒ පුද්ගලයා 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඉදිකළ හෝ මිල දී ගත් පළමු නිවස විය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා "අනුමතිය ලත් නිවාස ණය" යන්නෙන් ආණ්ඩුවෙන් හෝ 422 වන අධිකාරය වූ මුදල් නීති පනතේ අර්ථානුකූලව යම් බැංකු ආයතනයකින් හෝ යම් පළාත් සභා අරමුදලක්, පළාත් පාලන ආයතනයකින් හෝ නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් ආයතනයකින් හෝ ලබාගත් ණය මුදලක් අදහස් වේ ;

(ඔ) 23 වන වගන්තිය යටතේ අවුරුදු පහක කාලසීමාවකට ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙන සමාගමක් විසින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස්වල, එසේ කොටස් නිකුත් කිරීමේදී යම් තක්සේරු වර්ෂයක් සඳහා ආයෝජනය කර තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් ලක්ෂ පහකට අඩු නොවන අවස්ථාවක, එසේ සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබෙන මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක් ;

(ඕ) 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් සමාගමක් විසින් ආයෝජනයට කරන ලද යම් මුදලක් ;

(ක) 21 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් වියදමක් ;

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් දරුවකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම් ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මවගේ හෝ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම් සමග එකතු කරනු ලැබූ සහ එහි කොටසක් ලෙස සලකනු ලැබූ අවස්ථාවක ඒ තක්සේරු වර්ෂයේදී ඒ දරුවා විසින් කරන ලද යම් සුදුසුකම් ලබන ගෙවීමක් මවු හෝ පියා විසින් කරන ලද සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම –

(අ) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් :–

(i) යම් තක්සේරු වර්ෂයක දී ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ), (උ), (ඌ), (එ), (ඒ) සහ (ඔ) යන ඡේදවල සඳහන්

සුදුසුකම් ලැබීමේ ගෙවීම් හැර, අනෙක් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් එකී තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් විසිපන්දහසක් යන දෙකෙන් වඩා අඩුවන්නා වූ මුදල නොඉක්මවිය යුතු ය ;

(ii) ඒ තක්සේරු වර්ෂය තුළ ඒ තැනැත්තා විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන්, රුපියල් විසිපන්දහසක් නොඉක්මවිය යුතු ය ;

(iii) ඒ තක්සේරු වර්ෂය තුළ ඒ තැනැත්තා විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන්, රුපියල් මිලියන දහසක් නොඉක්මවිය යුතු ය ;

(iv) සියලු සුදුසුකම් ලබන ගෙවීම්වල එකතුව සම්බන්ධයෙන් සිදුකරන ලද සහ (2) වන උපවගන්තියේ (අ), (ඉ), සහ (උ) ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම්වල එකතුව වෙනුවෙන් රුපියල් හැත්තෑපන්දහසක් හෝ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් නොඉක්මවිය යුතු ය ;

(v) ඒ තක්සේරු වර්ෂයේදී ඒ තැනැත්තා විසින් කරන ලද (2) වන උපවගන්තියේ (එ) සහ (ඒ) ඡේදවල සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් එක් ලක්ෂයක් යන මේ දෙකින් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය ;

(vi) ඒ තක්සේරු වර්ෂයේදී ඔහු විසින් කරන ලද (2) උපවගන්තියේ (ඔ) ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලැබීමේ ගෙවීමක් වෙනුවෙන්, ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ එකී සුදුසුකම් ලැබීමේ ගෙවීම යන මෙයින් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය ;

(ආ) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් සම්බන්ධයෙන් –

(i) ඒ තක්සේරු වර්ෂය තුළ ඒ සමාගම විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ආ), (ඌ), (ඔ), (ඕ) සහ (ක) අනුඡේදවල සඳහන් ගෙවීම් නොවන, සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමින් පහෙන් එක් පංගුවක් නොඉක්මවිය යුතු ය. ;

(ii) ඒ තක්සේරු වර්ෂය තුළ ඒ සමාගම විසින් කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන්, රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය ;

(iii) යම් සමාගමක් විසින් කරන ලද (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් වන විට එය එහි තක්සේරු කළ හැකි ආදායමෙන් පහෙන් එකක් හෝ එම සුදුසුකම් ලැබීමේ ගෙවීම යන මෙයින් අඩු මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය ;

(iv) යම් සමාගමක් විසින් කරන ලද (2) වන උපවගන්තියේ (ඕ) ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන්, රුපියල් මිලියන එකසියයක් නොඉක්මවිය යුතු ය, හෝ එම සුදුසුකම් ලැබීමේ ගෙවීම යන මෙයින් අඩු මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඕ) හෝ (ක) ඡේදයන්හි සඳහන් යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලබන ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ නොහැකි යම් සුදුසුකම් ලබන ගෙවීමක මුදල ඊළඟට එළඹෙන ඒ තක්සේරු වර්ෂයේ දී සහ ඒ ආදී වශයෙන් ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(6) යම් තක්සේරු වර්ෂයක දී කරන ලද ලෙස සැලකෙන (2) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ සඳහන් සුදුසුකම් ලබන යම් ගෙවීමක් සම්බන්ධයෙන් දෙනු ලබන දීමනාවේ අතිරික්තය, ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එන (මෙහි මින් මතු "ප්‍රථම අනුප්‍රාප්තික තක්සේරු වර්ෂය"

යනුවෙන් සඳහන් කරනු ලබන) තක්සේරු වර්ෂයේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබිය යුතු අතර, සහ එම අතිරික්තයේ යම් ශේෂයක්, ප්‍රථම අනුප්‍රාප්තික තක්සේරු වර්ෂයට ඉක්බිතිවම යෙදෙන ප්‍රථම තක්සේරු වර්ෂයේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ යුතු ය.

(7) (2) වන උපවගන්තියේ (එ) ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමකට දෙනු ලබන දීමනාවකින්, ඒ වියදම දරන ලද තක්සේරු වර්ෂයේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ නොහැකි අතිරික්තය, ඒ වියදම දරන ලද තක්සේරු වර්ෂයට ඉක්බිතිවම අනුප්‍රාප්ත වන අවුරුදු නවයකට නොවැඩි කාලසීමාවක් තුළ විභාජනය කරනු ලැබිය හැකි අතර, එසේ විභාජනය කරනු ලැබූ මුදල් ප්‍රමාණය, ඒ ඒක් ඒක් තක්සේරු වර්ෂයේදී දරන ලද සුදුසුකම් ලැබීමේ ගෙවීමක් ලෙස සැලකිය යුතු ය.

(8) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "අනුමත පුණ්‍යායතනයක්" යන්නෙන්, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16 අ වගන්තියේ අර්ථානුකූලව අනුමත පුණ්‍යායතනයක් හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 (9) (අ) වගන්තිය යටතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 31 වන උපවගන්තියේ (7) වන උපවගන්තිය යටතේ මේ වගන්තියේ කාර්යය සඳහා අනුමත පුණ්‍යායතනයක් වශයෙන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ පොදු පුන්‍යායතනයක් හෝ ආයතනයක් අදහස් වේ. ;

(ආ) මුදලින් හැර අන්‍යාකාරයකින් ආණ්ඩුවට කරනු ලබන ත්‍යාගයක මුදල් ප්‍රමාණය ඒ ත්‍යාගයෙහි වටිනාකම විය යුතු අතර, ඒ වටිනාකම –

(i) තෑගි කරනු ලැබූ දේපළ සඳහා ඒ තක්සේරු වර්ෂ තුළදී ත්‍යාග දායකයාට දරන්නට සිදුවූ වියදම ; හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය තුළ දරන්නට සිදුවූ වියදම් නිශ්චය කරනු ලැබිය නොහැකි අවස්ථාවක හෝ ඒ තක්සේරු වර්ෂය තුළ කිසිම වියදමක් දරනු නොලැබූ අවස්ථාවක ඒ තෑගි කළ දේපල තෑගි කළ අවස්ථාවේදී වූ වෙළෙඳ අගය,

විය යුතු ය.

VIII වන පරිච්ඡේදය

සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ

සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ.

**35**. (1) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, එක් එක් තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ ඒ වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මත—

(අ) ඔහු, දේපළ භාරගන්නකුගේ, භාරකරුවකුගේ, පොල්මඃකරුවකුගේ හෝ ඈවරකරුවකුගේ තත්ත්වයෙන් ක්‍රියාකරන්නකු නොවන පුද්ගලයකු නම් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 79 වන වගන්තියේ (7) වන උපවගන්තියෙන් නිර්වාසික පුද්ගලයකු ලෙස සලකනු ලබන්නේ නම් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසෙහි සඳහන් අනුප්‍රමාණය අනුව ;

(ඇ) ඒ තැනැත්තා සමාගමක් නොවන හෝ (අ) ඡේදය අදාළ වන පුද්ගලයකු නොවන හෝ තැනැත්තකු නම් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

79 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසිකයකු ලෙස සලකනු ලබන පුද්ගලයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම ඒ තක්සේරු වර්ෂය සඳහා 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් දීමනාව ඉක්මවන්නා වූ මුදලකට නොවැඩි විය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකුගේ ව්‍යවස්ථාපිත ආදායමට—

(අ) විශ්‍රාම වැටුපක් වරිවර්තනය කිරීමෙන් ලැබුණ මුදලක් ; හෝ

(ආ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂිකය වශයෙන් ලැබුණා වූ මුදලක් එහෙත් ඒ මුදලෙහි වූ යම් කොටසක් හැර යම් මුදලක් ඉක්මවන්නා වූ

(i) රුපියල් දහඅට ලක්ෂයක් ; හෝ

(ii) ඒ පුද්ගලයාට ඒ පාරිතෝෂිකය ගෙවන සේවායෝජකයා යටතේ යම් සේවා නියුක්තියකින් විශ්‍රාම ලැබීමට පෙරාතුවම වූ අවුරුදු තුන තුළදී ගෙවන ලද සාමාන්‍ය මාසික වැටුප හෝ වේතනය සේවා කාලයේ සම්පූර්ණ කළ අවුරුදු ගණනින් වැඩි කළ විට ලැබෙන ගණනට සමාන මුදලක් යන මෙයින්

කවර හෝ වැඩි මුදල ; හෝ

(ඇ) ධුරය හෝ සේවා නියුක්තිය අහිමිවීම සඳහා වන්දි වශයෙන් ලැබුණ යම් මුදලක් ; හෝ

(ඈ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ යම් අර්ථසාධක අරමුදලකින් ඒ අරමුදලට ඔහු විසින් ගෙවනු ලැබූ දායක මුදලට සමාන වන කොටස හැර යම් සේවා නියුක්තියන්, ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී හෝ යම් තදනන්තර අවස්ථාවක දී ඔහුට ගෙවනු ලැබූ යම් මුදලක් ; හෝ

(ඉ) පරිපාලිත අර්ථසාධක අරමුදලකින් සේවා නියුක්තයකුට ගෙවන ලද (තම දායක මුදල වශයෙන් සේවා යෝජක විසින් 1968 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ අරමුදලට ගෙවන ලද දායක මුදල් නියෝජනය වන කොටස සහ සේවායෝජකයා විසින් ගෙවනු ලැබූ දායක මුදල් සම්බන්ධයෙන් ඒ එකතු වූ පොලිය සම්බන්ධයෙන් ඒ සේවායෝජක විසින් සියයට පහළොව බැගින් බදු ගෙවන ලද්දේ නම් සේවායෝජක විසින් ගෙවන ලද ඒ දායක මුදල් සඳහා එකතු වූ පොලිය හැර) යම් මුදලක් ; හෝ

(ඊ) යම් සේවා නියුක්තියකින් ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී 1980 අංක 46 දරන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල පනතින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් ඔහුට ගෙවන ලද යම් මුදලක්,

ඇතුළත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහුගේ බදු අය කල හැකි ආදායම, ඉහත සඳහන් කරනු ලැබූ කිසිම මුදලක් ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් කරනු නොලැබුවේ නම් ඔහුගේ බදු අය කළ හැකි ආදායම ඉක්මවන අවස්ථාවක මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද කොමසාරිස්

ජනරාල්වරයාගේ මතය අනුව සේවායෝජක විසින් සේවයෙහි නියුක්තකරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාර ලෙස අදාළ වන ක්‍රමයක් අනුව ඉහත සඳහන් ඒ මුදල් ප්‍රමාණයන් ඒ පුද්ගලයාගේ සේවායෝජක විසින් ගෙවනු ලැබ ඇත්නම්, මේ පනතේ පළමුවන උපලේඛනයේ IV වන කොටසේ සඳහන් උචිත අනුප්‍රමාණ අනුව බද්ද අය කරනු ලැබිය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව ඒ සේවායෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාරී ලෙස අදාළ නොවන ක්‍රමයක් අනුව ඉහත සඳහන් යම් මුදලක් ඒ පුද්ගලයාට ගෙවනු ලැබ ඇත්නම් මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව (ඉක්මවීම ඇතුළත්ව) ඔහුගේ බදු අය කළ හැකි ආදායම මත බද්ද අයකරනු ලැබිය යුතු ය :

එසේ වුව ද මේ තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායමට කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, ඒ පුද්ගලයාගේ සේවායෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාරව අදාළ කරනු ලැබිය නොහැකි ක්‍රමයකට අනුකූලව ඒ පුද්ගලයාට ගෙවා ඇත්තා වූ (ඇ) ඡේදයෙහි සඳහන් යම් මුදලක් ඇතුළත් වන අවස්ථාවක, ඒ මුදල 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ අර්ථානුකූලව, සේවා නියුක්ති ආදායමක් සේ සැලකෙන අතර, මේ පනතේ පළමුවන උපලේඛනයේ 1 වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව බදු අය කරනු ලැබිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක දී යම් පුණ්‍ය ආයතනයක් විසින් ගිලන් හෝ දුගී අය වෙනුවෙන් ආයතනගත සත්කාර සලකන්නා වූ ද, ඒ සත්කාරය සැලසීම සම්බන්ධයෙන් වියදම ඒ පුණ්‍ය ආයතනය විසින් දරනු ලබන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන්නා වූ ද අවස්ථාවක, විෂය කාරණය සම්බන්ධයෙන් සියලු අවස්ථාවල දී අඩු කිරීම හෝ ලිහිල් කිරීම සාධාරණ සහ යුක්තිසහගත බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා එම ආයතනයේ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ඒ පුණ්‍යායතනය විසින් ගෙවිය යුතු බද්ද, ඔහු විසින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, අඩු කිරීම හෝ ලිහිල් කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකිය.

(4) ශ්‍රී ලංකාවේ යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් සේවයේ සාමාජිකයන්ගේ සහ ඒ ඒ සාමාජිකයන්ගේ පවුල්වල ශුභසාධනය සඳහා යම් අරමුදලක් හෝ සමිතියක් ඇතිකරන ලද හෝ පිහිටුවන ලද අවස්ථාවක ඒ අරමුදල හෝ

සමිතිය විසින් ගෙවිය යුතු බද්ද අඩු කිරීම හෝ ලිහිල් කිරීම ඊට අදාල සියලු අවස්ථාගත කරුණු අනුව සාධාරණ සහ යුක්තිසහගත බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, ඒ අරමුදල හෝ සමිතිය විසින් ගෙවි යුතු බද්ද ඔහු විසින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව අඩු කිරීම හෝ ලිහිල් කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

## IX වන පරිච්ඡේදය

## සමහර ලාභ සහ ඒ ලාභවලින් ලත් ලාභාංශ සම්බන්ධයෙන් බදු පැනවීමට අදාළ විශේෂ විධිවිධාන

ආණ්ඩුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය සංස්ථාවක් හෝ පලාත් පාලන ආයතනයක් වෙත සතු කරන ලද දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය මත වූ පොලිය සම්බන්ධයෙන් බදු අය කිරීමට අදාළ විශේෂ විධිවිධාන.

**36**. (1) ආණ්ඩුවේ හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ වෙත පවරගන්නා ලැබූ යම් නිශ්චල හෝ චංචල දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය මත ගෙවිය යුතු වූ, ඒ වන්දිය උපචිත වන දිනයෙන් ආරම්භව ඒ මත ගෙවිය යුතු සම්චිත පොලිය වන ("අදාළ පොළිය" යනුවෙන් මේ වගන්තියේ සඳහන් වන) පොළිය සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද—

(අ) යම් තැනැත්තකු විසින් ලබාගන්නා ලද අදාල පොලිය ඒ පොලිය අදාළ වන්නේ යම් තක්සේරු වර්ෂයකට ද ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තාට උද්ගත වන ආදායම ලෙස නොව ඒ පොලිය ඒ තැනැත්තා ලබාගන්නේ නම් යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ දී ඔහුට උද්ගත වන ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ඒ පොලිය ආදායම් බද්දට යටත් විය යුතු ය ;

(ආ) යම් තැනැත්තකුට අදාළ පොලිය ගෙවනු ලබන ආණ්ඩුව, ඉඩම් ප්‍රතිසංස්කරණය කොමිෂන් සභාව, රාජ්‍ය සංස්ථාව හෝ පළාත් පාලන ආයතනය විසින් ඒ පොලියෙන් සියයට දහයකට සමාන මුදලක්, ඒ පොලියෙන් අඩු කරනු ලැබිය යුතු ය. තව ද ගෙවිය යුතු වන අදාළ පොලියේ දළ මුදල් ප්‍රමාණයේ විස්තර අඩුකර ගන්නා ලද බද්ද, ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය, එය ගෙවනු ලැබුවේ යම්

තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය දැක්වෙන ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් සමග එසේ අඩුකර ගන්නා ලද මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය. තව ද එසේ ප්‍රේෂණය කරන ලද මුදල් ප්‍රමාණය (අ) ඡේදය යටතේ ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු වන බද්දෙන් හිලව් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි—

"ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අදහස් වේ ;

ඇතැම් තැන්පතු ගිණුම මත ගෙවිය යුතු පොළියෙන් ආදායම් බදු අඩුකර ගැනීම.

**37**. (1) (අ) යම් පුද්ගලයකු විසින් ; හෝ

(ආ) යම් පුද්ගලයකු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් හෝ

බැංකු ආයතනයක—

(i) ඒ බැංකු ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන්නා වූ ; සහ

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කළ නිශ්චිතව සඳහන් කරනු ලබන කොන්දේසිවලට අනුකූලව වන්නා වූ,

කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන යෝජනා ක්‍රමයක් යටතේ තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණයක් මත ගෙවන ලද (මේ වගන්තියේ අදාළ පොලිය යනුවෙන් සඳහන් කරනු ලබන) සමුච්චිත පොලියට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. මේ උපවගන්තියෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යයි නියම කරන ලද යම් කාරණයක් නිශ්චිතව සඳහන් කිරීමේ දී ඉතිරි කිරීම්, දිරිගැන්වීමේ සහ පහසු කිරීමේ අවශ්‍යතාව කෙරෙහි ඔහු විසින් සැලකිල්ල දැක්විය යුතු ය.

(2) මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද—

(අ) ඒ පොලිය අදාළ වන්නේ යම් තක්සේරු වර්ෂයකට ද ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තාට උද්ගත වන ආදායම් ලෙස නොව ඒ පොලිය ඔහුට ගෙවනු ලබන්නේ යම් තක්සේරු වර්ෂයකදී ද, ඒ තක්සේරු වර්ෂයේ දී ඔහුට උද්ගත වන ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද මෙම පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණ අනුව ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ ය ;

(ආ) ඒ පුද්ගලයාට අදාළ පොලිය ගෙවන බැංකු ආයතනය විසින් (අ) ඡේදයේ කුමක් සඳහන්ව ඇත ද, ඒ පොලියෙන් සියයට දහයකට සමාන මුදල් ප්‍රමාණයක් අඩුකරනු ලැබිය යුතු ය. තව ද එසේ අඩුකර ගන්නා ලද මුදල වහාම කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය ;

(ඇ) බැංකු ආයතනයක් විසින් යම් පුද්ගලයකුට ගෙවනු ලබන අදාළ පොලියෙන් (ආ) ඡේදයට අනුකූල අදායම් බද්දක් අඩු කරනු ලබන අවස්ථාවක, ගෙවිය යුතු වන අදාළ පොලියේ දළ මුදල් ප්‍රමාණය, අඩුකර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ මුදල් ප්‍රමාණය සහ සැබවින්ම ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය දැන්වෙන ලියවිල්ලක් වූ ප්‍රකාශයක් ඒ පුද්ගලයාට නිකුත් කරනු ලැබිය යුතු ය ;

(ඈ) (i) යම් පුද්ගලයකුට ගෙවනු ලබන අදාළ පොලියෙන් (ආ) ඡේදයට අනුකූල යම් මුදල් ප්‍රමාණයක් අඩු කරනු ලබන්නේ වූ ; සහ

(ii) (අදාළ පොලිය හැර) ඔහුගේ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ඒ අඩු කිරීම කරනු ලබන තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයා ආදායම් බදු ගෙවීමට යටත් උපරිම අනුප්‍රමාණය සියයට පහළොවකට වඩා අඩු වන්නා වූ, අවස්ථාවක, (ඇ) ඡේදයෙහි සඳහන් ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබූ විට සහ XXVIII වන පරිච්ඡේදයේ

විධිවිධානවලට යටත්ව, සියයට පහළොව සහ ඒ උපරිම බදු අනුප්‍රමාණය අතර වෙනසට සමාන අදාළ පොලියෙන් යම් ප්‍රතිශතයක් ආපසු ලබාගැනීමට ඒ පුද්ගලයාට හිමිකම ඇත්තේ ය.

(3) බැංකු ආයතනයක් විසින් යම් පුද්ගලයකුට ගෙවන ලද අදාළ පොලියෙන් යම් ආදායම් බද්දක් අඩුකර ගැනීමට (2) වන උපවගන්තියෙන් නියමිත බැංකු ආයතනයක් ඒ ආදායම් බද්ද අඩු කර ගැනීමට පැහැර හරින අවස්ථාවක, එවිට මේ වගන්තිය යටතේ ඒ ආයතනය විසින් අඩුකර ගැනීමට නියමිත බද්ද සඳහා ඒ බැංකු ආයතනයේ අධ්‍යක්ෂවරයා, සාමාන්‍යාධිකාරිවරයා හෝ වෙනත් ප්‍රධාන නිලධරයා පෞද්ගලිකව වගකිව යුතු ය. තව ද ඒ බද්ද මේ පනතෙහි විධිවිධාන සලස්වන ලද සියලු ක්‍රමවලින් ඒ අධ්‍යක්ෂවරයාගෙන්, සාමාන්‍යාධිකාරිවරයාගෙන් හෝ ප්‍රධාන නිලධාරියාගෙන් අයකර ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යෝජන ක්‍රමයක් යටතේ පුද්ගලයකු විසින් බැංකු ආයතනයක මුදල් කිසිවක් තැන්පත් කරනු ලැබ ඇත්තා වූ ද, ඒ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද කොන්දේසි කඩකරමින් ඒ මුදල් මත වූ පොලිය ඒ පුද්ගලයා විසින් ඉවත් කරගනු ලබන්නා වූ ද අවස්ථාවක මේ පනතෙහි කුමක් සඳහන්ව ඇත ද එසේ ඉවත් කරගන්නා ලද පොලිය අදාළ වන්නේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ සෑම තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ම අතිරේක තක්සේරු කිරීම කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම් හවුල් ව්‍යාපාර සහ පුද්ගල මණ්ඩල විසින් දෙන ලද ණය පිළිබඳ දළ පොලිය මත ආදායම් බදු අනුප්‍රමාණය.

**38**. ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින් ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුට දෙන ලද ණයක් මත ගෙවිය යුතු වන (මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ නිදහස් කරනු ලබන පොලිය නොවන්නා වූ) ඒ සමාගමට, හවුල් ව්‍යාපාරයට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයට උද්ගත වන්නා වූ හෝ උද්ගත වන්නේ යයි 93 වන වගන්තියෙන් සලකනු ලබන්නා වූ පොලිය වන්නා වූ දළ පොලිය මත මේ පනතේ කුමක් සඳහන්ව ඇති ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමකට හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවිය යුතු රාජ්‍ය භාගය මත ආදායම් බදු අනුප්‍රමාණය.

**39**. ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ශ්‍රී ලංකාවේ උද්ගත වන හෝ ශ්‍රී ලංකාවේ උද්ගත වන්නේ යයි 94 වන වගන්තිය යටතේ සලකනු ලබන රාජ්‍ය භාගය වශයෙන් ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් ඒ සමාගමට, හවුල් ව්‍යාපාරයට හෝ පුද්ගල මණ්ඩලයට, ගෙවිය යුතු දළ රාජ්‍ය භාග මත මේ පනතේ වෙනස් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

නිර්වාසිකයකු යම් නිශ්චිත කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ සේවයෙහි නියුක්ත කිරීමෙන් ලබන්නා වූ ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණ.

**40**. (1) 79 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ අවුරුදු තුනක කාලයක් සඳහා නිර්වාසිකයකු බවට සලකනු ලබන පුද්ගලයකු එම අවුරුදු තුනක කාලය ඉකුත්වීමෙන් පසුව ද ශ්‍රී ලංකාවේ අඛන්ඩව සේවා නියුක්තියෙහි යොදවා සිටින අවස්ථාවක ඒ අවුරුදු තුනක කාල සීමාව අවසානයෙන් ආරම්භව අවුරුදු දෙකක කාලයක් සඳහා ඒ පුද්ගලයාගේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ වලින් මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුන ද, මේ පනතේ පලමුවන උපලේඛනයේ III වන කොටසේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණය අනුව ආදායම් බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) යම් පුද්ගලයකු "ප්ලැග්ෂිප් සමාගමක" සේවයෙහි නියුක්ත වන අවස්ථාවකදී ඔහු 79 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ අවුරුදු 5 ක කාලයක් සඳහා නිර්වාසික තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කාලය ඉකුත්වීමෙන් පසුව ද ඒ ප්ලැග්ෂිප් සමාගම තුල අඛන්ඩව සේවයේ නියුක්ත වන විට ඒ අවුරුදු පහක කාලය අවසානයෙන් ආරම්භ වන කාලය තුල සහ—

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ගිවිසුමක නියමය යටතේ ඒ ප්ලැග්ෂිප් සමාගමේ ලාභය සහ ආදායම බද්දෙන් නිදහස් කිරීම නතර වන දිනය අවසානයේ ; හෝ

(ආ) ඒ පස් අවුරුදු කාලසීමාව අවසාන වූ පසුව ආරම්භවන තවදුරටත් වූ අවුරුදු පහක කාල සීමාව අවශ්‍ය වන දිනය වන,

කවර හෝ කලින් සඳහන් කල අවස්ථාවකදී, ඒ පුද්ගලයා විසින් ඒ ප්ලැග්ෂිප් සමාගමේ නියුක්තියෙන්. උපයාගන්නා ලාභවලින් මේ පනතට පටහැනිව කුමක් සඳහන් වුවද මේ පනතේ පලමු උපලේඛනයේ III වන කොටසේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමානයට අනුව ආදායම් බදු අයකරගනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ ප්ලැග්ෂිප් සමාගම යන්නෙන්—

1995 නොවැම්බර් මස 8 වන දින හෝ ඉන් පසුව ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමක් ඇති කර ගෙන ඇත්තා වූ ද ඒ ගිවිසුම ට අනුකූලව ඒ ගිවිසුමේ සඳහන් කාලය ඇතුලත ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද ව්‍යවසායේ ප්‍රයෝජන සඳහා-

(අ) යම් ගොඩනැගිල්ලක් මිලදී ගැනීම හෝ ඉදිකිරීම හෝ යම් ඉඩමක් පිරියත යන්ත්‍රයක්, හෝ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම ; සහ

(ආ) සමාගම විසින් පවත්වාගෙන යන්නා වූ ව්‍යවසාය භාවිතය සඳහා (අ) ඡේදයේ ඇතුලත් කර නොමැති යම් වත්කමක් අත්කර ගැනීම සඳහා,

ඇමරිකානු ඩොලර් මිලියන පනහක හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලක් ඊට සමාන මුදලක් ශ්‍රී ලංකාවෙන් ආයෝජනය කර ඇත්තා වූ සමාගමක් අදහස් වේ.

යම් අක්වෙරළ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවකින් උපචිත වන යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණ.

**41**. යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් අක් වෙරළ විදේශ මුදල් ගනුදෙනුවකින් උද්ගත වන, යම් අක්වෙරළ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක ලාභ සහ ආදායම් මේ පනතේ පස්වන උපලේඛනයේ ලබාදී ඇති උචිත අනුප්‍රමාණ අනුව ආදායම් බද්දට යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා යම් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් විසින් වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග ඇතුළත් වන යම් විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනුවක් අක්වෙරළ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් අපනයනවලින් ශ්‍රී ලංකාවේදී ප්‍රතිතකරුට හෝ ප්‍රතිතලාභියාට උපචිත වන ලාභ සහ ආදායම් මත ආදායම් බදු අනුප්‍රමාණ.

**42**. ප්‍රතිත පදනමක් මත ශ්‍රී ලංකාවට රැගෙනවිත් යම් නිෂ්පාදන ක්‍රියාවලියකට එම භාණ්ඩ යටත් නොකොට අපනයනය කරන භාණ්ඩ වන-

(අ) ශ්‍රී ලංකාවේ දී කණිනු නොලැබූ යම් මැණික් ගල් හෝ ලෝහ ;

(ආ) යම් ඛනිජ තෙල්, ගෑස් හෝ ඛනිජ තෙල් නිෂ්පාදන ; හෝ

(ඇ) එම නිෂ්පාදන අපනයනය කිරීමෙන් මෙරටට උපචිත වීමට ඉඩ ඇති විදේශ විනිමය ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන මේ ඡේදයේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් නිෂ්පාදන,

අපනයනය කිරීමෙන් ප්‍රතිතකරුට හෝ ප්‍රතිලාභියාට ශ්‍රී ලංකාවේදී උපචිත වන ලාභ සහ ආදායම්, මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් කර ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බද්දට යටත් විය යුතු ය.

**43**. නැවත අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට රැගෙන එනු ලබන භාණ්ඩ හෝ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පහසුකම් ඇති කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ව්‍යවසායකින් යම් තැනැත්තකුට උපචිත වන ලාභ සහ ආදායම මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් කර ඇති උචිත අනුප්‍රමාණ අනුව ආදායම් බද්දට යටත් විය යුතු ය.

අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඇතැම් ව්‍යවසායවලින් උපචිත වන ලාභ සහ ආදායම් මත බදු අනුප්‍රමාණ.

**44**. යම් කොටස් හෝ කොටස් අයිතිය හෝ කොටස් බලපත්‍රයක් අත්කර ගැනීමේ දිනසිට වසර දෙකක කාලයක් ඇතුළත අලෙවිය සිදුවන අවස්ථාවකදී, එකී කොටස් හෝ කොටස් අයිතිය හෝ කොටස් බලපත්‍ර අලෙවියෙන්, ඒකීය භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් නොවන යම් පුද්ගලයකුට ලැබෙන ලාභ, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණයට අනුව ආදායම් බද්දට යටත් විය යුතුය :

යම් කොටසක් හෝ කොටස් බලපත්‍රයක් විකිණීම මත ආදායම් බදු අනුප්‍රමාණ.

එසේ වුව ද, මේ කොටස් විකිණීමක් සම්බන්ධයෙන් 2005 අංක 5 දරන මුදල් පනතේ 7 වන වගන්තිය යටතේ කොටස් ගනුදෙනු බද්ද ගෙවනු ලැබ ඇත්නම්, එම විකිණීම සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "ලාභ" යන්නට ලැබීම් ඇතුළත් වන අතර, එම ලාභය (ඒ කොටස්) විකිණීමෙන් ලැබුණු මුදලින්, එම කොටස් අන්සතු කිරීමට සෘජුව සම්බන්ධ වන 25 වන වගන්තිය යටතේ ඉඩ දිය හැකි යම් වියදම් සහ ඒ කොටස් අත්කර ගැනීමේ පිරිවැය අඩු කිරීමෙන් ආගණනය කළ යුතු අතර, එය ඒ වර්ෂයේදී ඒ තැනැත්තා විසින් මාස විසිහතරක් නොඉක්මවන කාලසීමාවක් තුළ දරන ලද කොටස්, අයිතිවාසිකම් හෝ කොටස් බලපත්‍ර අන්සතු කිරීමෙන් දරන්නට සිදු වූ අලාභය ලාභයක් හෝ වාසියක් වූයේ නම්, මේ පරිච්ඡේදය යටතේ බදු අයකර ගැනීමට යටත්වන ආකාරයෙන් මෙහි ඉහත සඳහන් පරිදි ආගණනය කරන ලද අඩු කිරීමෙන් පසු ශුද්ධ ලාභය හෝ වාසිය විය යුතු ය. තව ද, වෙන් වෙන් දිනවල දී අත්කර ගත් එකම සමාගමේ වි කොටස් කිණීමෙන් එම විකිණීම සංයුක්ත වන අවස්ථාවක දී ඒ කොටස්වල පිරිවැය හෝ ඒවා දරා සිටි කාලසීමාව, එම කොටස් ප්‍රථමයෙන්

මිලදී ගැනීම සහ ප්‍රථමයෙන් අන්සතු කිරීම පදනම් කරගෙන තීරණය කළ යුතු ය. යම් වර්ෂයක ලාභ හෝ ලැබීම් ඉක්මවා යන අඩු කරනු ලැබිය හැකි අලාභයක අතිරික්තයක්, ඊළඟ වර්ෂයෙන් වර්ෂයට ඉදිරියට ගෙන යා හැකි අතර, මේ ඡේදය යටතේ ශුද්ධ ලාභ හෝ ලැබීම් ආගණනය කිරීමේදී ඒ ආකාරයෙන් අඩු කරනු ලැබිය හැකි ය.

සමාගමක් නොවන තැනැත්තකු විසින් කරගෙන යනු ලබන ඇතැම් ව්‍යවසායවල ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය.

**45**. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමට 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව-

(අ) කෘෂිකාර්මික ව්‍යවසායකින් ;

(ආ) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායකින් ; හෝ

(ඇ) ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින්,

වන (මෙහි මින් මතු මේ වගන්තියේ "නිශ්චිත ලාභ" යනුවෙන් සඳහන් කරන ලබන) මේ ලාභ සහ ආදායම් ඇතුළත් වන්නේ නම් මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, එම නිශ්චිත ලාභ මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා –

(අ) කෘෂිකාර්මික ව්‍යවසාය යන්නට -

(i) මසුන් ඇල්ලීම ;

(ii) කවර වූ හෝ විස්තරයක පැල වර්ග වගා කිරීම සඳහා වූ යම් ව්‍යවසායක් උදෙසා කළමනාකරණ සේවා සැපයීම,

සඳහා වූ යම් ව්‍යවසායක් ඇතුළත් වේ ;

(ආ) "යම් කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායම්" යන්නෙන්-

(i) (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් වන ව්‍යවසායක් සම්බන්ධයෙන් වන විට කළමනාකරණය සැපයීම සඳහා වන ගාස්තුවලින් ලැබෙන ලාභ සහ ආදායම ; සහ

(ii) අනෙකුත් අවස්ථාවක දී එම ව්‍යවසායේ ඵලදාව, කිසියම් සැදීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියකට භාජනය නොකර විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම,

අදහස් වේ ;

(ඇ) "ඉදිකිරීම් වැඩ සඳහා වන ව්‍යවසාය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන යම් -

(i) ගොඩනැගිලි ;

(ii) පාරවල් හෝ පාලම් ; හෝ

(iii) ජල සම්පාදනය, ජලපවාහන හෝ කසල ඉවත් කිරීමේ පද්ධති—

ඉදිකිරීම සඳහා වන ව්‍යවසායක් අදහස් වේ ;

(ඈ) "සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක් " යන්නෙන් -

(i) ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් හෝටලයක් හෝ ආගන්තුක නිවාසයක් ; හෝ

(ii) ලංකා සංචාරක මණ්ඩලය විසින් 'අ' ශ්‍රේණියේ හෝ 'ආ' ශ්‍රේණියේ ආපනශාලාවක් ලෙස ශ්‍රේණිගත කර ඇති ආපනශාලාවක් ;

(iii) සංචාරකයන් නියෝජිතයකුගේ ලද යම් ව්‍යාපාරයක් ;

(iv) සංචාරකයන් ප්‍රවාහනය කිරීමේ යම් ව්‍යාපාරයක ; හෝ

(v) සංචාරකයන් උදෙසා විනෝද හෝ ක්‍රීඩා පහසුකම් සලසාදීම සඳහා ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් ව්‍යාපාරයක්,

මෙහෙයවීම සඳහා වූ ව්‍යවසායක් අදහස් වේ.

සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන ඇතැම් ව්‍යවසායවල ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය.

**46**. (1) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමක බදු අය කළ හැකි ආදායමට යම්–

(අ) කෘෂිකාර්මික ව්‍යවසායකින් ;

(ආ) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායකින් ; හෝ

(ඇ) ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින්,

ලැබෙන ලාභ හා ආදායම් ඇතුළත් වන අවස්ථාවක, එම බදු අය කළ හැකි ආදායමෙහි ඒ ලාභ හා ආදායම් සංයුක්ත වන කොටස සඳහා මේ පරිච්ඡේදයේ වෙනත් විධිවිධානවල හෝ X පරිච්ඡේදයේ හෝ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "කෘෂිකාර්මික ව්‍යවසාය" "සංචාරක ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක් " සහ යම් "කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ හා ආදායම සහ ඉදිකිරීම් වැඩ සඳහා වන ව්‍යවසාය" යන යෙදුම්වලට මේ පනතේ 45 වන වගන්තියේ පිළිවෙළින් දී ඇති අර්ථය තිබිය යුත්තේ ය.

විශේෂඥතාවට පත් නිවාස බැංකුවලට අදාල ආදායම් බදු අනුප්‍රමාණය.

**47**. (1) විශේෂඥතාවට පත් නිවාස බැංකුවක් ලෙස ව්‍යාපාරය කරගෙන යන යම් සමාගමක, යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායමට, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ ව්‍යාපාරයෙන් ලැබූ යම් ලාභ සහ ආදායම් ඇතුළත් වන අවස්ථාවක, එම බදු අය කළ හැකි ආදායමෙහි ඒ ලාභ හා ආදායමෙන් සංයුක්ත වන කොටස, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "විශේෂඥතාවට පත් නිවාස බැංකුව" යන්නෙන් පදිංචිය සඳහා නිවාස සැපයීම හා සම්බන්ධ කටයුතු සඳහා පමණක් මුදල් ණය දීමෙහි නිරත 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථනානුකූලව බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් හෝ විශේෂඥතාවට පත් බැංකුවක් අදහස් වේ.

48. (1) මේ පනතේ 18 වන වගන්තියේ හෝ 22 වන වගන්තියේ සඳහන් යම් සමාගමක ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස්ව පැවැති කාලසීමාව ඉකුත්වීමෙන් පසුව, ආරම්භ වන කවර හෝ තක්සේරු වර්ෂයක් සඳහා 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ සමාගමේ ලාභ සහ ආදායමෙන් මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.

බදුවලින් නිදහස් කාලය ඉකුත් වූ පසු ඇතැම් සමාගම්වලට අදාළ වන්නා වූ ආදායම් බදු අනුප්‍රමාණය.

(2) මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, 17 වන හෝ 19 වන වගන්තියේ සඳහන් යම් සමාගමක, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ හා ආදායම—

(අ) ඒ සමාගමේ ලාභ හා ආදායම, ආදායම් බද්දෙන් නිදහස්ව පැවැති කාලසීමාවට ඉක්බිතිවම අනුප්‍රාප්ත වන තක්සේරු වර්ෂ දෙකෙන් එක් එක් වර්ෂය සඳහා වර්ෂයකට සියයට දහයක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය ;

(ආ) (අ) ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම—

(i) ඒ සමාගම, කෘෂිකර්මයෙහි හෝ සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය කිරීමෙහි නිරත සමාගමක් නම්, සියයට පහළොවක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය ;

(ii) ඒ සමාගම, කෘෂිකර්මයෙහි හෝ සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය කිරීමෙහි නිරත සමාගමක නොවන සමාගමක් නම්, සියයට විස්සක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.

49. සමාගමක් නොවන යම් තැනැත්තකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වන බදු අය කළ හැකි ආදායමට–

46 වන වගන්තියට අනුකූලව බදු අයකල ලාභවලින් ගෙවූ ලාභාංශ මත ආදායම් බදු අනුප්‍රමාණය.

(අ) 46 වන වගන්තියේ සඳහන් ලාභ හා ආදායමෙන් වන ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක ; හෝ

(ආ) 46 වගන්තියේ සඳහන් සමාගමකින් කෙළින්ම හෝ අන්තර් සමාගම් එකක් හෝ වැඩි ගණනක් මගින් හෝ (අ) ඡේදයේ

සඳහන් යම් ලාභාංශයකින් ලැබෙන ලාභාංශය ඇතුළත් වන අවස්ථාවක, පළමුව සඳහන් ලාභාංශය 46 වගන්තියේ සඳහන් ලාභ හා ආදායම ඇති වූ හෝ උපචිත වූ තක්සේරු වර්ෂයේ දී හෝ එම තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ දෙකක් ඇතුළත හෝ ගෙවනු ලැබුවහොත් ;

ඒ ලාභාංශ ඇතුළත් වන්නා වූ පරිදි බදු අය කළ හැකි යම් ආදායමකින් යම් කොටසක් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක් නොවන තැනැත්තන්ගේ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

**50**. යම් සමාගමක් නොවන තැනැත්තකු විසින් යම් නිශ්චිත ව්‍යවසායක් ආරම්භ කරන ලද්දා වූ හෝ 1993 නොවැම්බර් මස 10 වන දින හෝ ඉන් පසුව, ආරම්භ කරන ලද්දේ නම් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායමට යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ අවස්ථාවක එම ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය.

යම් නිශ්චිත ව්‍යවසායක් ආරම්භ කරන සමාගමක් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

**51**. යම් සමාගමක් යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙනයාම 1993 නොවැම්බර් මස 10 වන දින හෝ ඉන්පසුව ආරම්භ කරන්නා වූ ද 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායමට යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ ද අවස්ථාවක, ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් මගින් සංයුක්ත වන්නා වූ බදු අය කළ හැකි ආදායමේ කොටස, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙන යන්නා වූ සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

**52**. 1993 නොවැම්බර් මස 10 වන දිනට පෙර යම් නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරනු ලැබුවා වූ යම් සමාගමක්, 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායමට යම් නිශ්චිත ව්‍යවසායකින් ලැබෙන යම් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ අවස්ථාවක, ඒ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම මගින් සංයුක්ත වන්නා වූ බදු අය කළ හැකි ආදායමේ කොටස මේ පනතේ කුමක් සඳහන් වුව ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

අපනයන ලාභ සහ ආදායම් කෙරෙන් ලාභාංශ සම්බන්ධයෙන් ආදායම් බදු අනුප්‍රමාණය.

**53**. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට පහත සඳහන් :–

(අ) යම් ලාභාංශයක්, එනම්–

(i) 1979 අංක 28 දරන පනතේ 32ඊ වගන්තියේ සඳහන් යම් සමාගමක අපනයන ලාභ සහ ආදායමෙන්, ඒ ලාභ සහ ආදායමෙන් සියයට දහයක අනුප්‍රමාණය මත බද්දක් අය කරනු ලබන කාලය තුළ දී හෝ ඉන් පසුව එක් වර්ෂයක් ඇතුළත හෝ ගෙවන ලද්දා වූ ලාභාංශයක් ; හෝ

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් සමාගමක්, ඒ ගිවිසුම යටතේ ඒ සමාගම වෙත ප්‍රදානය කරන ලද බදු නිදහස් කිරීම වෙනුවට ආදායම් බද්දට යටත්වීමට මනාපය ප්‍රකාශ කර ඇති විට එසේ ආදායම් සම්බන්ධයෙන් සියයට දහයක අනුප්‍රමාණයක් මත ආදායම් බද්ද අය කිරීමට යටත් ආදායමෙන් එසේ බදු අයකරන කාලය ඇතුළත හෝ ඉනික්බිතිවම එක් වර්ෂයක් ඇතුළත ගෙවන ලද්දා වූ ලාභාංශයක් ;

(ආ) යම් සමාගමක් වෙත ලැබුණු (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ හෝ සඳහන් ලාභාංශයකින් ඒ සමාගම විසින් ගෙවනු ලැබූ ලාභාංශයක් සම්බන්ධයෙන් වන විට, පළමුව සඳහන් ලාභාංශය ඒ සමාගම වෙත ලැබුණේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ වර්ෂයේදී හෝ ඉන් පසුව එළඹෙන වර්ෂය තුළදී හෝ එකී දෙවනුව සඳහන් ලාභාංශය ගෙවනු ලැබුවේ නම්, එවැනි ලාභාංශයක් ; හෝ

(ඇ) (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ හෝ සඳහන් ලාභාංශ ගෙවනු ලැබූ කාලපරිච්ඡේදය තුළ දී අතරමැදි සමාගම් එකක් හෝ ඊට වැඩි ගණනක් මගින් යට කී සමාගමට ලැබුණා වූ ද එකී (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ හෝ සඳහන් කර ඇත්තා වූ ද ලාභාංශ අතුරින් ගෙවනු ලැබූ යම් ලාභාංශයක් සම්බන්ධයෙන් සියයට දහයක අනුප්‍රමාණය අනුව ඒ තක්සේරු වර්ෂයේ දී හෝ ඉන් පසුව එළඹෙන තක්සේරු වර්ෂ දෙක තුළ දී හෝ බදු අයකරනු ලැබිය යුතු වේ නම් සහ එකී පළමුව සඳහන් ලාභාංශය ඒ සමාගම වෙත ලැබුණේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ වර්ෂයේ දී හෝ ඉන් පසුව එළඹෙන වර්ෂය තුළ දී හෝ එකී දෙවනුව සඳහන් ලාභාංශය ගෙවනු ලැබුවේ නම්, එවැනි ලාභාංශයක්

ඇතුළත් වන අවස්ථාවක දී, බදු අය කළ හැකි යම් ආදායමක යම් කොටසකින් මේ පනතේ පස් වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණයට අනුව බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමට –

(අ) (i) යම් සමාගමක 51 වන හෝ 52 වන වගන්තියේ සඳහන්, සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායමින් හෝ 56 වන වගන්තියේ සඳහන් ලාභ සහ ආදායමින් හෝ සියයට පහළොවක අනුප්‍රමාණයක් මත ආදායම් බදු අය කළ හැකි කාලසීමාව ඇතුළත හෝ ඉන් පසු එක් අවුරුද්දක් ඇතුළත හෝ ඒ ලාභ සහ ආදායම් වලින් ගෙවන ලද ලාභාංශයක් වන;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 1993 නොවැම්බර් මස 11 වන දිනට පෙර තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත 1994 දෙසැම්බර් 31 දිනට පූර්වයෙන්, තත් කාර්ය සඳහා ඇතුළත් වූ ගිවිසුමක් වන ගිවිසුමකට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වී සිටින යම් සමාගමක් විසින් සියයට පහළොව බැගින් ආදායම් බදු ගෙවා තිබෙන ලාභ හා ආදායම් වන සුදුසුකම් ලැබූ අපයනය ලාභ හා ආදායම්වලින්, සියයට පහළොවක අනු-ප්‍රමාණයක් මත ආදායම් බදු අය කරනු ලැබිය හැකි කාලසීමාව ඇතුළත හෝ ඉන් පසු එක් අවුරුද්දක් ඇතුළත හෝ ගෙවන ලද ලාභාංශයක් වන ලාභාංශයක් මත;

(ආ) යම් සමාගමක් විසින්, ඒ සමාගමට ලැබුණු (අ) ඡේදයේ (i) අනුඡේදයේ හෝ (ii) අනුඡේදයේ සඳහන් යම් ලාභාංශයකින් ගෙවන ලද ලාභාංශයක්, පළමු සඳහන් ලාභාංශය ඒ සමාගමට දෙවනුව සඳහන් ලාභාංශය ලැබුණු තක්සේරු වර්ෂය ඇතුළත හෝ එයින් පසු එක් අවුරුද්දක් ඇතුළත ගෙවනු ලබන්නේ නම්, එසේ ඒ සමාගම විසින් ගෙවන ලද ලාභාංශයක් වන; හෝ

(ඇ) (අ) ඡේදයේ (i) අනුඡේදයේ හෝ (ii) අනුඡේදයේ හෝ සඳහන් වන්නා වූ ද ලාභාංශ ගෙවන ලද්දේ යම් ලාභ හෝ ආදායමකින් ද ඒ ලාභයෙන් හා ආදායමෙන් සියයට පහළොවක අනුප්‍රමාණයක් මත බදු අය කරනු ලැබිය හැකි කාලසීමාව

ඇතුළත් හෝ ඉන් පසු අවුරුදු දෙකක් ඇතුළත යම් සමාගමකට ලැබී ඇත්තා වූ ද යම් ලාභාංශයකින් ගෙවන ලද ලාභාංශයක් වන ලාභාංශයක්, දෙවනුව සඳහන් ලාභාංශය ඒ සමාගමට ලැබුණු තක්සේරු වර්ෂය ඇතුළත හෝ ඉන් පසු එක් අවුරුද්දක් ඇතුළත ඒ පළමු සඳහන් ලාභාංශය ගෙවනු ලබන්නේ නම්, එසේ ඒ සමාගම විසින් ගෙවන ලද ලාභාංශයක් වන,

යම් ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවකදී,

ඒ ලාභාංශ ඇතුලත් වන්නා වූ බදු අය කළ හැකි යම් ආදායමක යම් කොටසකින්, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණයට අනුව, ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

(3) යම් සමාගමක බදු අය කළ හැකි ආදායමට (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් යම් ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක 63 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව ඒ ලාභාංශය සංයුක්ත වන ඒ බදු අය කළ හැකි ආදායම් කොටසකට අදාළ බදු අනුප්‍රමාණය සියයට පහළොවක් විය යුතු ය.

ඇතැම් ලාභාංශ මත ආදායම් බදු අනුප්‍රමාණ.

**54**. යම් තක්සේරු වර්ෂයක් සඳහා (සමාගමක් නොවන) යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), ඡේදයේ සඳහන් ආදායමෙන් නිදහස් කරන ලද යම් ලාභාංශයක් හැර ලාභාංශයක් :—

(අ) මුදල් නොවන්නා වූ හෝ මුදල් ගෙවීම සඳහා නියමයක් නොවන්නා වූ ද;

(ආ) ආදායම් බද්දෙන් නිදහස් කරන ලද හෝ බදු අය කළ නොහැකි ආදායමින් ගෙවීමට නියමිත මුදල් හෝ මුදල් ගෙවීම සඳහා වූ නියමයක් වූ ද; හෝ

(ඇ) යම් සමාගමකට බදු අඩු කිරීමට හිමිකම් ඇද්ද එසේ නැද්ද යන්න නොතකා 65 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ බදු අඩුකිරීමක් නොමැතිව 10 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු නොලැබූ අවස්ථාවක වෙනත් සමාගමකින් ලැබුණ ලාභාංශයක් වූ ද,

අවස්ථාවක එම ලාභාංශ මත ආදායම් බද්ද මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට අනුව අය කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවට පිටතින් ලැබුණු ලාභාංශ සඳහා ආදායම් බදු අනුප්‍රමාණය.

**55**. යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ බදු අය කල හැකි ආදායමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබුණු ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක, එම ආදායම මත, ද්විත්ව බදු අයකිරීම වැළැක්වීම සඳහා පවත්නා යම් ගිවිසුමක විධිවිධානවලට යටත්ව, එම ලාභාංශ නියෝජනය කරන බදු අය කළ හැකි ආදායමෙන් යම් කොටසක් මෙම පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අනුප්‍රමාණයට අනුව බදු අය කරනු ලැබිය යුතුය.

යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සැලකුණු අපනයන සම්බන්ධයෙන් වූ ආදායම් බදු ප්‍රමාණය.

**56**. (1) 60 වන වගන්තියේ (ඇ) ඡේදයේ (1) වන අනුඡේදයේ සඳහන් යම් නිශ්චිත ව්‍යවසායකට –

(අ) (තොග වශයෙන් වන කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි හෝ අලුත් පොල් හැර) ඒ නිශ්චිත ව්‍යවසාය විසින් වැඩිමනත් නිෂ්පාදනය කිරීමක් නොමැතිව අපනයනය කිරීම සඳහා යම් වෙළෙඳ ද්‍රව්‍යයක් **;** හෝ

(ආ) ඒ නිශ්චිත ව්‍යවසාය විසින් අපනයනය කිරීම සඳහා යම් වෙළෙඳ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ හෝ සෑදීමේ සහ සැකසීමේ හෝ එතීමේ භාණ්ඩ,

යම් ව්‍යාපාරයක්, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන අවස්ථාවක, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම නොවන, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම වන්නා වූ ඒ සැපයීමෙන් ලැබුණු ලාභ සහ ආදායම, මේ වගන්තියේ මතු සඳහන් විධිවිධානවලට අනුකූලව ආදායම් බද්දට යටත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු (යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වන සමාගමක් ද ඇතුළුව) සමාගමක් වන්නා වූ ද යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අයකළ හැකි ආදායමට, (1) වන උපවගන්තියේ ලාභ සහ ආදායම් ඇතුළත් වන අවස්ථාවක, ඒ ලාභ සහ ආදායම මත සියයට පහළොවක අනුප්‍රමාණයක ආදායම් බද්දක් ඒ සමාගමෙන් අයකරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු (යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වන පුද්ගලයකු ද ඇතුළුව) පුද්ගලයකු වන්නා වූ අවස්ථාවක යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහුගේ බදු අය කළ හැකි ආදායමට (1) වන උපවගන්තියේ ලාභ සහ ආදායම ඇතුළත් වන අතර (මෙහි මින් මතු මේ වගන්තියේ “ආදායමේ අදාළ කොටස” යනුවෙන්

සඳහන්) ආදායමේ කොටසක් මත සියයට පහළොව ආදායමේ අනුප්‍රමාණය ඉක්මවන්නා වූ විට ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයෙන් බදු ගණනය කළ යුතු ය :—

(අ) ආදායමේ අදාළ කොටස ඒ ලාභ සහ ආදායම් ඉක්මවන්නේ නම්–

(i) ඒ ලාභ සහ ආදායමට සමාන වන ආදායමේ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද සියයට පහළොව බැගින් වූ අනුප්‍රමාණයක් විය යුතු ය ; තව ද,

(ii) ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද මේ පනත යටතේ අදාළ කළ යුතු පරිදි වූ සියයට පහළොවට වැඩි බදු අනුප්‍රමාණයක් අනුව ආගණනය කරනු ලැබිය යුතුය ;

(ආ) ආදායමේ අදාළ කොටස ලාභ සහ ආදායම නොඉක්මන්නේ නම්, ආදායමේ අදාළ කොටසේ මුළු ප්‍රමාණය මත ගෙවිය යුතු බද්ද මේ පනතේ ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද සියයට පහළොවක අනුප්‍රමාණයක් විය යුතු ය.

(4) (1), (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධාන එහි සඳහන් කරන ලද සැපයීම් –

(අ) (i) (1) වන උපවගන්තියේ සඳහන් නිශ්චිත ව්‍යවසාය කරගෙන ගිය තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකුගේ හෝ බදු අය කළ හැකි ආදායම මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ආදායම් බද්දට යටත් කළ හැකි කාලසීමාව තුළ කරනු ලැබුවේ නම්;

(ii) (1) වන උපවගන්තියේ සඳහන් නිශ්චිත ව්‍යවසායේ අපනයන ලාභ සහ ආදායම 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ ඒ නිශ්චිත ව්‍යවසාය විසින් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතිකරගත් ගිවිසුමක් ප්‍රකාර හෝ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය හැකි කාලසීමාව තුළ කරනු ලැබුවේ නම් ;

(ආ) ඒ සැපයීම්වලට අදාළ අපනයන ඇත්ත වශයෙන් කරන ලද බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි සාක්ෂි ඉදිරිපත් කරනු ලැබුවේ නම්,

අදාළ විය යුතු ය.

යම් වාසික සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද සේවාවන්ගෙන් ලැබෙන ලාභ සහ අදායම් සම්බන්ධයෙන් මුළු ආදායම් අනුප්‍රමාණය.

**57**. ශ්‍රී ලංකාව තුළ වූ යම් වාසික සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට යම් වෘත්තියක් කරගෙන යාමෙන් හෝ ක්‍රියාත්මක කිරීමේ ආකාරයන් මගින් සේවා සිදුකරමින් ශ්‍රී ලංකාවේදී සිදුකරන ලද සේවාව වෙනුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම් සම්බන්ධයෙන්, මතුපිට ඒ ලාභ සහ ආදායම් ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුවක් මාර්ගයෙන් ඒ සමාගම වෙත ප්‍රේෂනය කර ඇත්නම්, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද නියමිත අනුප්‍රමාණ මත ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය.

ඇහලුම් අපනයන කරුවන්ට ඇතැම් සේවා සැපයීමෙන් ලැබෙන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය.

**58**. රෙදි පිළි සහන මණ්ඩලය විසින් අනුමත කරන ලද කිසියම් ඇහලුම් නිෂ්පාදකයකු විසින් රෙදිපිළි සහන මණ්ඩලයේ ලියාපදිංචි යම් අපනයනකරුවකු වෙත, යම් ඇහලුම් මැසීමේ සේවාවන්, ඇහලුම් කොටස් කිසිවක්, ඇහලුම් කිසිවක වටිනාකම වැඩිදියුණු කිරීම අරමුණු කරන්නා වූ වෙනත් යම් සේවාවක් සැපයීමෙන් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ ඇත්තා වූ අපනයන වෙළෙඳ හවුසියක් මගින් හෝ කෙලින්ම ඒ අපනයනකරු විසින් අපනයනය කරනු ලැබුවා වූ ද, අපනයනකරු විසින් නිෂ්පාදකයා හට සපයන ලද රෙදි වලින් සාදනු ලැබුවා වූ ද,3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම්වල යම් කොටසකින්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයකට එරෙහිව කුමක් සඳහන් වුවද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නියමිත අනුප්‍රමාණයට අනුව ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය.

(අ) ඒ සැපයුමට අදාල අපනයනවල විදේශ විනිමය වටිනාකම ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම සඳහා වූ ජාත්‍යන්තර ණයවර ගිණුමකට එරෙහිව ගෙවිව පසු ගෙවීමේ පදනම මත ශ්‍රී ලංකා බැංකුවක ණයවර ගිණුමක් විවෘත කිරීම මගින් ; හෝ

(ආ) (i) ගෙවීම් සැලකිල්ලට ගැනීමේ දී ඒ අපනයනකරු විසින් ඒ නිෂ්පාදකයාගේ නමට එවන ලද අණකරයක්, විදුලි පණිවිඩ පැවරුමක් මගින් වූ විදේශ ව්‍යවහාර මුදලක් ඒ සැපයුමට ගෙවීම් කර ; සහ

(ii) ඒ සැපයුම්වලට අදාළ ඇහලුම් සත්‍ය වශයෙන්ම අපනයනය කර ඇති බවට තමා සෑහීමට පත්වන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් ලේඛන ගත සාක්ෂියක්,

මගින් ඒ සැපයුම ආවරණය කර ඇත්නම්

මේ පනතේ වෙනත් යම් විධිවිධානයකට එරෙහිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නියමිත අනුප්‍රමාණයට අනුව ආදායම් බදු අයකරගනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "රෙදිපිළි සහන මණ්ඩලය" යනුවෙන් 1996 අංක 33 දරන රෙදිපිළි සහන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද රෙදිපිළි සහන මණ්ඩලයක් අදහස් වේ.

නැවකින් නැවකට මාරු කිරීමේ නියෝජ්‍යායතන ගාස්තු වලින් ලබන්නාවූ ලාභාංශ මත වූ බදු අනුප්‍රමාණය.

**59**. (1) නැව් හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යන කිසියම් නිර්වාසික තැනැත්තකුගේ යම් අනුයෝජිතයකු විසින් ලබාගන්නා ලාභ සහ ආදායම් ඒ නිර්වාසික තැනැත්තා විසින් කරගෙන යනු ලබන නැවකින් නැවකට මාරුකිරීමේ කාර්යය කිසිවක් සම්බන්ධයෙන් යම් නිර්වාසික තැනැත්තකු විසින් සිදුකරන ලද සේවාවන් සැලකිල්ලට ගෙන විදේශීය ව්‍යවහාර මුදලින් යම් අනුයෝජිතයකුට ගෙවිය යුතු නියෝජ්‍යායතන ගාස්තු ලෙස ආරෝපිත කරනු ලැබිය යුතු අතර, ඒ අනුයෝජිතයා වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා විසින් අනුමතකරන ලද අනුයෝජිතයකු වන අවස්ථාවක දී, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති සුදුසු අනුප්‍රමානයන්ට ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් අනුයෝජිතයකුට අදාළ නියෝජ්‍යායතන ගාස්තු වෙනුවෙන් සහ යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් ආරෝපිත කල හැකි ලාභ සහ ආදායම් (1) වන උපවගන්තියේ සඳහන් කල සහ යම් තක්සේරු වර්ෂයක දී ඒ අනුයෝජිතයාට උපචිත වන්නා වූ නියෝජ්‍යායතන ගාස්තු ලෙස දැරිය යුතු මුදලක් විය යුතු ය. එම අනුපාතයටම, නැව් අනුයෝජිත ව්‍යාවහාරයෙන් ඒ අනුයෝජිතයා ලබන ව්‍යවස්ථාපිත ආදායමේ අනුපාතය ඒ නැව් අනුයෝජිත ව්‍යාපාරයෙන් මුළු ලැබීමක් දරන පරිදි විය යුතු ය.

අර්ථ නිරූපනය.

**60**. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා-

(අ) "අපනයන පිරිවැටුම" යන්න යම් නිශ්චිත ව්‍යවසායක් සම්බන්ධයෙන් යෙදෙන විට, භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් හෝ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් සේවාවක් සැපයීමෙන් හෝ ඒ ව්‍යවසාය විසින් ලබාගත්තේ හෝ නොගත්තේ වුව ද ලබාගත හැකි මුළු මුදල අදහස් වන නමුත් එයට-

(i) මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමෙන් හෝ ප්‍රාග්ධන වත්කම් කිසිවක් විකිණීමෙන්, ලබාගත්තේ හෝ නොගත්තේ වුව ද, ලබාගත හැකි වූ යම් මුදලක්;

(ii) තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි හෝ අලුත් පොල් අපනයනය කිරීමෙන් ලබාගත්තේ හෝ නොගත්තේ වුව ද ලබාගත හැකි වූ යම් මුදල් ප්‍රමාණයක් ; හෝ

(iii) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම නොවන ලාභ සහ ආදායම් කිසිවක්,

ඇතුළත් නොවේ ;

(ආ) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, "සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම" යන්නෙන් ඉන් ඒ තැනැත්තා විසින් කරගෙන ගිය යම් නිශ්චිත ව්‍යවසායකින් ඒ තක්සේරු වර්ෂය සඳහා මේ පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද (මැණික් සහ ස්වර්ණාභරණ විකිණීමෙන් ලත් ලාභ සහ ආදායම් සහ යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් ලත් ලාභ සහ ආදායම් බැහැර කිරීමෙන් පසුව 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල) ලාභ සහ ආදායමට පහත සඳහන් සම්බන්ධතාව, එනම්, ඒ තක්සේරු වර්ෂයේ ඒ ව්‍යාපාරයේ අපනයන පිරිවැටුම් යම් අනුප්‍රමාණයක් දරන්නේ ද එකී ලාභ සහ ආදායමට ඒ අනුපාතයම දරන මුදල අදහස් වේ ;

(ඇ) "නිශ්චිත ව්‍යවසාය" යන්නෙන්-

(i) ඒ ව්‍යවසාය විසින් සාදන ලද, නිෂ්පාදනය කරන ලද හෝ මිලට ගන්නා ලද සම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය කිරීමෙන් ; හෝ

(ii) විදේශ ව්‍යවහාර මුදලින් වූ ගෙවීම් සඳහා නැව් අලුත්වැඩියා කිරීම, නැව් බිඳ හෙළීම, මුදු නැව් බඩු කන්ටේනර් අලුත්වැඩියා කිරීම හා යථා තත්ත්වයට පත්කිරීම, පරිගණක මෘදුකාංග, පරිගණක වැඩසටහන්, පරිගණක පද්ධති සැපයීම හෝ පරිගණක දත්ත පටිගත කිරීම පිළිබඳ යම් සේවාවන් හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් සේවාවක් ඉටුකිරීමෙහි,

නිරත වන යම් ව්‍යාපාරයක් අදහස් වේ ; සහ

(ඈ) "මුළු පිරිවැටුම" යන්න, යම් නිශ්චිත ව්‍යවසායක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් යම් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් හෝ වෙළෙඳාමකින්, ලබාගත්තේ හෝ නොගත්තේ වුව ද, ලැබිය හැකි වූ මුළු මුදල අදහස් වන නමුත් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම නොවන යම් ආදායම් කිසිවක්, ප්‍රාග්ධන වත්කම්, මැණික් හෝ ස්වර්ණාභරණ විකිණීමෙන්, ලබා ගත්තේ හෝ නොගත්තේ වුව ද ලබාගත හැකි යම් මුදල් ප්‍රමාණයක් ඊට ඇතුළත් නොවේ.

මේ වගන්තියේ කාර්ය සඳහා "සම්ප්‍රදායික නොවන භාණ්ඩ" යන්නෙන්, තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ස්ක්‍රැප් රබර්, රබර් කිරි හෝ අලුත් පොල් හැර 16 වන වගන්තියේ සඳහන් වූ අනෙක් භාණ්ඩ අදහස් වේ ;

X වන පරිච්ඡේදය

**සමාගම්**

යම් වාසික සමාගමක් විසින් ගෙවීමට යටත් ආදායම් බද්ද.

**61**. (1) යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් ඒ වර්ෂය වෙනුවෙන් ගෙවීමට යටත් ආදායම් බද්ද, පනත සඳහන් දෑ වලින් සමන්විත විය යුතු ය :—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් උචිත අනුප්‍රමාණය අනුව ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ මුදල් ප්‍රමාණයකින් :

(ආ) (i) 7 වන වගන්තියේ (අ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති යම් සමාගමක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් ; හෝ

(ii) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද යම් ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක්,

(iii) එම ලාභාංශය සම්බන්ධයෙන්10 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ යම් කොටස් හිමියෙක් වෙත ; හෝ

(iv) වෙනත් නේවාසික සමාගමකින් ලැබුන යම් ලාභාංශයක්,

මගින් බෙදාහරින ලද යම් ලාභාංශයක් හැර යම් තක්සේරු වර්ෂයක් සඳහා එම ලාභවලින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් නොවන එම සමාගම විසින් එම තක්සේරු වර්ෂයේ දී බෙදාහරිනු ලබන දළ ලාභාංශවල මුළු එකතුවෙන් සියයට දහයකට සමාන මුදලක් ;

(ඇ) යම් තක්සේරු වර්ෂයක් සඳහා ණයක් නොවන ආකාරයකින් ආණ්ඩුව විසින් ප්‍රාග්ධනයෙන් සියයට හැත්තෑපහකට නොඅඩු ප්‍රමාණයක් සපයා දෙනු ලැබූ යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට එහි ලාභවලින් (අ) ඡේදය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද අඩු කිරීමෙන් පසුව වූ එහි ලාභවල ශේෂයෙන් සියයට විසිපහකට සමාන මුදලක් විය යුතු ය :

එසේ වුව ද යම් වර්ෂයක් සඳහා ඒ සංස්ථාවේ බදු අය කළ හැකි ආදායම ආගණනය කිරීමට පදනම් කර ගත් ලාභවලින් ඒ තක්සේරු වර්ෂයේ දී බෙදාහරිනු ලැබූ යම් දළ ලාභාංශවල එකතු ප්‍රමාණය -

(i) ඒ ශේෂයෙන් සියයට විසිපහකට වඩා අඩු නොවන අවස්ථාවක, මේ ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය ; තව ද,

(ii) ඒ ශේෂයෙන් සියයට විසිපහකට අඩු වන අවස්ථාවක, අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ රාජ්‍ය සංස්ථාව මේ ඡේදය යටතේ යටත්වන බද්ද, ඒ ශේෂයෙන් සියයට විසිපහක, එම ලාභාංශවල එම ප්‍රමාණය ඉක්මවන අතිරික්තයට සමාන මුදලක් විය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ" ලාභවලට ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් වූ එහි ලාභ ඇතුළත් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඈ) යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට තිහකට වඩා අඩු නොවන අනු ප්‍රමාණයකට මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ ආදායම් බදු ගෙවීමට යම් සමාගමක් යටත් වන අවස්ථාවක එම සමාගමේ බදු අය කළ හැකි ආදායමෙන් සියයට දෙකහමාරකට සමාන මුදලක් ආණ්ඩුව විසින් පිහිටුවනු ලැබූ මානව සම්පත් ප්‍රතිලාභ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :

එසේ වුවද මානව සම්පත් ප්‍රතිලාභ අරමුදල පිහිටුවනු ලබනතුරු, එම බදු මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් සමාගමකින් ලැබුණ යම් ලාභයකට අදාළව "දළ ලාභාංශ ප්‍රමාණය" විය යුත්තේ එසේ ලැබුණ ලාභාංශ ප්‍රමාණය වේ.

යම් නිර්වාසික සමාගමක් විසින් ගෙවීමට යටත් ආදායම් බද්ද.

**62**. (1) යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවේ නිර්වාසික සමාගමක් ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ගෙවීමට යටත් ආදායම් බද්ද-

(අ) දෙවන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ මුදලට සමාන මුදලකින් ; සහ

(ආ) එම තක්සේරු වර්ෂය තුළ එම සමාගම ප්‍රේෂණ කර ඇති අවස්ථාවක සමාගමේ එම ප්‍රේෂණවලින් සියයට දහයක මුදලට සමාන මුදලකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි "ප්‍රේෂණ" යන්න නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන්—

(අ) වාසික සමාගමක් විසින් ඒ නිර්වාසික සමාගමට ගෙවන ලද යම් ලාභාංශ ඇතුළත් නොවන්නා වූ සමාගමේ බදු අය කළ හැකි ලාභ හා ආදායම සහ ශ්‍රී ලංකාවේ දී ලබන ලාභවලින් බදු අය කරනු ලැබීමට යටත් ඒ සමාගම ශ්‍රී ලංකාවෙහි කරගෙන යන යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් වෙනුවෙන් ඒ සමාගම විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී ලබන යම් මුදල් ප්‍රමාණයක් මෙරටට ප්‍රේෂණය කළ හෝ පිටරටෙහි දී රඳවා ගනු ලැබූ මුදල ;

(ආ) ඒ සමාගම විසින් අපනයනය කළ බඩු පිටරට විකිණීමෙන් ලැබුණු මුදල්වලින් පිටරට රඳවා තබන කොටස ; සහ

(ඇ) ඒ සමාගම විසින් අපනයනය කොට තොග වෙළෙඳ පොළක නොවිකුණනු ලැබූ නැතහොත් කොහෙත්ම නොවිකුණනු ලැබූ යම් නිෂ්පාදන සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවෙන් ඉපැයුණු බවට 84 වන වගන්තිය යටතේ සැලකෙන ලාභවලින් පිටරට රඳවා ඇති කොටස,

අදහස් වේ.

ඇතැම් ලාභාංශ ලබාගන්නා සමාගමේ තක්සේරු කල හැකි ආදායමේ කොටසක් නොවන බව.

**63**. යම් වාසික සමාගමක් විසින් යම් වාසික හෝ නිර්වාසික සමාගමකට ලාභාංශ ගෙවනු ලැබ-

(අ) ඒ ලාභාංශ සම්බන්ධයෙන් පළමුව සඳහන් කළ වාසික සමාගම විසින් 65 වන වගන්තිය යටතේ අඩු කිරීමක් කරනු ලැබ ඇති ;

(ආ) එම ලාභාංශ 10 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති ; හෝ

(ඇ) එම ලාභාංශ, පළමුව සඳහන් කල වාසික සමාගමට වෙනත් නේවාසික සමාගමකින් ලැබුණු ලාභාංශ ප්‍රමාණයක යම් කොටසකින් සමන්විත වන්නා වූ ;

අවස්ථාවක, මේ පනතෙහි වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ලාභාංශය දෙවනුව සඳහන් කළ සමාගමේ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

තම කොටස්කරුවන් සමග කරන ගණුදෙනු වලින් ලැබෙන සමාගමක ලාභ.

**64**. සමාගමක කොටස්කරුවන් නොවන තැනැත්තන් සමග කරනු ලැබුවේ නම්, තක්සේරු කළ හැකිවන්නේ යම් ගණුදෙනුවලින් ලැබෙන ලාභ ද තම කොටස්කරුවන් සමග සමාගමක් විසින් කරනු ලබන සමාගමට ලැබෙන එබඳු ලාභ මේ පනතෙහි අර්ථානුකූලව ලාභ විය යුතු ය.

යම් ලාභාංශයකින් බද්දක් අයකර ගැනීමට වාසික සමාගමකට හිමිකම ඇති බව.

**65**. (1) (ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක් හැර) සෑම වාසික සමාගමක් විසින්ම යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අයකළ හැකි ආදායම ආගණනය කිරීමට පදනම් කරගන්නා ලාභවලින්, මුදල්වලින් හෝ මුදල් ගෙවීමට කෙරෙන නියෝග ආකාරයෙන්-

(අ) 7 වන වගන්තියේ (අ) සහ (ඇ) ඡේද යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ;

(ආ) ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක්,

නොවන වෙනත් කොටස්කරුවකුට ගෙවිය යුතු දළ ලාභාංශවලින් සියයට දහයකට සමාන ආදායම් බද්දක් අඩුකර ගත යුතු ය :

එසේ වුව ද, (1) වන උපවගන්තිය යටතේ හෝ මෙම උපවගන්තිය යටතේ ආදායම් බදු අඩු කිරීමෙන් පසු වෙනත් සමාගමකින් ලැබුණු යම්

ලාභාංශයක් සහ 10 වන වගන්තිය යටතේ නිදහස් කරනු ලැබූ යම් ලාභාංශයක් හෝ හැර, යම් සමාගමක ලාභ සහ ආදායමෙන් ආදායම් බදු අයකළ හැකි වුව ද නැති වුව ද එම සමාගමේ ලාභ සහ ආදායමෙන් ගෙවිය යුතු යම් දළ ලාභාංශ මුදලින්, මේ උපවගන්තිය යටතේ ආදායම් බදු අඩුකර ගත යුතු ය.

වෙනත් සමාගමකින් ලැබුණ යම් ලාභාංශයකට අදාළව දළ ලාභාංශ ප්‍රමාණය විය යුත්තේ එසේ ලැබුණ ලාභාංශ ප්‍රමාණය වේ.

(2) යම් තක්සේරු වර්ෂයක් තුළ දී වාසික සමාගමක් විසින් ගෙවිය යුතු වන යම් ලාභාංශයක් ගෙවීම සඳහා ලියනු ලැබූ හෝ පිළියෙළ කරනු ලැබූ බලපත්‍රයක්, චෙක්පතක් හෝ වෙනත් අණක් නිකුත් කරන සෑම තැනැත්තකුම විසින්, මෙහි පහත දැක්වෙන කරුණු පෙන්නුම් කරන ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කර ඇති ආකාරයට එයට ඇමිණිය යුතු ය.

එනම්-

(අ) ආදායම් බදු අඩු කිරීමෙන් පසු නියම වශයෙන් ගෙවනු ලැබූ ශුද්ධ ප්‍රමාණයට අනුරූප වන දළ ප්‍රමාණය ;

(ආ) ආදායම් බදු වශයෙන් අඩු කරනු ලැබූ මුදල ;

(ඇ) නියම වශයෙන් ම ගෙවනු ලැබූ ශුද්ධ ප්‍රමාණය ;

(ඈ) පහත දැක්වෙන ලාභාංශ යනාදියෙන් ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණ වෙන් වෙන්ව දක්වමින්, දළ ලාභාංශයේ සංයුතිය:—

(i) ලැබුණු බදු වලින් නිදහස් ලාභාංශවලින් ;

(ii) ලැබුණු වෙනත් ලාභාංශවලින් ;

(iii) ආදායම් බද්දෙන් නිදහස් ආදායමෙන් ;

(iv) වෙනත් ලාභවලින් සහ ආදායමෙන්,

ගෙවන ලද මුදල.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට කොටස් හෝ සෘණ පත්‍ර ස්වරූපයෙන් වූ වාසික සමාගමක ලාභාංශයක් ඇතුළත් වූ විටෙක ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් ඒ ලාභාංශය මුදලින් ගෙවන ලද්දේ නම්, ඒ ලාභාංශය වෙනුවෙන් (1) වන උපවගන්තිය යටතේ බද්දක් වශයෙන් අඩුකර ගැනීමට සමාගමට හිමිකම් තිබූ ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් අඩුකර ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

**66**. (1) යම් සමාගමක් සම්බන්ධයෙන් වන විට යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගම තම ලාභවලින් සාධාරණ කොටස් තම කොටස්කරුවකුට බෙදා දී නැති බවට තක්සේරුකරු සෑහීමකට පත්වූ අවස්ථාවක (පවත්නා ව්‍යාපාරයක් හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයක් මිලයට ගැනීම සඳහා ගෙවනු ලැබූ මිල හැර) සමාගමේ ව්‍යාපාරයේ සංවර්ධනය සඳහා දරනු ලැබූ යම් වියදමක් අඩු කිරීමෙන් පසු සමාගමේ සම්පූර්ණ ලාභ හෝ එහි කොටසක් තක්සේරුකරු විසින් දන්වනු ලැබූ දිනයකදී සමාගමේ කොටස්කරුවන්ට ලාභාංශය වශයෙන් බෙදාදුන් ලෙස (2) වන, (3) වන හා (4 වන) උපවගන්තිවල විධිවිධානවලට යටත්ව තක්සේරුකරු විසින් සලකනු ලැබිය හැකි ය.

ඇතැම් බෙදා හරිනු නොලැබූ ලාභ බෙදාහරිනු ලැබූ ලෙස සැලකිය යුතු බව.

(2) සමාගමක් විසින් තම කොටස්කරුවන්ට එහි ලාභවලින් සාධාරණ කොටසක් බෙදාදෙන ලද්දේ ද නැද්ද යන්න (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කිරීමේ දී තක්සේරුකරු විසින්—

(අ) එහි මුළු ලාභ ප්‍රමාණය ;

(ආ) සමාගම සම්බන්ධයෙන් යම් අතිරේක තක්සේරුවක් කරනු ලැබ ඇත්නම් එය ;

(ඇ) සමාගමෙහි ව්‍යාපාරයෙහි තත් කාලයෙහි පවත්නා වූ අවශ්‍යතාවයන් ; සහ

(ඈ) සමාගමේ ව්‍යාපාරයෙහි නඩත්තුව සහ සංවර්ධනය සහ වුවමනා හෝ ප්‍රඥාගෝචර විය හැකි වෙනත් අවශ්‍යතා,

සැලකිල්ලට ගත යුතු ය.

(3) (1) වන උප වගන්තියේ කාර්ය සඳහා පහත දැක්වෙන මුදල්වලින් යමක්, සමාගමේ ව්‍යාපාරයේ අවශ්‍යතාවලට හෝ ව්‍යාපාරයේ නඩත්තුව හෝ සංවර්ධනය සඳහා වුවමනා හෝ ප්‍රඥාගෝචර විය හැකි වෙනත් අවශ්‍යතාවලට හෝ යොදාගනු නොලැබූ හෝ යොදාගත නොහැකි

සමාගමේ කොටස්කරුවන් අතර බෙදාදීම සඳහා ඇති ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය :—

(අ) ප්‍රමාණවත් ප්‍රතිෂ්ඨාවක් සඳහා නොව, අන් ලෙසකින් නිකුත් කරනු ලැබූ හෝ ඇතිකර ගත් යම් කොටසක් යම් ණය ප්‍රාග්ධනයක් හෝ ණයක්, (ඒ කොටස ණය ප්‍රාග්ධනය හෝ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් අධි මුදලක් වේ නම් එය ද ඇතුළුව) නිදහස් කර ගැනීමෙහි හෝ නැවත ගෙවීමෙහිලා සමාගමේ ලාභවලින් වියදම් කරනු ලැබූ හෝ යොදාගනු ලැබූ හෝ නැතහොත් වියදම් කිරීමට හෝ යොදා ගැනීමට අදහස් කරනු ලැබූ යම් මුදලක් ;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරයකුට හෝ කොටස් හිමියකුට ණයට දෙනු ලැබූ යම් මුදලක් ; සහ

(ඇ) යම් ව්‍යාජ හෝ කෘත්‍රිම ගනුදෙනු අනුව හෝ ඒවායේ ප්‍රතිඵලයක් වශයෙන් වියදම් කරනු ලැබූ හෝ යොදාගනු ලැබූ හෝ වියදම් කිරීමට හෝ යොදාගැනීමට අදහස් කරනු ලැබූ යම් මුදලක්.

(4) යම් කොටසක් හෝ ණය ප්‍රාග්ධනයක් හෝ ණයක් නිකුත් කරන ලද්දේ හෝ දරන ලද්දේ–

(අ) (යම් වාරිකයක් ද ඇතුළුව) ප්‍රාග්ධනයේ හෝ ණයේ ප්‍රමාණයට බොහෝ සෙයින්ම අඩු, වටිනාකමක් සමාගමට ඇතිවන ආකාරයේ ප්‍රතිෂ්ඨාවක් සඳහා නම් ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ ආකාරයට ප්‍රතිෂ්ඨාවක් සඳහා නිකුත් කරනු ලැබූ හෝ දරනු ලැබූ යම් කොටසක් හෝ ණය ප්‍රාග්ධනයක් හෝ ණයක් නිදහස් කිරීමට හෝ නැවත ගෙවීමට හෝ එසේ නිදහස් කිරීමෙන් හෝ නැවත ගෙවීමෙහි ලා හෝ ඒ සඳහා යොදාගත් හෝ යොදා ගැනීමට අදහස් කරන ලද මුදල් සොයා ගැනීමෙහි කාර්ය සඳහා නැතහොත් එබඳු ප්‍රතිශ්ඨාවක් සඳහා නිකුත් කරනු ලැබූ හෝ දරනු ලැබූ නියම ලෙස හෝ අනියම් ලෙස නියෝජනය වන යම් කොටසක් හෝ යම් ණය ප්‍රාග්ධනයක් හෝ ණයක් සඳහා නම් ;

(3) වන උපවගන්තියේ කාර්ය සඳහා එම කොටස හෝ ණය ප්‍රාග්ධනය හෝ ණය ප්‍රමාණවත් ප්‍රතිශ්ඨාවක් සඳහා හැර අන්‍යාකාරයකට නිකුත් කරනු ලැබ හෝ දරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, යම් කාර්යයක් සඳහා අදාළ කරගෙන ඇති හෝ අදාළ කරගනු ලබන යම් මුදලකට මේ උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ කරන ලද යම් සඳහනක් හෝ එම මුදල් ප්‍රතියෝජනය කිරීමේදී හෝ ප්‍රතියෝජනය කිරීම උදෙසා යොදා ගත් හෝ යොදා ගනු ලබන මුදල්වලට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් සමාගමේ සම්පූර්ණ ලාභ හෝ ඉන් කොටසක් සමාගමේ කොටස්කරුවන්ට ලාභාංශ වශයෙන් බෙදාදුන් ලෙස (1) වන උපවගන්තිය යටතේ තක්සේරුකරු විසින් සලකනු ලැබූ අවස්ථාවක, එසේ බෙදා දුන් ලෙස සලකනු ලැබූ ලාභ සම්බන්ධයෙන් ඒ වර්ෂය වෙනුවෙන් පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම් මත ආදායම් බද්ද අය කළ හැකි ඉහළම අනුප්‍රමාණය අනුව ආදායම බද්දක් ඒ සමාගම විසින් ගෙවිය යුතු වන අතර ඒ බද්ද-

(අ) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද වෙනුවෙන් නොව ඊට අමතර වශයෙන් විය යුතුය ; තව ද,

(ආ) තක්සේරුකරුවකු විසින් එම සමාගම විෂයයෙහි තක්සේරු කර අයකර ගත හැකි අතර, එය ගෙවීම සහ අයකර ගැනීම පිළිබඳ විධිවිධාන එලෙසටම අදාළ විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් සමාගමක්, අධිකරණයක් විසින් කළ ආඥාවක් අනුව හෝ සමාගමේ කොටස් කරුවන් විසින් ඒ වෙනුවෙන් සම්මත කරනු ලබන යෝජනාවක් අනුව හෝ ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, ඒ ගණන් බේරා වසා දැමීම ආරම්භ වන තක්සේරු වර්ෂයකදී හා ඒ අවසන් කිරීම සම්පූර්ණ වනතෙක් හෝ ඊට පසුව එළඹෙන තෙක් එක් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් පසු ආදායම් ශේෂය, ලාභාංශය වශයෙන් ඒ කොටස්කරුවන්ට බෙදා දුන් ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.

සමාගමක ලාභ සහ ආදායම සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් නතුකර ගන්නා අවස්ථාවක අදාල වන විධිවිධාන.

**67**. යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් සමාගමක ලාභ සහ ආදායම හෝ එවැනි ලාභවල සහ ආදායමෙහි යම් කොටසක් ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු, කොටස්කරුවකු හෝ විධායක නිලධරයකු විසින් නතුකර ගන්නා ලද අවස්ථාවක, ඒ ලාභ සහ ආදායම හෝ ඒ ලාභවල ආදායමෙහි යම් කොටසක් එම තක්සේරු වර්ෂය වෙනුවෙන් ඒ ලාභ හෝ ආදායම හෝ එහි කොටස නතු කරගත් තැනැත්තාගේ ලාභවල සහ ආදායමෙහි කොටසක් විය යුතු අතර, ඒ අනුව තක්සේරු කළ හැකිය. තව ද සියලු අවස්ථාගත කරුණු ගැන සැලකිලිමත්ව කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ඒ සමාගමේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ කාර්යය සඳහා එම ලාභ සහ ආදායම හෝ එහි කොටස් 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අඩු කළ හැකිය.

මේ පරිච්ඡේදයේ විධිවිධාන පුණ්‍යායතන ආදියට අදාල නොවිය යුතු බව.

**68**. මේ පරිච්ඡේදයේ විධිවිධාන, සංස්ථාවක වන පුණ්‍යායතනයකට හෝ 101 වන වගන්තිය යටතේ තක්සේරු කරනු ලැබිය හැකි සංස්ථාගත මණ්ඩලයක් වූ යම් පුද්ගල මණ්ඩලයකට අදාළ නොවිය යුතු ය.

## XI වන පරිච්ඡේදය

## **විශේෂ අවස්ථා**

### අ - දරුවෝ

දරුවකුගේ ආදායම තක්සේරු කිරීම.

**69**. (1) දරුවකු වන පුද්ගලයකු යම් තක්සේරු වර්ෂයක් තුළදී අවුරුදු දහඅටට එළඹුණු විට හෝ ඔහු විවාහ වූ විට, ඒ තක්සේරු වර්ෂය සඳහා -

(අ) ඒ පුද්ගලයාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම ඔහුගේ දෙමවුපියන්ගෙන් කෙනකුගේ ව්‍යවස්ථාපිත ආදායමට එකතු කරනු නොලැබිය යුතු අතර, එය ඔහුගේ දෙමවුපියන්ගෙන් කෙනකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් ලෙස ද සලකනු නොලැබිය යුතු ය ;

(ආ) ඒ පුද්ගලයාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 32 වන වගන්තිය යටතේ, අඩු කළ හැකි යම් මුදලක් ඔහුගේ දෙමවුපියන්ගෙන් කෙනකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු නොලැබිය යුතු ය ;

(ඇ) ඒ පුද්ගලයා විසින් කරන ලද 34 වන වගන්තියේ අර්ථානුකූලව කරන ලද යම් සුදුසුකම් ලබන ගෙවීමක්, ඔහුගේ දෙමවුපියන්ගෙන්, කෙනකු විසින් කරන ලද සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

තව ද, ඒ දරුවා සම්පූර්ණ තක්සේරු වර්ෂය තුළම දරුවකු නොවන පුද්ගලයකු වූවාක් මෙන් සලකා, ගණන් බලන ලද ආදායම් බද්දක් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවීමකට ඒ දරුවා යටත් විය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් තුළ දරුවකුගේ මවුපියන්ගේ විවාහයේ පැවතීම අවසාන වූ හෝ නොපැවතී ලෙස සලකනු ලැබූ හෝ අවස්ථාවක-

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම ඔහුගේ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට එකතු කරනු ලැබිය යුතු අතර, එය ඔහුගේ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් ලෙස ද සලකනු ලැබිය යුතු ය ;

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 32 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබිය හැකි යම් මුදලක්, ඔහුගේ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය ;

(ඇ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවා විසින් කරන ලද, 34 වන වගන්තියේ අර්ථානුකූල සුදුසුකම් ලබන ගෙවීමක් ඔහුගේ පියා විසින් කරන ලද සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) නිසි බලය ඇති අධිකරණයක තීන්දු ප්‍රකාශයක් යටතේ හෝ නිසි පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ, භාර්යාව ඇගේ ස්වාමිපුරුෂයාගෙන් වෙන් වී ජීවත්වේ නම් හෝ වෙන්වීම ස්ථිර වෙන්වීමක් බවට පෙනී යන අවස්ථානුගත කරුණු යටතේ ස්වාමිපුරුෂයා හා භාර්යාව ඇත්ත වශයෙන් වෙන්වී සිටිත් නම්, (2) උප වගන්තියේ කාර්යය සඳහා, විවාහය පවතින ලෙස නොසැලකිය යුතු ය.

### ආ - භාරගැනුම්කරුවෝ, භාරකරුවෝ හා පොල්මෑකරුවෝ යනාදීහු

භාරගැනුම්කරුවන් සහ භාරකරුවන් විසින් වාර්තා සැපයිය යුතු බව සහ බදු ගෙවීමට ඔවුන් යටත් වන බව.

**70**. (1) දැන්වීමෙහි සඳහන් කාලසීමාව ඇතුළත පහත සඳහන් වාර්තා ආදිය සපයන ලෙස යම් භාරගැනුම්කරුවකුට හෝ භාරකරුවකුට හෝ නියම කරමින් තක්සේරුකරුවකු විසින් ඒ භාරගැනුම්කරු හෝ භාරකරු වෙත හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් දෙනු ලැබිය හැකිය:—

(අ) භාරගැනුම්කරුවකු සම්බන්ධයෙන් වන විට ආදායම් බද්ද පිළිබඳව කාර්යය සඳහා ඔහුගේ පාලනය යටතේ ඇති දේපළවලින් ලැබෙන ආදායම පිළිබඳ වාර්තාවක් ;

(ආ) භාරකරුවකු සම්බන්ධයෙන් වන විට ආදායම් බද්ද පිළිබඳ කාර්යය සඳහා භාරයට යටත් දේපළවලින් ලැබෙන ආදායම පිළිබඳ වාර්තාවක් ;

තව ද පහත දැක්වෙන ආකාරයෙන් භාරගැනුම් කරුවකුගෙන් හෝ භාරකරුවකුගෙන් ආදායම් බද්ද අය කරනු ලැබිය යුතු ය:—

(i) භාරගැනුම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ඔහුගේ පාලනයට යටත් දේපළවල ආදායම මත ; සහ

(ii) භාරකරුවකු සම්බන්ධයෙන් වන විට මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ භාරයේ දේපළවල ආදායම මත.

(2) (1) වන උපවගන්තිය යටතේ ආදායම් බද්දට යටත් වන ආදායමක් සහිත භාරයක් සඳහා අර්ථලාභීන් සිටින අවස්ථාවක, ඒ අර්ථලාභීන්ට හිමිකම් ඇති, ඒ ආදායමේ කොටස, (1) වන උපවගන්තිය යටතේ බද්දට යටත් ආදායම් ප්‍රමාණයෙන් අඩු කරනු ලැබිය යුතු අතර, මේ පනතේ කාර්යය සඳහා ඒ ආදායමේ කොටස ඒ අර්ථලාභීන්ගේ ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, ඒ අනුව, එක් එක් අර්ථලාභියාගෙන් ඒ ආදායමේ ඔහුගේ කොටස සම්බන්ධයෙන් ආදායම් බද්ද අයකර ගනු ලැබිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් භාරයක සම්පූර්ණ ආදායම හෝ ඉන් කොටසක් හෝ අර්ථලාභියකුගේ ආදායම ලෙස (2) වන උපවගන්තිය යටතේ සලකනු ලබන විටක කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයක අනුව වූ ද ඒ ආදායමේ ප්‍රමාණය සඳහන් වන්නා වූ ද දැන්වීමක්, භාරකරු විසින්, ඒ තක්සේරු වර්ෂයේ පිළිවෙළින් ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල තිස්වන දින හෝ ඊට පෙර සහ ඊළඟම තකසේරු වර්ෂයේ අප්‍රේල් මස තිස්වන දින හෝ ඊට පෙර ඒ අර්ථලාභියාට දිය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයක් සඳහා භාරගැනුම්කරුවකුගෙන් හෝ භාරකරුවකුගෙන් අයකර ගනු ලැබිය යුතු ආදායම් බද්ද ඔහු පිළිබඳව තක්සේරුවක් කරනු නොමැතිව වුව ද, වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු විසින් ගෙවිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා "භාරය" යන පදයට යම් ඒකක භාරයක් ඇතුළත් නොවිය යුතු අතර, "භාරකරු" යන පදයට යම් ඒකක භාරයක භාරකරු ඇතුළත් නොවිය යුතු ය.

අබලතාවයකට පත් තැනැත්තකුගේ භාරකාරයකු ආදායම් බද්ද ගෙවීමට යටත් බව.

**71**. අබලතාවකට පත් තැනැත්තකුගේ භාරකරුගෙන් ඒ තැනැත්තාගෙන් මේ පනත යටතේ ආදායම් බද්ද අයකර ගනු ලබන ආකාරයටම හා අය කර ගනු ලබන ප්‍රමාණයටම ආදායම බද්ද අයකර ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කිසිවක් ඒ තැනැත්තා කෙළින්ම ඔහුගේ නමින් තක්සේරු කරනු ලැබීම වළක්වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

මියගිය තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු ගෙවීමට පොල්මංකරුවකු යටත්වන බව.

**72**. මියගිය තැනැත්තා ජීවත් ව සිටියේ නම්, මේ පනත යටතේ කිරීමට ඔහු යටත් වන සියලු ක්‍රියා, කරුණු හා දේවල්, කිරීමට ඒ මියගිය තැනැත්තාගේ පොල්මංකරු යටත් විය යුතු අතර මියගිය තැනැත්තා මියගිය දිනයට පෙර වූ සියලු කාලසීමාවන් සම්බන්ධයෙන්, ඔහු ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අයකර ගනු ලැබිය හැකි ව තිබූ ආදායම් බද්ද, ඒ පොල්මංකරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද,-

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් මේ පනතේ XXIX වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ පොල්මංකරුට විරුද්ධව කිසිම නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය ;

(ආ) ඒ තැනැත්තා විසින් වංචාවක් කිරීමේ හෝ ඕනෑකමින් ම වැළකීමේ හේතුව නිසා හෝ ඒ තැනැත්තාගේ බූදලයේ පොල්මංකරු විසින් වැරදි ප්‍රකාශයක් කිරීමේ හේතුව නිසා තක්සේරු කිරීමක් නොකර ඇති හෝ අඩුවෙන් තක්සේරු කිරීමක් කර ඇති හෝ අවස්ථාවක දී හැර, ඒ තැනැත්තාගේ බූදලය සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ ප්‍රොබේට් බලපත්‍රය පොල්මංකරුවෙත නිකුත් කරන ලද තක්සේරු වර්ෂයට පසුව එළඹෙන තුන්වන තක්සේරු වර්ෂය ඉකුත් වීමෙන් පසුව ඒ මියගිය තැනැත්තා මියගිය දිනට පෙරාතුව වූ කාල සීමාවක් සම්බන්ධයෙන් කිසිම තක්සේරු කිරීමක් හෝ නොකළ යුතු නමුත් ඒ තැනැත්තා විසින් වංචාවක් කිරීමෙන් හෝ ඕනෑකමින්ම වැළකීමේ හේතුව නිසා හෝ ඒ තැනැත්තාගේ පොල්මංකරු විසින් වැරදි ප්‍රකාශයක් කිරීමේ හේතුව නිසා, තක්සේරු කිරීමක් නොකර ඇති හෝ අඩුවෙන් තක්සේරු කිරීමක් කර ඇති හෝ විටක, ඉහත කී තුන්වන තක්සේරු වර්ෂය ඉකුත්වීමෙන් පසුව ඕනෑම වේලාවකදී තක්සේරු කිරීමක් හෝ අතිරේක තක්සේරු කිරීමක් කරනු ලැබිය හැකිය ; තව ද,

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මංකරුගේ බැඳීම -

(i) මියගිය තැනැත්තාට මේ වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳීමක් ඇතිවන බවට දැන්වීමක් කරන ලද දිනයේදී පොල්මංකරුගේ සන්තකයේ හෝ පාලනය යටතේ තිබුණු මිය ගිය තැනැත්තාගේ බූදලයේ; සහ

(ii) උරුමක්කාරයකුට හෝ ඒ බූදලය පිළිබඳ යම් සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තකුට අයත් වී තිබිය හැකි ඒ බූදලයේ, යම් කොටසක,

එකතුවට සීමා විය යුතු ය.

පොල්මංකරුවන් විසින් සැපයිය යුතු වාර්තා හා පොල්මංකරුවන් හා අර්ථලාභීන් බදු අයකර ගනු ලැබීමට යටත් බව.

**73**. (1) දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත ආදායම් බද්ද පිළිබඳ කාර්යය සඳහා මියගිය තැනැත්තකුගේ පොල්මංකරු විසින් අද්මිනිස්ත්‍රාසිකරනු ලබන බූදලයෙන් ලැබෙන ආදායමත්, එක් එක් උරුමක්කාරයකුගේ නම හා ලිපිනයත් මියගිය තැනැත්තාගේ බූදලයට සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තකුගේ නම හා ලිපිනය හා (ඒ උරුමක්කරු හෝ වෙනත් තැනැත්තා මින් මතු අර්ථලාභී වශයෙන් මෙහි හඳුන්වනු ලැබේ) ඒ බූදලයට ඔහුට ඇති සම්බන්ධතාවත් සඳහන් වන වාර්තාවක් තමාට සැපයිය යුතු බවට නියම කරමින් තක්සේරුකරුවකු විසින් මියගිය තැනැත්තාගේ පොල්මංකරුට ලියවිල්ලකින් දැන්වීමක් කළ හැකි ය.

(2) මියගිය තැනැත්තාගේ බූදලයෙන් අර්ථලාභීයකුට ලැබීමට හිමිකම් ඇති ආදායමේ කොටස සම්බන්ධයෙන් ආදායම් බද්ද (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ අර්ථලාභියාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(3) මියගිය තැනැත්තාගේ බූදලයෙන් අර්ථලාභියකුට ලැබීමට හිමිකම් ඇති ආදායම් කොටස සම්බන්ධයෙන් ඒ අර්ථලාභියාගෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා (2) වන උපවගන්තිය යටතේ ආදායම් බද්දක් අයකර ගනු ලබන අවස්ථාවකදී කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතිය අනුව වූ ද ඒ ආදායමේ ප්‍රමාණය සඳහන් කර ඇත්තා වූ ද, දැන්වීමක් ඒ බූදලයේ පොල්මංකරු විසින් ඒ තක්සේරු වර්ෂයෙන් ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල තිස්එක්වන දින හෝ ඊට පෙර සහ ඒ තක්සේරු වර්ෂයේ අවසානයට ඉක්බිතිවම එළඹෙන අප්‍රේල් මාසයේ තිස්වන දින හෝ ඊට පෙර එම අර්ථලාභියාට නිකුත් කළ යුතු ය.

(4) මියගිය තැනැත්තකුගේ බූදලයෙන් අර්ථලාභියකුට ලැබීමට හිමිකම් ඇති ආදායම් නිශ්චය වශයෙන් දැනගත නොහැකි අවස්ථාවකදී ඒ ආදායම සම්බන්ධයෙන් පොල්මංකරුගෙන් ඒ ආදායම් බද්ද අයකර ගනු ලැබිය යුතු ය.

(5) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ පොල්මංකරුවකුගෙන් අයකර ගත යුතු ආදායම් බද්ද ඔහු පිළිබඳව තක්සේරුවක් කරනු ලැබ නොමැති වුව ද ඔහු විසින් 114 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු ය.

**74**. යම් ඒකක නොවන භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙන් හෝ මියගිය තැනැත්තකුගේ බූදලයක පොල්මඃකරුවන්ගේ තත්ත්වයෙන් හෝ දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු ක්‍රියා කරන අවස්ථාවක, ඒ භාරකරුවන්ගේ හෝ පොල්මඃකරුවන්ගේ තත්ත්වයෙන් ඔවුන්ගේ මේ පනත යටතේ අය කරනු ලැබිය යුතු ආදායම් බද්ද, හවුලේ හෝ වෙන් වෙන් වශයෙන් හෝ ඔවුන්ගේ අයකර ගනු ලැබිය යුතු අතර ඒ බදු ගෙවීමට ඔවුන් හවුලේ සහ වෙන් වෙන් වශයෙන් යටත් විය යුතු ය. හවුල් භාරකරු සහ පොල්මඃකරුවෝ.

ඇ - ඒකක භාර

**75**. (1) මේ පනතේ කාර්යය සඳහා සෑම ඒකක භාරයක් සහ සෑම අන්‍යොන්‍ය අරමුදලක්ම ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ශ්‍රී ලංකාවේ වාසික සමාගම්වලට අදාළ මේ පනතේ විධිවිධාන, සෑම ඒකක භාරයක් සහ සෑම අන්‍යොන්‍ය අරමුදලක් සම්බන්ධයෙන් ම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරනු ලැබිය යුතු ය. සෑම ඒකක භාරයක්ම සමාගමක් වශයෙන් සැලකිය යුතු බව.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාපෘතියට හානියක් නොමැතිව-

(අ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක "ඒකකයක්" ඒ සමාගමේ "කොටසක්" ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක ඒකක දරන්නකු ඒ සමාගමේ කොටස්කරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) යම් ඒකක භාරයකට හෝ යම් අන්‍යොන්‍ය අරමුදලට යටත් වූ යම් දේපළකින්, නැතහොත් ඒ ඒකක භාරය හෝ අන්‍යොන්‍ය අරමුදල සඳහා හෝ වෙනුවෙන් ඒ ඒකක භාරයේ භාරකරු හෝ ඒ අන්‍යොන්‍ය අරමුදලේ රක්ෂක විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින් හෝ යම් ව්‍යාපාරයකින් ඒ භාරකරුට හෝ රක්ෂකට ව්‍යුත්පන්න වූ හෝ ඒ භාරකරුගේ හෝ රක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පැනනගින හෝ උපචිත වන ලාභ සහ ආදායම් ඒ සමාගමේ ලාභ සහ ආදායම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඈ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක ලාභ සහ ආදායමෙන් කවර වූ හෝ ආකාරයකින් එහි ඒකක දරන්නන් වෙත කරනු ලබන යම් බෙදීමක් ඒ සමාගමේ කොටස්කරුවන් වෙත බෙදා දුන් ලාභාංශයක් ලෙස සලකනු ලැබිය යුතුය; තව ද

(ඉ) යම් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක, යම් ඒකකයක ගෙවා නිමි අගය ඒ සමාගමේ යම් කොටසක ගෙවා නිමි අගය ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් ඒකක භාරයක කළමනාකරුට හෝ භාරකරුට හෝ යම් අන්‍යොන්‍ය අරමුදලක කළමනාකරුට හෝ රක්ෂකට ඒ ඒකක භාරයේ හෝ අන්‍යොන්‍ය අරමුදලේ අරමුදල්වලින් පාරිශ්‍රමික වශයෙන් පරිහරණය කරන ලද හෝ ගෙවන ලද යම් මුදලක් 25 වන වගන්තියේ කාර්ය සඳහා සමාගමේ ආදායම නිෂ්පාදනය කිරීමේ දී ඒ සමාගම විසින් දරන ලද විය පැහැදම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති කිසිවකට අනුකූලව කොටස් හෝ ණය සාධන පත්‍ර ගනුදෙනු කිරීමේ වගන්තියේ උපයන ලාභ සහ ආදායම් ඇතුළත් වන හිමිකම් ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක ආදායමෙන් බදු අයකල හැකි යම් කොටසකින් මේ පනතේ දෙවන උපලේඛනයේ (අ) කොටසේ 2(අ) අයිතමයේ නිශ්චිතව සඳහන් කර ඇති අනුප්‍රමානයට ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය.

ඇ - හවුල් ව්‍යාපාර

හවුල් ව්‍යාපාරයක ආදායම තක්සේරු කිරීම

**76**. (1) දෙදෙනකු විසින් හෝ ඊට වැඩි දෙනකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යනු ලබන අවස්ථාවක පහත දැක්වෙන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(2) යම් හවුල් ව්‍යාපාරයක යම් තක්සේරු වර්ෂයක් සඳහා බෙදිය හැකි ලාභය හෝ අලාභය ඒ හවුල් ව්‍යාපාරය විසින් ඒ තක්සේරු වර්ෂය තුළ කරගෙන ගිය යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබුණු සහ යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම නිශ්චය කර ගැනීම සම්බන්ධයෙන් අදාළ වන මේ පනතේ, විධිවිධානවලට අනුකූලව නිශ්චය කර ගනු ලැබූ ඒ හවුල් ව්‍යාපාරයක් මුළු ලාභයට, හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු යම් පොලියක, වාර්ෂික බිම් කුලියක හෝ රාජ්‍ය භාගයක ප්‍රමාණය එකතු කිරීමෙන් පසු එය (ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු වෙත ගෙවිය යුතු අවස්ථාවක දී හැර) ඒ හවුල් ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය විය යුතු ය :

එසේ වුව ද, හවුල් ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ නිශ්චය කර ගැනීමේ දී හවුල්කරුවන්ගේ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික සඳහා හෝ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය වෙනුවෙන් වූ පොලිය සඳහා හෝ කිසිම අඩු කිරීමක් නොකළ යුතු නමුත් බෙදිය හැකි ලාභය හෝ අලාභය හවුල්කරුවන් අතර බෙදීමේ දී එකී වැටුප් පාරිශ්‍රමික සහ පොලී සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත පහත සඳහන් විස්තර දැක්වෙන වාර්තාවක් සපයන ලෙස නියම කරමින් තක්සේරුකරුවකු විසින් දැන්වීමක් හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරුවකුට දෙනු ලැබිය හැකි ය.

(අ) ඒ හවුල් ව්‍යාපාරය විසින් යම් තක්සේරු වර්ෂයක් තුළ කරගෙන ගිය යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබුණු සහ යම් තැනැත්තකුගේ ලාභ හා ආදායම නිශ්චය කරගැනීම සම්බන්ධයෙන් අදාළ වන, මේ පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කර ගනු ලැබූ ඒ හවුල් ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය සහ ඒ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු වූ යම් පොලියක්, වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ රාජ්‍ය භාගයක් ;

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ හවුල් ව්‍යාපාරයේ වෙනත් යම් ආදායමක් ; සහ

(ඇ) සියලුම හවුල්කරුවන්ගේ නම් හා ලිපින සහ හවුල්කරුවන්ගේ යම් වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික ද හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය වෙනුවෙන් වූ පොලිය ද සැලකිල්ලට ගෙන බෙදිය හැකි ලාභ හෝ අලාභ සහ වෙනත් ආදායම්, ඒ ලාභ හෝ අලාභ සහ වෙනත් ආදායම් ඇති වූ කාලය ඇතුළත හවුල්කරුවන්ගේ හවුල් ව්‍යාපාරයේ කොටස් අනුව හවුල් කරුවන් අතර බෙදා දුන් පිළිවල,

කිසිම සක්‍රිය හවුල් කරුවකු ශ්‍රී ලංකාවේ වාසිකව නොසිටින අවස්ථාවක ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතයා විසින් ඒ වාර්තාව සැපයිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියක වූ සහ එක් එක් හවුල්කරුගේ යම් වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික ද එක් එක් හවුල්කරුගේ ප්‍රාග්ධනය වෙනුවෙන් වූ පොලියක් ද සැලකිල්ලට ගෙන, යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභයේ හෝ අලාභයේ සහ වෙනත් ආදායමේ ඒ එක් එක් හවුල්කරුගේ කොටස දැක්වෙන දැන්වීමක් හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු විසින් හෝ සක්‍රීය හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ වාසිකව නොසිටින අවස්ථාවක ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතයා විසින් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල තිස්එක් වන දින හෝ ඊට පෙර සහ ඒ තක්සේරු වර්ෂයේ අවසානයට ඉක්බිතිවම එළඹෙන අප්‍රේල් මාසයේ තිස්වන දින හෝ ඊට පෙර එම හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරුට නිකුත් කළ යුතු ය:

එසේ වුව ද, මේ පනතේ විධිවිධාන මගින් හෝ ඒ යටතේ ඒ හවුල්ව්‍යාපාරයේ යම් හවුල්කරුවකුට ඇති වගකීම හෝ ඔහු වෙත පැවරී ඇති කාර්යභාරය කෙරෙහි, ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් හෝ හවුල් ව්‍යාපාරයේ අනුයෝජිතයා විසින් මේ උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් නොකළ හේතුව නිසාවෙන් බලපෑමක් ඇති නොවිය යුතු ය.

(5) හවුල් ව්‍යාපාරයකින් යම් හවුල්කරුවකුට ලැබුණු ව්‍යවස්ථාපිත ආදායම, හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභයේ ඔහුගේ කොටස ඔහු විසින් කරගෙන ගිය යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබුණු ලාභය ලෙස සලකා සහ වෙනත් ආදායමේ ඔහුගේ කොටස ඔහුට තනිව උපචිත ආදායමක් ලෙස සලකා 28 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරනු ලැබිය යුතු අතර, බෙදිය හැකි අලාභයේ යම් හවුල්කරුවකුගේ කොටස 32 වන වගන්තියේ අර්ථානුකූලව ඔහුට සිදු වූ අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, (3) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි, වාර්තාවක් සපයා නොමැති හෝ ඒ උපවගන්තිය යටතේ සැපයූ වාර්තාවක, පිළිගෙන නොමැති අවස්ථාවක, තක්සේරුකරුවකු විසින් ඔහුගේ උපරිම නිගමනය අනුව, යම් හවුල්කරුවකුගේ හවුල් ව්‍යාපාරයේ ව්‍යවස්ථාපිත ආදායම හෝ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි අලාභයේ යම් හවුල්කරුවකුගේ කොටස හෝ ඇස්තමේන්තු කරනු ලැබිය හැකිය:

එසේම තවදුරටත් හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ හවුල්කරුවකු විසින් නතු කොටගෙන ඇති බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, ඒ හවුල්කරු විසින් නතු කොටගෙන ඇති ප්‍රමාණය හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභයේ ඒ හවුල්කරුගේ කොටසට තක්සේරුකරු විසින් ඇතුළත් කරනු ලැබිය හැකි අතර, ඒ හවුල්කරුගේ ව්‍යවස්ථාපිත ආදායම ඒ අනුව ආගණනය කරනු ලැබිය යුතු ය.

(6) යම් නිර්වාසික හවුල්කරුවකුගේ හෝ හවුල්කරුවන්ගේ හවුල් ව්‍යාපාරයේ ආදායම හවුල් ව්‍යාපාරයේ නාමයෙන් හෝ යම් වාසික හවුල්කරුවකුගේ නාමයෙන් හෝ නිර්වාසික හවුල්කරුගේ හෝ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතයකුගේ නාමයෙන් හෝ තක්සේරුකරු කරනු ලැබිය යුතු අතර, තක්සේරුව මත අය කරනු ලබන ආදායම් බද්ද හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් හෝ එහි යම් හවුල්කරුවකුගෙන් හෝ එවැනි යම් අනුයෝජිතයකුගෙන් හෝ XXVI වන පරිච්ඡේදයේ විධිවිධානවල සලස්වා ඇති ආකාරයෙන් ලබාගත යුතු ය.

ඇතැම් අවස්ථාවල දී හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කළ යුතු බව.

**77.** (1) 76 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව වාර්තාවක් සපයා නොමැති හෝ ලාභවල ප්‍රමාණය සම්බන්ධයෙන් හෝ ආදායම් ප්‍රමාණය සම්බන්ධයෙන් හෝ හවුල්කරුවන් අතර ඒ ලාභ හෝ ආදායම බෙදාදීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි හෙයින් තක්සේරුකරු විසින් වාර්තාව පිළිගෙන නොමැති අවස්ථාවක යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කිරීම සම්බන්ධයෙන් අදාළ වන, මේ පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද හවුල් ව්‍යාපාරයේ ලාභවල සහ ආදායමෙහි ඇස්තමේන්තු ප්‍රමාණය මත හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කිරීම නීත්‍යානුකූල විය යුතු අතර ඒ තක්සේරුව අනුව වූ ආදායම් බදු, මේ පනතේ තුන්වන උපලේඛනයේ තත්කාර්ය සඳහා දක්වා ඇති අනු ප්‍රමාණයන් අනුව අයකරනු ලැබිය යුතු අතර, ඒ ආදායම් බදු හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් හෝ යම් හවුල්කරුවකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයේ යම් අනුයෝජිතයකුගෙන් හෝ ලබාගත යුතු ය. එකී තක්සේරුවෙන් අතෘප්තියට පත් තැනැත්තකු විසින් XXIII වන පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ඊට විරුද්ධ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ සමීක්ෂණ මණ්ඩලය විසින් හෝ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභ හා වෙනත් ආදායම් නිශ්චය කරනු ලැබිය හැකි අතර, එය හවුල්කරුවන් අතර බෙදා දෙනු ලැබිය හැකි ය. තව ද, 76 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව හවුල් ව්‍යාපාරයෙන් එක් එක් හවුල්කරුගේ ව්‍යවස්ථාපිත ආදායම ද ඒ වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බද්ද ද කොමසාරිස් ජනරාජල්වරයා විසින් හෝ සමීක්ෂණ මණ්ඩලය විසින් හෝ ආගණනය කරනු ලැබිය හැකිය. අලුත් තක්සේරුවක් නොකර, අභියාචනයට විෂය වූ තක්සේරුව අනුව වූ බද්දක් ලෙස ඒ ආදායම් බද්ද ලබාගත හැකි ය.

(2) හවුල් ව්‍යාපාරයක නාමයෙන් (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරනු ලැබීමෙන් පසු හවුල්කරුවකු විශ්‍රාම ගැනීමෙන් හෝ මියයාමෙන් හෝ හවුල්කරුවන් කෙනකු හෝ වැඩි දෙනකු සම්බන්ධයෙන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමෙන් හෝ අළුත් හවුල්කරුවකු ඇතුළත් කර ගැනීමෙන් හෝ ඒ හවුල් ව්‍යාපාරයෙහි වෙනසක් ඇති වූ සහ ඒ වෙනස නිසා, ඒ තක්සේරුවට පෙර ඒ හවුල් ව්‍යාපාරයේ වත්කම්වල හවුල් අයිතිකරුවන් වූ තැනැත්තන් අතුරෙන් එක්කෙනෙක් හෝ ඊට වැඩි දෙනකු ඒ වත්කම්වල අයිතිකරු ලෙස හෝ හවුල්කරු ලෙස දිගටම සිටින අවස්ථාවක, ඒ වෙනස හේතුකොට ගෙන වත්කම්වල අයිතිකරු වන තැනැත්තාගෙන් හෝ හවුල් ව්‍යාපාරයෙහි ඒ තක්සේරුව අනුව වූ ආදායම් බදු හෝ නොගෙවා තිබෙන ආදායම් බදු කොටස හෝ අයකර ගනු ලැබිය යුතු අතර, ඒ අනුව XXVI වන පරිච්ඡේදයේ විධිවිධාන ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට අදාළ විය යුතුය.

හවුල් ව්‍යාපාර මත අයකල යුතු බදු

**78.** (1) 77 වන වගන්තියේ අන්තර්ගත විධිවිධානවල කුමක් සඳහන් වුව ද සෑම හවුල් ව්‍යාපාරයකින්ම 76 වන වගන්තියේ සඳහන් බෙදිය හැකි ලාභවල මුළු ප්‍රමාණය මත සහ වෙනත් ආදායම් මත මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් උචිත අනුප්‍රමාණ අනුව එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අය කළ යුතු අතර, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව xiii වන පරිච්ඡේදයේ විධිවිධානවල සලසා ඇති පරිදි එම හවුල් ව්‍යාපාරය විසින් ත්‍රෛමාසික වාරික වලින් එම බදු ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 2004 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවන ලද ආර්ථික සේවා බද්ද, මෙම උපවගන්තිය යටතේ ගෙවිය යුතු ආදායම් බද්දට වඩා වැඩි නම් යම් තක්සේරු වර්ෂයක් සඳහා (1) වන උපවගන්තියෙහි සඳහන් ආදායම් බද්ද ගෙවීම අදාළ නොවිය යුතු ය:

එසේ ම තවදුරටත් (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද, 2004 අංක 11 දරන මුදල් පනත් යටතේ ගෙවන ලද ආර්ථික සේවා බද්දට වඩා වැඩි නම්, ගෙවිය යුතු ආදායම් බද්දෙන් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවන ලද ආර්ථික සේවා බද්ද අඩු කරනු ලැබිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා බෙදිය හැකි අලාභයක් ඇති අවස්ථාවක වෙනත් ආදායම්වල සම්පූර්ණ මුදලින් බෙදිය හැකි අලාභය හිලව් නොකර, එම වෙනත් ආදායම මත බදු අය කළ යුතු ය.

(3) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ (ගෙවීම් පැහැර හැර තිබී අයකර ගනු ලැබූ යම් බද්දක් හැර) ගෙවන ලද බදු මුදලක කොටසකින්, යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභ බෙදීමේ අනුප්‍රමාණය ප්‍රයෝජනයට ගනිමින් එක් එක් හවුල්කරුවකුට ආරෝපණය කළ හැකි වූ ද, එම හවුල් ව්‍යාපාරය විසින් 2004 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවනු ලබන ආර්ථික සේවා ගාස්තු වලට එරෙහිව හිලව් කරනු ලැබුවා වූ ද යම් මුදලක් අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල, එම තැනැත්තා වෙත ආරෝපණය කළ හැකි බදු මුදලේ කොටසෙහි අතිරික්තය ආපසු ලබා ගැනීමේ හෝ ඉදිරියට ගෙන යාමේ යම් අයිතියක් නොමැතිව, එම ලාභයේ කොටස මත සහ එම හවුල් ව්‍යාපාරයෙන් ලැබුන වෙනත් ආදායම් මත, එම තක්සේරු වර්ෂය සඳහා එම හවුල් ව්‍යාපාරයේ එම කොටස්කරුගේ ආදායම් බදු වගකීමට එරෙහිව හිලව් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ විධිවිධාන වලට යටත්ව මේ පනතේ XIII වන පරිච්ඡේදයේ විධිවිධානවලින් සලසා ඇති පරිදි ගෙවිය යුතු වූ ද, නියමිත දිනයේ දී හෝ එදිනට පෙර ගෙවා නොමැති වූ ද යම් ත්‍රෛමාසික බදු වාරිකයක්, මේ පනතේ කාර්ය සඳහා බදු ගෙවීම පැහැර හරින ලද බදු මුදලක් වන අතර, එසේ ගෙවීම පැහැර හැර ඇති බදු මුදල අයකර ගැනීම සඳහා එම හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකුට හෝ සියලුම හවුල්කරුවන්ට එරෙහිව මේ පනතේ XXVI වන පරිච්ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නඩු පවරනු ලැබිය හැකි ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "ගෙවිය යුතු බදු මුදලේ ත්‍රෛමාසික වාරිකය" යන්නට, හවුල් ව්‍යාපාරයේ ලාභ සහ ආදායම පිළිබඳ විස්තර නොතිබීම හේතුකොට ගෙන එම වර්ෂය සඳහා බෙදිය හැකි ලාභ සහ වෙනත් ආදායම දැනගත නොහැකි අවස්ථාවක, පසුගිය වර්ෂයේ බෙදිය හැකි ලාභ සහ වෙනත් ආදායම පදනම් කරගෙන ඇස්තමේන්තු කරන ලද බදු ප්‍රමාණයන් ඇතුළත් වේ.

(5) 76, 77 වන වගන්තිවල සහ මේ වගන්තියේ කාර්ය සඳහාත් ඒ වගන්තිවල සඳහන් "තැනැත්තා" යන වචනයට, හවුල් ව්‍යාපාරයක්ද ඇතුළත් වන බව කියවා තේරුම් ගත යුතු ය.

ඉ- වාසික භාවය

**79**. (1) සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලියාපදිංචි කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවෙහි පිහිටි අවස්ථාවක හෝ එහි ව්‍යාපාර කටයුතු පාලනය කිරීම හා කළමනාකරණය කිරීම ශ්‍රී ලංකාව තුළ කරනු ලබන අවස්ථාවක ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය මේ පනතේ කාර්යන් සඳහා, ශ්‍රී ලංකාව තුළ වාසික ලෙස සලකනු ලැබිය යුතු ය.

වාසිකභාවය යන්නේ අදහස් වන්නේ කුමක්ද යන වග.

(2) යම් තක්සේරු වර්ෂයක් තුල දින එකසිය අසූතුනක් හෝ ඊට වැඩි ගණනක් ශ්‍රී ලංකාවෙහි කායික වශයෙන් පෙනී සිටින පුද්ගලයකු ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේම ශ්‍රී ලංකාවේ වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) අනුක්‍රම තක්සේරු වර්ෂ දෙකක් හෝ වැඩි ගණනක් සඳහා වාසිකයකු ලෙස සලකනු ලැබූ පුද්ගලයකු දින තුන්සිය හැට පහක අඛන්ඩ කාලසීමාවක් සඳහා ඔහු ශ්‍රී ලංකාවෙන් නොකඩවා බැහැරව සිටිනතාක් කල් වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා එසේ බැහැරව සිටින විට (2) උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද ඒ බැහැරව සිටීම ආරම්භ කරනු ලැබවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු නිර්වාසිකයකු වූ බවට (3) වන උපවගන්තිය යටතේ සලකනු ලැබූ අවස්ථාවක, සමස්තයක් වශයෙන් ගත් කළ දින තිහක් නොඉක්මවන යම් කාලසීමාවක් හෝ කාලසීමාවන් සඳහා ඔහු ශ්‍රී ලංකාවේ සිටිය නමුදු දින තිහක් නොඉක්මවන එම කාලසීමාව හෝ කාලසීමාවන් ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගත කරනු ලැබූ කාලසීමාවක් හෝ කාලසීමාවන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ සේවයේ නියුක්ත වූ ද, ඒ සේවා නියුක්තිය පිළිබඳ කාර්ය සඳහා යම් කාලසීමාවක් තුල වෙනත් යම් රටක වාසික ව දූ පුද්ගලයකු සහ ඒ පුද්ගලයාගේ කලත්‍රයා, ඒ කාලසීමාව වෙනුවෙන් ඔහුට ගෙවිය යුතු නිල පඩි නඩි සම්බන්ධයෙන් ඒ රටෙහි ආදායම් බද්දක් හො ඊට සමාන ස්වභාවයක් වූ වෙනත් බදු ඔහු විසින් නොගෙවිය යුතු නම්, ඒ කාලසීමාව ඇතුළත ශ්‍රී ලංකාවෙහි වාසික වූ ලෙස මේ පනතෙහි කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලාංකික නොවන වෙනත් යම් රටක පුරවැසියකු වූ හෝ යටත් වැසියකු වූ එවැනි යම් පුද්ගලයකුගේ නිල පඩි නඩි හෝ ශ්‍රී ලංකාව තුල උද්ගත වූ හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වූ වෙනත් ආදායම් හෝ නොවන. යම් ආදායමක් සම්බන්ධයෙන් වාසිකයකු ලෙස ආදායම් බද්ද ගෙවීමට ඔහු එසේ ශ්‍රී ලංකාව තුළ වාසික වූ ලෙස සලකනු ලැබීමේ හේතුව නිසා ඔහු යටත් නොවිය යුතු ය.

(6) වෙළෙඳ නැව් පනතේ අර්ථානුකූලව වූ ශ්‍රී ලංකාවේ නැවක සේවයේ නියුක්ත කරනු ලැබ සිටින පුද්ගලයෙක්, ඔහු එසේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ වාසික වූ ලෙස මේ පනතේ කාර්ය සඳහා, සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් පුද්ගලයකු ශ්‍රී ලංකාව නොවන වෙනත් යම් රටක පුරවැසියකු වූ හෝ යටත් වැසියකු වූ හෝ අවස්ථාවක ඔහු ඒ නැවේ සේවා නියුක්තියෙන් ලබන ආදායම් නොවන යම් ආදායමක් සම්බන්ධයෙන්, වාසිකයකු ලෙස ආදායම් බදු ගෙවීමට ඔහු එසේ ශ්‍රී ලංකාවේ වාසිකයකු වශයෙන් සලකනු ලැබීමේ හේතුව නිසා, ඔහු යටත් නොවිය යුතු ය.

(7) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද, ශ්‍රී ලංකාවෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින්නා වූ ද, පුද්ගලයකු, ඉහතින් වූ උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඔහු ශ්‍රී ලංකාවෙහි සේවා නියුක්තිය ආරම්භ කල දින සිට ගණන් බලනු ලැබූ අවුරුදු තුනක කාලයක් සඳහා නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ පුද්ගලයා 40 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අර්ථානුකූලව ප්ලැග්ෂිප් සමාගමක සේවයෙහි නියුක්ත පුද්ගලයකු වන අවස්ථාවක, ඔහු ශ්‍රී ලංකාවෙහි සේවා නියුක්තිය ආරම්භ කළ දිනයේ සිට ගණන් බලනු ලැබූ අවුරුදු පහක කාලයක් සඳහා, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

ඊ–නිර්වාසික තැනැත්තන්ගේ බැඳීම්

නිර්වාසි තැනැත්තන්ගේ ඇතැම් ලාභ අයකර ගනු ලැබිය හැකි බව.

**80**. ශ්‍රී ලංකාවේ තැනැත්තකු, නිර්වාසික තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කරමින්, යම් රක්ෂණයක් කරන හෝ යම් රක්ෂණයක් කිරීමෙහි ලා මූලිකව ක්‍රියා කරන හෝ යම් දේපළක් විකුණන හෝ බැහැර කරන හෝ විකිණීමෙහිලා මූලිකව ක්‍රියා කරන හෝ අවස්ථාවක ඒ දේපළ ශ්‍රී ලංකාවේ තිබුන ද ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබීමට තිබුණ ද ඒ රක්ෂණය, විකිණීම හෝ බැහැර කිරීම ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී කරනු ලැබුව ද නැතහොත් ඒ නිර්වාසික තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී කරනු ලැබුව ද ඒවායින් උපලබ්ධි වන මුදල් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් හෝ ඒ නිර්වාසික තැනැත්තාට ගෙවනු ලැබුව ද නැතහොත් ඔහු විසින් භාර ගනු ලැබුව ද, එවැනි යම් රක්ෂණයකින්, විකිණීමකින් හෝ බැහැර කිරීමකින් උද්ගත වන ලාභ, ඒ නිර්වාසික තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී ඔහු විසින් කරනු ලැබූ ව්‍යාපාරික ගනුදෙනුවෙන් ලබාගත් ලාභ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු වෙනුවෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තා මේ පනතේ සියලු කාර්ය සඳහා ඔහුගේ අනුයෝජිතයා වශයෙන් සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, විකුණන ලද හෝ බැහැර කරන ලද දේපළ ඒ නිර්වාසික තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද අවස්ථාවක, විකිණීමෙන් හෝ බැහැර කිරීමෙන් ලබන ලාභ–

(අ) ඒ විකිණීම හෝ බැහැර කිරීම හෝ තොග වශයෙන් කරනු ලැබුවේ නම්, දේපළ තොග වශයෙන් විකුණන වෙළෙන්දකු විසින් සාධාරණ ලෙස ලැබීමට අපේක්ෂා කරනු ලබන ලාභවලට වැඩි නොවන්නාක් සේ සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) ඒ විකිණීම හෝ බැහැර කිරීම සිල්ලර වශයෙන් කරනු ලැබුවේ නම්, දේපළ සිල්ලර වශයෙන් විකුණන වෙළෙන්දකු විසින් සාධාරණ ලෙස ලැබීමට අපේක්ෂා කරනු ලබන ලාභවලට වැඩි නොවන්නාක් සේ සලකනු ලැබිය යුතු ය.

නිර්වාසික තැනැත්තකු වෙනුවෙන් තක්සේරු කරනු ලැබිය හැකි තැනැත්තෝ.

**81**. ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන නිර්වාසික තැනැත්තකුගේ සියලු ලාභ ආදායම් සම්බන්ධයෙන් ඒ නිර්වාසික තැනැත්තා කෙලින්ම හෝ ඔහුගේ අනුයෝජිතයා ඒ ලාභ හෝ ආදායම ලැබව ද,් නොලැබුව ද, ඒ අනුයෝජිතයාගේ නාමයෙන් හෝ තක්සේරු කරනු ලැබිය යුතු අතර එසේ කෙළින්ම හෝ අනුයෝජිතයාගේ නාමයෙන් තක්සේරු කරනු ලැබූ ආදායම් බද්ද නිර්වාසික තැනැත්තාගේ වත්කමෙන් හෝ අනුයෝජිතයාගෙන් හෝ මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබූ ආකාරයෙන් ලබා ගත යුතු ය. අනුයෝජිතයන් එක් කෙනකුට වැඩි ගණනක් සිටිත් නම්, නිර්වාසික තැනැත්තාගේ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ඔවුන් එක්ව හෝ වෙන් වෙන් වශයෙන් තක්සේරු කරනු ලැබිය හැකි අතර, ඒ තක්සේරුව අනුව, ආදායම් බද්දට ඔවුන් එක්ව හා වෙන් වෙන් වශයෙන් යටත් විය යුතු ය.

ඇතැම් නිර්වාසික තැනැත්තන්ගේ බැඳීම්.

**82**. (1) මේ වගන්තියේ කාර්ය සඳහා —

(අ) එක් තැනැත්තකු සහ සෙසු තැනැත්තකු අතර සැලකිය යුතු තරම් අනන්‍යතාවක් තිබෙන බවට හෝ එක් එක් තැනැත්තකුගේ පරම පාලක සම්බන්ධතාව ඒ එක් එක් තැනැත්තකුට හෝ ඒ තැනැත්තන්ට අයත් බවට හෝ මේ වගන්තිය යටතේ අයත් ලෙස සැලකෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්ව සිටින අවස්ථාවක ඒ එක් එක් තැනැත්තාට සෙසු තැනැත්තා සමග කිට්ටු සම්බන්ධයක් ඇත්තේ ය; සහ

(ආ) සමාගමක පාලක සම්බන්ධතාව, කෙළින්ම හෝ නාමිකයන්ගේ මාර්ගයෙන් ඒ සමාගමේ කොටස් සහ, ඒවායේ අර්ථලාභී හිමිකරුවන්ට අයත් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද එක් සමාගමක කොටස්, වෙනත් සමාගමක් විසින් හෝ වෙනත් සමාගමක් වෙනුවෙන් දරනු ලබන අවස්ථාවක. ඒ කොටස් ඒ වෙනත් සමාගමේ කොටස් හිමියන් විසින් දරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) තමා සමග කිට්ටු සම්බන්ධයක් ඇති වාසික තැනැත්තකු සමග නිර්වාසික තැනැත්තකු ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ ද, වාසික වූ තැනැත්තාට ව්‍යාපාරයෙන් කිසිම ලාභයක් නොලැබෙන පරිදි හෝ ඒ ව්‍යාපාරයෙන් උද්ගත වේ යයි බලාපොරොත්තු විය හැකි සාමාන්‍ය ලාභ වලට අඩුවෙන් ලාභ ලැබෙන පරදි හෝ ඒ ව්‍යාපාරයේ ක්‍රියා පටිපාටිය සකස් කොට ඇත්තා වූ ද අවස්ථාවක වාසික තැනැත්තා සමග ඇති තම සම්බන්ධය අනුව නිර්වාසික තැනැත්තා විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද වාසික තැනැත්තා ඒ නිර්වාසික තැනැත්තාගේ අනුයෝජිතයා වුවාක් මෙන්ම ඒ නිර්වාසික තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතු අතර වාසික තැනැත්තාගේ නාමයෙන් ලැබෙන ඒ ව්‍යාපාරයේ ලාභ සම්බන්ධයෙන් ඒ නිර්වාසික තැනැත්තාගේ ආදායම් බද්ද අය කරනු ලැබිය යුතු ය. තව ද මේ පනතේ සියලු විධිවිධාන ඒ අනුව අදාල විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිට සාදනු ලැබූ හෝ නිපදවනු ලැබූ භාණ්ඩ හෝ නිෂ්පාදන නිර්වාසික තැනැත්තකු විසින් හෝ ඔහුට කිට්ටු සම්බන්ධයක් ඇති තැනැත්තකු හෝ තැනැත්තන් විසින් හෝ විකිණීමෙන්, උද්ගත වන ලාභ සම්බන්ධයෙන් ආදායම් බද්ද අය කරනු ලැබිය යුතු වූ අවස්ථාවක, ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන හෝ විකිණීමෙන් මේ පනතේ කාර්ය සඳහා, ඒ නිර්වාසික තැනැත්තාට ලැබෙන ලාභ වෙළෙන්දකුට ලැබේ යයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි ලාභවලට නො අඩු ලාභ ලෙස සලකනු ලැබිය යුතු අතර, තමාගේ සම්බන්ධයක් නොමැති, සෑදූ තැනැත්තාගේ හෝ නිෂ්පාදකයාගෙන් කෙළින්ම ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන ලබාගත් නිර්වාසික තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් රඳවා තබා ගනු ලැබූ අවස්ථාවක භාණ්ඩ හෝ නිපදවන ලද ද්‍රව්‍ය තමාගේ සම්බන්ධයක් නොමැති, සෑදූ තැනැත්තාගෙන් හෝ නිෂ්පාදකයාගෙන් කෙළින් ම ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන ලබාගත්, සිල්ලරට විකුණන්නකුට යුක්ති සහගතව බලාපොරොතුතු විය හැකි ලාභවලට නො අඩු ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන වෙනුවෙන් රේගු ආඥාපනත යටතේ වටිනාකම අනුව ගෙවනු ලැබූ ආනයන ගාස්තු ශ්‍රී ලංකාවේ දී ගෙවනු ලැබූ අවස්ථාවක. ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන ශ්‍රී ලංකාවට ගෙන ආ විට, එහි වියදම වශයෙන් අඩු කල යුතු මුදල, ශ්‍රී ලංකාව තුළ උද්ගත වන ලාභ ආගණනය කිරීමේ කාර්යය සඳහා ඒ ආනයන ගාස්තු එසේ ගෙවනු ලැබුවේ යම් වටිනාකමක් මත ද, ඒ වටිනාකම වැඩි නොවිය යුතු ය.

ඇතැම් ව්‍යාපාරවල ලාභ ලැබීම් වල ප්‍රතිශතයක් ලෙස ගණනය කල යුතු බව.

**83**. නිර්වාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් පැන නගින හෝ උද්ගත වන නිවැරදි ලාභයේ ප්‍රමාණය ඒ වෙළෙඳාමට හෝ ව්‍යාපාරයට අදාලව 106 වන වගන්තියේ (12) වන උපවගන්තියේ සඳහන් කරන ලද පරිදි වඩාසම්පූර්ණ හෝ වැඩිදුර වාර්තා හෝ වඩා සම්පූර්ණ කල හෝ වැඩිදුර තොරතුරු, හෝ 106 වන වගන්තියේ (13) වන උපවගන්තියේ සඳහන් කළ ලේඛන හෝ අනෙකුත් ලේඛන ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට නොහැකිවීමේ හේතු නිසා නිශ්චය වශයෙන් වහා දැන ගත නොහැකි බව කොමසාරිස් ජනරාල්වරයා මතය වන අවස්ථාවකදී, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එකී නිර්වාසික තැනැත්තා එකී නොහැකියාව පිළිබඳව ප්‍රකාශයක් කළ විටක, එකී ලාභය වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් ලැබෙන මුදලේ ප්‍රතිශතයක් වශයෙන් නිශ්චය කළ යුතු ය. :

එසේ වුව ද, කවර අවස්ථාවක දී හෝ ඒ ප්‍රතිශතය හයකට නොඅඩු විය යුතු ය.

අපනයන නිෂ්පාදන විකිණීමෙන් නිර්වාසික තැනැත්තකුට ලැබෙන ලාභ.

**84**. නිර්වාසික තැනැත්තකු ශ්‍රී ලංකාවෙහි කෘෂිකාර්මික හෝ වෙනත් නිෂ්පාදන ව්‍යවසායක් පවත්වාගෙන යන්නා වූ ද ඒ ව්‍යාපාරයේ යම් නිෂ්පාදිතයක් ශ්‍රී ලංකාවෙන් පිටත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත බාරදීම සඳහා හෝ විකුණන ලබන්නා වූ ද අවස්ථාවක, ගිවිසුම ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දී කරනු ලැබුව ද, තොග වෙළෙඳ පොළක දී විකිණීමෙන් උද්ගත වන සම්පූර්ණ ලාභය 2 වන වගන්තියේ අර්ථානුකූලව ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, පැටවීම හා බෑම, කලවම් කිරීම, තේරීම, ඇසුරැම් කිරීම හෝ බැහැර කිරීම නොවන්නා වූ යම් සැකසීමක් ශ්‍රී ලංකාවෙන් පිටත දී නිෂ්පාදනය සම්බන්ධයෙන් කරනු ලැබීම නිසා ලාභය වැඩි වූ බව පෙන්වනු ලැබිණි නම්, ඒ වැඩි ලාභය ශ්‍රී ලංකාව තුළ ඇති වන හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වන ආදායමක් ලෙස නොසැලකිය යුතු ය.

එවැනි යම් නිෂ්පාදනයක් තොග වෙළෙඳ පොළෙහි විකුණනු නොලැබූ හෝ කිසිසේත්ම විකුණනු නොලැබූ හෝ යම් අවස්ථාවක එකී තැනැත්තාට 2 වන වගන්තියේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවෙන් ලාභය ව්‍යුත්පන්න වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ලාභය උපරිම වාසි ලැබෙන පරිදි ඒ තැනැත්තා විසින් ඒ නිෂ්පාදනය තොග වශයෙන් විකුණනු ලැබුවේ නම්, ඉන් ලැබිය හැකි ලාභවලට වඩා අඩු නොවිය යුතු ය.

**85**. වාසික තැනැත්තකු විසින් සේවයේ නියුක්ත කරගනු ලැබීමෙන් නිර්වාසික තැනැත්කුට ලැබෙන ලාභ වෙනුවෙන්. ඒ ලාභ ශ්‍රී ලංකාවෙහි දී කරනු ලැබූ සේවාවන්ගේ හෝ අතීත සේවාවන්ගෙන් උද්ගත වූ ලාභ වන තාක් ප්‍රමාණයට, ආදායම් බද්ද අය කරනු ලැබිය යුතු ය.

නිර්වාසික තැනැත්තන්ගේ ඇතැම් ලාබ ආදායම් බද්දට යටත් වීම.

**86**. (1) 79 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසිකයකු ලෙස සලකනු ලබන යම් පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායම, ශ්‍රී ලංකාවේ දී ඉටු කරන ලද සේවාවන්ගෙන් ලැබුණු ආදායමෙන් පමණක් සමන්විත වන්නා වූ සහ රුපියල් තුන් ලක්ෂයක් නොඉක්මවන්නා වූ අවස්ථාවක, ඒ ආදායම් සම්බන්ධයෙන් බදු අයකරනු නොලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී නිර්වාසික තැනැත්තන් ආදායම බද්දෙන් නිදහස් කිරීම සහ ඇතැම් නිර්වාසික තැනැත්තන් අඩුකල අනුප්‍රමාණ අනුව ආදායම් බදු ගෙවීමට යටත් වීම.

(2) නිර්වාසික සමාගමකින් ලාභාංශයක් වශයෙන් 76 (2) වන උපවගන්තිය යටතේ අවසර දෙනු නොලැබූ හෝ ව්‍යතිරේක කරන ලද හෝ පොලියක්, වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ නිෂ්පාදන භාගයක් වශයෙන් හෝ යම් මුදලක්, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව නිර්වාසික තැනැත්තකු විසින් ලබන අවස්ථාවක ඒ මුදල ඒ නිර්වාසික තැනැත්තාගේ ශ්‍රී ලංකාව තුල උද්ගතවන හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වන ආදායම වශයෙන් සලකනු නොලැබිය යුතු ය. තව ද ඒ සම්බන්ධයෙන් ඔහුගෙන් ආදායම් බද්දක් අය කරනු නොලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් යම් බද්දක් ආපසු ගෙවීමකට ඔහු හිමිකම් නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් යම් මුදලක් ශ්‍රී ලංකාව තුළ කරගෙන යන යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක ලැබීම්වල කොටසක් ලෙස සමන්විත වන අවස්ථාවක, ඒ වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ලාභ ආගණනය කිරීමෙහිලා ඒ මුදල බැහැර කරන ආකාරයෙන් ඒ උපවගන්තියේ විධිවිධානවල ඇති කිසිවක් ක්‍රියාත්මක නොවිය යුතු ය.

(4) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග එකඟවීමට ඇතුළත් වූ සමාගමකින් යම් නිර්වාසික තැනැත්තකුට ලැබුනු රාජ්‍ය භාගයක් වෙනුවෙන් ඒ තැනැත්තා විසින් ආදායම් බද්ද ගෙවිය යුතු වන අනුප්‍රමාණය ඒ රාජ්‍ය භාගය වෙනුවෙන් ආදායම් බදු අඩු කළ යුතු වන අනුප්‍රමාණය ලෙස යම් අනුප්‍රමාණයක් එකඟවීමේ සඳහන් වේ නම් ඒ අනුප්‍රමානය නොඉක්මවිය යුතු ය.

උ-නැව් කටයුතු සහ ගුවන් කටයුතු

නිර්වාසික නැව් හිමියන්ගේ හෝ නැව් කුලියට ගන්නන්ගේ ලාභ.

**87**. (1) නිර්වාසික තැනැත්තකු විසින් නැව් හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන අවස්ථාවක සහ ඔහුට අයත් වූ හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ හෝ යම් නැවක් ශ්‍රී ලංකාවේ නැව් තොටකට පැමිණි අවස්ථාවක, (හුදෙක් නැවකින් නැවකට මාරු කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගෙන ආ බඩු හැර) ශ්‍රී ලංකාවේ නැව්ගත කරනු ලබන මගීන්, තැපැල්, ඇති කරන සතුන් සහ භාණ්ඩ ගෙනයාම වෙනුවෙන් ලැබිය යුතු මුළු මුදලෙන් සියයට හයකට සමාන ප්‍රමාණයක්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, ඒ මගින්, තැපැල්, ඇති කරන සතුන් හෝ භාණ්ඩ ගෙනයාමෙන් ඔහුට ඇති වන සම්පූර්ණ ලාභය වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ ලාභ ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ ලාභ ලෙස ද සලකනු ලැබිය යුතු ය.

(2) යම් නිර්වාසික තැනැත්තකුට අයත් වූ හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ නැවක් ශ්‍රී ලංකාවේ නැව් තොටකට පැමිණීම අනියම් පැමිණීමක් වන සහ ඒ නැව හෝ ඒ තැනැත්තාට අයිති හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ වෙනත් නැව් හෝ තවදුරටත් එසේ පැමිණීමට ඉඩ නැති අවස්ථාවක, ඒ නැවේ ලාභ සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ආදායම් බද්දක් ද අයකරනු නොලැබිය යුතු ය.

නැවක ප්‍රධානයා අනුයෝජිතයකු බව.

**88**. 87 වන වගන්තියේ විධිවිධාන යටතේ ආදායම් බද්ද ගෙවීමට යටත් යම් නිර්වාසික තැනැත්තකුට අයිති හෝ ඔහු විසින් කුලියට ගන්නා ලද හෝ නැවක ප්‍රධානයා මේ පනතේ සියලු කාර්ය සඳහා ඒ නිර්වාසික තැනැත්තාගේ අනුයෝජකයා ලෙස සලකනු ලැබිය යුතු ය. (වෙනත් යම් අනුයෝජිතයෙක් සිටි නම් ඔහු බැහැර කළ යුතු බව මින් අදහස් නොවිය යුතු ය.)

ආදායම් බද්ද ගෙවීම හිඟව ඇති විට ආපසු යාත්‍රා කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම.

**89**. (1) නැව් හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන ගිය තැනැත්තකුගේ ආදායම අනුව අයකළ යුතු ආදායම බද්ද (ඒ තැනැත්තා කෙලින්ම හෝ වෙනත් තැනැත්තකුගේ නාමයෙන් තක්සේරු කරනු ලැබුව ද) තුන් මසකට වැඩි කාලයක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ප්‍රධාන රේගු අයකැමිට හෝ නැවට ආපසු යාත්‍රා කිරීමට අවසර දිය හැකි වෙනත් බලධරයකුට හෝ ඒ තැනැත්තාගේ නම ද පැහැර හැර ඇති ආදායම් බද්දේ විස්තර ද ඇතුළත් වූ සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබ ඇති එකතු කර ගැනීමේ හා අයකර ගැනීමේ වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීමට අතිරේකව, නිකුත් කල හැකි ය. ඒ සහතිකය ලැබුණු

විට ඒ තැනැත්තාට සම්පූර්ණයෙන් ම අයත් වූ හෝ කොටසක් අයත් වූ හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ හෝ නැවකට ශ්‍රී ලංකාවේ යම් නැව් තොටකින් ආපසු යාත්‍රා කිරීමට අවසර දීම, එකී ආදායම් බද්ද ගෙවන තෙක්, ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධාන රේගු අයකැමිට හෝ වෙනත් බලධරයාට මෙයින් බලය පැවරෙන අතර, එසේ කිරීමට ඔහුට මෙයින් නියම කරනු ලැබේ.

(2) මේ වගන්තිය යටතේ ආපසු යාත්‍රා කිරීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන රේගු අයකැමිට හෝ වෙනත් බලධරයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් නොපැවරිය යුතු ය. නැතහොත් පවත්වාගෙන නොයා යුතු ය. එසේම මේ වගන්තිය යටතේ නැවක් රඳවා ගැනීමේ කාරණය, රඳවා ගනු ලැබීමේ කාලය සඳහා වරායට අයවිය යුතු මුදලක් හෝ ගාස්තුවක් ගෙවීමට අයිතිකරුට හෝ නැව කුලියට ගත් තැනැත්තාට හෝ අනුයෝජිතයාට ඇති වගකීම කෙරෙහි බල නොපෑ යුතු ය.

**90**. (1) නිර්වාසික තැනැත්තකු ගුවන්යානා හිමියකුගේ හො නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යන අවස්ථාවක, ඔහුට අයත් වූ ඔහු විසින් කුලියට ගනු ලැබූ යම් ගුවන් යානයක් ශ්‍රී ලංකාව තුළ යම් රේගු ගුවන් තොටුපළකට පැමිණි විට, ශ්‍රී ලංකාවේ දී ඒ ගුවන් යානයට පැට වූ මගීන්, තැපැල්, ඇති කරන සතුන් හෝ බඩු ගෙන යාමෙන් ඔහුට ලැබෙන සම්පූර්ණ ලාභය ශ්‍රී ලංකාව තුළ දී ඇති වන ලෙස සලකනු ලැබිය යුතු ය : නිර්වාසික ගුවන්යානා අයිතිකරුවන්ගේ හා ගුවන්යානා කුලියට ගන්නන්ගේ ලාභ.

එසේ වුව ද එක් ගුවන් යානයකින් තවත් ගුවන් යානයකට හෝ ගුවන් යානයකින් නැවකට හෝ නැවකින් ගුවන් යානයකට හෝ මාරු කිරීම් කාර්යය සඳහා ම පමණක් ශ්‍රී ලංකාවට ගෙනෙනු ලබන බඩුවලට මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.

(2) ගුවන් යානයක අයිතිකරු වශයෙන් හෝ ගුවන් යානයක් කුලියට ගන්නකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු යම් ගණන් දීමේ කාල පරිච්ඡේදයක් සඳහා (3) වන උපවගන්තියේ සඳහන් සහතිකය ඉදිරිපත් කරන අවස්ථාවක, මගීන්, තැපැල්, ඇති කරන සතුන් හෝ බඩු ගෙන යාමේ ඔහුගේ ව්‍යාපාරයෙන් අගය ක්ෂයවීම සඳහා යම් දීමනාවක් අඩු කිරීමට පෙර ඔහුට ශ්‍රී ලංකාව තුළ ඇතිවන ලාභය, එකී කාල සීමාව සඳහා එකී සහතිකයෙන් පෙන්වනු ලබන මුළු ලාභ හා මගීන්, තැපැල්, ඇති කරන සතුන් හා බඩු ගෙන යාම වෙනුවෙන් ඔහුට ලැබෙන මුළු මුදල අතර ඇති අනුපාතය ම ශ්‍රී ලංකාවෙහි දී පටවනු ලැබූ මගීන්, තැපැල්, ඇති කරන සතුන් හා බඩුගෙන යාම වෙනුවෙන් ලැබෙන මුදලට දරන මුදලක් විය යුතු ය :

එසේ වුව ද මේ පනතෙහි මීට ඉහතින් ම වූ විධිවිධානවලට නියමිත ක්‍රමයට වඩා සැලකිය යුතු අන්දමින් වෙනස් වන ක්‍රමයකින් එකී මුළු ලාභ ආගණනය කර ඇති අවස්ථාවක, ලාභවල අනුපාතය එකී විධිවි ධාන ප්‍රකාර ලාභ ආගණනය කරන ලද නම් ලැබෙන අනුපාතයට හැකි තරමින් අනුරූප වන ලෙස ගලපා ගත යුතු ය.

(3) සහතිකය, ගුවන් යානා අයිතිකරුවකු වශයෙන් හෝ ගුවන් යානා කුලියට ගන්නකු වශයෙන් වූ නිර්වාසික තැනැත්තාගේ ව්‍යාපාරයෙන් ඔහුට ලැබෙන මුළු ලාභය තක්සේරු කරන යම් ආදායම් බදු නිලධරයකු විසින් හෝ ඔහු ඔහු වෙනුවෙන් හෝ නිකුත් කරනු ලැබුවක් විය යුතු ය. තව ද ව්‍යාපාරය සම්බන්ධයෙන් යම් ගණන් දීමේ කාලයක් සඳහා පහත දැක්වෙන කරුණු ඉන් සහතික කළ යුතු ය :—

(අ) ක්ෂය වීම වශයෙන් යම් දීමනාවක් නොකොට, ඒ බලධරයා විසින් ආදායම් බද්දෙහි කාර්යය සඳහා ආගණනය කරනු ලැබූ ලාභ හෝ ලාභ නොමැති වූ විටක නම් අලාභ සහ මගීන්, තැපැල්, ඇති කරන සතුන් හෝ බඩුගෙන යාම වෙනුවෙන් ලැබෙන මුළු මුදල අතර ඇති අනුපාතය ; සහ

(ආ) ඒ බලධරයා විසින් ආගණනය කරනු ලැබූ ක්ෂයවීම සඳහා වූ දිමනාව සහ මගීන්, තැපැල්, ඇතිකරන සතුන් හා බඩු ගෙන යාම වෙනුවෙන් ලැබෙන මුළු මුදල අතර ඇති අනුපාතය.

(4) තක්සේරු කරනු ලබන වේලෙහි (2) වන උපවගන්තියේ විධිවිධාන යම් කරුණක් නිසා, සතුටුදායක ලෙස අදාල කිරීමට නොහැකි වූ විට, ශ්‍රී ලංකාවෙහි දී උපදින ලාභ ශ්‍රී ලංකාවේ දී ගුවන් යානාවකට පටවනු ලැබූ මගීන්, තැපැල්, ඇතිකරන සතුන් හා බඩු ගෙන යාම වෙනුවෙන් ලැබෙන මුළු මුදලෙහි සාධාරණ ප්‍රතිශතයක් ලෙස සලකා ආගණනය කළ හැකි ය:

එසේ වුව ද ප්‍රතිශතය අනුව යම් තැනැත්තකු යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කරනු ලැබූ අවස්ථාවක, ඒ වර්ෂය සඳහා ඔහු ගෙවීමට යටත් වන ආදායම් බද්ද (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ක්‍රමය පදනම් කොටගෙන නැවත ආගණනය කරන ලෙස තක්සේරු වර්ෂයේ අවසානයෙන් පසු තුන් වර්ෂයක් ඇතුළත කවර වූ හෝ වේලාවක ඉල්ලීමක් කිරීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

**91**. (1) 87 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සහ 88 වන සහ 89 වන වගන්තිවල විධිවිධාන නැව් හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යන නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ වන ආකාරයට ම, ඒ විධිවිධාන ගුවන් යානා අයිතිකරුවකුගේ හෝ ගුවන් යානා කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යන, සෑම නිර්වාසික තැනැත්තකුට ම අදාළ විය යුතු ය.

නිර්වාසික ගුවන් යානා අයිතිකරුවන්ගේ සහ කුලියට ගන්නන්ගේ ලාභවලට 87 (2) වන 88 වන සහ 89 වන වගන්ති අදාල වීම.

(2) ගුවන් යානා අයිතිකරුවකුගේ හෝ ගුවන් යානා කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යන නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් 87 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 88 වන සහ 89 වන වගන්තිවල විධිවිධාන අදාළ කිරීමේ දී-

(අ) "වරායට අයවිය යුතු මුදල් හා ගාස්තු" යන්නට ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවෙන් පිටට යන යම් ගුවන් යානාවක් රේගු ගුවන් තොටුපළකට ගොඩ බැස්සවීම, නතර කර ගැබීම හෝ යානා ගෘහයක තැබීම වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ වෙනත් තැනැත්තකුට ගෙවිය යුතු යම් ගාස්තුවක් ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය ;

(ආ) "නැව් තොට" යන්නට රේගු ගුවන් තොටුපළක් ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය ;

(ඇ) "නැව" යන්නට ගුවන් යානාව ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර, නැව් හිමියා යන්න ද ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය ;

(ඈ) යම් නැවකට ආපසු යාත්‍රා කිරීමට ඉඩ දීම පිළිබඳව කරනු ලබන යම් සඳහන් කිරීමකට රේගු ආඥාපනතේ 63 වන වගන්තිය යටතේ ආපසු යාත්‍රා කිරීමේ සහතිකයක් දීම වෙනුවට ගුවන් යානාවක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ නියමිත හෝ බලය දෙනු ලැබූ යම් ක්‍රියාවක් ගැන සඳහන් කිරීමක් ඇතුළත් වූ ලෙස සැලකිය යුතු අතර ආපසු යාත්‍රා කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීමක් පිළිබඳව කරනු ලබන සඳහන් කිරීමක් ද ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය ;

(ඉ) නැවක ප්‍රධානයා පිළිබඳව කරනු ලබන යම් සඳහන් කිරීමකට ගුවන් යානාවක තත් කාලයේ පාලනය හෝ භාරය ඇතිව සිටින තැනැත්තා පිළිබඳව කරනු ලබන සඳහන් කිරීමක් ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය ;

ඌ - රක්ෂණය

රක්ෂණ සමාගම්වල ලාභ නිශ්චය කිරීම.

**92**. (1) අන්‍යොන්‍ය හෝ හිමිකාර සමාගමක ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ (කොමිස් මුදල් ඇතුළුව) ඒ ව්‍යාපාරයට ආරෝපණය කළ හැක කළමනාකරන වියදම් හැර, ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජන ආදායම විය යුතු ය :

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ නිර්වාසික මෙවැනි සමාගමක් කෙලින් ම හෝ අනුයෝජිතයකුගේ මාර්ගයෙන් ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු කරන අවස්ථාවක, එයින් ලැබෙන ලාභ නිශ්චය කල යුතු වන්නේ, සමාගමේ ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ වාර මුදල් සමාගම විසින් ලබාගත් මුළු ජීවිත රක්ෂණ වාර මුදලට යම් අනුපාතයක් දරයි ද, සමාගමේ ජීවිත රක්ෂණ අරමුදල් මුලු ආයෝජන ආදායමට එම ලාභ දරන පරිදිය. එහෙත් ඒ ලාබ නිශ්චය කිරීමේ දී ජීවිත රක්ෂණ වාර මුදල් හෝ ආයෝජන ආදායම හෝ නොවන යම් ආදායම් හෝ ලාභ පහත දැක්වෙන එක් එක් අවස්ථාවේ සඳහන් කර ඇති වියදම්වලට හිලව්කර ගණන් බලා මුළු ජීවිත රක්ෂණ වාර මුදලින් අඩු කළ යුතු ය :—

(අ) (කොමිස් ඇතුළුව) ශ්‍රී ලංකාව තුල අනුයෝජන වියදම් ; සහ

(ආ) සමාගමේ ප්‍රධාන කාර්යාලයේ වියදම්වලින් සාධාරණ අනුපාතයක්.

(2) අන්‍යොන්‍ය හෝ හිමිකාර නිර්වාසික සමාගමක (ජීවිත රක්ෂණය හැර) රක්ෂණ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයේ දළ වාර මුදල් (රක්ෂිතයන්ට ආපසු දෙනු ලැබූ වාර මුදල් ද සහ ප්‍රතිරක්ෂණය සඳහා ගෙවන ලද වාර මුදල් අඩු කොට) ගෙන, කාලසීමාව අවසානයේ දී ලාභ නිශ්චය කරන කාලසීමාවේ දී දුරු වී නොතිබූ අවදානම් සඳහා සංචිතයක්, සමාගම එකක් වශයෙන් ගත් කල එහි කටයුතුවල දී එබඳු අවදානම් සඳහා යොදා ගන්නා ප්‍රතිශතය අනුව එයින් අඩු කොටසේ ඒ කාලසීමාව ආරම්භයේ දී ඉතිරිව තිබූ අවදානම සඳහා එසේම ගණන් බලනු ලැබූ සංචිතයක් ඊට එකතු කොට ඉන් ලැබෙන ශුද්ධ ප්‍රමාණයෙන් (නැවත රක්ෂණය යටතේ අලාභ සම්බන්ධයෙන් ලබාගත් මුදල් හැර) ඇත්ත වශයෙන් ම වූ අලාභය ද ශ්‍රී ලංකාවෙහි අනුයෝජන වියදම් ද සමාගමෙහි ප්‍රධාන කාර්යාලයෙහි වියදම්වල යුක්ති සහගත ප්‍රමාණයක් ද අඩු කිරීමෙනි ; එකී අලාභ සහ වියදම් ගණන් බැලීමේ දී වාර මුදල් නොවන යම් ආදායම් හෝ ලාභ ඒ වියදම්වලට නිසි පරිදි හිලව්කර ගණන් බැලිය යුතු ය.

(3) නිර්වාසික රක්ෂණ සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙහි දී කරනු ලැබූ ව්‍යාපාර කටයුතු සීමිත ප්‍රමාණයක වීම නිසා (1) වන හා (2) වන උපවගන්ති අදාළ කිරීම සඳහා අවශ්‍ය විස්තර සපයන ලෙස නියම කිරීම අසාධාරණ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ උපවගන්තිවල විධිවිධානවල කුමක් වුව ද, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයෙන් ලැබෙන වාර මුදල් සහ එහි වාර මුදල් මුළු ගණන අතර ඇති අනුපාතය අනුව සමාගමෙහි ලාභ ආදායමෙහි මුළු ගණන ආශ්‍රයෙන් හෝ සියලු අවස්ථාගත කරුනු සම්බන්ධයෙන් සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයාට හැඟෙන අන් කිසි ක්‍රමයකින් හෝ සමාගමෙහි ලාබ නිශ්චය කිරීම ඔහු විසින් අවසර දිය හැකි ය.

(4) මේ වගන්තියෙහි (ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජන ආදායම) යන යෙදුමෙන් (5) වන උපවගන්තියේ සඳහන් යම් ලාභාංශයක මුදල හැර-

(අ) තම එකම ව්‍යාපාරය ජීවිත රක්ෂණය වූ සමාගමක් සම්බන්ධයෙන් නම් එහි ආයෝජනවලින් ලැබෙන සම්පූර්ණ ආදායම ; සහ

(ආ) වෙනත් සමාගමක් සම්බන්ධයෙන් නම් එහි ආයෝජන ආදායමෙන් රක්ෂණ ව්‍යාපාරයට ආරෝපණය කිරීම සාධාරණ වන යම් කොටසක්,

අදහස් වේ.

(5) යම් සමාගමක් විසින්, ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන යම් සමාගමකට ලාභාංශයක් ගෙවනු ලැබ ඒ ලාභාංශය ඒ වාසික සමාගම වෙත වෙනත් සමාගමකින් ලැබුණු ලාභාංශ මුදලක යම් කොටසකින් සමන්විත වන අවස්ථාවක, ඒ ලාභාංශය, ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන සමාගමේ ජීවිත රක්ෂණ අරමුදලේ ආයෝජන ආදායමේ කොටසක් නොවිය යුතු ය.

### ඒ - ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලිය යනාදිය

ඇතැම් ණය මත ලැබෙන පොලිය, ලාභ සහ ආදායම ලෙස සළකනු ලැබිය යුතු බව.

**93**. නිර්වාසික තැනැත්තකුගෙන් ලබා ගන්නා ලද ණයක් මත ඒ නිර්වාසික තැනැත්තාට පොලිය ගෙවනු ලැබිය යුතු අවස්ථාවක සහ ඒ ණය මත ගෙවිය යුතු පොලිය-

(අ) ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තකු විසින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ; හෝ

(ආ) ඒ ණය මුදල හෝ එහි කොටසක් ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබ ඇති හෝ ශ්‍රී ලංකාවේ දී පාවිච්චි කරනු ලැබ ඇති හෝ අවස්ථාවක නිර්වාසික තැනැත්තකු විසින් හෝ,

දරනු ලබන අවස්ථාවක, ඒ පොලිය ශ්‍රී ලංකාවේ දී උද්ගත වන හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වන හෝ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් රාජ්‍ය භාග ලාබ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු බව.

**94**. රාජ්‍ය භාග-

(අ) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් කෙලින් ම හෝ අන්‍යාකාරයකින් දරනු ලබන ; හෝ

(ආ) **32** වන වගන්තිය යටතේ අඩු කළ හැකි, විටක එකී රාජ්‍ය භාග ශ්‍රී ලංකාවේ දී උද්ගත වන හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වන හෝ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලී යනාදියෙන් ආදායම් බදු අඩුකර ගැනීම.

**95**. (1) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු වුව ද-

(අ) සෑණපත්‍රවල, උකස්කරවල, ණයවල, තැන්පත් මුදල්වල හෝ අත්තිකාරම් මුදල්වල පොලී වශයෙන් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි දේපල සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවෙහි උපදින ආදායමෙන් හෝ ගෙවිය යුතු කුලියක්, බිම් කුලියක්, රාජ්‍ය භාගයක් හෝ වාර්ෂිකයක් වශයෙන් හෝ,

ගෙවිය යුතු වන යම් මුදලක්, ශ්‍රී ලංකාවෙහි තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ශ්‍රී ලංකාවෙන් පිට යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ අවස්ථාවක, පටහැනිව යම් එකඟවීමක් තිබුණ ද මේ පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය අනුව හෝ ද්විත්ව බදු ගෙවීමෙන් සහනය සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඒ තැනැත්තා පදිංචි හෝ ඒ හවුල් ව්‍යාපාරය පිහිටි දේශයේ ආණ්ඩුව අතර බලපවත්නා ගිවිසුමක් පවතින කල්හි ඒ ගිවිසුමෙහි සඳහන් උචිත අනුප්‍රමාණය අනුව, ආදායම් බදු අඩු කර ගැනීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය. එසේ අඩු කළ යුතු බදු

ප්‍රමාණය ඒ තැනැත්තාගෙන් ජනරජයට අයවිය යුතු ණයක් වන්නේ ය. එය බදු ණයක් වශයෙන් වහාම අයකර ගත යුතු අතර මේ පනත යටතේ වෙනත් ආකාරවලින් ගෙවිය යුතු යම් ආදායම් බද්දකට අතිරේකව ඒ තැනැත්තා වෙනුවෙන් තක්සේරු කර ඔහුගෙන් එය අයකර ගැනීම කළ හැකි ය ;

එසේ වුව ද-

(අ) ශ්‍රී ලංකාවෙන් පිට යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු හෝ බැර කළ යුතු යම් මුදලකින්, අවස්ථාවෝචිත පරිදි, හතරවන උපලේඛණයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණ නොවන හෝ ද්විත්ව බදු ගෙවීම සඳහා සහනය සලසන ගිවිසුමෙහි සඳහන් අනුප්‍රමාණ නොවන අනුප්‍රමාණයන් අනුව යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අඩු කරන ලෙස, ශ්‍රී ලංකාවෙන් පිට ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් මේ පනත යටතේ ගෙවිය යුතු මුළු බද්ද සැලකිල්ලට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුට නියම කළ හැකි අතර එසේ අඩු කර ගත හැකි බද්ද ඉහත කී ආකාරයට අයකර ගත යුතු හෝ ගෙවිය යුතු වන්නේ ය.

(ආ) ශ්‍රී ලංකාවෙහි ඇති නොවන ආදායමෙන් ගෙවනු ලැබූ පොලියකට හෝ බැංකුකරුවකු විසින් දෙනු ලැබූ යම් ණයක් හෝ, අත්තිකාරමක පොලියකට හෝ යම් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග විදේශ ව්‍යවහාර මුදලින් යම් තැනැත්තකුගේ බැරට ඇති මුදලට ඔහුට ගෙවනු ලැබූ යම් පොලියකට මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාල නොවිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිට යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ යම් මුදලකින් (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර ආදායම් බදු අඩුකර ගන්නා තැනැත්තකු විසින් ඒ අවස්ථාවෙහි දී ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට-

(අ) ඒ ගෙවීමේ හෝ බැර කිරීමේ දළ ප්‍රමාණය ද ;

(ආ) එසේම අඩු කරනු ලැබූ ආදායම් බද්දෙහි අනුප්‍රමාණය හා ප්‍රමාණය ද ;

(ඇ) ඇත්ත වශයෙන්ම ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ ශුද්ධ ප්‍රමාණය ද,

දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් නිකුත් කළ යුතු ය.

(3) යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට (1) වන උපවගන්තිය ප්‍රකාර ආදායම් බදු අඩු කිරීමට පාත්‍ර වූ මුදලක් ඇතුළත් වන අවස්ථාවක, ඒ මුදල පිළිබඳව (2) වන උපවගන්තිය ප්‍රකාර නිකුත් කරනු ලැබූ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු, අඩු කරගත් ආදායම් බදු මුදල වශයෙන් ඒ ප්‍රකාශයෙහි දැක්වුණු මුදල ආදායම් බදු මුදලෙන් හිලව් කිරීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය.

යම් විදේශීය විනෝද ක්‍රීඩකයන්ට හෝ ශිල්පීන්ට කරන ලද ගෙවීම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම.

**96**. (1) සෑම තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ම -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ; සහ

(ආ) විනෝද ක්‍රීඩකයකුගේ හෝ ශිල්පියකුගේ වෘත්තීය හෝ රක්ෂාව කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන

වෙනත් යම් තැනැත්තකුට, ඒ වෘත්තීය හෝ රක්ෂාව කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන අතරතුර ඒ වෙනත් තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී කරන ලද සේවාවන් සම්බන්ධයෙන් ගෙවීමක් කරන විට, මේ පනතේ පස් වන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයට අනුව ආදායම් බද්දක් ඒ ගෙවීමෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(2) තමා විසින් වෙනත් යම් තැනැත්තකුට කරන ලද ගෙවීමකින් (1) වන උපවගන්තියට අනුකූල ආදායම් බද්දක් අඩුකරගනු ලබන සෑම තැනැත්තකු ම, පහත දැක්වෙන විස්තර දැක්වන ප්‍රකාශයක් ඒ වෙනත් තැනැත්තාට නිකුත් කළ යුතු ය :—

(අ) ලැබිය යුතු වන ගෙවීමේ දළ මුදල් ප්‍රමාණය ;

(ආ) සැබැවින් ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක තක්සේරු කල හැකි ආදායමට මේ වගන්තියෙහි සඳහන් ගෙවීමක් ඇතුළත් වන අවස්ථාවක, එවිට -

(අ) ඒ තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ නම්, (2) වන උපවගන්තියට අනුකූලව කරන ලද ඒ ගෙවීමට අදාළ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති බදු මුදල ඔහු විසින් ගෙවිය යුතු වන ආදායම් බද්දෙන් අඩු කර ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය ;

(ආ) ඒ තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් නොවන්නේ නම්, (2) වන උපවගන්තියට අනුකූලව කරන ලද ඒ ගෙවීමට අදාළ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට සහ XXVIII වන පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති බදු මුදල ආපසු ලබා ගැනීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

(4) තමන්ට කරන ලද යම් ගෙවීමකින් (1) වන උපවගන්තියට අනුකූලව, ආදායම් බදු අඩු කර ගැනීමට ඒ උපවගන්තිය යටතේ නියමිත යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් එකී බදු මුදල අඩුකර ගැනීමට අපොහොසත් වූ විටක—

(අ) ඒ තැනැත්තා පුද්ගලයකු නම් ඒ පුද්ගලයා ද ;

(ආ) ඒ තැනැත්තා සමාගමක් හෝ සංස්ථාගත කරනු ලැබූ නැතහොත් සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩලයක් වන්නේ නම්, ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්වරයා, කළමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධරයා,

ඒ උපවගන්තිය යටතේ ඔහු විසින් අඩු කර ගැනීමට නියමිත බද්ද ගෙවීමට පෞද්ගලිකව යටත් විය යුතු ය. මේ පනතේ විධිවිධාන සලස්වන ලද සියලු ක්‍රමවලින්, අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයාගෙන්, ලේකම්වරයාගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් ඒ බද්ද අය කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියෙහි "විනෝද ක්‍රීඩකයකුගේ හෝ ශිල්පියකුගේ වෘත්තිය හෝ රක්ෂාව" යන යෙදුමෙහි නළුවකුගේ, සංගීතඥයකුගේ, මලල ක්‍රීඩකයකුගේ හෝ පිනුම්කරුවකුගේ වෘත්තිය හෝ රක්ෂාව ඇතුළත් වන්නේ ය.

ඒ - ද්විත්ව බදු අය කිරීම්වල දී සහන

ද්විත්ව බදු සහන සඳහා වන ගිවිසුම් වල බලපෑම.

**97**. (1) (අ) ශ්‍රී ලංකාවේ නීති යටතේ වූ ආදායම් බද්ද සහ වෙනත් දේශයක නීති මගින් පැන වූ ඒ ස්වභාවයේ යම් බදු සම්බන්ධයෙන් ද්විත්ව බදු අය කිරීම්වලින් සහනයක් සැලැස්වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා ඒ වෙනත් යම් දේශයක ආණ්ඩුවක් අතර හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා වෙනත් යම් දේශවල ආණ්ඩු සමග ඇතිකරගත් ගිවිසුමක් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයෙන් අනුමත කරන අවස්ථාවක, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ඒ ගිවිසුම මගින්-

(i) ආදායම් බද්දෙන් සහන දීම සඳහා ;

(ii) ශ්‍රී ලංකාවේ වාසික නොවන තැනැත්තන් කෙරෙහි ශ්‍රී ලංකාව තුළ දී අදාළ කරගනු ලබන ලාභ හෝ ආදායම නිශ්චය කර ගැනීමට හෝ එවැනි තැනැත්තන් සහ ඔවුන්ගේ අනුයෝජිත ආයතන ශාඛා හෝ ආයතන කෙරෙහි ශ්‍රී ලංකාව තුළ දී අදාළ කරගනු ලබන ලාභ හෝ ආදායම නිශ්චය කර ගැනීම සඳහා ;

(iii) ශ්‍රී ලංකාවේ නිර්වාසික තැනැත්තන් සමග විශේෂ සම්බන්ධකම් ඇති ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් වෙනුවෙන් යෙදෙන ලාභ හෝ ආදායම් නිශ්චය කිරීම සඳහා ;

(iv) තොරතුරු හුවමාරු කරගැනීම සඳහා ; හෝ

(v) ගෙවිය යුතු ආදායම් බදු අයකර ගැනීමට සහාය ලබාගැනීම සඳහා,

විධිවිධාන සලසන තාක් දුරට, ඒ ගිවිසුමට ශ්‍රී ලංකාවේ නෛතික බලය ඇතිවිය යුතු ය

(ආ) (අ) ඡේදය යටතේ යෝජනා සම්මතයෙන් අනුමත කරනු ලැබූ සෑම ගිවිසුමක්ම ඒ අනුමත කල බවට වූ දැන්වීමකුත් සමග ගැසට් පත්‍රයේ පළ කල යුතු ය.

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත වූ යම් දේශයක නීති යටතේ ගෙවිය යුතු බද්ද, ශ්‍රී ලංකාවේ ගෙවිය යුතු යම් බද්දකට බැර වශයෙන් ඉඩ හරිනු ලැබිය යුතු බවට (අ) ඡේදයේ සඳහන්

යම් ගිවිසුමකින් විධිවිධාන සැලසෙන යම්කිසි අවස්ථාවක යම් ප්‍රභවයකින් ඇතිවන ලාභ හෝ ආදායම මත වූ ශ්‍රී ලංකා බද්ද සම්බන්ධයෙන් එසේ ඉඩ හරිනු ලබන බැර කිසිවකට ඒ ලාභ හෝ ආදායම සම්බන්ධයෙන් ගෙවිය යුතු ශ්‍රී ලංකාවේ බදු මුදලට වඩා වැඩි නොවිය යුතු ය.

(2) (අ) මේ වගන්තියේ කාර්ය සඳහා-

(i) "ආදායම" ගණන් බැලීම, තක්සේරු කල හැකි ආදායම නිශ්චය කිරීම සම්බන්ධයෙන් මේ පනතෙහි වූ විධිවිධාන ප්‍රකාර හැකිතාක් දුරට කල යුතු නමුත්, පොලී වාර්ෂිකයන්, බිම් කුලී හෝ රාජ්‍ය භාග වශයෙන් ඒ ආදායමෙන් ගෙවිය යුතු යම් මුදලක් එයට ඇතුලත් නොවිය යුතු ය ;

(ii) "ශ්‍රී ලංකාවේ බද්ද" යන්නෙන්, මේ වගන්තිය යටතේ යම් සහන සඳහා අඩු කිරීමක් සිදු කිරීමට පෙර මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වන නමුත් ඒ බද්ද අයකර ගනු ලබන ආදායමෙන් පොලී වාර්ෂිකයන්, බිම් කුලී හෝ රාජ්‍ය භාග වශයෙන් ගෙවිය යුතු යම් මුදලකින් අය කෙරෙන යම් බද්දක් එයට ඇතුළත් නොවේ.

(ආ) ශ්‍රී ලංකාවේ ආදායම් බදු අනුප්‍රමාණය මේ උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර ගණන් බලනු ලැබූ බදු ගෙවූ හෝ බදු ගෙවිය යුතු ආදායමෙන් ශ්‍රී ලංකා ආදායම් බද්ද බෙදීමෙන් නිශ්චය කළ යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා වෙනත් යම් දේශයක ආණ්ඩුවක් අතර ඇති කරගනු ලැබ, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 70 වන වගන්තියේ හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 82 වන වගන්තියේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 92 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින් ම වූ දිනයෙහි ශ්‍රී ලංකාවේ නෛතික බලය ඇති සෑම ගිවිසුමක්ම මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබූ ගිවිසුමක් ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

ශ්‍රී ලංකාවේ ආදායම් බදු සම්බන්ධයෙන් දෙනු ලබන සහන.

**98.** (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් (2) වන උපවගන්තියේ සඳහන් ඔහුගේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ ආදායම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි ආදායම් බදු සහ අනුරූප කාලසීමාව සඳහා වෙනත් යම් රටක දී ආදායම් බදු ගෙවන ලද බවට හෝ ගෙවීමට යටත් බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක, එවිට (මේ වගන්තිය යටතේ යම් සහනයක් ප්‍රදානය කරනු ලැබීමට පෙර) එම වෙනත් යම් රටක දී ඔහුගේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එම ආදායම සම්බන්ධයෙන් ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ඉක්මවා ශ්‍රී ලංකාවේ දී ඔහු හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් එම ආදායම් සම්බන්ධයෙන් ගෙවිය යුතු ආදායම් බද්දක් වෙතොත්, එම අතිරික්තයට සමාන මුදලකින් ශ්‍රී ලංකාවේ දී ඒ තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සහන ලැබීමට ඔහුට හෝ ඒ හවුල් ව්‍යාපාරයට හිමිකම් ඇත්තේය :

එසේ වුව ද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය එකී වෙනත් රටක දී එම ලාභ සහ ආදායම සම්බන්ධයෙන් එකී අනුරූප කාලසීමාව සඳහා ආදායම් බදු ගෙවීමට යටත් නොවන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බදු ගණනට සමාන සහනයකට ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) (i) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකාවේ දී කළමනාකරණ උපදේශක සේවාවන් සලසනු ලබන්නා වූ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වන යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි යම් හවුල් ව්‍යාපාරයකට ; හෝ

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹියා වූ සමාගමක් වන්නා වූ සහ–

(අ) මිලට ගනු ලැබූ හෝ ඉදි කරනු ලැබූ යම් ගොඩනැගිල්ලක සහ මිලට ගනු ලැබූ යම් ඉඩමක පිරියතක, යන්ත්‍රයක හෝ ගෘහ භාණ්ඩවල ; සහ

(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා (අ) ඡේදයෙන් ඇතුළත් කරනු නොලැබූ යම් වත්කමක් අත්කර ගැනීමේ පිරිවැය පියවීමට ; හෝ

ඇමෙරිකා එක්සත් ජනපදයේ ඩොලර් දශලක්ෂ පනහක් හෝ වෙනත් යම් විදේශීය ව්‍යාවහාර මුදලකින් ඊට සමාන මුදලක් ඒ ගිවිසුම අනුව නිශ්චිත කාලසීමාව ඇතුළත ඒ ගිවිසුම අනුව ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කරනු ලැබුවා වූ හෝ එලෙස ආයෝජනය කිරීමට එකඟ වූ යම් වාසික සමාගමකට, වාස්තු විද්‍යාත්මක ඉංජිනේරු පරිමාන සමීක්ෂාවන් සහ ඊට අනුයාත වන වෙනත් යම් සේවාවන් ශ්‍රී ලංකාවෙහි දී සලසන්නා වූ යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයකට ;

(iii) (ii) වන අනුඡේදයේ සඳහන් යම් නිර්වාසික තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට වාස්තු විද්‍යාත්මක, ඉංජිනේරු පරිමාන සමීක්ෂණ හෝ ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සහ ඊට ආනුෂංගික වෙනත් සේවා ශ්‍රී ලංකාවේ දී සලසන්නා වූ යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි වූ හවුල් ව්‍යාපාරයකට ;

(ආ) (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ හෝ (iii) වන අනුඡේදයේ සඳහන් සේවාවන් ඒ අනුඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් සැලසීමෙන් ශ්‍රී ලංකාවෙන් උද්ගත වන හෝ ව්‍යුත්පන්න වූ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන්,

අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා (2) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකු විසින් හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් තම ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් යම් රටක දී ගෙවිය යුතු ආදායම් බද්ද, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාව් දී හෝ ඒ වෙනත් රටක දී (මේ වගන්තිය යටතේ යම් සහනයක් ප්‍රදානය කිරීමට පෙර) ඒ තැනැත්තා විසින් හෝ ඒ හවුල්කරු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකාවේ දී හෝ ඒ වෙනත් රටෙහි දී ආදායම් බද්ද සම්බන්ධයෙන් වූ කාර්ය සඳහා නිශ්චය කරනු ලැබූ ඔහුගේ බදු අය කල හැකි ආදායමෙන් බෙදීමෙන් ලබාගත් ලබ්ධියට සමාන අනුප්‍රමාණයක් අනුව ආගණනය කරනු ලැබිය යුතු ය.

ඔ- විවිධ කරුණු

විශේෂ ලාභ හෝ ආදායම් මාර්ග සම්බන්ධයෙන් වූ විධිවිධාන අදාළ කිරීම.

**99**. මේ පනතෙහි යම් විධිවිධානයක් **3** වන වගන්තියේ සඳහන් යම් විශේෂ ලාභ හෝ ආදායම් මාර්ගයකට ප්‍රකාශිතව අදාළ වන අවස්ථාවක ඒ විධිවිධානය, ඒ වගන්තියෙහි සඳහන් කරනු ලැබූ වෙනත් මාර්ගයකින් ලැබෙන ලාභ හෝ ආදායම නිශ්චය කිරීමෙහි ලා අදාල කර නොගත යුතු ය.

රක්ෂණයෙන් ලැබෙන ඇතැම් ලැබීම් කෙසේ සලකනු ලැබිය යුතු ද යන වග.

**100**. රක්ෂණ වාරික වශයෙන් ගෙවන ලද යම් මුදලක් යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් උපචිත ලාභ හෝ ආදායම් ඉපයීමෙහි ලා දරන්නට සිදු වූ වියදමක් වශයෙන් අඩු කිරීමට ඉඩ දී ඇති අවස්ථාවක, ඒ රක්ෂණ ගිවිසුම යටතේ ලබා ගත් යම් මුදලක් පහත දැක්වෙන පරිදි සලකනු ලැබිය යුතුය:—

(අ) එසේ ලබාගත් මුදල වෙළෙඳාමේ බඩු තොගය හෝ ලාභ නැති වී යාම හෝ මේ වගන්තියේ (ආ) හෝ (ඇ) වන අනුඡේදයන්හි සඳහන් නොවන වෙනත් යම් මුදලක් හෝ සම්බන්ධයෙන් නම්, ඒ වෙළෙඳාමෙන් ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබූ ලැබීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ආ) එසේ ලබාගත් මුදල් 25 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අර්ථානුකූලව, ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කරනු ලැබූ ප්‍රාග්ධන වත්කමක් සම්බන්දයෙන් නම් දේපළ බැහැර කිරීමෙන් ලබාගත් මුදලක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව එම වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ඒ මුදල් ප්‍රමාණයට හා ඒ සම්බන්ධයෙන් අදාල විය යුතු ය;

(ඇ) එසේ ලබාගත් මුදල, 25 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අර්ථානුකූලව, ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කරනු නොලැබූ ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් නම්, ප්‍රාග්ධන ස්වභාවයේ වූ ලැබීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, උපලබ්ධි වූ මුදල කුලී ප්‍රතියෝජනය කරන ලද ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් වූ වක් නම් මේ වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය. එවැනි අවස්ථාවක දී, 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ(අ) වන ඡේදයේ විධිවිධානවලට අනුකූල ක්ෂවීම සඳහා වූ අඩුකිරීම, ඒ ප්‍රාග්ධන වත්කම ප්‍රතියෝජනය කිරීමේ පිරිවැයෙන් රක්ෂන ගිවිසුමක් යටතේ උපලබ්ධ කරගනු ලබන මුදල අඩු කර ගනු ලැබීමෙන් පසු ඉතිරිවන මුදල මත ආගණනය කරනු ලැබිය යුතු ය.

සමාජශාලාවල හා වෙළෙඳ සමිති ආදියෙහි ආදායම නිශ්චය කිරීම.

**101**. (1) සංස්ථාගත කල හෝ නොකල යම් පුද්ගල මණ්ඩලයක් විසින් සමාජ ශාලාවක් හෝ ඒ හා සමාන ආයතනයක් පවත්වා ගෙන යන්නා වූ ද (ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල් ඇතුළුව) එකී අයහාර ගිණුමට ලැබෙන දල ලැබීම්වලින් හතරෙන් තුන් කොටසකට අඩු නොවන මුදල් ප්‍රමාණයක් එහි සාමාජිකයන්ගෙන් ලැබෙන්නා වූ ද අවස්ථාවක, එම පුද්ගල මණ්ඩලය විසින් වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලෙස නොසැලකිය යුතු ය. එහෙත් එකී දල ලැබීම්වලින් හතෙරෙන් තුන් කොටසකට අඩු මුදලක් (ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල් ඇතුළුව) සාමාජිකයන්ගෙන් ලැබෙන අවස්ථාවක සාමාජිකයන් සමග හා අන් අය සමග කරනු ලැබූ ගනුදෙනු වලින් ලැබෙන සම්පූර්ණ ආදායම වෙළෙඳ ව්‍යාපාරයකින් ලැබෙන ලැබීම් ලෙස සැලකිය යුතු අතර එයින් ලැබෙන ලාභ ද ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලෙස නොසැලකුවහොත් එහි තක්සේරු කල හැකි ආදායම ද සම්බන්ධයෙන් ආදායම් බදු අය කරනු ලැබීමට ඒ පුද්ගල මණ්ඩලය යටත් විය යුතු ය.

(2) සංස්ථාගත කල හෝ නොකල යම් පුද්ගල මණ්ඩලයක් විසින් වෙළෙඳ සංගමයක් හෝ වෙළෙඳ මණ්ඩලයක් හෝ ඒ හා සමාන ආයතනයක් පවත්වාගෙන යන විට එහි ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල වශයෙන් වූ ලැබීම්වලින් දෙකෙන් එක් කොටසකට වැඩි ප්‍රමාණයක් ඒ ඇතුළුවීමේ ගාස්තු සහ දායක මුදල් 25 වන වගන්තියේ කාර්ය සඳහා ඉඩ හැරිය හැකි අඩු කිරීම බව කියා සිටින හෝ එසේ කියා සිටීමට හිමිකම් ඇති

තැනැත්තන්ගෙන් ලැබෙන අන්දමේ තත්වයක් පවත්නා වූ අවස්ථාවක ඒ පුද්ගල මණ්ඩලය විසින් වෙළෙඳ ව්‍යාපාරයන් පවත්වාගෙන යන ලෙස සැලකිය යුතු ය. තව ද සාමාජිකයන් සමග සහ අන් තැනැත්තන් සමග කරනු ලබන ගනුදෙනුවලින් ලැබෙන (ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල් ඇතුළුව) එහි මුළු ආදායම වෙළෙඳ ව්‍යාපාරයකින් ලැබෙන ලැබීම් ලෙස සැලකිය යුතු ය. තවද එහි ලාභය හෝ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලෙස නොසැලකුවහොත් එහි තක්සේරු කරනු ලැබිය හැකි ආදායම යන දෙකෙන් වැඩි ගණන සම්බන්ධයෙන් ඒ පුද්ගල මණ්ඩලය ආදායම් බදු අය කරනු ලැබීමට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි "සාමාජිකයෝ" යන්න පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් යෙදුනු විට මණ්ඩලයේ කටයුතු පිළිබඳව සක්‍රිය පාලනයක් ක්‍රියාත්මක කෙරෙන එහි මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති තැනැත්තෝ අදහස් වෙති.

(4) මේ වගන්තියේ ඇතුළත් කිසිවක් III වන පරිච්ඡේදය යටතේ ප්‍රදානය කරන ලද යම් නිදහස් කිරීමකට බලපාන සේ කියවා තේරුම් නොගත යුතු ය.

(5) X වන පරිච්ඡේදයේ විධිවිධාන, සංස්ථාපිත මණ්ඩලයක් වන සහ මේ වගන්තිය යටතේ ආදායම් බදු සඳහා තක්සේරු කරනු ලැබිය හැකි යම් පුද්ගල මණ්ඩලයකට අදාල නොවිය යුතු ය.

රාජ්‍ය නොවන සංවිධානවල ලාභ සහ ආදායමෙන් ආදායම් බදු අයකළ යුතු බව.

**102**. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ අර්ථ නිරූපනය කර ඇති පරිදි යම් රාජ්‍ය නොවන සංවිධානයකට, ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් යම් මුදලක් ලැබෙන අවස්ථාවක, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, එම මුදලින් සියයට තුනකට සමාන මුදලක් එම තක්සේරු වර්ෂය සඳහා රාජ්‍ය නොවන සංවිධානයේ මුළු ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු අතර එම ලාභ සහ ආදායම ශ්‍රී ලංකාවේ දී උපචිත වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "රාජ්‍ය නොවන සංවිධානයක්" යන්නෙන් රාජ්‍ය නොවන ස්වභාවයකින් යුත් ස්වේච්ඡා පදනමක් මත පුද්ගල කණ්ඩායමක් විසින් පිහිටුවනු ලැබුවා වූ ද, දේශීය වශයෙන් හෝ යම් විදේශ රටකින් නැතහොත් යම් විදේශීය හෝ දේශීය සංවිධානයකින් ලැබෙන ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබුනු මුදල් මත යැපෙන්නා වූ ද, දුප්පත් හා අසරණ අයට ද, රෝගී තැනැත්තන්ට, අනාථ දරුවන්ට සහ වැන්දඹුවන්ට,

යෞවනයන්ට සහ ළමයින්ට සහ සාමාන්‍යයෙන් ව්‍යසන අවස්ථාවන්හි දී අවශ්‍ය පුද්ගලයන්ට සහන සැලසීම සඳහා ස්ථාපිත කරනු ලැබුවා වූ හෝ පිහිටුවනු ලැබුවා වූ ද, මේ වගන්තියේ කාර්ය සඳහා රාජ්‍ය නොවන සංවිධානයක් වශයෙන් කොමසාරිස්ජනරාල් විසින් තීරණය කරනු ලබන්නා වූ ද, යම් සංවිධානයක් හෝ සංගමයක් අදහස් වේ.

(3) රාජ්‍ය නොවන සංවිධානයක ලාභවලින් සහ ආදායම්න් මේ පනතේ පස් වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණවලට අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් රාජ්‍ය නොවන සංවිධානයක්-

(අ) තත් කාර්ය සඳහා රජය විසින් හඳුනාගනු ලැබූ යම් ප්‍රදේශයක අවතැන්වූ තැනැත්තන්ට පුනරුත්ථාපන කටයුතු සහ යටිතල පහසුකම් සහ ජීවනෝපාය පහසුකම් සලසන කටයුතුවල පමණක් නියැලී සිටින බවට ; හෝ

(ආ) යම් ව්‍යසනයක ස්වභාවය සහ බරපතලකම සහ ඒ අනුව ලබා දිය යුතු සහනවල ප්‍රමාණය සැලකිල්ලට ගෙන, මානුෂික ස්වභාවයෙන් යුක්ත බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ක්‍රියාකාරකමක පමණක් නියැලී සිටින බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා එම රාජ්‍ය නොවන සංවිධානය විසින් ගෙවිය යුතු බදු මුදල ප්‍රේෂනය කරනු ලැබිය හැකි ය.

ඇතැම් ගනුදෙනු හා බැහැර කිරීම් සැලකිල්ලට නොගත යුතු බව.

**103**. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු මුදල අඩුකරවන හෝ අඩු කිරීමේ ප්‍රතිඵලය ඇති යම් ගනුදෙනුවක් කෘත්‍රිම බව හෝ ව්‍යාජ බව හෝ යම් බැහැර කිරීමක් ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කරනු නොලැබූ බව තක්සේරුකරුවකුගේ මතය වන අවස්ථාවක ඔහු විසින්, එම ගනුදෙනුව හෝ බැහැර කිරීම සැලකිල්ලට නොගෙන සිටිය හැකි අතර, ඒ ගනුදෙනුවේ හෝ බැහැර කිරීමේ පාර්ශවකරුවන් ඒ අනුව තක්සේරු කරනු ලැබිය හැකි විය යුතු ය.

මේ වගන්තියේ "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදානයක්, ප්‍රඥප්තියක්, එකඟවීමක් හෝ වැඩ පිළිවෙලක් ඇතුළත් වේ.

ආශ්‍රිත ව්‍යවසාය අතර සිදුවන ගණුදෙනුවලින් උපචිත වන ලාභ සහ ආදායම හෝ පාඩු අසම්බන්ධිත මිළ සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු බව.

**104**. (1) ආශ්‍රිත ව්‍යවසාය දෙකක් අතර සිදු කරන ලද යම් ගණුදෙනුවකදි උද්ගත වූ, උපයාගත් හෝ උපචිත වූ යම් ලාභයක් සහ ආදායම හෝ දැරීමට සිදු වූ යම් පාඩුවක් අසම්බන්ධිත මිළ සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලාභ සහ ආදායම හෝ යම් පාඩුවක් අසම්බන්ධිත මිළ සැළකිල්ලට ගෙන තීරණය කර නැති බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එම ලාභ සහ ආදායම හෝ එම පාඩුව ඇත්ත වශයෙන්ම අසම්බන්ධිත මිළ සැළකිල්ලට ගෙන තීරණය කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තාට ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි ය. එසේ ඔප්පු කිරීමට එම තැනැත්තා අපොහොසත් වන අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන්, අවස්ථාවෝචිත පරිදි ලාභය හා ආදායමේ හෝ පාඩුවේ ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් ඇස්තමේන්තු කර ඒ අනුව තක්සේරුවක් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් අසම්බන්ධිත මිළ, තත්කාර්ය සඳහා නියම කරනු ලබන ක්‍රම එකක් හෝ ඊට වැඩි ගණනක පදනම මත තීරණය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා–

(අ) යම් ව්‍යවසායක්, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ එවැනි ප්‍රමාණයකට, කෙළින්ම හෝ අන්‍යාකාරයකින් එක් මැදිහත්කරුවකු හෝ මැදිහත්කරුවන් වැඩි ප්‍රමාණයක් හරහා වෙනත් ව්‍යවසායක් පාලනය කිරීම සම්බන්ධයෙන් සහභාගි වන්නේ නම්, පළමුව සඳහන් කළ ව්‍යවසාය දෙවනුව සඳහන් කළ ව්‍යවසායේ ආශ්‍රිත ව්‍යවසායක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) "අසම්බන්ධිත මිළ" යන්නෙන් ආශ්‍රිත ව්‍යවසායයන් නොවන තැනැත්තන් අතර ඇති කරගනු ලබන ගනුදෙනු වල දී පාලනය කළ නොහැකි තත්වයක් යටතේ අදාළ කර ගනු ලබන මිළක් අදහස් වේ.

ඕ- ඛනිජ තෙල් සෙවීම සහ කැනීම

බනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ බනිජතෙල් කැනීමේ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ සහ ආදායම නිශ්චය කිරීම.

**105**. (1) 2003 අංක 26 දරන් ඛනිජතෙල් සම්පත් පනත යටතේ කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවකු වශයෙන් ගිවිසුමකට ඇතුළත්ව සිටින යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් මේ පනතේ 79 වන වගන්තියේ විධිවිධාන නොතකා මේ පනතේ කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිද එම කොන්ත්‍රාත්තුවේ හෝ උපකොන්ත්‍රාත්තුවේ කාලසීමාව තුල දී ශ්‍රී ලංකාව තුළ වාසිකව ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ කණින ලද ඛනිජතෙල් අපනයනය කිරීමෙන් සහ දේශීය වශයෙන් විකිණීමෙන් ලැබෙන පිරිවැටුම පිළිගත් වාණිජ පරිචයවල පදනම මත තීරණය කරනු ලැබිය යුතු අතර, එම පිරිවැටුම් 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත යටතේ ඇතුළත් වූ ඛනිජ තෙල් සම්පත් ගිවිසුමේ යම් නිශ්චිත විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ ඛනිජතෙල් කැණීමේ ව්‍යාපරයෙන් ලැබෙන ලාභ සහ ආදායම, වියදමේ එකම අයිතමයක් එක්වරකට වැඩි වාර ගණනක් අඩු නොකිරීමට යටත්ව මේ පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති වෙනත් වියදම්වලට අමතරව එම ලාභ සහ ආදායම පහත දැක්වෙන අඩු කිරීම් සිදු කිරීමෙන් පසු නිශ්චය කරනු ලැබිය හැකි ය :—

(අ) ඛනිජතෙල් මෙහෙයුම් පැවැත්වීම සඳහා උපකොන්ත්‍රාත් කරුවන්ගේ සේවය වෙනුවෙන් කරන ලද ගෙවීම් ;

(ආ) 25 වන වගන්තිය යටතේ ක්ෂයවීම සඳහා දීමනාවක් වෙනුවට හෝ අලුත් කිරීමේ වියදම වෙනුවට ඛනිජතෙල් සම්පත් ලබාගැනීම සඳහා භාවිත කරන ලද යම් පිරයත, යන්ත්‍රෝපකරන හෝ උපකරන අත්කර ගැනීමේ වියදමෙන් සියයට සියයක්. එම වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල් එම ව්‍යාපාරයෙන් ලැබුණු මුදල් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) පොළී වියදම් ;

(ඈ) යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ ලබාගත් ඛනිජ තෙල් සම්පත් මත ගෙවන ලද රාජ්‍යභාගය. එසේ වුව ද, මේ මුදල 32 වන වගන්තිය යටතේ කරන ලද අඩු කිරීමක් ලෙස මේ මුදල් ප්‍රමාණයට ඉඩ දෙනු නොලැබිය යුතු ය ;

(ඉ) ඉහත (ආ) ඡේදය යටතේ අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු නොලැබූ අවස්ථාවක, ප්‍රාග්ධන වියදම් ඇතුළු ඛනිජතෙල් වර්ධනය සහ නිෂ්පාදනය පිළිබඳ සියලු වියදම් ;

(ඊ) පළමුවන වාණිජ නිෂ්පාදන වර්ෂය තුළ දී පළමුවන වාණිජ නිෂ්පාදන වර්ෂය දක්වා සහ එම වර්ෂය ද ඇතුළුව යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ කැණීමේ බිම් කොටස් තුළ අසාර්ථක වූ තෙල් ළිං කැණීම් කටයුතුවල දී යම් කොන්ත්‍රාකරුවකුට දැරීමට සිදු වූ සියලු වියදම් ;

(උ) පළමුවන වාණිජ නිෂ්පාදනයෙන් පසුව, යම් තක්සේරු වර්ෂයක් තුළ දී යම් ඛනිජතෙල් සම්පත් ගිවිසුමක් යටතේ කැණීමේ බිම් කොටස් තුළ අසාර්ථක වූ තෙල් ළිං කැනීමේ කටයුතුවල දී යම් කොන්ත්‍රාත්කරුවකු විසින් දරන ලද වියදම්.

XII පරිච්ඡේදය

වාර්තා යනාදිය

වාර්තා හා තොරතුරු ආදිය සැපයිය යුතු බව.

**106**. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදායම් බදු ගෙවීමට යටත් සෑම තැනැත්තකු විසින් ම, ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන සැප්තැම්බර් මාසයේ තිස්වන දින හෝ ඊට පෙර තමාගේ ආදායම, පිළිබඳව ද තමාට දරුවකු සිටී නම් ඒ දරුවාගේ ආදායම පිළිබඳව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක හා එසේ නියමිත තොරතුරු ඇතුළත් වාර්තාවක් තක්සේරුකරුවකුට සැපයිය යුතු ය :

එසේ වුව ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකුගේ ආදායම හුදෙක් පහත සඳහන් එකකින් හෝ කීපයක එකතුවකින් සමන්විත වන අවස්ථාවක එවැනි පුද්ගලයකු සම්බන්ධයෙන් ඉහත කී විධිවිධාන අදාළ නොවිය යුතු ය:—

(අ) මේ පනතේ 4 වන වගන්තියේ සඳහන් බදු පැනවිය හැකි සේවා නියුක්ති ආදායම රුපියල් හාරලක්ෂ විසිදහසක් නොඉක්මවනු, ලබන්නා වූ සහ එම දළ ලාභ හා ආදායමෙන් සේවායෝජක විසින් XIV වන පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩුකර ඇත්තා වූ පුද්ගලයකුට ;

(ආ) බදු අයකර ගැනීමට යටත් ලාභාංශවලින් 65 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සියයට දහයේ අනුප්‍රමාණය අනුව ආදායම් බදු අඩු කරනු ලැබ ඇති විටෙක ;

(ඇ) බදු අයකර ගැනීමට යටත් පොලී ආදායමෙන් 133 වන වගන්තිය යටතේ සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩුකර ගෙන තිබෙන විටක.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් සමාගමක් ඇතුළුව යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරමින් සිටින හෝ පවත්වාගෙන යන යම් තැනැත්තෙක්, අවස්ථාවෝචිත පරිදි එම සමාගම ලියාපදිංචි කිරීමෙන් හෝ සංස්ථාගත කිරීමෙන් හෝ එම කටයුත්ත ආරම්භ කිරීමේ දින සිට, එක් වර්ෂයක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලියාපදංචි කිරීමේ අංකයක් ලබාගත යුතු අතර, මේ පනත යටතේ එම තැනැත්තාගෙන් කිසිම බදු මුදලක් අය නොකිරීම නොතකා, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි විස්තර හා ලේඛන ඇතුළත වාර්තාවක් එක් තක්සේරු වර්ෂයක් අවසන් වීමට පසුව එළඹෙන නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කල යුතු ය.

(3) (අ) නම, ලිපිනය, ලියාපදිංචි කිරීමේ අංකය සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ඇතුළත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් (2) උපවගන්තිය යටතේ ලියාපදංචි වූ සියළු තැනැත්තන් වෙත නිකුත් කරනු ලැබිය යුතු ය ;

(ආ) 1982 අංක 17 දරන සමාගම් පනතේ අන්තර්ගත යම් විධිවිධානයක පටහැනිව, කුමක් සඳහන් වුව ද -

(i) කොමසාරිස් ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා පළ කරන ලද දැන්වීමක් මගින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනයකට පෙර ලියාපදිංචි කරන ලද යම් සමාගමකට අදාළව, යම් මූල්‍ය වර්ෂයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කල යුතු යම් වාර්ෂික වාර්තාවක් සමග ;

(ii) (1) වන අනුඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන දිනයක දී හෝ එදිනට පසුව ලියාපදිංචි කරන

ලද යම් සමාගමකට අදාළව එම සමාගම විසින් ඉදිරිපත් කිරීමට නියමිත පළමුවන වාර්ෂික වාර්තාව සමග,

සමාගම් පනත යටතේ ගොනු කරන ලද වාර්ෂික වාර්තාවේ වැදගත් කොටසක් වශයෙන්, (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා ගැනීම, සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යයක් වන්නේ ය.

(ඇ) (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරන ලද දිනය, එසේ තීරණය කිරීමෙන් පසු, වහාම කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) (අ) මේ පනතේ 79 වන වගන්තිය යටත් ශ්‍රී ලංකාව තුල වාසික ලෙස සලකනු ලබන සෑම සමාගමක් විසින් ම එක් එක් වර්ෂය සඳහා, ඔක්තෝබර් මස 31 වන දින හෝ එදිනට පෙර සහ අප්‍රේල් මස 30 වන දින හෝ එදිනට පෙර අර්ධ වාර්ෂික පදනමක් මත, පිළිවෙලින් අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා සහ ඔක්තෝබර් සිට මාර්තු දක්වා වන කාලසීමාව ඇතුළත ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශ පිළිබඳ විස්තර ඇතුළත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන විස්තර ඇතුළත් කරමින් ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශ පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි යම් කාලයක් තුළ දී කිසිම ලාභාංශයක් ප්‍රකාශයට පත් කර නැති අවස්ථාවක "කිසිවක් නැත" යන වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකා තුළ වාසික ලෙස සලකනු නොලබන සෑම සමාගමක විසින්ම එක් එක් වර්ෂයේ පිළිවෙලින් අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා සහ ඔක්තෝබර් සිට මාර්තු දක්වා වූ කාලය තුළ දී ප්‍රේෂණය කරන ලද මුදල පිළිබඳව විස්තර ඇතුළුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි විස්තර ඇතුළත් කරමින් 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සමාගමක් විසින් ප්‍රේෂණය කරන ලද මුදල් පිළිබඳ වාර්තාවක් ඔක්තෝබර් මස 31 වන දින සිට අප්‍රේල් මස 30 වන දින හෝ එදිනට පෙර අර්ධ වාර්ෂික

පදනමක් මත, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. කිසිදු මුදලක් එකී කාල පරිච්ඡේදය තුල ප්‍රේෂණය නොකරන ලද අවස්ථාවක "කිසිවක් නැත" යනුවෙන් සඳහන් කරන ලද වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) (අ) යම් තක්සේරු වර්ෂයක් ඇතුළත මේ උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් පහෙන් යම් නියමයන් හතරක් සපුරාලන යම් තැනැත්තකු විසින් එකී නියමයන් සපුරාලීමේ දින සිට එක් මාසයකට නොවැඩි කාලයක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) මේ වගන්තියේ (අ) ඡේදයේ කාර්යය සඳහා එම නියමයන් පහත දැක්වෙන පරිදි වේ :—

(i) රුපියල් දස දහසකට වැඩි ශුද්ධ මුදල් ප්‍රමාණයක් මාසික නේවාසික විදුලි බිල්පතක් වශයෙන් ගෙවීම ;

(ii) රුපියල් විසිපන්දහසකට වැඩි මාසික ක්‍රෙඩිට් කාඩ් බිල්පතක් උපචිත කරගනු ලැබීම ;

(iii) රුපියල් දස දහසකට වැඩි ශුද්ධ මුදලක් මාසිකව නිවාස දුරකථන බිල්පතක් වශයෙන් ගෙවීම ;

(iv) පිටරට යාම සඳහා ගුවන් ටිකට් පතක් මිල දී ගැනීම ; සහ

(v) ගමනාගමනය කටයුතු සඳහා භාවිතා කරනු ලබන මෝටර් වාහනයක අයිතිකරුව සිටීම.

(6) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ ආදායම් බදු ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු ම—

(අ) යම් තක්සේරු වර්ෂයක අවසාන දිනයේ දී, සෑම වත්කම් හා බැරකම්වලම වටිනාකම ; සහ

(ආ) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබූ යම් ලාභ හෝ ආදායම පිළිබඳව,

ප්‍රකාශයක් කල යුතු ය.

(7) නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි ආකෘතියක හා එසේ නියම කරනු ලැබිය හැකි තොරතුරු ඇතුළත් තමාගේ ආදායම් පිළිබඳව සහ ඔහුට දරුවකු සිටී නම්, ඒ දරුවාගේ ආදායම පිළිබඳව ද වාර්තාවක් සපයන ලෙස, නියම කරමින් කවර වූ හෝ පුද්ගලයකුට දැනුම් දිය හැකි ය.

(8) ඉහතින් වූ උපවගන්තිවල කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කොට දක්වනු ලබන ආකෘතිය අනුව නොවන්නා වූ සහ ඉදිරිපත් කල යුතු ලෙස එසේ දක්වනු ලබන තොරතුරු ඇතුළත් නොවන්නා වූ ආදායම පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකුම, මේ පනතේ කාර්යය සඳහා තම ආදායම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් නොකල තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් දින හෝ ඉන් පෙර ආදායම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නා වූ සහ එයින් (8) උපවගන්තියේ විධිවිධාන යටතේ ආදායම පිළිබඳ වාර්තාවක් සපයනු නොලැබූ ලෙස සලකනු ලබන්නා වූ අවස්ථාවක ඔහු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත ආකෘතිය අනුව නොවන බවට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත යම් විස්තර ඇතුළත් නොවන බවට එම තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ අවසානයේ සිට දින තිහක් ඇතුළත් තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(10) යම් තැනැත්තකුට (9) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට, ඒ තැනැත්තා විසින්, ඒ දැන්වීම ලැබී දවස් තිහක් ඇතුළත, අදාළ වාර්තාව නිසි වාර්තාවක් කිරීමට අවශ්‍ය විස්තර සපයනු ලැබුව හොත් ඒ වාර්තාව සම්බන්ධයෙන් ඉන් පසුව (8) වන උපවගන්තියේ විධිවිධාන අදාල නොවිය යුතු ය.

(11) යම් තැනැත්තකු විසින් යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන්නා වූ හෝ ක්‍රියාත්මක කරන්නා වූ ද ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබෙන ලාභ සහ ආදායම් බද්දෙන් නිදහස් වූ හෝ විවිධ අනුප්‍රමාණ අනුව බදු ගෙවීමට යටත් වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් එක් එක් ක්‍රියාකාරකමෙන් ලබන ලාභ සහ ආදායම වෙන වෙනම පිළිබිඹුවන පරිදි ගිණුම් පවත්වාගෙන ගොස් ගිණුම් වාර්තා සකස් කළ යුතු ය.

(12) අවශ්‍ය යැයි තක්සේරුකරුවකු අදහස් කරන අවස්ථාවක හෝ එසේ අදහස් කරන සෑම විටකම, දැන්වීමේ නියමිත කාලය ඇතුළත -

(අ) වඩා සම්පූර්ණ හෝ වැඩිදුර වාර්තා ; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බදු, තක්සේරු කිරීම සඳහා තක්සේරුකරුගේ මතය අනුව අවශ්‍ය හෝ අදාළ විය හැකි යම් කරුණකට අදාළ වඩා සම්පූර්ණ සහ වැඩිදුර තොරතුරු,

තමා වෙත සපයන ලෙස නියම කරන ලිඛිත දැන්වීමක්, තක්සේරුකරු විසින් යම් තැනැත්තකුට දිය හැකි ය.

(13) යම් තැනැත්තකුගේ ආදායම, පිළිබඳව සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ තැනැත්තාට -

(අ) දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් වූ ද ඔහුගේ සන්තකයෙහි ඇත්තා වූ ද යම් ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, බඩු තොග ලැයිස්තු, ලේඛන, චෙක්පත්, බැර පත්, විගණන වාර්තා හෝ වෙනත් යම් ලියකියවිලි පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස හෝ තක්සේරුකරු වෙත ප්‍රේෂණය කරන ලෙස නියම කරන ;

(ආ) ඔහුගේ ආදායම, පිළිබඳ විමසනු ලැබීමේ කාර්යය සඳහා දැන්වීමෙහි නියමිත ස්ථානයක දී නියමිත වේලාවේ දී හා දිනයක දී පෞද්ගලිකව ම හෝ ඔහු විසින් බලය දෙන ලද නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ පෙනී සිටින ලෙස නියම කරන,

ලිඛිත දැන්වීමක් තක්සේරුකරු විසින් කල හැකිය.

(14) මේ පනතේ කාර්යය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් යම් තැනැත්තකුට -

(අ) දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි යම් කරුණක් සම්බන්ධයෙන් විමසනු ලැබීම සඳහා දැන්වීමෙහි සඳහන් වේලාවේ දී එහි සඳහන් දිනයේ දී හා ස්ථානයේ දී පෞද්ගලික ම හෝ ඔහු විසින් බලය දෙන ලද නියෝජිතයකු මගින් හෝ පෙනී සිටින ලෙස නියම කරන ;

(ආ) දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් වූ ද ඔහුගේ සන්තකයෙහි ඇත්තා වූ ද යම් ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, බඩු තොග ලැයිසතු, ලේඛන, චෙක්පත්, බැරපත්, විගණක වාර්තා හෝ වෙනත් යම් ලේඛන එකී නියෝජ්‍ය කොමසාරිස්වරයාට ඉදිරිපත් කරන ලෙස හෝ ප්‍රේෂණය කරන ලෙස නියම කරන ;

(ඇ) දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කාලය ඇතුළත, ඒ තැනැත්තා සහ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පංතියක් අතර ඇති යම් ගනුදෙනුවලට අදාළව ඒ දැන්වීම මගින් ඉල්ලනු ලබන යම් තොරතුරක් සැපයීමට නියම කරන,

ලිඛිත දැන්වීමක් කල හැකි ය.

යම් තොරතුරක් සැපයීමට යම් තැනැත්තකුට නියම කරමින් මේ උපවගන්තිය යටතේ ඒ තැනැත්තාට දැන්වීමක් දෙනු ලැබ ඇති අවස්ථාවක, ඒ තොරතුරු සැපයීම තහනම් කරමින් වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ තැනැත්තා විසින් ඒ දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියෙහි යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම්වල බැංකුකරුවකු සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ඇතුළත් වන බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(15) (14) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ දැන්වීමක් අනුව පෙනී සිටින යම් තැනැත්තකුට, එසේ පෙනී සිටීමෙහි ලා දරන්නට සිදු වූ යුක්ති සහගත වියදම්වලට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලැබිය හැකි ය.

(16) (14) වන උපවගන්තිය යටත් නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබූ හෝ ඔහු වෙත ප්‍රේෂණය කරනු ලැබූ හෝ (13) වන උපවගන්තිය යටතේ තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබූ නැතහොත් ප්‍රේෂණය කරනු ලැබූ එසේ නැතහොත් වෙනත් මාර්ගයකින් ඔහුගේ සන්තකයට පත්වන නැතහොත් පත්වී ඇති යම් ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ලේඛන, ගිණුම්, වෙළඳ ලැයිස්තු, චෙක්පත්, බැරපත්, විගණන වාර්තා හෝ වෙනත් ලේඛන, මේ පනතේ කාර්යය සඳහා රඳවා ගැනීමට අවශ්‍ය තාක්කල් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ අනුමතිය ඇතිව තක්සේරුකරුවකු විසින් හෝ තමාගේ භාරයෙහි රඳවා ගත හැකි ය :

ඒසේ වුව ද, තක්සේරුකරුවකු විසින් එසේ රඳවා තබා ගැනීම, අදාළ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ පහක් ඉකුත් වූ පසුව වලංගු නොවිය යුතු ය.

(17) යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකු වෙනුවෙන් හෝ මේ පනත යටතේ සපයනු ලැබූ ලෙස සැලකෙන යම් වාර්තාවක් ප්‍රකාශයක් හෝ සහතිකයක්, පටහැනි තත්ත්වය ඔප්පු කරන ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ බලය පිට හෝ සපයනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර එවැනි යම් වාර්තාවක්, ප්‍රකාශයක් හෝ සහතිකයක් අත්සන් කරන යම් තැනැත්තකු ඒ වාර්තාවේ, ප්‍රකාශයේ හෝ සහතිකයේ කරුණු දන්නා ලෙස සලකනු ලැබිය යුතු ය.

(18) මේ වගන්තියේ කාර්යය සඳහා “ලේඛන” යන යෙදුමට යම් පරිගණක වැඩ සටහනක් හෝ දත්ත, සංකේතාකාරයෙන් හෝ විද්‍යුත්, කාන්දම් හෝ වෙනත් මාධ්‍යයකින් ගබඩා කර ඇති හෝ සටහන් කර ඇති යම් ඩිස්කටයක්, පටියක්, සුසංහිත ඩිස්කටයක් හෝ එවැනි වෙනත් යම් දෙයක් ඇතුළත් වේ.

හවුල්කරුවන් ආදීන් විසින් විගණන වාර්තා සැපයිය යුතු බව.

**107**. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා ගිණුම් ප්‍රකාශයක් සහ ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායම් ආගණනය කරනු ලබන්නේ යම් කාලයක් සම්බන්ධයෙන් ද ඒ කාලය සඳහා යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පිළිබඳව, දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන විස්තර අඩංගු උපලේඛන යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි සියලු විස්තර ඒ දැන්වීමේ නිශ්චිත ව සඳහන්

කාල සීමාව ඇතුළත සැපයීමට නියම කරමින් හවුල් ව්‍යාපාරයක හවුල්කරුට හෝ ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ තක්සේරුකරුවකු විසින් ලිඛිත දැන්වීමක් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද -

(අ) ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ දැන්වීමක් සමාගම වෙත දෙනු නොලැබුව ද ඒ සමාගම විසින් සෑම වර්ෂයක් සඳහා නැතහොත් ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලබන්නේ වෙනත් යම් කාල සීමාවක් සඳහා ද ඒ කාලසීමාව සඳහා ගැසට් පත්‍රයේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ප්‍රකාශ සහ යම් උපලේඛන ඉදිරිපත් කල යුතු ය.

මේ අනුඡේදයේ විධිවිධාන නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු වාර්ෂික පිරිවැටුමක් සහිත හෝ වර්ෂයකට රුපියල් මිලියන එක් සියයකට නොඅඩු ශුද්ධ ලාභයක් සහිත වෙනත් යම් සමාගමක් හැර අන් කිසි සමාගමකට අදාළ නොවිය යුතු ය ;

(ආ) එම වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තීය හෝ රක්ෂාව යම් හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් නොවන යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ අවස්ථාවක දී සහ ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන පනහකට නොඅඩු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට රුපියල් මිලියන විසිපහකට නොඅඩු බෙදා දිය හැකි ශුද්ධ ලාභයක් හෝ වෙනත් යම් තැනැත්තකු වන විට රුපියල් මිලියන විසිපහකට නොඅඩු ශුද්ධ ලාභයක් හෝ වූ විටක දී, ඒ හවුල්කරු හෝ තැනැත්තා විසින් මේ වගන්තිය යටතේ දැන්වීමක් දී නොතිබුණ ද, අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ කාලසීමාව සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ ප්‍රකාශ හෝ උපලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(2) මේ පනතේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් සපයනු ලබන ආදායම් පිළිබඳ වාර්තාවක් සනාථ කිරීමෙහිලා වූ ගිණුම් ප්‍රකාශය, අනුමත ගණකාධිකාරීවරයකු විසින් සකස් කොට ඇති අවස්ථාවක, ඒ ප්‍රකාශය සමග -

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකාරයකින් සහ විස්තර ඇතුළත් කරමින්, අනුමත ගණකාධිකාරීවරයකුගේ සහතිකයක් ;

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ගිණුම් ප්‍රකාශයකට අදාළ යම් විස්තර ඇතුළත් උපලේඛන,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත් යම් තක්සේරු වර්ෂයක් සඳහා නැතහොත් ව්‍යවස්ථාපිත ආදායම් ආගනණය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද, ඒ කාලසීමාව සඳහා වූ ආදායම් වාර්තාවක් සනාථ කිරීමෙහිලා-

(අ) යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ඒ සමාගම විසින් සපයනු ලැබූ ; හෝ

(ආ) යම් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු විසින් හෝ සමාගමක් නොවන යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පිරිවැටුම රුපියල් පනස් ලක්ෂයක ඉක්මවන්නා වූ අවස්ථාවක ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ කාලසීමාව සඳහා ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු හෝ සමාගමක් නොවන්නා වූ තැනැත්තකු විසින් හෝ සපයනු ලැබූ ගිණුම් ප්‍රකාශයක් අනුමත ගණකාධිකාරීවරයකු විසින් ක්‍රියාත්මක කරන ලද විගණනයක පදනම මත පිළියෙල කරනු ලැබිය යුතු ය.

රුපියල් මිලියන දෙසිය පණහකට නොඅඩු වාර්ෂික පිරිවැටුමක් හෝ අවස්ථාවෝචිත පරිදි වර්ෂයකට රුපියල් මිලියන එක්සියයකට නොඅඩු ශුද්ධ ලාභයක් හෝ බෙදා දිය හැකි ලාභයක් සහිත, නිල ලැයිස්තුගත පොදු සමාගමකට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට හෝ පමණක් මේ උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා -

(අ) "අනුමත ගණකාධිකාරිවරයා" යන්නෙන් -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ගණකාධිකාරිවරයෙක්;

(ii) "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථකථනයේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරිවරයෙක් ;

(iii) සමාගම් (විගණකවරයන්) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබ "බලය ලත් නියෝජිතයා" යන්නෙහි අර්ථ කථනයේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් පුද්ගලයෙක්; හෝ

(iv) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි වී තිබෙන සහ අදාළ වර්ෂයේ පිරිවැටුම රුපියල් මිලියන පණහක් නොඉක්මවන එවැනි යම් සමුපකාර සමිතිවල විගණනය කිරීම සඳහා බලය දෙනු ලැබ තිබෙන විගණකවරයකු

අදහස් වේ.

(ආ) "ශුද්ධ ලාභය" යන්නෙන්, යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, පිළිගත් වානිජ පරිචයන් සහ ගණක ප්‍රමිතිවලට අනුකූලව නිශ්චය කරනු ලැබූ ශුද්ධ ලාභය අදහස් වේ ;

(ඇ) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සහ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වන විට "පිරිවැටුම" යන්නෙන් (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණ හෝ ලැබිය යුතු මුදලක් හැර) ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යෑමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී ඒ කාලසීමාව තුළ ඇතුළත් ව ගනුදෙනු වලින් ඉටුකරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණ හෝ ලැබිය යුතු මුළු මුදල් ප්‍රමාණය අදහස් වේ.

වාර්තාවල හා වෙනත් ලේඛනවල ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය ඇතුළත් විය යුතු බව.

**108.** (1) මේ පනතේ කාර්යය සඳහා යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදායම් බදු ගෙවීමට යටත් සෑම පුද්ගලයකු විසින්ම–

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම පිළිබඳ වාර්තාවෙහි,

(i) ඔහු 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් තැනැත්තකු නම්, ඔහුගේ හැඳුනුම්පත් අංකය ; හෝ

(ii) ඔහු ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් නොවන්නේ නම්, ඔහුගේ පවත්නා විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය,

දැක්විය යුතුය.

(ආ) මේ පනතේ විධිවිධාන සාධාරණීය ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිත ව සඳහන් කරනු ලබන යම් ගනුදෙනුවකට අදාළ ලේඛනවල-

(i) ඔහු ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් වන්නේ නම්, ඔහුගේ හැඳුනුම්පත් අංකය ; හෝ

(ii) ඔහු ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් නොවන්නේ නම් ඔහුගේ පවත්නා විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය,

දැක්විය යුතුය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත් යටතේ ආදායම් බදු ගෙවීමට යටත් සෑම සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, මේ පනතේ කාර්ය සඳහා–

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඒ සමාගමේ හෝ හවුල් ව්‍යාපාරයේ හෝ පුද්ගල මණ්ඩලයේ ආදායම පිළිබඳ වාර්තාවෙහි; සහ

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අමාත්‍ය වරයා විසින් නිශ්චිත ව සඳහන් කරනු ලබන ඒ සියලු ගණුදෙනුවලට අදාළ සියලු ලේඛනවල,

අවස්ථාවෝචිත පරිදි 1987 අංක 7 දරන ව්‍යපාර නාම ආඥා පනත යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ඒ සමාගමේ හෝ හවුල් ව්‍යාපාරයේ හෝ පුද්ගල මණ්ඩලයේ ලියාපදිංචි කිරීමේ අංකය දැක්විය යුතුය.

වෙනත් තැනැත්තන්ගේ ගණනට ලබාගත් හෝ වෙනත් තැනැත්තන්ට ගෙවනු ලැබූ ආදායම් පිළිබඳව වාර්තා සැපයිය යුතු බව.

**109**. කිනම් තත්ත්වයකින් වුවද යම් තැනැත්තකු –

(අ) වෙනත් යම් තැනැත්තකුට උපචිත වූ හෝ උද්ගත වූද මේ පනතේ අර්ථානුකූලව බද්දට යටත් වූ ද යම් ලාභ හෝ ආදායමක් ලැබූ අවස්ථාවක ;හෝ

(ආ) එබඳු ලාභ හෝ ආදායම් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ අණට ගෙවූ අවස්ථාවක,

දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත පහත දැක්වෙන කරුණු එනම් :—

(i) එබඳු සියලුම ලාභ හා ආදායම් පිළිබඳව සත්‍ය වූත් නිවැරදි වූත් ප්‍රකාශයක් ;හා

(ii) ඒ ලාභ හා ආදායම් උපචිත වූයේ හෝ උද්ගත වූයේ යම් තැනැත්තකුට ද ඒ සෑම තැනැත්තකුගේම නම සහ ලිපිනය,

ඇතුළත් වාර්තාවක් සපයන ලෙස නියම කරන දැන්වීමක් තක්සේරු කරුවකු විසින් පළමු කී තැනැත්තාට දිය හැකිය.

**110**. දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් සපයන ලෙස නියම කෙරෙන ලිඛිත දැන්වීමක්, යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක පදිංචිකරුවකු වන යම් තැනැත්තකුට තක්සේරුකරුවකු විසින් දිය හැකිය :— ගෙවිය යුතු කුලී පිළිබඳ වාර්තා පදිංචිකරුවකු විසින් සැපයිය යුතු බව.

(අ) ඒ ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරුගේ නම හා ලිපිනය;

(ආ) ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් කරනු ලැබූ යම් වැඩි දියුණු කිරීම් ; හා

(ඇ) ගෙවිය යුතු කුලිය හා ඒ කුලියට සම්බන්ධ අතමාරු වූ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවක් පිළිබඳ සත්‍ය වූත්, නිවැරදි වූත් ප්‍රකාශයක්.

**111**. දැන්වීමේ දිනයේදී තම නිවාසයෙහි, හෝටලයෙහි හෝ ආයතනයෙහි පදිංචිව සිටින්නා වූද, තාවකාලික බැහැර යෑම් අත්හැර ඒ දිනයට පෙරාතුව තුන් මාසය මුළුල්ලේම එසේ පදිංචිව සිටියා වූද සෑම නවාතැන්කරුවකුගේ හෝ නේවාසිකයකුගේ නම ඇතුළත් වාර්තාවක්, දැන්වීමෙහි නියම කාලසීමාව ඇතුළත සැපයිය යුතු යැයි නියම කරන ලිඛිත දැන්වීමක් තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකුට දිය හැකිය. නවාතැන්කරුවන් හා නේවාසිකයන් පිළිබඳ වාර්තා.

**112**. (1) (අ) තමාගේ ආදායම පිළිබඳව ද, තමාට දරුවකු සිටී නම් ඒ දරුවාගේ ආදායම පිළිබඳව ද, දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත වාර්තාවක් සපයන ලෙස නියම කරමින් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් 106 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ ලිඛිත දැන්වීමක් අනුව කටයුතු කිරීමට යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක ; වාර්තා සැපයීම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයක් නියම කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට ඇති බලය.

(ආ) 106 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සැපයීමට නියමිත වාර්තාවක් ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත සැපයීමට යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක ; හෝ

(ඇ) 120 වන වගන්තියේ යම් නියමයන් අනුව කටයුතු කිරීමට යම් සේවායෝජකයකු පැහැර හරින අවස්ථාවක ;

(ඈ) 106 වන වගන්තියේ (5) වන උපවගන්තියේ සඳහන් කාලය ඇතුළත, එම වගන්තිය යටතේ එම තැනැත්තා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක ;

කොමසාරිස් ජනරාල්වරයා විසින් –

(i) ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක විෂයෙහි රුපියල් පනස් දහසක් නොඉක්මවන දණ්ඩනයක් නියම කළ හැකි අතර, ඒ දණ්ඩනය නියම කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය හැකි ය ; තව ද

(ii) ඒ තැනැත්තා හෝ සේවායෝජකයා වෙත කරනු ලබන ලිඛිත දැන්වීමක් මගින් –

(අ) එම දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළදී ඒ දණ්ඩනය ගෙවීමට ; සහ

(ආ) ඒ වාර්තාව සපයා නොමැති අවස්ථාවක හෝ ඒ නියමය අනුව කටයුතු කර නොමැති අවස්ථාවක එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ දී ඒ වාර්තාව සැපයීමට හෝ ඒ නියමය අනුව කටයුතු කිරීමට,

නියම කළ හැකිය.

(2) අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ වාර්තාව සැපයීම හෝ නියමය අනුව කටයුතු කිරීම පැහැර හැරීම තම පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට සහ අවස්ථාවෝචිත පරිදි, ඔහු විසින් ඒ වාර්තාව සපයා ඇති බවට හෝ ඒ නියමය අනුව කටයුතු කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක විෂයෙහි නියම කරන ලද දණ්ඩනය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කරනු ලැබිය හැකිය ; නැතහොත් අත්හරිනු ලැබිය හැකිය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු හෝ යම් සේවායෝජකයකු විෂයෙහි දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක 202 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ හෝ දැන්වීමට හෝ නියමයට අදාළව 202 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ නඩු පැවරීමට ඒ තැනැත්තා හෝ ඒ සේවායෝජක යටත් නොවිය යුතු ය.

## XIII වන පරිච්ඡේදය

### ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම

**113**. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ගෙවීමට යටත් යම් ආදායම් බද්දක් තක්සේරුකරුවකු විසින් තමා හෝ යම් හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කිසිම තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද පිළිවෙලින් ඒ තක්සේරු වර්ෂයේ අගෝස්තු, නොවැම්බර් සහ පෙබරවාරි මාසවල පහළොස් වන දින හෝ ඊට පෙර ද ඊළඟට එළඹෙන වර්ෂයේ මැයි මස පහළොස් වන දින හෝ ඊට පෙර ද වාර කොටස් හතරකින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවනු ලැබිය යුතුය. ඒ එක් එක් වාර කොටස මෙහි මින් මතු "ත්‍රෛමාසික වාරිකයක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු බද්දක ත්‍රෛමාසික වාරිකය, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු හෝ එම හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු බදු මුදලෙන් හතරෙන් එකක් විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සහ (2) වන උපවගන්තියේ කුමක් සඳහන්ව ඇත් ද-

(අ) ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් විසින් 61 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ ;

(ආ) ශ්‍රී ලංකාවේ වාසික නොවන සමාගමක් විසින් 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ප්‍රේෂණය කරන ලද මුදල් සම්බන්ධයෙන්,

ඒ සමාගම විසින් ගෙවිය යුතු සම්පූර්ණ බද්ද, අවස්ථාවෝචිත පරිදි, එම ලාභාංශ බෙදීමේ හෝ එම මුදල් ප්‍රේෂණය කිරීමේ දිනයට පසුව එළඹෙන තිස්වන දින හෝ එදිනට පෙර විය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්දේ යම් ත්‍රෛමාසික වාර මුදල් ප්‍රමාණයන් (1) වන උපවගන්තිය යටතේ එම ත්‍රෛමාසික වාර මුදල ගෙවීමට නියමිත දිනය හෝ එදිනට දින තිහකට නොඅඩු කාලයකට පෙර එම තැනැත්තා විසින් ගෙවනු ලබන්නේ නම්, එම ත්‍රෛමාසික වාර මුදල සියයට දහයකින් අඩු කරනු ලැබිය යුතු ය. එසේ අඩුකරන ලද ත්‍රෛමාසික වාරික මුදල එම තැනැත්තා විසින් ගෙවනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් කිසිම අඩුකිරීමකින් තොරව එම ත්‍රෛමාසික වාරිකය ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

XIV වන පරිච්ඡේදය

## සේවා යෝජකයන් විසින් සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩුකිරීම

සේවායෝජකයන් විසින් ආදායම් බද්ද අඩු කල යුතු බව.

**114**. (1) එක් එක් වැටුප් කාලසීමාව සඳහා පාරිශ්‍රමික ගෙවන අවස්ථාවේදී සෑම සේවායෝජකයකු විසින් තම සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමිකවලින් ආදායම් බද්ද මේ පරිච්ඡේදයෙහි විධිවිධානවලට අනුකූලව අඩු කරනු ලැබිය යුතු ය.

(2) සේවා නියුත්තයකුගේ පාරිශ්‍රමිකයෙන් (1) වන උපවගන්තිය යටතේ අඩු කර මේ පරිච්ඡේදයේ විධිවිධාන සලසා තිබෙන පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරන ලද ආදායම් බද්ද ඒ සේවා නියුක්තයා විසින් ඒ අඩු කිරීම කරන ලද දින කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා සේවායෝජකයකුගෙන් මුදලින් හෝ වෙනත් යම් ආකාරයකින් පාරිශ්‍රමිකයන් ලබන යම් තැනැත්තෙක් ඒ සේවායෝජකයාගේ සේවා නියුක්තියකු ලෙස සලකනු ලැබේ.

සේවායෝජකයන් විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමක් කල යුතු බව.

**115**. (1) (අ) (i) මසකට රුපියල් විසිපන්දහසකට හෝ වර්ෂයකට රුපියල් තුන්ලක්ෂයකට වැඩියෙන් පාරිශ්‍රමිකයන් ලබන යම් තැනැත්තෙක් ;

(ii) එම සේවායෝජකයා විසින් යම් ගෙවීමක් කරන හෝ ඔහුගෙන් යම් ගෙවීමක් අය වීමට ඇති හෝ වෙනත් යම් තත්ත්වයකින් සේවා නියුක්තියකු ලෙස වෙනත් යම් ප්‍රතිලාභ දරන අධ්‍යක්ෂවරයෙක් හෝ විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන තැනැත්තෙක් ;

(iii) 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතට වැටෙන සහ කෙළින්ම රජය අරමුදලින් හෝ රජයේ අරමුදලින් ලැබෙන මුදල් වලින් නොගෙවනු ලබන යම් පාරිශ්‍රමිකයන් ලබන තැනැත්තෙක් ; හෝ

(ආ) යම් නිර්වාසික පුද්ගලයකු,

සේවයෙහි නියුක්ත කරන්නා වූ ද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107 ඇ(1) වන වගන්තිය යටතේ හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 99 වන වගන්තිය යටතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 107 වන වගන්තිය යටතේ හෝ මේ පනත

යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීමක් කර නොමැත්තා වූ ද සෑම සේවා යෝජකයකු විසින් ම (මේ පරිච්ඡේදයේ මින් මතු "නියමිත සේවා නියුක්තයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි යම් පුද්ගලයකු තම සේවයෙහි සිටින බව 2006 ජූලි මස 1 වන දින නොඉක්මවා කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීමක් කළ යුතු ය.

(2) සේවායෝජකයකු විසින් යම් නිශ්චිත සේවා නියුක්තයකුට සේවයෙහි නියුක්ත කරවීම හෝ යම් නිශ්චිත සේවා නියුක්තයකුට පාරිශ්‍රමික ගෙවීම ආරම්භ කරනු ලබන අවස්ථාවක, ඒ සේවායෝජකයා විසින්, ඒ සේවා නියුක්තයා තම සේවා නියුක්තියෙහි සිටින බව, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවා නියුක්තිය හෝ ඒ ගෙවීම ආරම්භ කිරීමෙන් දින හතක් ඇතුලත, කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන (1) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් කළ සේවායෝජකයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු විසින් කරන ලද යම් දැනුම් දීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියකට අනුව විය යුතු අතර, එසේම නියම කරනු ලබන විස්තර ද ඊට ඇතුළත් විය යුතු ය.

(4) (1) උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු විසින් කරන ලද යම් දැනුම් දීමක් කිරීම පැහැර හරිනු ලැබව ද එය නොතකා ඒ සේවායෝජකයා විසින් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තම නිශ්චිත සේවා නියුක්තයන් එක් එක්කෙනාගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කල යුතු ය.

ආදායම් බදු වක්‍ර අදාළ කිරීම.

**116**. (1) 114 වන වගන්තිය ප්‍රකාර යම් තක්සේරු වර්ෂයක් සඳහා සේවායෝජකයකු විසින් අඩු කළ යුතු ආදායම් බදු ප්‍රමාණය, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත ඒ තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු වක්‍රවලට අනුකූලව විය යුතු ය.

(2) සේවා නියුක්තියෙන් ලබන නිත්‍ය ලාභ සම්බන්ධයෙන් සෑම සේවා නියුක්තයකුගේම ගෙවීම් කාලසීමාවක් සඳහා වූ පාරිශ්‍රමිකවලින් සේවා නියුක්තියෙන් ලබන නිත්‍ය ලාභ සඳහා අදාළ වන බදු වක්‍රයට අනුකූලව, ඒ ගෙවීම් කාලසීමාව වෙනුවෙන් ආදායම් බද්ද අයකර ගනු ලැබිය යුතුය. තව ද ගෙවීම් කාලසීමාවක් සම්බන්ධයෙන් ඒ සියලු ලාභ එකතු කළ යුතු අතර, ආදායම් බදු වක්‍රය අදාළ කිරීමේ කාර්යය සඳහා ඒ ලාභ එක් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතුය.

යම් ගෙවීම් කාලසීමාවක් වෙනුවෙන් සේවා නියුක්තියෙන් ලබන නිත්‍ය ලාභවලට –

(අ) ඒ ගෙවීම් කාලසීමාව වෙනුවෙන් ගෙවිය යුතු වේතන, වැටුප් දීමත් හෝ විශ්‍රාම වැටුප් හෝ ඒ ගෙවීම් කාලසීමාව වෙනුවෙන් උපදින්නා වූ හෝ විධිමත් ලෙස උපචිත වන්නා වූ ද ගෙවිය යුතු වූ ද ඒ සේවා නියුක්තියෙන් ලබන වෙනයම් ලාභ ;

(ආ) 4 වන වගන්තියෙහි (ඇ) ඡේදයේ සඳහන් සේවා නියුක්තියෙන් ලබන යම් ලාභ හා ඒ ගෙවීම් කාලසීමාව වෙනුවෙන් උපදින හෝ උපචිත වන (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් අතිරේක ආදායම් හෝ අර්ථ ලාභ නොවන වෙනත් අතිරේක ආදායම් හෝ අර්ථ ලාභ නොවන වෙනත් අතිරේක ආදායම් හෝ අර්ථ ලාභ වශයෙන් සේවා නියුක්තියෙන් ලබන යම් ලාභ ; සහ

(ඇ) (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ 4 වන වගන්තියෙහි (ඇ) ඡේදයේ ඇතුළත් කරනු නොලැබූ සේවා නියුක්තියෙන් ලබන ලාභවල මුළු එකතුව ඒ ගෙවීම් කාලසීමව සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන අවස්ථාවක, ඒ ලාභ,

ඇතුළත් විය යුතු ය.

(3) 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් සේවා නියුක්තියෙන් ලබන ලාභවලට අදාළ ආදායම් බදු චක්‍රය අනුව ඒ ලාභ සම්බන්ධයෙන් ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රසාද මුදල්, කොමිස් මුදල් හෝ ඒ හා සමාන ස්වභාවයෙන් යුත් වෙනයම් අර්ථ ලාභ වශයෙන් සේවා නියුක්තයකු සේවා නියුක්තියෙන් ලබන යම් ලාභ සම්බන්ධයෙන් ඒ ලාභවලට අදාළ ආදායම් බදු චක්‍රය අනුව ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය.

(5) ආදායම් බදු චක්‍ර වෙනස් කරනු ලැබූ අවස්ථාවක, වෙනස් කරන ලද ඒ අදායම් බදු චක්‍ර ක්‍රියාත්මක වන දිනට පසුව එළඹෙන ගෙවීම් කාලසීමාවේ සිට ඒ වෙනස් කරනු ලැබූ ආදායම් බදු චක්‍ර අදාළ විය යුතු ය.

(6) සේවා නියුක්තියෙන් ලබන යම් ලාභ ගෙවනු නොලබන නමුදු සේවා නියුක්තයකුගේ ගිණුමට ඔහුගේ අර්ථලාභය සඳහා හෝ සේවා නියුක්තයකු වෙනුවෙන් වෙන යම් තැනැත්තකුගේ ගිණුමට හෝ ඔහුගේ අර්ථලාභය සඳහා බැර කරනු ලැබූ හෝ යොදනු ලැබූ හෝ යොදනු ලැබූ අවස්ථාවේ ඒ ලාභ එකී සේවා නියුක්තයාට ගෙවනු ලැබූ ලෙස සැලකිය යුතු ය;

(7) සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමික මාස්පතා නොගෙවනු ලබන අවස්ථාවක. එක් එක් ලිත් මාසයක් තුල කරනු ලැබූ ගෙවීම්වල එකතුව මාසික ගෙවීමක් ලෙස සැලකිය යුතු අතර, පාරිශ්‍රමික මාස්පතා ගෙවනු ලබන සේවා නියුක්තයකු ලෙස ඒ නියුක්තයා සලකනු ලැබිය යුතු ය. තවද, ඒ ගෙවීම්වලට උචිත ආදායම් බද්ද ඒ මාසය තුල කරන ලද ගෙවීම් වලට උචිත ආදායම් බද්ද ඒ මාසය තුළ කරන ලද ගෙවීම් එකකින් හෝ වැඩි ගණනකින් අඩු කරනු ලැබිය හැකි ය:

එසේ වුවද සේවායෝජකයකු හෝ සේවා නියුක්තියකු විසින් ඉල්ලුම් කරනු ලැබූ විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ අඩු කිරීම කළ යුතු වෙන යම් ක්‍රමයක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකිය.

(8) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, යම් සේව නියුක්තයකුට ගෙවනු ලබන යම් කොමිස් මුදලක් ඒ ගෙවීම් කරන දින සේවා නියුක්තියෙන් උපදින ලාභ ලෙස සලකනු ලැබිය යුතුය.

(9) යම් ගෙවීම් කාලසීමාවක් සඳහා අතික් නිතය පාරිශ්‍රමික ගෙවන අවස්ථාවේ දී ම ඒ ගෙවීම් කාලසීමාව තුළ කරන ලද අතිකාල වැඩ සඳහා ගෙවීම් කිරීම සඳහා සේවායෝජකයකු විසින් කරුණු ඉදිරිපත් කරමින් කළ ඉල්ලීමක් අනුව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වූ අවස්ථාවක ආදායම් බද්ද අඩු කිරීමේ ප්‍රමාණය නිශ්චය කිරීමේ කාර්ය සඳහා ඒ අතිකාල වැඩ සම්බන්ධයෙන් ඒ සේවා නියුක්තයාට කරනු ලැබූ ගෙවීම් ඊළඟට එළඹෙන ගෙවීම් කාලසීමාව තුළ ඒ සේවා නියුක්තයාගේ නිත්‍ය පාරිශ්‍රමික සමග එකතු කරනු ලැබිය යුතු ය.

(10) සේවායෝජකයකු විසින් සේවා නියුක්තයකු සේවයෙහි නියුක්ත කරවීම සම්බන්ධයෙන් ඒ සේවා නියුක්තයා, මිය යාමෙන් පසු ඒ සේවායෝජකයා විසින් යම් පාරිශ්‍රමිකයන් ගෙවනු ලැබුවහොත්, ඒ සේවායෝජක විසින් ඒ ගෙවීම කිරීමේ දී මියගිය සේවා නියුක්තයා තමා විසින් එතෙක් සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටියාක් මෙන්, ආදායම් බද්ද අඩු කළ යුතු ය.

**117**. (1) යම් සේවායෝජකයකු විසින් විධායක හෝ විධායක නොවන යම් අධ්‍යක්ෂවරයකුට හෝ යම් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයකුට යම් පාරිශ්‍රමිකයක් හෝ යම් ප්‍රතිලාභයක් ලබාදෙන හෝ සේවා නියුක්තයකු නොවන බවට සලකනු ලබන වෙනත් යම් තැනැත්තකුට මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රතිලාභයක් ලබා දෙන අවස්ථාවක සහ 116 වගන්තියේ සඳහන් බදු වක්‍ර අදාළ කර ගැනීමේ දී එම මුදල් සැලකිල්ලට ගනු නොලබන අවස්ථාවක එම සේවායෝජකයා විසින් මේ පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව එම මුදල් වලින් හෝ එම ප්‍රතිලාභවල වටිනාකමින් සියයට දහයක අනුප්‍රමාණයකට ආදායම් බදු අඩු කළ යුතු ය. එම මුදල් ප්‍රමාණවලට හෝ ප්‍රතිලාභවල වටිනාකමට අදාළ 118 වන වගන්තිය යටතේ කිසිදු විධානයක් නිකුත් කිරීම හෝ භාරගැනීම නොකළ යුතු ය.

විශේෂ අනුප්‍රමාණ අනුව බදු අඩු කිරීම.

(2) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය ප්‍රකාරව අඩු කරනු ලබන ආදායම් බද්දට අදාළව මේ පනත යටතේ මුදල් ආපසු ගෙවීමක් නොකළ යුතු නමුත්, එම මුදල් හෝ ප්‍රතිලාභවල වටිනාකම එම වර්ෂය සඳහා ඔහුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමට ඇතුලත් කොට ඇත්නම්, එම තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් එම තැනැත්තා ගෙවිය යුතු ආදායම් බද්දට එරෙහිව එම ආදායම් බද්ද හිලව් කරනු ලැබිය හැකිය.

(3) 116 වන වගන්තියේ සඳහන් කර ඇති බදු වක්‍ර ප්‍රයෝජනයට ගනිමින් ආදයම් බදු මත යම් පාරිශ්‍රමිකයන් අඩු කරන ලෙස නියම කරනු ලැබ ඇති යම් සේවායෝජකයකු විසින් එසේ අඩු කිරීම අත්හැර එම පරිශ්‍රමිකය මත සියයට දහයක අනුප්‍රමාණයට බදු අඩුකරන අවස්ථාවක116 වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි බදු වක්‍ර යටතේ ගෙවිය යුතු බද්ද සහ මේ වගන්තිය යටතේ සේවායෝජකයා විසින් අඩු කර ඇති බද්ද අතර ඇති වෙනසේ පදනම මත ගණන් බලනු ලැබිය යුතු ගෙවීම පැහැර හැර ඇති එම බදු මුදල ගෙවීමට එම සේවායෝජකයා යටත් විය යුතු අතර පහත දැන්වෙන පරිදි ගණන් බලනු ලබන ගෙවීම පැහැර හැර ඇති බදු මුදලින් සියයට දහයක් නොඉක්මවන දණ්ඩනයකට එම සේවායෝජකයා යටත් විය යුතු ය-

(අ) 106 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක් මත ගෙවිය යුතු බදු මුදල ගෙවිය යුතු දිනයේ දී හෝ එදිනට පෙර සම්පූර්ණයෙන් ම හෝ එම මුදලින් කොටසක් හෝ ගෙවා නොමැති අවස්ථාවක, එසේ ගෙවීම පැහැර හැර ඇති බදු මුදල මත පළමුවන මාසය සඳහා සියයට පහක අනුප්‍රමාණයට ද, ඉන් පසුව එක් එක් මාසය සඳහා හෝ මාසයක කොටසක් සඳහා සියයට එකක වැඩිපුර අනුප්‍රමාණයකටද ;

(ආ) එම තැනැත්තාගෙන් ලැබිය යුතු වාර්තාවක් නොලැබී තක්සේරුවක් නිකුත් කරනු ලැබ අදාළ බදු මුදල ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, එසේ ගෙවීම පැහැර හැර ඇති බදු මුදල මත සියයට දහයක අනුප්‍රමාණයට ;

(ඇ) යම් තක්සේරුවක් පිළිබඳව අභියාචනයක් ඉදිරිපත් කොට එම අභියාචනය සමථයකට පත්කිරීමේදී බදු මුදල් ගෙවිය යුතු වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු බදු මුදල මත සියයට දහයක අනුප්‍රමාණයට,

තවද, එම බදු මුදල් මේ පනත් යටතේ ගෙවීම පැහැර හැර ඇති බදු මුදල් වශයෙන් සලකා කොමසාරිස් ජනරාල්වරයා විසින් එම බදු මුදල සේවායෝජකයාගෙන් අය කරගනු ලැබිය හැකිය.

සේවා යෝජකයන්ට විධාන.

**118.** (1) තම සේවායෝජකයා විසින් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තම පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින්, යම් තක්සේරු වර්ෂයක් සඳහා තමා විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බදු ප්‍රමාණය මේ පරිච්ඡේදය යටතේ අඩු කළ හැකි ආදායම් බද්දට වඩා අඩු නම් හෝ තමාගේ පාරිශ්‍රමිකයෙන් අඩු කළ යුතුව තිබූ ප්‍රමාණයට වඩා ආදායම් බද්ද අඩු කරනු ලැබ ඇත්නම් ඒ තක්සේරු වර්ෂය සහා ආදායම් බද්ද අඩු කිරීමෙහිලා අවශ්‍ය අනුකූලනය කිරීම් කළ යුතු බවට ඔහුගේ ස්වායෝජකයාට විධානයක් නිකුත් කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියක වූ හා එසේ නියම කරනු ලබන විස්තර ඇතුලත් ඉල්ලීමක්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) සේවා නියුක්තයකු විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ කල්හි, (සේවා නියුක්තයාට පිටපතක් නිකුත් කරනු ලැබිය යුතු) ලියවිල්ලකින් වූ අවශ්‍ය විධානය ඒ සේවා නියුක්තයාගේ සේවායෝජකයා වෙත නිකුත් කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් කල හැකි අතර ඒ සේවායෝජකයා විසින් එකී විධානයට අනුකූලව එකී සේවා නියුක්තියාගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කළ යුතු ය :

එසේ වුව ද, නිකුත් කරන ලද එවැනි යම් විධානයක් කවර වූ හෝ අවස්ථාවක දී වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ යම් සේවා නියුක්තයකුගේ ආදායම් බද්ද අය කරගනු ලැබිය හැකි ද, ඒ සේවා නියුක්තයා සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඒ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් ඒ සේවා නියුක්තයාගේ සේවායෝජක වන තැනැත්තා වෙත ලියවිල්ලක් කරනු ලබන (පිටපතක් ඒ සේවා නියුක්තයා වෙත නිකුත් කළ යුතු) විධානයකින් මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද එම සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ විධානයට අනුකූලව අඩු කරන ලෙස නියම කරමින් විධානයක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එම විධානයට අනුකූලව ඒ තැනැත්තා විසින් ඒ සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ ආදායම් බද්ද අඩු කළ යුතු ය :

එසේ වුව ද, එවැනි යම් විධානයක් කවර වූ හෝ අවස්ථාවක දී වෙනස් කරනු ලැබිය හැකි ය.

මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා මේ වගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා "නිශ්චිත සේවා නියුක්තයකු" ලෙස සැලකිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා නිකුත් කරන ලද විධානයකින් අතෘප්තියට පත් යම් සේවා නියුක්තයකු විසින් ඒ විධානය නිකුත් කළ දිනට ඉක්බිතිව දින තිහක කාලයක් ඇතුළත අභියාචනයෙහි හේතු සැකෙවින් දක්වමින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනා කළ හැකි ය. එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය :

එසේ වුව ද, ඒ සේවා නියුක්තයා විසින් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් මත, ඒ තක්සේරු කිරීමට විරුද්ධව 165 වන වගන්තිය යටතේ ඒ සේවා නියුක්තයා විසින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් 163 වන වගන්තිය යටතේ ඒ සේවා නියුක්තයා සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා තක්සේරුවක් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

සේවා යෝජකයන් විසින් නිසි වාර්තා තබා ගත යුතු බව.

**119**. යම් නිශ්චිත සේවා නියුක්තයකුට යම් පාරිශ්‍රමිකයක් ගෙවන සෑම සේවායෝජකයකු විසින්ම–

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පඩිපතක සහ එසේ සඳහන් කරනු ලබන ආකාරයෙන්, ඒ පාරිශ්‍රමික ගෙවීම පිළිබඳ නිසි වාර්තාවක් තබාගත යුතු ය ;

(ආ) සියලුම සේවා නියුක්තයන්ගේ ප්‍රකාශවලින්, පඩිපත් වලින් සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික ගෙවීම සම්බන්ධයෙන් වූ ලදුපත් සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සම්බන්ධයෙන් සහ එම පාරිශ්‍රමිකවලින් අඩු කරන ලදුව කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලබන ආදායම් බද්ද සම්බන්ධයෙන් වූ වෙනත් සියලු ගිණුම් වාර්තාවලත් සුරක්ෂිතභාවය සඳහා සියලු සාධාරණ ආරක්ෂා මාර්ග ගනු ලැබිය යුතු අතර, ඒ වාර්තා අදාළ වන තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු අවුරුදු පහකට නොඅඩු කාලසීමාවක් ඒ සියලු වාර්තා තබාගත යුතු ය; තව ද

(ඇ) තමා විසින් පවත්වාගෙන යනු ලබන (අ) සහ (ආ) ඡේදවල සඳහන් යම් වාර්තාවක් පරීක්ෂා කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකුට අවසර දිය යුතු ය.

ආදායම් බද්ද අඩු කිරීමෙන් පසු සේවා යෝජකයන් සතු කාර්ය.

**120**. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ස්වකීය සේවා නියුක්තයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කිරීමට නියම කරනු ලැබ සිටින සෑම සේවායෝජකයකුම විසින් –

(අ) එවැනි යම් අඩුකිරීමක් කළ මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පහළොස්වන දින ඉකුත්වීමට පෙර ඒ අඩුකිරීම්වල මුදල කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු අතර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක සහ එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයෙන් වූ මාසික ප්‍රකාශනයක් ඒ අවස්ථාවේ දී ම කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය;

(ආ) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩුකර තිබේ ද ඒ එක් එක් සේවා නියුක්තයා වෙත ඉහතින් වූ තක්සේරු වර්ෂයේ එසේ කරන ලද අඩුකිරීම් සම්බන්ධයෙන් වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුලත් වූ ද සහතිකයක්, එක් එක් වර්ෂයේ අප්‍රේල් මස තිස්වන දින ඉකුත්වීමට පෙර දිය යුතු ය;

(ඇ) යම් සේවා නියුක්තියකුගේ සේවා නියුක්තිය අවසන් වීම සිදුවූ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙන් ආරම්භව ඒ සේවය අවසන් වන දිනයෙන් අවසාන වන කාලසීමාව සම්බන්ධයෙන් අඩු කරන ලද ආදායම් බදු මුදල නිශ්චිතව සඳහන් වන්නා වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක වූ ද සහතිකයක් ඒ සේවා නියුක්තයාගේ සේවය අවසන් වීමෙන් පසු දින තිහක් ඇතුළත ඒ සේවා නියුක්තයාට දිය යුතු ය;

(ඈ) එක් එක් වර්ෂයේ අප්‍රේල් මස තිස්වන දින ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක සහ එසේ නිශ්චය කරනු ලබන විස්තර ඇතුළත් ඉහතින් වූ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වූ වාර්ෂික ප්‍රකාශයක්, ඒ වාර්ෂික ප්‍රකාශය අදාළ වන තක්සේරු වර්ෂය තුළ දී මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බදු අඩු කරන ලද්දේ ද ඒ එක් එක් සේවා නියුක්තයා සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක වූ ආදායම් බදු අඩුකිරීම් පත්‍රයක් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය ; තව ද

(ඉ) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම සේවායෝජකයා විසින් යම් තක්සේරු වර්ෂයක දී අවසන් කලේ ද ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දින සිට එසේ අවසන් වූ දිනය තෙක් වූ කාලසීමාව, (ඇ) ඡේදයේ සඳහන් කර ඇති ඊට ඉහතින් ම වූ තක්සේරු වර්ෂය වූවාක් මෙන්, එසේ පවත්වා ගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම තමා අවසන් කරන ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව පිළිබඳ වූ එකී ඡේදයේ විධිවිධානවලට අනුකූලව එකී තක්සේරු වර්ෂයේ එසේ අවසන් කළ මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ අන්තිම දිනය ඉකුත්වීමට පෙර, ක්‍රියා කළ යුතු ය.

නොගෙවන ලද හෝ වැඩියෙන් ගෙවන ලද ආදායම් බදු මුදල් විධිමත් කිරීම.

**121**. (1) යම් සේවා නියුක්තයකුට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩු කළ යුතුව ඇති ආදායම් බදු මුදල හෝ එහි කොටස අඩු කිරීම සේවායෝජකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක, ඒ පැහැර හැරීම ගැන ඔහුට දැනගන්නට ලැබුණුවිට 120 වන වගන්තිය යටතේ නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු අතර අඩු නොකරන ලද ආදායම් බදු මුදල 127 වන වගන්තිය යටතේ අයවීමට ඇති මුදල සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(2) යම් ගෙවීම් කාලසීමාවක් සම්බන්ධයෙන් අඩු කරන ලද මුදලට වැඩියෙන් සේවායෝජකයකු විසින් යම් මුදලක් යම් තක්සේරු වර්ෂයක් තුළ දී කොමසාරිස් ජනරාල්වරයාට යවා ඇති අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂයෙහි පසුව එළඹෙන යම් ගෙවීම් කාලසීමාවක් සම්බන්ධයෙන් යවන මුදලින්, වැඩියෙන් ගෙවූ ඒ මුදල සේවායෝජකයා විසින් අඩු කළ හැකි අතර ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ වූ පරිදි දැනුම් දිය යුතු ය.

අවශ්‍ය අඩුකිරීම නොකරනු ලබන විට සේවා නියුක්තයා විසින් දැන්වීමක් කල යුතු බව.

**122**. (1) සේවා නියුක්තයකුට පාරිශ්‍රමික ගෙවන විට යම් හේතුවක් නිසා යම් ආදායම් බද්දක් සම්පූර්ණයෙන් අඩු කරනු ලැබ නැති අවස්ථාවක, ඒ පාරිශ්‍රමිකය ආදායම් බද්ද අඩුකිරීමට යටත් වේ නම් ඒ අඩු කිරීම නොකර ඒ පාරිශ්‍රමික තමාට ලැබී ඇති බවට ඒ පාරිශ්‍රමිකය ලැබී දින පහළොවක් ඇතුළත ඒ සේවා නියුක්තයා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක ඒ දැන්වීම කරන තැනැත්තාගේ සම්පූර්ණ නම හා ලිපිනය ද ඔහුගේ සේවායෝජකගේ සම්පූර්ණ නම හා ලිපිනය ද ස්වකීය පාරිශ්‍රමික පිළිබඳ සම්පූර්ණ විස්තර ද ඇතුළත් විය යුතු ය.

අඩු කරන ලද ආදායම් බද්ද සේවා යෝජකයන්ගේ වත්කම් වල කොටසක් නොවිය යුතු බව.

**123**. වෙනයම් නීතියක කුමක් සඳහන්ව ඇත් ද, මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩුකර කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීම සඳහා සේවායෝජකයා විසින් තබා ගෙන ඇති සෑම බදු අඩුකිරීමකම මුදල, ඒ සේවායෝජක වස්තුභංගත්වයට පත්වුවහොත්, ඔහුගේ ව්‍යාපාරය ඈවර කරනු ලැබුවහොත් හෝ විසුරුවා හරිනු ලැබුවහොත් හෝ ඔහු මියගියහොත් හෝ පොල්මඃකරුවකු විසින් කටයුතු කරනු ලැබීමට යටත් වන හෝ අද්මිනිස්ත්‍රාසිකරණයට යටත් වන නැතහොත් ණය හිමියන්ගේ අර්ථලාභියා සඳහා පවරා දීමට යටත්වන ඒ සේවායෝජකගේ දේපළක් නොවිය යුතු ය. තව ද, ඒ මුදල ඒ සේවායෝජකගේ වස්තුභංගත්වයට පත්වූ ඈවර කරනු ලැබූ හෝ පවරා දෙනු ලැබූ බූදලයෙන් හෝ ඒ මියගිය සේවායෝජකගේ බූදලයෙන් හෝ වෙන්ව පැවතිය යුතු අතර එහි කොටසක් නොවිය යුතු ය.

ආදායම් බද්ද අඩු කිරීම හෝ ගෙවීම පැහැර හැරීම.

**124**. (1) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කිරීම යම් සේවායෝජකයකු විසින් පැහැර හරින අවස්ථාවක, නැතහොත් සේවා නියුත්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් ගෙවීම් කාලසීමාවක් සඳහා වූ ආදායම් බද්ද යම් සේවායෝජකයකු විසින් අඩු කර, අඩු කළ සම්පූර්ණ මුදල ඊළඟ මාසයෙහි පහළොස්වන දින හෝ ඉන් පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත නොයවා ඇති අවස්ථාවක, මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩු කිරීමට ඔහුට නියම කරන ලද මුත් ඔහු විසින් එසේ අඩු නොකරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට නැතහොත් අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත නොයවනු ලැබූ අඩුකරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට හෝ එහි කොටසකට, ඒ සේවා යෝජකයා පෞද්ගලිකව වගකිවයුතු අතර ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු වූයේ යම් දිනයක හෝ ඉන් පෙර ද ඒ දිනට ඉක්බිති දිනයේ සිට ඒ මුදල ගෙවීම පැහැර හැර තිබූ බව සලකනු ලැබිය යුතු ය. තව ද ඒ සේවායෝජකයා පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ විවිධාන සලස්වනු ලබන ආකාරයකින් ඒ මුදල ඒ සේවායෝජකයාගෙන් අයකරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අඩුකිරීම සේවායෝජකයා විසින් පැහැර හරින ලද බද්දේ ප්‍රමාණය හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයා විසින් සේවා නියුක්තයාගෙන් අයකරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ආදායම් බදු මුදල සේවායෝජකගෙන් හා සේවා නියුක්තයාගෙන් අයකර ගැනීම පිණිස සුදුසු යයි තමා අදහස් කරන පියවරවල් ගැනීමෙන්, නැතහොත් ඒ මුදල

සම්පූර්ණයෙන් සේවායෝජකයාගෙන් හෝ සම්පූර්ණයෙන් සේවා නියුක්තයාගෙන් නැතහොත් ඉන් කොටසක් සේවායෝජකයාගෙන් සහ කොටසක් සේවා නියුක්තයාගෙන් අයකර ගැනීමෙන් කොමසාරිස් ජනරාල්වරයා වළක්වන ලෙස මේ වගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

සේවායෝජකයන් පිළිබඳ තක්සේරු කිරීම නිකුත් කිරීම.

**125**. (1) ස්වකීය සේවා නියුක්තිකයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩුකිරීමට මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ නියම කරනු ලැබ සිටින යම් සේවායෝජකයකු –

(අ) යම් ගෙවීම් කාලසීමාවක් සඳහා වූ සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් අඩු කිරීම පැහැර හරින අවස්ථාවක ;

(ආ) යම් ගෙවීම් කාලසීමාවක් සඳහා අඩු කරන ලද සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීම පැහැරහරින අවස්ථාවක; හෝ

(ඇ) 120 වන වගන්තිය යටතේ යම් මාසික හෝ වාර්ෂික ප්‍රකාශයක් සැපයීම පැහැර හරින අවස්ථාවක,

එකී ගෙවීම් කාලසීමාව සඳහා, තක්සේරුකරුගේ මතය පරිදි ඒ සේවායෝජක විසින් අඩුකර, කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු වූ ආදායම් බදු මුදල හෝ අතිරේක ආදායම් බදු මුදල, ඒ ගෙවීම් කාලසීමාව ඇතුළත් වන වර්ෂයෙහි යම් අවස්ථාවක නැතහොත් ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත තක්සේරුකරුවකු විසින් තක්සේරු කරනු ලැබිය හැකි අතර, 127 වන වගන්තිය යටතේ අයවීමට තිබිය හැකි මුදල සමග ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ තක්සේරුකරු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ සේවායෝජකට නියම කළ යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයකදී යම් ගෙවීම් කාලසීමාවක් සඳහා සේවායෝජක විසින් අඩු කරනු ලැබ කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු වූ නිසි ආදායම් බදු මුදලට අඩුවෙන් (1) වන උපවගන්තිය යටතේ යම් සේවායෝජකයකු තක්සේරු කරනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, තක්සේරුකරුගේ මතය පරිදි, ඒ සේවායෝජකයා තක්සේරු කරනු ලැබිය යුතු වූ අතිරේක ආදායම් බද්දේ ප්‍රමාණය අනුව ඒ සේවායෝජකයා තක්සේරු කිරීම, ඒ තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක දී හෝ ඒ තක්සේරුකරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත දී තක්සේරුකරුවකු විසින් කරනු ලැබිය හැකි අතර, 127 වන වගන්තිය යටතේ අයවීමට තිබිය හැකි මුදල සමග ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ තක්සේරුකරු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ සේවායෝජකට නියම කළ යුතු ය :

එසේ වුව ද, තක්සේරකරුගේ මතය අනුව, යම් තක්සේරු වර්ෂයක දී යම් සේවායෝජකයකු විසින් අඩුකරගත යුතු යම් ආදායම් බද්දක් සම්බන්ධයෙන් එම සේවායෝජකයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ යම් වංචාවක් මගහැරීමක් හෝ වුවමනාවෙන්ම පැහැර හැරීමක් කර ඇති අවස්ථාවක, එම තක්සේරු වර්ෂයේ අවසානයට පසුව යම් කිසි අවස්ථාවක, තක්සේරුකරු විසින් එම සේවායෝජකයා සම්බන්ධයෙන් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**126**. (1) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ කරන ලද යම් තක්සේරුවක ප්‍රමාණය ගැන අතෘප්තියට පත් වූ යම් සේවයෝජකයකු විසින් ඒ තක්සේරු කිරීමේ දැන්වීමෙහි දිනයෙන් පසු දින තිහක කාලසීමාවක් ඇතුළත ඒ තක්සේරු කිරීමට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනා කළ හැකි ය : අභියාචනා.

එසේ වුව ද, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, අසනීපවීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා ඒ කාලසීමාව තුළ අභියාචනා කිරීමෙන් අභියාචක වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්කරනු ලැබූ විට, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කාලය දීර්ඝ කිරීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අභියාචනය 120 වන වගන්තිය යටතේ සපයනු ලැබීමට නියමිත, අවස්ථාවෝචිත පරිදි මාසික ප්‍රකාශනයක් හෝ වාර්ෂික ප්‍රකාශනයක් නොමැතිව කරන ලද තක්සේරු කිරීමට විරුද්ධව ඉදිරිපත් කර ඇති අවස්ථාවක අභියාචන පෙත්සම ඒ ප්‍රකාශනය සමග ඉදිරිපත් කල යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් ඇතුළත උද්ගතවන යම් ගෙවීම් කාලසීමාවක් සඳහා තක්සේරුවක මුදලට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම සේවායෝජකයකු විසින් ම (ඒ සේවායෝජකයා විසින් දැනටමත් එලෙස කර නොමැති නම්) ඒ ගෙවීම් කාලසීමාව සම්බන්ධයෙන් තම සේවා නියුක්තයන්ට ගෙවන ලද පාරිශ්‍රමිකයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩු කිරීමට හා කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ඒ සේවායෝජකයට නියම කරනු ලැබූ එහෙත් එසේ ප්‍රේෂණය කරනු නොලැබූ සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක්, ඒ තක්සේරුව සම්බන්ධයෙන් වූ දැන්වීමේ දිනය දක්වා 127 වන වගන්තිය යටතේ ඒ මත උපචිත වූ යම් දණ්ඩනයක් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය. තව ද, එසේ ප්‍රේෂණය කරන ලද බව ඔප්පු කරන කුවිතාන්සියක් අභියාචන පෙත්සමට ඇමිණිය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන්නා වූ අභියාචන පෙත්සමක් වලංගු නොවිය යුතු ය.

(5) 125 වන වගන්තිය යටතේ කරන ලද තක්සේරු කිරීමක් මගින් අයකර ඇති ආදායම් බදු මුදල, ඒ තක්සේරු කිරීමට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර තිබුණ ද සේවායෝජකයා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(6) 165 වන වගන්තියේ (7) වන උපවගන්තියේ සිට 170 වන වගන්තිය තෙක් වූ වගන්තිවල විධිවිධාන, අවශය වෙනස් කිරීම් සහිතව (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයකට අදාළ විය යුතු ය.

(7) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව කරන ලද තක්සේරු කිරීමකට විරුද්ධව (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාවක් ඇතුළත වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්තාවක, නැතහොත් තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් 165 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ ගිවිසුමකට එළඹෙන අවස්ථාවක, නැතහොත් අභියාචනයක දී තක්සේරු කිරීමක් නිශ්චය කර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත විය හැකි පරිදි, කරන ලද හෝ ගිවිසගනු ලැබූ හෝ නිශ්චය කර ඇති තක්සේරු කිරීම මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය :

එසේ වුව ද, අභියාචනයක දී නිශ්චය කර ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නා වූ යම් තක්සේරු වර්ෂයක් යම් ගෙවීම් කාලසීමාවක් සඳහා වූ ද තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් 125 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කිරීමෙන්, තක්සේරුකරුවකු වළක්වන ලෙස මේ උපවගන්තියෙහි සඳහන් කිසිවක කියවා තේරුම් නොගත යුතු ය.

පැහැර හැරීම සඳහා දණ්ඩනය.

**127**. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවායෝජකයකු විසින් ගෙවිය යුතු යම් කාලසීමාවක් සඳහා වූ යම් අදායම් බද්දක් පැහැර හැර ඇති අවස්ථාවක, ඒ සේවායෝජක විසින් ඒ බද්දට අතිරේකව-

(අ) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ආ) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත්වීමෙන් පසුව, දින තිහක් ඉකුත්වීමට පෙර ද ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක එය පැහැර හැර පවතින කාලය තුළ දින තිහක එක් එක් වැඩිපුර කාලසීමාවක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් පැහැර හරිනු ලැබ ඇති බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක වැඩිපුර දණ්ඩන මුදලක් ගෙවිය යුතු ය :

එසේ වුව ද –

(i) ගෙවීම පැහැර හැරීම තම පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට, සහ පැහැර හැර ඇති බදු මුදල තමා විසින් ගෙවා ඇති බවට සහ ඒ ගෙවීම කරන ලද අවස්ථාවේ දී සැපයීමට නියමිත ප්‍රකාශය සපයන ලද බවට, ඒ සේවායෝජක විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත් ඒ සේවායෝජක විසින් ගෙවිය යුතු එවැනි යම් දණ්ඩනයක මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැකි ය. නැතහොත් අඩු කරනු ලැබිය හැකි ය ;

(ii) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුදල යම් කාලසීමාවක් සඳහා පැහැර හරිනු ලැබූ බද්ද වෙනුවෙන්, පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට පනහක් නොඉක්මවිය යුතු ය.

පැහැර හැරීම මත දණ්ඩනය.

**128**. 127 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවායෝජකයකු විසින් යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් ආදායම් බදු මුදලක් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින් එම බදු මුදලට අමතරව, පහත දැක්වෙන පරිදි ගණන් බලනු ලබන ගෙවීම පැහැර හැර ඇති බදු මුදලින් සියයට දහයක් නොඉමවන දණ්ඩන මුදලක් ද ගෙවනු ලැබිය යුතු ය :—

(අ) 106 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක් මත ගෙවිය යුතු බදු මුදල ගෙවිය යුතු දිනයේ දී හෝ එදිනට පෙර සම්පූර්ණයෙන් ම හෝ එම මුදලින් කොටසක් ගෙවා නොමැති අවස්ථාවක, එසේ ගෙවීම පැහැර හැර ඇති බදු මුදල මත පළමුවන මාසය සඳහා සියයට පහක අනුප්‍රමාණයට ද, ඉන් පසුව එක් එක් මාසය සඳහා හෝ මාසයක කොටසක් සඳහා වැඩිපුර සියයට එකක අනුප්‍රමාණයකට ද ;

(ආ) එම තැනැත්තාගෙන් ලැබිය යුතු වාර්තාවක් නොලැබී අදාළ යම් තක්සේරුවක් නිකුත් කරනු ලැබ අදාළ බදු මුදල ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, එසේ ගෙවීම පැහැර හැර ඇති බදු මුදල මත සියයට දහයක අනුප්‍රමාණයට ;

(ඇ) යම් තක්සේරුවක් පිළිබඳව අභියාචනයක් ඉදිරිපත් කොට එම අභියාචනය සමථයට පත්කිරීමේ දී බදු මුදල් ගෙවිය යුතු වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු බදු මුදල මත සියයට දහයක අනු ප්‍රමාණයක.

ගෙවන ලද බද්ද සඳහා බැර කිරීම.

**129**. සේවා නියුක්තයකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ තක්සේරු කළ හැකි ආදායමට, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ආදායම බදු අඩු කර ගනු ලැබූ යම් පාරිශ්‍රමිකයක් ඇතුළත් වන අවස්ථාවක, 120 වන වගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ පාරිශ්‍රමිකයා පිළිබඳව නිකුත් කරන ලද බදු අඩුකර ගැනීමේ සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ විට, අඩුකර ගන්නා ලදැයි ඒ සහතිකයේ දැක්වෙන බදු මුදල ඒ තක්සේරු වර්ෂය සඳහා තමා විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලැබීමට ඒ සේවා නියුක්තයාට හිමිකම් තිබිය යුතු ය :

එසේ වුව ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අඩු කිරීමේ සහතිකයක පදනම මත, මේ පරිච්ඡේදය යටතේ අඩු කරන ලද බදු මුදල හිලව් කරනු ලැබුවේ යම් ආදායමකින් ද එම ආදායම එම තක්සේරු වර්ෂය සඳහා එම සේවා යෝජකයාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් කොටසක් වන්නේ නම්, එසේ අඩු කරන ලද බදු මුදල හිලව් කිරීමට එම සේවායෝජකයාට හිමිකම් තිබිය යුතු ය.

ආකෘති සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම.

**130**. කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘතියෙහි සහ එසේ කරනු ලබන ආකාරයට විස්තර සටහන් කිරීමට සහ සැපයීමට මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ සේවායෝජකයකුට නියම කරනු ලබන අවස්ථාවක, සේවායෝජක විසින් ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, කොමසාරිස් ජනාරාල්වරයා විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද ආකෘතියක සහ එසේ කරන ලද ආකාරයකට සේවායෝජක විසින් විස්තර සටහන් කිරීම හෝ සැපයීම කරනු ලැබුවහොත් එය මේ විධිවිධානවලට ප්‍රමාණවත් ලෙස අනුකූලව ක්‍රියා කිරීමක් විය යුතු ය.

අර්ථ නිරූපණය.

**131**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පරිච්ඡේදයෙහි-

"සේවා නියුක්තයා" යන්නට-

(අ) සමාගමක හෝ සංස්ථාවක යම් අධ්‍යක්ෂවරයකු ;

(ආ) හවුල් ව්‍යාපාරයක යම් ක්‍රියාකාරී හවුල්කරුවකු ;

(ඇ) තමා විසින් ඉටු කරන ලද හෝ වෙනත් තැනැත්තකු විසින් ඉටුකරන ලද පූර්ව සේවාවන් සඳහා විශ්‍රාම වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික ලබන තැනැත්තකු,

ඇතුළත් වේ ; තවද

"සේවායෝජක" යන්නෙන්—

(අ) සේවා නියුක්තයකු ලෙස යම් පුද්ගලයකු සේවා ඉටුකරන්නේ යම් තැනැත්තකු, යම් හවුල් ව්‍යාපාරයක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් සඳහා ද ඒ තැනැත්තා, ඒ හවුල් ව්‍යාපාරය, ඒ පුද්ගල මණ්ඩලය හෝ ඒ සංවිධානය ද ;

(ආ) 4 වන වගන්තියේ අර්ථානුකූලව සේවා නියුක්තියෙන් යම් ලාභ ගෙවන යම් තැනැත්තකු, යම් හවුල් ව්‍යාපාරයක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් : හෝ

(ඇ) කලින් සේවා නියුක්තයකුව සිටි සේවා නියුක්තියකුගේ පූර්ව සේවා සඳහා ඒ සේවා නියුක්තයාට හෝ වෙනත් තැනැත්තකුට යම් විශ්‍රාම වැටුපක් හෝ වෙනත් යම් පාරිශ්‍රමිකයන් ගෙවන යම් තැනැත්තකු යම් හවුල් ව්‍යාපාරයක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් අදහස් වන අතර,

මෙහි පහත දැක්වෙන I වන තීරයෙහි නිශ්චිතව ම සඳහන් මණ්ඩලයක්, ආයතනයක් නැතහොත් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට II වන තීරයෙහි අනුරූප සටහනෙහි නිශ්චිත ව සඳහන් තැනැත්තෙක් ඊට ඇතුළත් වේ.

| I වන තීරය | II වන තීරය |
|---|---|
| සංස්ථාගත වූ හෝ සංස්ථාගත නොවූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් | ඒ සමාගමෙහි හෝ පුද්ගල මණ්ඩලයෙහි අධ්‍යක්ෂවරයා, ලේකම්, කළමනාකරු හෝ අන් ප්‍රධාන නිලධරයා. |
| හවුල් ව්‍යාපාරයක් | ශ්‍රී ලංකාවෙහි පදිංචි ප්‍රමුඛ හවුල්කරු හෝ යම් සක්‍රීය හවුල්කරුවකු ; යම් සක්‍රීය හවුල්කරුවකු ශ්‍රී ලංකාවෙහි වාසිකව නොසිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට ඒ හවුල් ව්‍යාපාරයෙහි ශ්‍රී ලංකාවෙහි සිටින අනුයෝජිතයා. |
| මියගිය තැනැත්තකුගේ බූදලය | බූදලයෙහි පොල්මඃකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු. |
| භාරයක් | භාරයෙහි භාරකරු හෝ භාරකරුවෝ. |
| නිර්වාසික තැනැත්තෙක් | ශ්‍රී ලංකාවෙහි සිටින එම තැනැත්තාගේ අනුයෝජිතයා හෝ ඇටෝර්නි බලකරු ; |

"ගෙවීම් කාලසීමාව" යන්නෙන්, සේවායෝජකයකු විසින් සේවා නියුක්තයකුට පාරිශ්‍රමික ගණන් බලා ගෙවනු ලබන්නේ යම් මාසයක, සතියක් හෝ වෙනත් එවැනි කාලසීමාවක් වෙනුවෙන් ද, ඒ මාසය, සතිය හෝ වෙනත් කාලසීමාව අදහස් වේ ;

"ප්‍රධාන නිලධරයා" යන්න, යම් සමාගමක් හා පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමග තමාගේ කිසි සම්බන්ධතාවක් නොමැති බව නැතහොත් ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධරයා වූ ශ්‍රී ලංකාවේ නේවාසික වෙනත් යම් තැනැත්තකු බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ සමාගම හා පුද්ගල මණ්ඩලය වෙනුවෙන් මේ පරිච්ඡේදයේ යම් විධිවිධානයක් යටතේ හෝ XXVI වන පරිච්ඡේදයේ යම් විධිවිධානයක් යටතේ දැන්වීමක් දී ඇති තැනැත්තකු ඉන් අදහස් වේ ; තවද

"පාරිශ්‍රමිකය" යන්නෙන් 4 වන වගන්තියෙහි අර්ථානුකූලව සේවා නියුක්තියෙන් අත්වන ලාභ අදහස් වේ.

## XV පරිච්ඡේදය

## ආණ්ඩුවේ ආයතනයක් විසින් ආදායම් බදු ගෙවීමට අදාල විධිවිධාන

ආණ්ඩුවේ ආයතනයක් විසින් එහි සේවා නියුක්තයන්ගේ ආදායම් බදු ගෙවීම.

**132**. (1) මේ පනතේ XIII වන සහ XIV වන පරිච්ඡේදවල සහ 2 වන වගන්තියේ කුමක් සඳහන් වුවද, යම් තක්සේරු වර්ෂයක් සඳහා ආණ්ඩුවේ ආයතනයක යම් සේවා නියුක්තයකුගේ නිල පාරිශ්‍රමිකවල දෙකෙන් එක් කොටසකට අදාළ කළ හැකි ආදායම් බද්ද නිල පාරිශ්‍රමිකවල එම කොටස 33 වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් දීමනාවට සමාන මුදලක් ඉක්මවා යන්නේ නම් එම ආණ්ඩුවේ ආයතනය විසින් ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එම ආදායම් බද්දෙන් කිසිම කොටසක් එම සේවා නියුක්තයාට ආපසු ගෙවීම හෝ එම සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු යම් බද්දකට එරෙහිව හිලවු කිරීම හෝ නො කළ යුතු ය.

(2) මේ පනතේ 4 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, ආණ්ඩුවේ ආයතනයක් යම් සේවා නියුක්තයකුගේ නිල පාරිශ්‍රමිකවල දෙකෙන් කොටසකට අදාළ කළ හැකි වූ ආදායම් බද්ද, ඒ සේවා නියුක්තිකයාගේ සේවා නියුක්තියෙන් ලබන ලද ලාභවලින් කොටසක් සංයුක්ත කරනු ලබන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා ආණ්ඩුවේ ආයතනයක යම් සේවා නියුක්තියකුගේ නිල පරිශ්‍රමිකවල දෙකෙන් කොටසකට අදාළ කළ හැකි ආදායම් බද්ද යන්නෙන්, යම් සේවා නියුක්තියකුගේ පරිශ්‍රමිකවල දෙකෙන් කොටසක් මත, 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කරන ලද දීමනාවට සමාන මුදලක් එයින් අඩු කිරීමෙන් පසුව, මේ පනතේ පළමුවන උපලේඛනයේ, 1 වන කොටසේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණයකට ගණනය කළ ආදායම් බද්ද අදහස් වේ.

(4) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා—

"ආණ්ඩුවේ ආයතනය" යන්නෙන්, මේ පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරනු ලැබුවා වූ ජනරජය යටතේ යම් ගෙවීම් කරනු ලබන ධුරයක් දරන පුද්ගලයන් සේවයේ නියුක්ත කරනු ලබන යම් ආයතනයක් හෝ පුද්ගලයන් සේවයේ නියුක්ත කරනු ලබන යම් ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් සභාවක්, විශ්වවිද්‍යාලයක්, මණ්ඩලයක් හෝ කොමිෂන් සභාවක් අදහස් වේ ; සහ

"නිල පඩිනඩි" යන්නෙන්, විශ්‍රාම වැටුප හැර, ලබාදෙන සේවය සඳහා ලැබෙන 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ නිශ්චිතව දැක්වෙන සේවා නියුක්තියකින් ලැබෙන ලාභ අදහස් වේ.

## XVI පරිච්ඡේදය

### බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවනු ලබන පොලියෙන් ආදායම් බදු අඩු කර ගැනීම.

බැංකු සහ මූල්‍ය ආයතන විසින් ආදායම් බදු අඩුකල යුතු බව.

**133**. (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් වෙත තැන්පත් කර ඇති යම් මුදල් ප්‍රමාණයක් මත ගෙවිය යුතු හෝ බැරකළ යුතු පොලියෙන් හෝ ලබාදිය හැකි වට්ටමෙන් එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් එම පොලී මුදල මත හෝ වට්ටම් මුදල මත සියයට දහයක අනුප්‍රමාණයට වූ ආදායම් බද්දක් අඩු කරගත යුතු ය ; එම අඩුකිරීම, එම පොලිය ගෙවනු ලබන හෝ බැරකරනු ලබන නැතහොත් වට්ටම ලබා දෙන අවස්ථාවේදී සිදු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අඩුකිරීමේ කාර්ය සඳහා, පොලිය හෝ වට්ටම යන්නට-

(අ) මේ පනත යටතේ අදායම් බද්දෙන් නිදහස් කරන ලද පොලියක් හෝ වට්ටමක් ;

(ආ) 95 වන වගන්තියට අනුකූලව ආදායම් බදු අඩු කරගෙන ඇති පොලිය හෝ වට්ටම් ;

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ ඒකාබද්ධ අරමුදලට හෝ යම් පළාත් සභාවක පළාත් සභා අරමුදලකට උපචිත වන යම් පොලියක් හෝ වට්ටමක් ; සහ

(ඈ) (i) යම් විදේශ ආණ්ඩුවකට ; හෝ

(ii) ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට,

ප්‍රතිලාභ වශයෙන් හිමිකම් ඇති යම් පොලියක් හෝ වට්ටමක් ඇතුළත් නොවිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක යම් මාසයකදී යම් බැංකුවක හෝ යම් මුල්‍ය ආයතනයක යම් ශාඛාවක් විසින් (2) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් යම් තැනැත්තකු නොවන යම් පුද්ගලයකුට ගෙවිය යුතු හෝ බරකළ යුතු යම් පොළියකට හෝ ලබාදිය හැකි වට්ටමකට අදාළව-

(අ) එම පොලියේ සහ එම වට්ටමේ මුළු එකතුව,-

(i) එම තක්සේරු වර්ෂයේ එම මාසය සඳහා රුපියල් එක් දහසක් නොඉක්මවන්නේ නම් ; හෝ

(ii) එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් දොලොස් දහසක් නොඉක්මවන්නේ නම් ; හෝ

(ආ) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් යම් පොළියක් හෝ වට්ටමක් හැර පොළියෙන් හෝ වට්ටමෙන් ලැබෙන තමාගේ ආදායම-

(i) එම තක්සේරු වර්ෂයේ එම මාසය සඳහා රුපියල් නව් දහසක් නොඉක්මවන බවට ; හෝ

(ii) එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් එක්ලක්ෂ අට දහසක් නොඉක්මවන බවට,

එම පුද්ගලයා එම ශාඛාවට ලිඛිතව ප්‍රකාශයක කරන්නේ නම් ආදායම් බද්ද අඩු කිරීමට අදාළව (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(4) යම් පුන්‍ය ආයතනයකට ගෙවනු ලබන යම් පොලියකට හෝ ලබාදෙන යම් වට්ටමකට අදාළව-

(අ) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ (i) වන අනු ඡේදයේ "රුපියල් එක් දහසක්" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයක්" යන වචන ආදේශ කර ඇති ලෙස සලකා ;

(ආ) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ (ii) වන උපඡේදයේ "රුපියල් දොලෙස් දහසක්" යන වචන වෙනුවට "රුපියල් තිස්දහසක්" යන වචන ආදේශ කර ඇති ලෙස සලකා ;

(ඇ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ (i) වන අනු ඡේදයේ "රුපියල් නව දහසක්" යන වචන වෙනුවට "රුපියල් දොලොස් දහසක්" යන වචන ආදේශ කර ඇති ලෙස සලකා ;

(ඈ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ (ii) වන අනුඡේදයේ "රුපියල් එක්ලක්ෂ අටදහසක්" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසක්" යන වචන ආදේශ කර ඇති ලෙස සලකා,

(3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) යම් බැංකුවක් හෝ මුල්‍ය ආයතනයක් විසින් පොලිය ගෙවිය යුත්තේ හෝ බැරකළ යුත්තේ නැතහොත් වට්ටමක් ලබා දිය යුත්තේ යම් තැනැත්තකුට ද නැතහොත් යම් හවුල් ව්‍යාපාරයකටද එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් එම පොලියෙන් හෝ වට්ටමෙන් සියයට දහයකට වැඩි අනුප්‍රමාණයකට අදායම් බදු අඩුකරන ලෙස එම බැංකුවෙන් හො මුල්‍ය ආයතනයෙන් ලිඛිතව ඉල්ලා සිටින අවස්ථාවක, හෝ අවස්ථාවෝචිත පරිදි (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ සඳහන් යම් පොලියකින් හෝ වට්ටමකින් ආදායම් බදු අඩුකරන ලෙස යම් පුද්ගලයකු හෝ පුන්‍ය ආයතනයක් වන යම් තැනැත්තකු විසින් යම් බැංකුවකින් හෝ පුන්‍ය ආයතනයකින් ලිඛිතව ඉල්ලා සිටින අවස්ථාවක එම පොලියේ හෝ වට්ටමේ මුදල් ප්‍රමාණයට අදාළව එහි සඳහන් යම් සීමාවක් නොතකා, එම බැංකුව හෝ මුල්‍ය ආයතනය විසින් එම ඉල්ලීමට අනුකූලව ක්‍රියා කරමින් ඒ අනුව ආදායම් බදු අඩු කළ යුතු ය. එසේ කරනු ලබන යම් අඩුකිරීමක් මේ වගන්තිය යටතේ කරන ලද අඩු කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය

(6) අවස්ථාවෝචිත පරිදි යම් තැනැත්තකුට හෝ හවුල්ව්‍යාපාරයකට ගෙවනු ලබන හෝ බැර කරනු ලබන යම් පොලියකින් හෝ ලබාදෙන යම් වට්ටමකින් (1) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ආදායම් බදු අඩුකරන සෑම බැංකුවක් හෝ මුල්‍ය ආයතනයක් විසින් පහත සඳහන් විස්තර සඳහන් වන ප්‍රකාශයක්'එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය-

(අ) අවස්ථාවෝචිත පරිදි ගෙවන ලද හෝ බැරකරන ලද පොලියේ හෝ ලබාදුන් වට්ටමේ දළ ප්‍රමාණය ;

(අ) පොලී අනුප්‍රමාණය සහ අඩුකරන ලද පොලී ප්‍රමාණය ;

(ඇ) සැබෑ ලෙස ගෙවන ලද හෝ බැරකරන ලද පොලියේ හෝ ලබාදුන් වට්ටමේ ප්‍රමාණය ; සහ

(ඈ) එම පොලිය හෝ වට්ටම අදාලවන කාලසීමාව.

සුරැකුම්පත්, භාණ්ඩාගාර බැඳුම්කර ආදිය මත ලැබෙන පොලිය මත බදු අඩුකර ගැනීම.

**134**. යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් බැලූ බැල්මට පෙනෙන වටිනාකමට වඩා අඩු වටිනාකමකට-

(අ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ සුරැකුම්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර;

(ආ) (417 අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ භාණ්ඩාගාර බිල්පත් ;

(ඇ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ,

ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක, එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් එම මිළ සහ බැලූ බැල්මට පෙනෙන වටිනාකම අතර ඇති අතිරික්තයෙන් සියයට දහයක අනුප්‍රමාණයකට ආදායම් බදු අඩුකර ගත යුතු ය. එම අඩුකිරීම, අවස්ථාවෝචිත පරිදි එම සුරැකුම්පත්, භාණ්ඩාගාර බැඳුම්කර භාණ්ඩාගාර බිල්පත් හෝ ශ්‍රී ලංකා මහබැංකුවේ සුරැකුම්පත් නිකුත් කරන අවස්ථාවේ දී ම සිදු කළ යුතු ය.

ආදායම් බදු අඩු කිරීම සඳහා සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගම්.

**135**. (1) යම් සාංගමික ණය සුරැකුම්පතක් නිකුත් කරන සෑම සමාගමක් විසින්ම මේ පනතේ වෙනස් විධිවිධාන වලට යටත්ව, එම සුරැකුම්පත් සම්බන්ධයෙන් ගෙවිය යුතු හෝ බැරකළ යුතු පොලියෙන් හෝ ලබාදෙන වට්ටමෙන්, එම පොලිය හෝ වට්ටම මත සියයට දහයක අනුප්‍රමාණය වූ ආදායම් බද්දක් අඩුකරගත යුතු ය ; එම අඩු කිරීම, එම පොලිය ගෙවන හෝ බැරකරන නැතහොත් වට්ටම ලබාදෙන අවස්ථාවේදී සිදු කළ යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා, සාංගමික ණය සුරැකුම්පත් යන යෙදුමෙන් යම් සමාගමක් විසින් හෝ එම සමාගම වෙනුවෙන්තිකුත් කරන ලද පොලී සහිත හෝ වට්ටම් ලබාදුන් සුරැකුම් පත කල් පිරීමේදී හෝ ඉන් පසුව යම් නිශ්චිත මුදලක් බැඳුම්කරය, නෝට්ටුව, ලිපිය දරන්නාට ලිපියක් හෝ උකස් ලාභියාට ඉල්ලුම් කළ විට ගෙවීමට එම සමාගම බැඳී සිටින යම් බැඳුම්කරයක්, නෝට්ටුවක්, ලිපියක් හෝ උකස් පත්‍රයක් අදහස් වන නමුත් ඊට ආයතනයකින් ලබාගත් ණයක්, අත්තිකාරම් අයිරා හෝ වෙනත් බැංකුවකින් හෝ මූල්‍ය ඒ හා සමාන පහසුකමක් ඇතුලත් නොවේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක් විසින් කරන ලද අඩු කිරීමක් සම්බන්ධයෙන් එම උපවගන්තියේ බැංකුව හෝ මූල්‍ය ආයතනය යන වචන වෙනුවට සමාගම යන වචනය ආදේශ කර ඇති ලෙස සලකා 133 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

අඩුකරනු ලැබූ බදු වෙනුවෙන් බැර.

**136**. යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙහි 133 වන වගන්තියේ සඳහන් ගෙවීමක් ඇතුළත් වන අවස්ථාවක, එවිට -

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, 133 වන වගන්තිය යටතේ කරන ලද මුළු අඩු කිරීම් ඉක්ම වන්නේ නම් ඒ වගන්තියට අනුකූලව කරන ලද ඒ ගෙවීමට අදාල ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට එම ප්‍රකාශයෙහි දක්වා ඇති බදු මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකර ගැනීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය ;

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, 133 වන වගන්තිය යටතේ කරන ලද මුළු අඩුකිරීම්වලට අඩුවන්නේ නම්, ඒ වගන්තියට අනුකූලව, සහ XXVIII වන පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව කරන ලද, ඒ ගෙවීමට අදාළ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, සහ ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් අතර වෙනසෙහි මුදල ආපසු ගෙවනු ලැබීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය :

එසේ වුව ද, 133 වන වගන්තිය යටතේ බදු අඩු කර ගනු ලැබ තිබෙන තක්සේරු වර්ෂ එකකට වැඩි ගණනකින් උපචිත වූ සම්පූර්ණ ආදායම, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේ දී සම්පූර්ණයෙන් ඇතුළත් කර නොමැති අවස්ථාවක, එසේ බදු අඩු කර ගැනීම, ඒ වර්ෂයේ දී හෝ පසුව එළඹෙන තක්සේරු වර්ෂයක දී හෝ ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමට ආදායමට ඇතුළත් ඉහත සඳහන් පරිදි බදු අඩු කරනු ලැබ තිබෙන ආදායමට ආරෝපණීය වන එසේ අඩුකර ගන්නා ලද අනුපාතික බදු මුදල් ප්‍රමාණයට සීමා කළ යුතු ය :

එසේම තවදුරටත් එම අඩු කිරීම මුල් නිකුත් කිරීමෙන් පසුව යම් පොලියක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලැබීමට කිසිදු අයිතිවාසිකමක් නොමැතිව වට්ටමක් සහිතව නිකුත් කරන ලද සමාගම් ණය සුරැකුම්පතක් සම්බන්ධයෙන් වන විට, මේ ඡේදයේ පළමුවන අතුරු විධානයේ විධිවිධානවලට අනුකූලව හිලව් කළ නොහැකි එවැනි යම් අඩු කිරීමක ප්‍රමාණය සම්බන්ධයෙන් 200 වන වගන්තිය යටතේ මුදල් ආපසු ලබාගැනීම සඳහා එහි තැනැත්තාට හිමිකම් නොතිබිය යුතු ය.

**137**. යම් තක්සේරු වර්ෂයක දී 133 වන වගන්තියේ සඳහන් (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පතක් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් සුරැකුම්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් හෝ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්‍රයක් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පතක් හෝ නිකුත් කරන අවස්ථාවේ දී, එම සුරැකුම් පත, බැඳුම්කරය හෝ බිල්පත මත සියයට දහයේ අනුප්‍රමාණය අනුව ආදායම් බදු අඩු කර ගනු ලැබූ යම් සුරැකුම්පතක්, භාණ්ඩාගාර බැඳුම්කරයක් හෝ බිල් පත්‍රයක් පිළිබඳ ද්විතියික වෙළෙඳපල ගනුදෙනුවල යම් තැනැත්තකු යෙදී සිටින්නා වූ හෝ යම් සුරැකුම්පතක්, බැඳුම්කරයක් හෝ බිල්පත්‍රයක් ඒ පොළී ආදායම ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා සමාගමක් වන්නේ නම්, ව්‍යවස්ථාපිත ආදායමේ හෝ සමාගමක් නොවන තැනැත්තකු වන්නේ නම් තක්සේරු කළ හැකි ආදායම් හෝ කොටසක වන්නේ නම් ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවේ පොළී ආදායම, එම මුදලින් නවයෙන් එකක් දක්වා දළ කරන ලද ප්‍රමාණයෙන් සියයට දහයක් බැගින් වූ මතිමාත්‍ර බදු බැර කිරීමක් ලබාගැනීමට ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

ද්විතීයික වෙළෙඳපල ගනුදෙනු මත මතිමාත්‍ර බැර කිරීම.

මේ වගන්තියේ "ද්විතීයික වෙළෙඳපල ගනුදෙනුවලින් ලැබූ පොළී ආදායම" යන්නෙන්, සුරැකුම්පත, බැඳුම්කරය හෝ බිල්පත ප්‍රාථමික නිකුත් කිරීමේ දිනයේ සිට හෝ ඉන් පසුව දිනයක දී, එවැනි සුරැකුම්පතක්, බැඳුම්කරයක් හෝ බිල්පත්‍රයකින් පොළී ආදායම උපයා ඇත්තේ හෝ ලබා ඇත්තේ යම් සුරැකුම්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හෝ භාණ්ඩාගාර බිල්පත් කෙලින්ම හෝ ආපසු මිලදී ගැනීමේ ගනුදෙනුවකින් ද, එම සුරැකුම්පත, භාණ්ඩාගාර බැඳුම්කරය හෝ භාණ්ඩාගාර බිල්පත්‍රය පිළිබඳ ආපසු මිලදී ගැනීමේ එම ගනුදෙනුවේ දී එම ගනුදෙනුවට අදාළ පොළී වියදම අඩු කිරීමෙන් පසු පොළී ආදායම ලෙස මේ පනතේ 107 වන වගන්තියේ සඳහන් ගණකාධිකාරිවරයකු විසින් සහතික කරන ලද මුදලක් අදහස් වේ.

**138**. (1) යම් තැනැත්තකු විසින් 133 වගන්ති යටතේ සියයට දහය බැගින් ආදායම් බදු අයකිරීමට යටත් යම් පොලියක් මත දැනටමත් ආදායම් බදු ගෙවා තිබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් සහ එම බද්ද ගෙවීමේ දින සිට මාස දොළහක කාලයක් ඇතුළත ලිඛිතව යම් හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, එම පොළී ආදායම මත 133 වගන්තිය යටතේ අඩු කරනු ලැබූ යම් බදු මුදලක් හැර එම පොළී ආදායම් මත ඔහු විසින් ගෙවන ලද ආදායම් බදු මුදල ආපසු අයකර ගැනීමට ඔහුට හිමිකම් ඇත.

රඳවා ගැනීමේ බද්දට යටත් පොළී මත ගෙවා ඇති ආදායම් බදු ආපසු ගෙවීම.

(2) මේ පනතේ 133 වන වගන්තියේ සඳහන් යම් පොලී ආදායමක් සමාගමක් වන යම් තැනැත්තකු විසින් සිය ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් කොට 137 වගන්තියේ සඳහන් මතිමාත්‍ර බැර කිරීම් ප්‍රකාරව එම තක්සේරු වර්ෂය සඳහා තමාගේ ආදායම් බදු වගකීමට වඩා වැඩි ආදායම් බද්දක් ගෙවා ඇති අවස්ථාවක, එම වැඩිපුර මුදල යම් ඉදිරි තක්සේරු වර්ෂයක දී ආදායම් බදු වගකීමකට එරෙහිව අඩු කිරීම සඳහා ඉදිරියට ගෙන යනු ලැබිය හැකි නමුත්, එම වැඩිපුර මුදල හෝ එහි යම් කොටසක් ආපසු ලබාගැනීමට එම සමාගමට හිමිකමක් නැත්තේ ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාර ආදායම් වශයෙන් යම් පොලියක් ලබන සමාගමක් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් නොවන යම් තැනැත්තකුට උපචිත වී ඇති යම් පොලියක් ගෙවන විට හෝ බැර කරන විට 133 වන වගන්තිය යටතේ ආදායම් බදු අඩු කිරීමට එම සම්පූර්ණ පොලී මුදල යටත් වන බවට තක්සේරුකරු සෑහීමට පත්වන පරිද එම තැනැත්තා විසින් ඔප්පු කරන්නේ නම්, එම පොලිය යම් තක්සේරු වර්ෂයක් සඳහා සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් කරනු නොලැබිය යුතු ය.

133 වන හෝ 136 වන වගන්ති යටතේ බදු අඩුකර ගන්නා අවස්ථා පිළිබඳ විධාන නිකුත් කිරීම.

**139**. (1) 133 වන වගන්තිය හෝ 136 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක පොලී ආදායමෙන් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක් හෝ සංස්ථා ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගමක් විසින්, ආදායම් බදු අඩුකර ගනු ලබන්නා වූ ද ඒ පොලී ආදායම, යම් තක්සේරු වර්ෂයක් සඳහා අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ බෙදාදිය හැකි ලාභයේ සහ ආදායමේ කොටසක් වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා හෝ හවුල්කරුවන්, ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද, ඒ තක්සේරු වර්ෂය සඳහා 133 වන වගන්තිය හෝ 136 වන වගන්තිය යටතේ අඩුකර ගත යුතු ආදායම් බද්ද, ඒ බදු ප්‍රමාණයට වඩා අඩු වන්නේ නම්, එම තක්සේරු වර්ෂයේ දී ආදායම් බදු අඩුකිරීමේ දී අවශ්‍ය වෙනස්කම් කරමින් සංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන ලෙස ඉල්ලා සිටිමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘති පත්‍රයක සහ එවැනි නිශ්චිත විස්තර ඇතුලත් ඉල්ලීමක්, එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කොමසාරිස් ජනරාල්වරයාට ඉදිරිපත් කල හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධරයකු විසින්, එම ඉල්ලීමෙහි නිශ්චිතව දැක්වෙන බැංකුව, මූල්‍ය ආයතනය හෝ සමාගම වෙත අවශ්‍ය විධාන ලිඛිතව නිකුත් කළ යුතු අතර එහි පිටපතක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එම බැංකුව හෝ මූල්‍ය ආයතනය හෝ සමාගම විසින් එම විධානවලට අනුකූලව එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතු පොලියෙන් ආදායම් බදු අඩු කල යුතු ය :

එසේ වුව ද නිකුත් කරන ලද එවැනි යම් විධානයක් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු, හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, එකී විධානයේ දින සිට දින තිහක් ඇතුළත එකී ඉල්ලීම සඳහා වූ හේතු සංක්ෂිප්තව දක්වමින් ලිඛිතව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. කොමසාරිස් ජනරාල්වරයා විසින් එකී ඉල්ලීම පිළිබඳව ගනු ලබන තීරණය අවසානාත්මක තීරණාත්මක විය යුතු ය.

එසේ වුව ද, 165 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට හැකිවන පිණිස, අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ලිඛිතව කරන ලද ඉල්ලීමක් මත කොමසාරිස් ජනරාල්වරයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය පිළිබඳ තක්සේරුවක් කිරීමට 163 වන වගන්තිය යටතේ තක්සේරුවක් කිරීමට සැලැස්විය යුතු ය.

(4) සෑම බැංකුවක් ම, මූල්‍ය සමාගමක් ම හෝ සමාගමක් ම විසින්–

(අ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුට ගෙවන ලද පොලිය සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට එකී පොලිය ගෙවූ දිනය හෝ දින පිළිබඳව නිසි වාර්තා පොත් පවත්වාගෙන යාම ;

(ආ) (අ) ඡේදයේ සඳහන් පරිදි පවත්වාගෙන යනු ලබන වාර්තා, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද නිලධරයකු විසින් පරීක්ෂා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(5) එසේ වුව ද ආදායම් බදු එසේ වැඩියෙන් අයකර ගැනීම උද්ගත වන්නේ, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් දරන ලද, 32 වන වගන්තිය යටතේ අඩු කිරීම් සිදු කළ හැකි අලාභවල ප්‍රතිඵලයක් වශයෙන් නම් සහ අදාළ තක්සේරු වර්ෂයේ ආරම්භයේ දී එම අලාභවල ප්‍රමාණය පෙර වර්ෂයේ පදනම මත ඇස්තමේන්තු කළ මුළු ව්‍යවස්ථාපිත ආදායම 133 වන වගන්තිය හෝ 136 වන වගන්තිය යටතේ ආදායම් බදු අඩු කිරීමට යටත් වූ පොලී ආදායම හෝ ආදායම් බද්දෙන් නිදහස් කර ඇති ප්‍රමාණය, අදාළ වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන මුළු ව්‍යවස්ථාපිත ආදායම, ඉක්මවන්නේ නම්, මිස, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් විධානයක් නිකුත් නොකළ යුතු ය.

ආදායම් බදු අඩු කිරීම පිළිපදින බැංකු සහ මූල්‍ය ආයතන සතු කාර්ය.

**140.** මේ පනත යටතේ ආදායම් බදු අය කළ යුතු තැනැත්තන්ට යම් තක්සේරු වර්ෂයක දී බැංකුවේ හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවනු ලබන පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට නියම කරනු ලැබ ඇති ඒ සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ම, ඒ ගෙවීම සම්බන්ධයෙන් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය සහ ඒ තැනැත්තා අතර ඇතුළත් වූ යම් ගිවිසුමකට අනුකූලව ඒ තැනැත්තාට ඒ පොලිය ගෙවනු ලබන අවස්ථාවේ දී ඒ ආදායම් බද්ද අඩු කළ යුතු ය. තව ද ඒ අඩුකිරීම කරනු ලැබුවේ යම් මාසයක දී ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර, එසේ අඩුකර ගන්නා ලද මුදල කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කළ යුතු ය. තව ද ඒ අවස්ථාවේ දී ම කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියකින් හා ඒ ආකෘතියෙන් වූ ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය.

බදු ගෙවීම මගහැරීම සම්බන්ධ දණ්ඩන.

**141.** යම් ණය සුරැකුමක් නිකුත් කරන යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් හෝ ස්ථාපිත බදු ණයකර නිකුත් කරන යම් සමාගමක් විසින් 133 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අඩුකර නොගන්නා බව කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස වන අවස්ථාවක ඒ පිළිබඳ හේතු දැක්වීමට ණය සුරැකුම් නිකුත් කරන ඒ බැංකුවට, මූල්‍ය ආයතනයට හෝ ස්ථාපිත බදු ණයක් නිකුත් කරන සමාගමකට අවස්ථාවක් දීමෙන් පසුව සහ 133 වන වගන්තියේ විධිවිධානවල උල්ලංඝනයක් සිදු වී තිබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ණය සුරැකුම්පත් නිකුත් කරන එවැනි සමාගමකට, බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට එකී වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් මගහැරෙන ලද ආදායම් බද්ද මෙන් පන්සිය ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

ආදායම් බදු අඩු කිරීම පැහැර හැරීම.

**142**. (1) 140 වන වගන්තියට අනුකූලව මේ පනත යටතේ ආදායම් බදු අයකළ යුතු තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයක දී යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීම ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, හෝ එසේ අඩු කරනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, මේ වගන්තියේ විධිවිධාන යටතේ අඩු කිරීමට එයට නියම කරන ලද මුත් එසේ අඩු නොකරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට නැතහොත් අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු නොලැබූ අඩු කරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට හෝ එහි කොටසට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වගකිය යුතු ය. තව ද අවස්ථාවෝචිත පරිදි අඩු කරනු නොලැබූ හෝ අඩු කරනු ලැබ ප්‍රේෂණය කරනු නොලැබූ මුදල් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු වූයේ යම් දිනයක හෝ ඉන් පෙරද, ඒ දිනයට ඉක්බිති දිනයෙහි සිට ඒ මුදල පැහැර හැර තිබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයෙන් ඒ මුදල ඒ බැංකුවෙන් හෝ මූල්‍ය ආයතනයෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද, යම් තැනැත්තකුට ගෙවන ලද පොලියකින් අඩු කිරීමට බැංකුව විසින් හෝ මූල්‍ය ආයතනය විසින් හෝ පැහැර හරිනු ලැබ ඇත්තා වූ ආදායම් බද්දේ මුදල හෝ එහි යම් කොටසක් හෝ අඩු කරනු ලැබිය යුතු වූයේ යම් තැනැත්තකු ගෙන් ද, ඒ තැනැත්තාගෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ මුදල හෝ ඒ කොටස අයකර ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ආදායම් බදු මුදල් සම්පූර්ණයෙන් ම බැංකුවෙන් හෝ මූල්‍ය ආයතනයෙන් නැතහොත් ඒ අඩුකිරීම කරනු ලැබිය යුතු වූයේ යම් තැනැත්තකුගෙන් ද සම්පූර්ණයෙන් ම ඒ තැනැත්තාගේ නැතහොත් බැංකුවෙන් හෝ මූල්‍ය ආයතනයෙන් කොටසක් සහ ඒ තැනැත්තාගෙන් කොටසක් ද අයකර ගැනීම පිණිස සුදුසු යයි තමා සිතන යම් පියවර ගැනීමෙන් කොමසාරිස් ජනරාල්වරයා වළක්වන්නේ යයි මේ වගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

බැංකු සහ මුල්‍ය ආයතන වෙත තක්සේරු කිරීම නිකුත් කිරීම.

**143**. මේ පනත යටතේ ආදායම් බදු අය කළ හැකි යම් තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයක දී ගෙවන ලද පොලියෙන් ආදායම් බද්ද අඩු කිරීමට නියම කරනු ලැබ සිටින යම් බැංකුවක් හෝ මුල්‍ය ආයතනයක් විසින්-

(අ) මේ පරිච්ඡේදය යටතේ අඩු කිරීමට ඊට නියම කර ඇති සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් හෝ අඩු කිරීමට පැහැර හරින ;

(ආ) එසේ අඩු කරන ලද සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට පැහැර හරින ; හෝ

(ඇ) 140 වගන්තිය යටතේ යම් ප්‍රකාශයක් සැපයීමට පැහැර හරින,

අවස්ථාවක තක්සේරුකරුවකු විසින් තක්සේරුකරුගේ මතය අනුව, එම තක්සේරු වර්ෂය සඳහා එම බැංකුව හෝ මුල්‍ය ආයතනය විසින් අඩුකර ලැබිය හැකිව තිබුණු සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වූ ආදායම් බදු මුදල හෝ අතිරේක ආදායම් බදු මුදල ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත යම් අවස්ථාවක දී තක්සේරු කරනු ලැබිය හැකි අතර, 145 වන වගන්තිය යටතේ අයවීමට තිබිය හැකි යම් මුදලක් සමග ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ බැංකුවට හෝ මුල්‍ය ආයතනයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ හැකි ය :

එසේ වුව ද තක්සේරුකරුගේ මතය අනුව, යම් තක්සේරු වර්ෂයක දී එම බැංකුව හෝ මුල්‍ය ආයතනය විසින් අඩුකරගත යුතු යම් ආදායම් බද්දක් සම්බන්ධයෙන් එම බැංකුව හෝ මුල්‍ය ආයතනය විසින් හෝ එය වෙනුවෙන් හෝ යම් වංචාවක්, මගහැරීමක් හෝ චුවමනා වෙන් ම පැහැර හැරීමක් කර ඇති අවස්ථාවක, එම තක්සේරු වර්ෂය අවසානයට පසුව යම්කිසි අවස්ථාවක, තක්සේරුකරු විසින්, එම බැංකුව හෝ මුල්‍ය ආයතනය සම්බන්ධයෙන් තක්සේරුවක් හෝ අතිරේක වූ තක්සේරුවක් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**144**. (1) 143 වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද යම් තක්සේරුවක ප්‍රමාණය ගැන අතෘප්තියට පත් වූ යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින්, ඒ තක්සේරු කිරීමේ දැන්වීමෙහි දිනයෙන් පසු, දින තිහක කාලසීමාවක් ඇතුළත, ඒ තක්සේරු කිරීමට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනය කළ හැකි ය : අභියාචන.

එසේ වුව ද ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, අසනීප වීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා ඒ කාලසීමාව ඇතුළත අභියාචනය කිරීමෙන් අභියාචක වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වුවහොත්, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කාලය දීර්ඝ කිරීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අභියාචනය ඉදිරිපත් කොට ඇත්තේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව 140 වගන්තිය යටතේ සැපයීමට නියමිත ප්‍රකාශනයක් නොමැතිව ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, අභියාචනා පෙත්සම ඒ ප්‍රකාශනය සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ තක්සේරුවක මුදලට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම බැංකුවක් හෝ මුදල් ආයතනයක්ම (ඒ බැංකුව හෝ මුදල් ආයතනය විසින් දැනටමත් එලෙස කර ඇත්නම් මිස) ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ බැංකුව විසින් හෝ ඒ මුදල් ආයතනය විසින් ගෙවන ලද පොලියෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩු කිරීමට හා කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ඒ බැංකුවට හෝ මුදල් ආයතනයට නියම කරනු ලැබූ එහෙත් ප්‍රේෂණය කරනු නොලැබූ සම්පූර්ණ ආදායම් බද්ද හෝ ඉන් යම් කොටසක් ඒ තක්සේරුව සම්බන්ධයෙන් වූ දැන්වීමේ දිනය දක්වා 145 වගන්තිය යටතේ ඒ මත උපචිත යම් දණ්ඩනයක් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය. තව ද ඒ ප්‍රේෂණය ඔප්පු කිරීමෙහි ලා කුවිතාන්සියක් අභියාචන පෙත්සමට ඇමිණිය යුතු ය.

(4) (2) වන සහ (3) උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන්නා වූ අභියාචනා පෙත්සමක් වලංගු නොවිය යුතු ය.

(5) 143 වන වගන්තිය යටතේ කරන ලද තක්සේරු කිරීමක් මගින් අයකර ඇති ආදායම් බදු මුදල, ඒ තක්සේරු කිරීමට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර තිබුණ ද බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ගෙවනු ලැබිය යුතු ය.

(6) 165 වන වගන්තියේ (7) වන උපවගන්තියේ සිට 170 වන වගන්තිය තෙක් වූ වගන්තිවල විධිවිධාන, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(7) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව කරන ලද තක්සේරු කිරීමකට විරුද්ධව (1) වන උපවගන්තියෙහි සඳහන් කාලසීමාව ඇතුළත වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, නැතහොත් තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් 165 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ගිවිසුමකට එළඹෙන අවස්ථාවක නැතහොත් අභියාචනයකදී තක්සේරු කිරීමක් නිශ්චය කර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ ගිවිසගනු ලැබූ හෝ අභියාචනයේ දී නිශ්චය කර ඇති තක්සේරු කිරීම පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය .

**145**. (1) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක විසින් ගෙවිය යුතු ආදායම් බදු කිසිවක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බැංකුව හෝ මූලය ආයතනය විසින් ඒ බද්දට අතිරේකව-

(අ) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ආ) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත්වීමෙන් පසුව දින තිහක් ඉකුත්වීමට හෝ ඒ බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, එය පැහැර හැර පවතින කාලය තුළ දින තිහක එක් එක් වැඩිදුර කාල සීමාවක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් පැහැර හරිනු ලැබ ඇති බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක වැඩිපුර දණ්ඩන මුදලක් ගෙවිය යුතු ය :

එසේ වුව ද-

(i) ගෙවීම පැහැර හැරීම ස්වකීය පාලනයෙන් බාහිර අවස්ථාගත කරුණු නිසා බවට සහ පැහැර හැර ඇති බදු මුදල එය විසින්

ගෙවා ඇති බව සහ ඒ ගෙවීම කරන ලද අවස්ථාවේ දී සෑපයීමට නියමිත ප්‍රකාශය සපයන ලද බවට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබුවහොත් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ගෙවිය යුතු එවැනි යම් දණ්ඩනයක මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැකි ය ; නැතහොත් අඩු කරනු ලැබිය හැකි ය ; තව ද

(ii) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, යම් තක්සේරු වර්ෂයක් සඳහා පැහැර හරිනු ලැබූ බද්ද වෙනුවෙන් පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට පනහක් නොඉක්ම විය යුතු ය.

**146**. 145 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව කිසියම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවිය යුතු කිසියම් ආදායම් බදු ගෙවීමක් පැහැර හැර ඇති අවස්ථාවක, 173 වන වගන්තියේ (3) උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ඒ පැහැර හරිනු ලැබූ බද්දට අතිරේකව දණ්ඩන මුදලක් සහ පොලී මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය සහ පොලිය.

**147**. මේ පරිච්ඡේදයෙහි "මූල්‍ය ආයතනය" යන්නෙන් මුදල් භාරගැනීම තමන් වෙනුවෙන්ම කරනු ලැබුව ද නැතහොත් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කරනු ලැබුවද තැන්පතු හෝ ණය පත්‍ර හෝ බැඳුම්කර ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයෙන් වූ ණය මගින් සහ ඒ මත පොලිය ගෙවීමේ ව්‍යාපරය හෝ ඒ ව්‍යාපාරයේ කොටසක් සමන්විත වන සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ අදහස් වේ.

අර්ථ නිරූපනය.

**148**. 133 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් යම් බද්දක් අයකරගනු ලැබ තිබෙන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිද ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය, ආදායම් බදු අය කරනු ලැබිය හැකි තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක් වන්නේ ය

ආදායම් බදු අය කරනු ලැබිය හැකි තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය.

**149**. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර තිබෙන කවර හෝ සමුපකාර සමිතියක්, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා සමාගමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ලියාපදිංචි සමුපකාර සමිති සමාගම් ලෙස සලකන බව.

බැංකු සහ මූල්‍ය ආයතන ලියාපදිංචි කිරීම.

**150**. (1) මෙම පරිච්ඡේදය යටතේ යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවන ලද පොලියෙන්, ආදායම් බදු අඩුකර ගැනීමට යටත් වන්නේ නම් එම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ඒ ආදායම් බදු අඩුකර ගැනීම ආරම්භ කිරීමට දින තිහකට ප්‍රථමයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කර ලියාපදිංචි අංකයක් ලබාගත යුතු අතර, ඒ අඩුකිරීම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් තොරතුරක් ඇතුළත් කරමින් මසකට වරක් කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එසේ ලියාපදිංචි නොවන හෝ කිසියම් වාර්තාවක් ඉදිරිපත් නොකරන කිසියම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලැබිය හැකි රුපියල් පනස් දහසකට නොවැඩි වන්නා වූ දණ්ඩනයකට යටත් විය යුතු ය.

## XVII පරිච්ඡේදය

## නිශ්චිත තැනැත්තන් විසින් ගෙවන ලද නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකර ගැනීම

නිශ්චිත තැනැත්තන් ලියාපදිංචි කිරීම.

**151**. (1) මේ පරිච්ඡේදය යටතේ නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකර ගැනීමට යටත්වන්නා වූ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඒ බදු අඩුකර ගැනීම ආරම්භ කිරීමට දින තිහකට ප්‍රථමයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කර ලියාපදිංචි අංකයක් ලබාගත යුතු අතර, ඒ අඩුකිරීම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින් මසකට වරක් කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය

(2) එසේ ලියාපදිංචි නොවන හෝ කිසියම් වාර්තාවක් ඉදිරිපත් නොකරන කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලැබිය හැකි රුපියල් පනස්දහසකට නොවැඩි දණ්ඩනයකට යටත් විය යුතු ය.

කුලී, බදු කුලී හෝ වෙනත් සමාන ගෙවීම්වලින් ආදායම් බදු අඩු කර ගැනීමට යටත් වන තැනැත්තන් ලියාපදිංචි කිරීම.

**152**. (1) මේ පරිච්ඡේදය යටතේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීම් කරන අවස්ථාවේ දී ඒ කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීම් වලින් ආදායම් බදු අඩුකර ගැනීමට යටත් වන්නා වූ ඒ තැන්තන් හෝ හවුල් ව්‍යාපාරය විසින් ඒ ආදායම් බදු අඩුකර ගැනිම ආරම්භ කිරීමට දින තිහකට ප්‍රථමයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කර ලියාපදිංචි අංකයක් ලබාගත යුතු අතර, ඒ අඩුකිරීම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින්

නිශ්චය කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින් මසකට වරක් කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එසේ ලියාපදිංචි නොවන හෝ කිසියම් වාර්තාවක් ඉදිරිපත නොකරන කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලැබිය හැකි රුපියල් පනස් දහසකට නොවැඩි දණ්ඩනයකට යටත් විය යුතු ය.

නිශ්චිත තැනැත්තන් විසින් නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකර ගත යුතු බව.

**153**. (1) සෑම නිශ්චිත තැනැත්තකු විසින් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකුට හෝ යම් හවුල් ව්‍යාපාරයකට ගෙවිය යුතු යම් නිශ්චිත ගාස්තුවකින්, ඒ නිශ්චිත ගාස්තුව ගෙවනු ලැබූ වේලාවේදී ඒ නිශ්චිත ගාස්තුවෙන් සියයට පහක අනුප්‍රමාණයක් අනුව ආදායම් බද්දක් අඩු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා-

"නිශ්චිත තැනැත්තා" යන්නෙන් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, තමන් වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙනුවෙන් හෝ වෙනත් යම් හවුල් ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපර වෙනුවෙන්, එකතුව රුපියල් එක් මිලියනයකට නොඅඩු නිශ්චිත ගාස්තු, ඒ තක්සේරු වර්ෂයේ දී ගෙවීමට හෝ බැර කිරීමට ඉඩ ඇත්තා වූ හෝ ඒ තක්සේරු වර්ෂයට පෙරාතුවම තක්සේරු වර්ෂයේ දී ගෙවා හෝ බැර කර ඇත්තා වූ යම් තැනැත්තෙක්, හවුල ව්‍යාපරයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ. ; එමෙන් ම

"නිශ්චිත ගාස්තුව" යන්නෙන් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් වෘත්තියක් හෝ රක්ෂාවක් හෝ වෙනත් යම් ස්වාධීන ස්වභාවයකින් යුත් කටයුත්තක් කරගෙන යාමේ දී අවස්ථාවෝචිත පරදි ඒ තැනැත්තා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉටුකරන ලද සේවාවන් සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් යම් නිශ්චිත තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු, මුළු එකතුව-

(i) එම තක්සේරු වර්ෂයේ කිසියම් මසකට රුපියල් පනස් දහසකට අඩු නොවන ; සහ

(ii) එම තක්සේරු වර්ෂයට රුපියල් පන්ලක්ෂයකට අඩු නොවන,

යම් මුදලක් හෝ මුදල් අදහස් වන අතර ඒ නිශ්චිත තැනැත්තා විසින් ගෙවිය යුතු යම් කොමිස් මුදලක්, තැරැව් ගාස්තුවක් හෝ ඒ සමාන

ස්වභාවයක වූ වෙනත් මුදලක් ඊට ඇතුළත් වන නමුත්, ඒ නිශ්චිත තැනැත්තා යටතේ වූ සේවා නියුක්තියක යෙදීමේ දී ඒ නිශ්චිත තැනැත්තාගේ යම් සේවා නියුක්තියකුට ගෙවිය යුතු යම් මුදලක් හෝ 156 වන වගන්තියේ (2) උපවගන්තියේ අර්ථ නිරූපනය කර ඇති "නිශ්චිත ඉඩම හෝ ගොඩනැගිල්ල" පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන් ගෙවන යම් කුලියක්, බදු කුලියක් හෝ වෙනත් ගෙවීමක් ඊට ඇතුළත් නොවේ.

මේ පරිච්ඡේදය යටතේ නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩුකිරීම සම්බන්ධයෙන් XVI පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු බව.

**154**. බැංකු සහ මූල්‍ය ආයතනය විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට, එසේ අඩු කරගන්නා ලද ආදායම් බදු වෙනුවෙන් බැර, විධාන නිකුත් කිරීම බැංකුවල සහ මූල්‍ය ආයතනවල කාර්ය ආදායම් බදු අඩු කිරීමේදී පැහැර හැරීම, බැංකු සහ මූල්‍ය ආයතන මත තක්සේරු කිරීම අභියාචනා සහ පැහැර හැරීම සඳහා දණ්ඩන යන විෂයයන්ට අදාළ XVI පරිච්ඡේදයේ විධිවිධාන නිශ්චිත තැනැත්තන් විසින් නිශ්චිත ගාස්තුවලින් ආදායම් බදු අඩු කිරීමට එසේ අඩු කරන ලද ආදයම් බදු වෙනුවෙන් බැර විධාන නිකුත් කිරීම නිශ්චිත තැනැත්තන්ගේ කාර්ය ආදායම් බදු අඩු කිරීමේ බදු අඩු කිරීමේදී පැහැර හැරීම, නිශ්චිත තැනැත්තන් මත තක්සේරු කිරීම, අභියාචනා මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම සඳහා දණ්ඩනය යන විෂයයන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව XVI පරිච්ඡේදය සංශෝධිත වූවා සේ සලකමින් "බැංකු සහ මූල්‍ය ආයතන" යන වචන වෙනුවට "නිශ්චිත තැනැත්තන්" සහ "පොලිය" යන වචන වෙනුවට "නිශ්චිත ගාස්තුව" යන වචන ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස අදාළ විය යුතුය. එසේ වුවද යම් නිශ්චිත තැනැත්තකු විසින් යම් හවුල් ව්‍යාපරයකට ගෙවන ලද යම් නිශ්චිත ගාස්තුවකින් මේ පරිච්ඡේදය යටතේ අඩුකර ගනු ලැබූ ආදායම් බදු සඳහා බැර ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් අන්‍යොන්‍ය එකඟත්වයෙන් වෙනස් තීරණයක් කරනු ලැබුවහොත් මිස, ඒ හවුල් ව්‍යාපාරයේ ලාභ සහ පාඩු ඒ හවුල්කරු විසින් බෙදාගන්නා අනුපාතය අනුව ඒ හවුල්කරුවන් අතර බෙදා හැරිය යුතු ය යන වෙනස් කිරීමට යටත් විය යුතු ය.

## XVIII පරිච්ඡේදය

### පදිංචිය සඳහා හැර, යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවනු ලබන කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම

කුලී, බදු කුලී යනාදිය ගෙවන තැනැත්තන් විසින් ආදායම් බදු අඩුකරගත යුතු බව.

**155**. යම් නිශ්චිත ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්, නිවාසයක් වශයෙන් නොවන අන්‍යාකාරයකින් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන් යම් කුලියක්, බදු කුලියක් හෝ වෙනත් ගෙවීමක් කරන සෑම තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, ඒ කුලිය, බදු කුලිය හෝ වෙනත් ගෙවීමක් කරන අවස්ථාවේ දී ඒ කුලියෙන්, බදු කුලියෙන් හෝ වෙනත් ගෙවීමෙන් සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩුකරගත යුතු ය.

XVI වන පරිච්ඡේදයේ විධිවිධාන මේ පරිච්ඡේදයට අදාල විය යුතු බව

**156**. (1) බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට, එසේ අඩුකර ගන්නා ලද ආදායම් බදු වෙනුවෙන් බැර, බැංකුවල සහ මූල්‍ය ආයතනවල කාර්ය, ආදායම් බදු අඩුකර ගැනීමේ දී පැහැර හැරීම්, බැංකු සහ මූල්‍ය ආයතන මත තක්සේරු කිරීම, අභියාචන සහ පැහැර හැරීම් සම්බන්ධ දණ්ඩන යන විෂයයන්ට අදාළව XVI වන පරිච්ඡේදයේ ඇති විධිවිධාන, 155 වගන්තියේ සඳහන් කර ඇති පරිදි වූ එකී කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීම්වලින් ආදායම් බදු අඩුකර ගැනීමෙ සම්බන්ධයෙන් ද එසේ අඩුකර ගන්නා ආදායම් බදු සඳහා බැර, එම කුලී ගෙවීමට, බදු කුලී ගෙවීමට හෝ වෙනත් ගෙවීම් කිරීමට යටත් තැනැත්තන්ගේ කාර්ය, ආදායම් බදු අඩුකර ගැනීමෙහිලා පැහැර හැරීම්, ඒ තැනැත්තන්ට තක්සේරු නිකුත් කිරීම, අභියාචන සහ මේ පරිච්ඡේදය යටතේ පැහැරහැරීම් සම්බන්ධ දණ්ඩන, යන විෂයයන් XVI වන පරිච්ඡේදය සංශෝධිත වූවා සේ සලකමින් "බැංකු ආයතන" යන වචන වෙනුවට, "ඒ බදු ගෙවීම්, බදු කුලී ගෙවීම් හෝ වෙනත් ගෙවීම් කිරීමට යටත් තැනැත්තා" යන වචන ද "පොලිය" වචනය වෙනුවට "කුලී හෝ බදු කුලී හෝ වෙනත් ගෙවීම්" යන වචන ද ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස, අදාළ විය යුතු ය. එසේ වුව ද, යම් තැනැත්තකු විසින් ඒ දේපළෙහි යම් හවුල් අයිතිකරුවනට ගෙවන ලද යම් බදු, බදු කුලී හෝ වෙනත් යම් ගෙවීම්වලින් මේ පරිච්ඡේදය යටතේ අඩුකර ගන්නා ලද ආදායම් බදු සඳහා බැර වාසිය, ඒ හවුල් අයිතිකරුවන් අතර, ඒ දේපළට ඔවුන්ට ඇති හවුල් අයිතිකාරත්වයේ අනුපාතය මත, බෙදාහැරිය යුතු ය, යන වෙනස් කිරීමට යටත්ව අදාළ විය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා "නිශ්චිත ඉඩම හෝ ගොඩනැගිල්ල" යනුවෙන්, යම් ලිත් මාසයක් සඳහා හෝ ඉන් කොටසක් සඳහා ගෙවිය යුතු කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීමේ මුදල් ප්‍රමාණය රුපියල් පනස් දහසකට අඩු නොවන හෝ යම් වර්ෂයක් සඳහා ගෙවිය යුතු මුළු කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීමේ මුදල් ප්‍රමාණය, රුපියල් පන්ලක්ෂයකට අඩු නොවන ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අදහස් වේ.

XIX පරිච්ඡේදය

## ආණ්ඩුවේ ආයතනයක් විසින් තොරතුරු සැපයූ අයට ගෙවනු ලබන ත්‍යාග මුදල්වලින් සහ ආණ්ඩුව විසින් යම් තැනැත්තකුට ගෙවනු ලබන දඩ මුදල්වල කොටස්වලින් සහ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද ලොතරැයි ත්‍යාගවලින් සූදු සහ ඔට්ටු ඇල්ලීමේ දිනුම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම.

ත්‍යාග හෝ දඩ මුදල් ආදිය ගෙවන ආණ්ඩුවේ ආයතනයක් හෝ ලොතරැයි ත්‍යාග ආදිය ගෙවන තැනැත්තන් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ආදායම් බදු අඩුකර ගත යුතු බව.

**157**. වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද–

(අ) ආණ්ඩුවේ ආයතනයක් විසින් ත්‍යාග මුදලක් හෝ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවන ලද හෝ ශ්‍රී ලංකා ජනරජය යටතේ යම් වැටුපක් ලබන ධුරයක් දරන කිසියම් තැනැත්තකුට අදාලව මේ පනතේ 4 වන වගන්තියට අනුකූලව සේවා නියුක්තියෙන් ලත් ලාභය යටතට ගෙනෙන කිසියම් දඩ කොටසක් හැර දඩ මුදල් කොටස ; හෝ

(ආ) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ලොතැරැයි ත්‍යාගයක්, සූදු ඔට්ටු ඇල්ලීමේ දිනුමක්,

යම් තැනැත්තකුට ගෙවනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම ආයතනය තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය එම ත්‍යාග මුදල, දඩ මුදලේ කොටස, ලොතැරැයි ත්‍යාගය, සූදු දිනුම් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම ගෙවනු ලබන අවස්ථාවේ දී එම දළ මුදලින් සියයට දහයක අනුප්‍රමාණයට ආදායම් බදු අඩුකර ගත යුතු ය :

එසේ වුව ද, (ආ) ඡේදයේ සඳහන් මුදල් ගෙවීම් සම්බන්ධයෙන් වන විට. එම ගෙවීම් රුපියල් ලක්ෂ පහකට අඩු නොවූ අවස්ථාවකදී පමණක් ඒසේ බදු මුදල් අඩු කිරීම කළ යුතු ය :

එසේ ම තවදුරටත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් මුදලින් හැර ලොතරැයි ත්‍යාගයක්, සූදු හා ඔට්ටු ඇල්ලීමේ දිනුමක් ගෙවනු ලබන අවස්ථාවක එම ලොතරැයි ත්‍යාග. සූදු හා ඔට්ටු ඇල්ලීම දිනුම් මත අදාළ ආදායම් බදු මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය යටත් විය යුතු ය.

මේ පරිච්ඡේදය යටතේ යම් අඩු කිරීම් සම්බන්ධයෙන් XVI පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු බව.

**158**. (1) බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට, බැංකුවල සහ මූල්‍ය ආයතනවල කාර්යය. ආදායම් බදු අඩු කිරීමේ දී පැහැර හැරීම, බැංකු සහ මූල්‍ය ආයතන මත තක්සේරු කිරීම, අභියාචනා සහ පැහැර හැරීම සඳහා දණ්ඩන යන විෂයයන්ට අදාළ XVI පරිච්ඡේදයේ විධිවිධාන 157 වන වගන්තියේ

සඳහන් පරිදි ත්‍යාග මුදල්වලින්, දඩ මුදල්වල කොටස්වලින්, ලොතරැයි ත්‍යාග මුදල්වලින්, සූදු දිනුම්වලින් සහ ඔට්ටු ඇල්ලීමේ දිනුම්වලින් ආදායම් බදු අය කිරීමට, එම ත්‍යාග මුදල්, දඩ මුදල්වල කොටස්, ලොතරැයි ත්‍යාග, සූදු දිනුම් ඔට්ටු ඇල්ලීමේ දිනුම් සඳහා මුදල් ගෙවන තැනැත්තන්ගේ හෝ හවුල් ව්‍යාපාරවල කාර්ය, ආදායම් බදු අඩු කිරීමේ දී පැහැර හැරීම, ඒ තැනැත්තන් හෝ හවුල් ව්‍යාපාර මත තක්සේරු නිකුත් කිරීම, අභියාචනා මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම සඳහා දණ්ඩනය යන විෂයයන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව XVI පරිච්ඡේදයේ "බැංකු සහ මූල්‍ය ආයතන" යන වචන වෙනුවට "යම් ත්‍යාග මුදලක, දඩ මුදලක් කොටසක්, ලොතැරැයි ත්‍යාග, සූදු දිනුමක් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම් ගෙවන යම් තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක් සහ "පොළිය" යන වචන වෙනුවට "යම් ත්‍යාග මුදලක්, දඩ මුදලක කොටසක්, ලොතරැයි ත්‍යාග, සූදු දිනුමක් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුමක් යන වචන ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස අදාළ විය යුතු ය.

(2) (අ) (i) යම් ලිත් මාසයක් ඇතුළත යම් තැනැත්තකුට; ගෙවන ලද ත්‍යාග මුදල් ප්‍රමාණයේ මුළු එකතුව එක් ත්‍යාග ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ගෙවීම මත ආදායම් බදු එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේ දී හෝ යම් මාසයක අවසාන ත්‍යාග මුදල් ගෙවන ලද දිනයේ දී අඩුකර ගනු ලැබිය යුතු ය ;

(ii) යම් මාසයක් තුළ යම් තැනැත්තකුට ගෙවන ලද දඩ කොටස් මුදල්වල මුළු එකතුව එක් දඩ මුදල් කොටසක් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ ගෙවීම මත ආදායම් බදු එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේ දී හෝ යම් මාසයක දී ගෙවන දඩ මුදල් කොටස මත අඩුකර ගනු ලැබිය යුතු ය ;

(iii) එක් දිනකට යම් තැනැත්තකුට ගෙවන ලද සූදු දිනුම්වල හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම්වල මුළු එකතුව, සූදු දිනුම්වල හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම්වල එක් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ගෙවීම් මත ආදායම් බදු ඔහු එම දවස ඇතුළත දී අඩු කරගනු ලැබිය යුතු ය.

(ආ) ලොතරැයි ත්‍යාග සම්බන්ධයෙන් වන විට එකී එක් එක් ත්‍යාගය මුදලින් හෝ අන්‍යාකාරයකින් ගෙවනු ලැබුව ද ඒවා වෙන් වෙන් වශයෙන් වූ ත්‍යාග ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා –

"ත්‍යාග මුදල් ගෙවීම්" යන්නෙන්, තොරතුරු සපයන්නන්ට සහ වෙනත් අයට ත්‍යාග මුදල් ගෙවීම සඳහා යම් යෝජනා ක්‍රමයක් යටතේ ආණ්ඩුව විසින් පිරිනමනු ලබන තෑග්ගක් හෝ ගෙවනු ලබන ත්‍යාග මුදලක් අදහස් වේ ;

"දඩ මුදල් වලින් කොටසක්" යන්නෙන් දඩ මුදල් ගෙවීමේ සැලැස්මක් අනුව ආණ්ඩුව විසින් අයකර ගන්නා ලද සහ බෙදා හරින ලද හෝ ගෙවනු ලබන දඩ මුදලකින් කොටසක් අදහස් වේ ;

"ලොතරැයි ත්‍යාග මුදල්" යන්නෙන් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන යම් ලොතරැයියකින් ප්‍රදානය කරනු ලබන මුදල් හෝ අන්‍යාකාරයක යම් ත්‍යාගයක් අදහස් වේ ;

"සූදු දිනුම්" යන්නෙන් කැසිනෝ ඇතුළු යම් සූදුවක දී හෝ සූදු ක්‍රීඩාවක දී දිනුම සඳහා ලැබෙන යම් ගෙවීමක් අදහස් වේ ;

"ඔට්ටු ඇල්ලීමේ දිනුම්" යන්නෙන් තුරඟ තරග පිටියක් ඇතුළත දී හෝ ඉන් පිටත දී දිනුම් සඳහා ලැබෙන යම් ගෙවීමක් අදහස් වේ.

(4) 140 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණද –

(අ) ලොතරැයි දිනුම්වලින් අඩුකර ගන්නා ලද සම්පූර්ණ බදු මුදල් ප්‍රමාණය. සතියේ පළමු දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, සතියේ එම පළමු දිනය වැඩකරන දිනයක් නොවන අවස්ථාවක ඊළඟ වැඩ කරන දිනයේ දී ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. තව ද, එම මුදල් ප්‍රමාණය, එකී ප්‍රේෂණය කල දිනයට පෙරාතුවම වූ ඉරිදා දිනයෙන් අවසන් වූ සතිය තුළ දී අඩුකර ගන්නා ලද බදු මුදලෙහි එකතුව විය යුතු ය ;

(ආ) සූදු ක්‍රීඩාවලින් හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම් වලින් අඩුකර ගන්නා ලද සම්පූර්ණ බදු මුදල් ප්‍රමාණය සතියේ පළමු දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, සතියේ එම පළමු දිනය වැඩකරන දිනයක් නොවන අවස්ථාවක ඊළඟ වැඩකරන දිනයේ දී ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, ප්‍රේෂණය කරනු ලැබිය යුතු එම මුදල් ප්‍රමාණය, එම ප්‍රේෂණය කළ දිනට පෙරාතුව ම වූ ඉරිදා දිනයෙන් අවසන් වූ සතිය ඇතුළත අඩුකර ගන්නා ලද බදු මුදලෙහි එකතුව විය යුතු ය.

**159**. (1) මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව කිසියම් ලොතරැයියක් හෝ ඔට්ටු ඇල්ලීමක් හෝ සූදු කටයුත්තක් මෙහෙයවන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ප්‍රදානය කරන ලද තෑගි හෝ කරන ලද ගෙවීම්වලින් මේ පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩුකර ගැනීමට යටත් වේ. නම්, ඒ ක්‍රියාකාරකම් ආරම්භවීමට දින තිහකට පෙරාතුව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කර ලියාපදිංචි අංකයක් ලබාගත යුතු අතර, ඒ ක්‍රියාකාරකම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින් මාසික පදනම මත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ලොතරැයි, ඔට්ටු ඇල්ලීම් සහ සූදු කටයුතු කර ගෙන යන තැනැත්තන් ලියාපදිංචි කිරීම.

(2) එසේ ලියාපදිංචි නොවන හෝ කිසියම් වාර්තාවක් ඉදිරිපත් නොකරන කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි රුපියල් පනස්දහසකට නොවැඩි වූ දණ්ඩනයකට යටත් විය යුතු ය.

## XX පරිච්ඡේදය

### කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද යම් වාර්ෂිකයකින් හෝ රාජ්‍ය භාගයකින් හෝ ගෙවන ලද යම් කළමනාකරණ ගාස්තුවකින් හෝ ගෙවන ලද ඊට සමාන ගාස්තුවකින් ආදායම් බදු අඩු කිරීම.

**160**. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් – වාර්ෂික රාජ්‍යභාග කළමනාකරන ගාස්තු හෝ ඊට සමාන ගෙවීම් කරන තැනැත්තන් විසින් ආදායම් බදු අඩු කිරීම.

(අ) 95 වන වගන්තියේ සඳහන් වන කිසියම් වාර්ෂිකයක් හෝ රාජ්‍ය භාගයක් හැර යම් වාර්ෂිකයක් හෝ රාජ්‍ය භාගයක් ; හෝ

(ආ) යම් කළමනාකරණ ගාස්තුහෝ වෙනත් සමාන ගාස්තු ගෙවන අවස්ථාවේදී එම වාර්ෂිකය, රාජ්‍ය භාග, කළමනාකරණ ගාස්තු හෝ වෙනත් යම් සමාන ගාස්තු ගෙවනු ලැබූ වේලාවේ දී, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් :–

(i) ගෙවන ලද දළ වාර්ෂිකයෙන් හෝ රාජ්‍ය භාගයෙන් සියයට දහයක ; සහ

(ii) ගෙවන ලද යම් කළමනාකරණ ගාස්තුවකින් හෝ ගෙවන ලද වෙනත් යම් සමාන ගාස්තුවකින් සියයට පහක,

අනුපාතයට ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය :

එසේ වුව ද, (අ) ඡේදයේ සඳහන් කරන ලද කිසියම් ගෙවීමක් සම්බන්ධයෙන්, වන විටක දී කිසියම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවන ලද එක් වාර්ෂිකය හෝ රාජ්‍ය භාගය, යම් මාසයක දී, රුපියල් පනස් දහසක් හෝ යම් වර්ෂයක දී රුපියල් ලක්ෂ පහක් ඉක්මවන අවස්ථාවල දී පමණක් බදු අඩු කර ගනු ලැබිය යුතු ය.

XVI වන පරිච්ඡේදයේ විධිවිධාන මේ පරිච්ඡේදයට අදාළකර ගැනීම.

**161**. (1) බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩුකිරීම, එසේ අඩුකර ගන්නා ලද ආදායම් බදු වෙනුවෙන් බැර විධානයක් නිකුත් කිරීම, බැංකු සහ මූල්‍ය ආයතනවල කාර්යය, ආදායම් බදු අඩු කිරීමේ දී පැහැර හැරීම, බැංකු සහ මූල්‍ය ආයතන මත තක්සේරු නිකුත් කිරීම සහ අභියාචන සහ පැහැර හැරීම් සඳහා දණ්ඩන යන විෂයයන්ට අදාළ XVI වන පරිච්ඡේදයේ විධිවිධාන, 160 වගන්තියේ සඳහන් කරන ලද පරිදි යම් වාර්ෂිකයක්, රාජ්‍ය භාගයක්, කළමනාකරණ ගාස්තු හෝ වෙනත් යම් සමාන ගෙවීමකින් ආදායම් බදු අඩු කිරීමට, යම් වාර්ෂිකයක්, රාජ්‍ය භාගයක්, කළමනාකරණ ගාස්තු හෝ වෙනත් යම් සමාන ගාස්තුවකින් යම් ගෙවීමක් කරන තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක කාර්යය, එසේ අඩු කරන ලද ආදායම් බදු වෙනුවෙන් බැර විධාන නිකුත් කිරීම, ආදායම් බදු අඩු කිරීමේදී පැහැර හැරීම, යම් තැනැත්තන් මත තක්සේරු කිරීම සහ අභියාචන සහ මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම සඳහා දණ්ඩනය වන විෂයයන්, XVI වන පරිච්ඡේදය සංශෝධිත වූවා සේ සලකමින්, “බැංකු සහ මූල්‍ය ආයතන” යන වචන වෙනුවට “එම වාර්ෂික, රාජ්‍ය භාග, කළමනාකරණ ගාස්තු හෝ වෙනත් සමාන ගාස්තු ගෙවීමට යටත් වන තැනැත්තන් හෝ හවුල් ව්‍යාපාර” යන වචන සහ “පොලිය” යන වචනය වෙනුවට ‘වාර්ෂික, රාජ්‍ය භාග, කළමනාකරණ ගාස්තු හෝ වෙනත් සමාන ගාස්තු” යන වචන, ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක ආදේශ කරනු ලැබූ ලෙස අදාළ විය යුතු ය.

(2) මේ පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩුකර ගැනීමට යටත් වන යම් කිසි තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඒ බදු අඩුකර ගැනීම ආරම්භ වීමට දින තිහකට ප්‍රථමයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කර ලියාපදිංචි අංකයක් ලබාගත යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කර මාසික පදනම මත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එසේ ලියාපදිංචි නොවන හෝ කිසියම් වාර්තාවක් ඉදිරිපත් නොකරන කිසියම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි රුපියල් පනස් දහසකට නොවැඩි දණ්ඩනයකට යටත් විය යුතු ය.

## XXI වන පරිච්ඡේදය

## ඇතැම් අර්ථසාධක අරමුදල්වල රඳවා ගැනීම

**162**. නිශ්චිත අර්ථසාධක අරමුදලක දායකයකුගේ බැරට, එම අරමුදලෙහි තිබෙන මුදල්වලින් යම් කොටසක් සඳහා ආදායම් බදු ගෙවිය යුතු වූ එම දායකයාගේ එම මුදල භාරව සිටින තැනැත්තකු විසින් දායකයාට එම මුදල් ගෙවීමේ දී ඒ දායකයා විසින් ගෙවන ලද දායක මුදල නියෝජනය කරන කොටස නොවන ඒ දායක මුදලින් සියයට පහළොවකට සමාන මුදලක් ඔහු විසින් තම භාරයෙහි රඳවා ගත යුතු ය. එවැනි මුදලක් තම භාරයෙහි රඳවා ගන්නා තැනැත්තා විසින් එසේ රඳවා ගන්නා ලද මුදල කොමසාරිස් ජනරාලවරයා වෙත දැනුම් දිය යුතු අතර කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් නීතියක් යටතේ ගෙවිය යුතු යම් බද්දක් වෙනුවෙන් අඩු කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් ඔහුට විධාන කරනු ලබන මුදල එයින් අඩු කළ යුතු ය. එසේ අඩු කරන ලද මුදල කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතුය එසේ. අඩු කිරීමෙන් පසු ඉතිරි වන යම් ශේෂයක් ඒ දායකයාට ගෙවිය යුතු ය.

නිශ්චිත අර්ථසාධක අරමුදලක, දායකයාගේ බැරට තිබෙන මුදලින් සියයට පහළොවක් එම මුදල් වෙනුවෙන් ගෙවිය යුතු බද්ද ගෙවීමට රඳවාගත යුතු බව.

## XXII වන පරිච්ඡේදය

## තක්සේරු කිරීම

**163**. (1) තක්සේරුකරුවකුගේ මතයට අනුව යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් ආදායම් බද්දකට, යටත් යම් තැනැත්තකු ඒ බද්ද ගෙවා නොමැති හෝ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ බද්ද වශයෙන් ඔහු විසින් ගෙවිය යුතුව තිබුණු නිසි මුදලට වඩා අඩු මුදලක් ගෙවා ඇති හෝ අවස්ථාවක, (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම යෙදෙන නොවැම්බර් මස පහළොස්වන දිනයට පසුව, ඒ තක්සේරුකරු විසින්, ඒ තක්සේරුකරුගේ විනිශ්චයට අනුව, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු වන මුදල තක්සේරු කළ යුතු ය තවද ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන් -

තක්සේරු කිරීම් සහ අතිරේක තක්සේරු කිරීම්.

(අ) එම තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා කිසිම බද්දක් ගෙවා නොමැති නම්, එසේ තක්සේරු කරන ලද බදු මුදල ; හෝ

(ආ) ඒ තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා බද්ද ලෙස යම් මුදලක් ගෙවා ඇත්නම්, ඒසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවන ලද බදු මුදල අතර වෙනස,

නොපමාව ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය :

එසේ වුව ද යම් තැනැත්තකු ශ්‍රී ලංකාව හැර යාමට ආසන්න යයි හෝ ආදායම ආරක්ෂා කිරීම පිණිස කලින් තක්සේරු කිරීම සුදුසු යයි හෝ තක්සේරුකරුගේ මතය වෙයි නම් ඔහු විසින් (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව යම් තැනැත්තකු යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම වූ නොවැම්බර් මාසයේ පහළොස්වන දිනට පෙර ඕනෑම අවස්ථාවකදී තක්සේරු කරනු ලැබිය හැකි අතර, එම බද්ද 113 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතෙ නියමිත දිනට පෙර කොමසාරිස් ජනරාල්වරයාට ගෙවන ලෙස ද ඒ තැනැත්තා ට නියම කරනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත් 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ 62 වන වගන්තියේ (2) වන උපවගන්තියෙ (ඇ) ඡේදය යටතේ සමාගමක් විසින් ගෙවිය යුතු බදුවලට අදාළ යම් තක්සේරුවක් ඒ බද්ද ගෙවීම සඳහා නියමිත දිනයෙන් දින තහක් ඉකුත් වූ පසුව කළ යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දට යටත් යම් තැනැත්තකු නිසි ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකට තක්සේරු කරනු ලැබ ඇතැයි තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, (3) වන උප වගන්තියෙහි සහ (5) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව ඒ තක්සේරුකරු විසින් ඔහුගේ මතය අනුව ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතුව තිබුනේ යම් අතිරේක මුදලකට ද ඒ මුදලට ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතු අතර, ඒ අතිරේක තක්සේරුව සහ එය යටතේ අය කළ බද්ද සම්බන්ධයෙන් ද තක්සේරු දැන්වීම, අභියාචනය සහ වෙනත් කටයුතු පිළිබඳ මේ පනතේ විධිවිධාන අදාළ විය යුතුය.

(3) යම් තැනැත්තකු විසින් ආදායම පිළිබඳ වාර්තාවක් සපයා ඇති අවස්ථාවක, ඒ තැනැත්තා පිළිබඳව (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ තක්සේරුවන් කිරීමේ දී තක්සේරුකරු විසින්

(අ) ඒ තැනැත්තා විසින් සාදන ලද වාර්තාව පිළිගනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) ඒ තැනැත්තා විසින් සාදන ලද වාර්තාව පිළිගනු නොලබන්නේ නම් ඔහු විසින් එ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙහි, ප්‍රමාණය ඇස්තමේන්තු කර ඒ අනුව ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් සාදන ලද වාර්තාවක් තක්සේරුකරුවකු විසින් නොපිළිගෙන, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා පිළිබඳ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක, වාර්තාව පිළිනොගැනීම සඳහා ස්වකීය හේතු තක්සේරුකරු විසින් ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත දන්වා සිටිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් ආදායම, පිළිබඳ වාර්තාවක් සපයා නොමැත්තා වූද, ඒ තැනැත්තා ආදායම් බද්ද ගෙවීමට යටත් බව තක්සේරුකරුගේ මතය වන්නා වූද අවස්ථාවක, තක්සේරුකරු විසින් (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ හෝ ඒ තැනැත්තා පිළිබඳව තක්සේරුවක් කිරීමේ දී ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙහි ප්‍රමාණය ඇස්තමේන්තු කර ඒ අනුව, ඔහු තක්සේරු කරනු ලැබිය හැකි ය. එසේ වුවත් වාර්තාවක් සැපයීම පැහැර හැරීම හෝ අතපසු කිරීම සම්බන්ධයෙන් මේ පනත යටතේ ඒ තැනැත්තා දණ්ඩනයකට යටත් වීම කෙරෙහි ඒ තක්සේරුව බල නොපෑ යුතු ය.

(5) 72 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව-

(අ) යම් තක්සේරු වර්ෂයකට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන දින හෝ ඊට පෙර යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයේ ආදායම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර ඇති එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට මාස දහ අටක් ඉකුත් වීමෙන් පසුව ; සහ

(ආ) (අ) වන ඡේදයේ සඳහන් දින හෝ ඊට පෙරාතුවම වාර්තාවක් ඉදිරිපත් කිරීම අතපසුකළ තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වසර තුනක කාලයක් ඉකුත්වීමෙන් පසුව,

මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද වෙනුවට කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් සේවා නියුක්තියෙන් ලබන ලාභවලට අදාළ යම් හිඟ මුදල් ඒ තැනැත්තා විසින් ලබාගැනීමට ආනුෂංගිකව ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්ද තක්සේරු කිරීම සම්බන්ධයෙන් මේ උපවගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය :

එසේ තවදුරටත් තක්සේරුකරුගේ මතය අනුව, යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්දක්, සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වංචාවක්, මඟහැරීමක් හෝ සිතාමතා පැහැර හැරීමක් සිදු කර ඇති අවස්ථාවක, එම තක්සේරු වර්ෂය අවසන් වී කරන හෝ අවස්ථාවක දී වුව එම තැනැත්තා පිළිබඳ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් තක්සේරුකරු විසින් සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(6) (5) උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, (3) වන උපවගන්තියේ අතුරු විධානයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකිරීමේ හේතුව මත අධිකරණය විසින් යම් තක්සේරුවක් අවලංගු කරන අවස්ථාවක, එසේ අවලංගු කරන ලද තක්සේරුව වෙනුවට අවශ්‍ය අවස්ථාවක දී තක්සේරුකරු විසින් තවදුරටත් වූ තක්සේරුවක් සිදුකිරීම නීත්‍යානුකූල වන්නේ ය :

එසේ වුව ද, අවලංගු කරන ලද තක්සේරුව වෙනුවට තවදුරටත් තක්සේරු කිරීම එක් තක්සේරුවකට පමණක් සීමා කළ යුතු අතර තවදුරටත් වූ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් නොකළ යුතු ය.

(7) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු පිළිබඳව (1) වන උපවගන්තිය යටතේ යම් තක්සේරුවක් හෝ (2) වන උපවගන්තිය යටතේ වූ අතිරේක තක්සේරුවක් සිදුකිරීම මගින් 173 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන දණ්ඩනයට යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි බලපෑමක් සිදු නොවිය යුතු අතර එම වගන්තියේ කාර්ය සඳහා එසේ තක්සේරු කරන ලද මුදල, එම තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂය සඳහා එසේ තක්සේරු කරන ලද මුදල, එම තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) (මෙහි මින් මතු "පළමුව සඳහන් තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් තම ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර, පළමුව සඳහන් කළ තක්සේරු වර්ෂයට ඉහතින් ම වූ අවුරුදු තුනක කාලය තුළ වූ එක් එක් තක්සේරු වර්ෂයට අදාළව 106 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 113 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරමින් සහ-

(අ) (i) තමා ඉදිරිපත් කළ වාර්තාවේ පදනම මත පළමු සඳහන් තක්සේරු වර්ෂය සඳහා පළමුව සඳහන් තක්සේරු වර්ෂයට ඉහතින් ම වූ තක්සේරු වර්ෂය සඳහා වූ ආදායම් බද්දෙන් සියයට එකසිය විස්සකට නො අඩු වන ආදායම් බද්දක් ගෙවා ඇත්නම් ; හෝ

(ii) තක්සේරු කළ හැකි ආදායම වශයෙන් පළමුව සඳහන් කළ තක්සේරු වර්ෂය සඳහා තමා ඉදිරිපත් කළ වාර්තාවෙහි, පළමුව සඳහන් තක්සේරු වර්ෂයට ඉහතින් ම වූ තක්සේරු වර්ෂය සඳහා තක්සේරු කළ ආදායමෙන් සියයට එකසිය විස්සකට නොඅඩු වන මුදලක් නිශ්චිතව දක්වා ඇත්නම් ; සහ

(ආ) පළමුව සඳහන් තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද සම්බන්ධයෙන් වංචාවක්, මහහැරීමක්, හිතාමතා පැහැර හැරීමක් සිදුකර ඇති බවට දිවුරුම් ප්‍රකාශයක් කර ඇත්නම්,

එම වාර්තාව පිළිගත යුතු අතර එම පුද්ගලයා පිළිබඳව කිසිම තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් නොකළ යුතු ය.

(9) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ තක්සේරු කළහැකි ආදායම රුපියල් මිලියන එකකට වඩා වැඩි නොවන අවස්ථාවක් සහ-

(අ) එම තක්සේරු වර්ෂයට හෝ කලින් වූ යම් තක්සේරු වර්ෂයට අදාළව 106 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් දැන්වීමක් කරනු ලැබ නොමැති අවස්ථාවක ; හෝ

(ආ) ඔහුගේ ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක සහ ඔහුට ළමයකු සිටී නම් කලින් වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා එම ළමයාගේ ආදායම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක

එම පුද්ගලයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ ආදායම පිළිබඳව සහ ඔහුට ළමයකු සිටී නම් එම ළමයාගේ ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර XXV පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් සමඟ එම වාර්තාවේ පදනම මත බදු ගෙවන්නේ නම් එම වාර්තාව පිළිගත යුතු අතර එම වාර්තාව සමඟ ගිණුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර නැති වුව ද එම තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයා සම්බන්ධයෙන් කිසිම තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් නොකළ යුතු ය.

**164**. තක්සේරු කරනු ලැබූ ආදායමෙහි ප්‍රමාණය ද, ගෙවීමට නියම කරනු ලැබූ මුදල ද සඳහන් කරමින් තක්සේරු කිරීමේ දැන්වීමක් තක්සේරු කරනු ලැබූ එක් එක් තැනැත්තාට තක්සේරුකරු විසින් දෙනු ලැබිය යුතු ය : තක්සේරු දැන්වීම.

එසේ වුව ද XIV වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ සේවා යෝජකයකු වෙත එවැනි දැන්වීමක් දෙනු ලැබූ අවස්ථාවක, ගෙවීමට නියම කළ බදු මුදල පමණක් එහි සඳහන් කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

## XXIII වන පරිච්ඡේදය

## අභියාචන

### අ- කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන

කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන.

**165**. (1) මේ පනත යටතේ කරනු ලැබූ තක්සේරුවක මුදල හෝ මේ පනතේ කාර්යයන් සඳහා කරනු ලැබූ යම් වටිනාකම් තක්සේරුවක මුදල සම්බන්ධයෙන් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් තක්සේරුව පිළිබඳ දැන්වීමේ දිනයෙන් පසු දින තිහක කාලසීමාවක් ඇතුළත, ඒ තක්සේරුවට හෝ වටිනාකම් තක්සේරුවට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

එසේ වුව ද ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුර වීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා ඒ කාලසීමාව ඇතුළත අභියාචනය කිරීමට අභියාචකට නොහැකි වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විට අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාල සීමාව දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(2) සෑම අභියාචනයක්ම කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමුකරනු ලබන ලිඛිත පෙත්සමක මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ අභියාචනයට හේතු පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව, වාර්තාවක් සපයා නැති අවස්ථාවක කරන ලද නම්, නිසියාකාරව පිළියෙල කරන ලද වාර්තාවක් සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරුවක් සම්බන්ධයෙන් වූ මුදලට විරුද්ධ (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකුම (ඒ තැනැත්තා විසින් දැනටමත් එලෙස කර ඇතිනම් මිස) ඒ තක්සේරු වර්ෂය සඳහා එ තැනැත්තා විසින් සපයන ලද වාර්තාවේ පදනම මත ඔහු විසින් ගෙවිය යුතු බදු මුදල තක්සේරුව සම්බන්ධයෙන් වූ ඒ දැන්වීමේ දිනය දක්වා ඒ මත උපචිත යම් දණ්ඩනයක් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය. තවද එම ගෙවීම ඔප්පු කිරීමෙහිලා කුවිතාන්සියක් අභියාචනා පෙත්සමට අමුණනු ලැබිය යුතු ය :

එසේ වුව ද තක්සේරුව සම්බන්ධයෙන් ඒ දැන්වීමේ කාලයේ දී හෝ ඊට ආසන්න කාලයක දී අභියාචක විසින් විඳින ලද බරපතල මුදල් දුෂ්කරතා නිසා නැතිහොත් වෙනත් යම් යුක්ති සහගත හේතුවක් නිසා ඒ බද්ද සහ ඒ දණ්ඩනය ගෙවීමෙන් අභියාචක වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වුවහොත් ඒ බද්ද සහ ගෙවීමේ දිනය දක්වා ඒ මත උපචිත දණ්ඩනය ගෙවීම සඳහා කාලය දීර්ඝ කිරීමක් දෙනු ලැබිය හැකි ය. තවද ඒ අනුව ඒ බද්ද සහ ගෙවීමේ දිනය දක්වා ඒ මත උපචිත වන දණ්ඩනය ගෙවීම ඔප්පු කිරීමෙහිලා ඒ දීර්ඝ කරනු ලැබූ කාලය ඇතුළත ඉදිරිපත් කරන ලද කූවිතාන්සියක් මේ වගන්තියේ කාර්ය සඳහා අභියාචන පෙත්සමට අමුණනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවලට විධිවිධානවලට අනුකූල නොවන අභියාචන පෙත්සමක් වලංගු නොවිය යුතු ය.

(6) එවැනි සෑම අභිධානයනක්ම එහි ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත ලැබුනුබව දැනුම්දිය යුතු අතර එසේ දැනුම් දෙනු ලැබූ විට, මේ වගන්තියේ කාර්යය සඳහා ලැබුනු බව දැන්වීමේ ලිපියේ දිනය එම අභිධානය ලැබුනු දින ලෙස සලකනු ලැබිය යුතු ය. කෙසේ වුවද, යම් අභිධානයක් ලැබුණු බව දැනුම්දෙනු ලැබූ විට, එම අභිධානය කොමසාරිස් ජනරාල්වරයා වෙත භාරදුන් දිනය කොමසාරිස් ජනරාල්වරයා වෙත එය හෝ දෙනු ලැබුනු දිනය ලෙස සලකු ලැබිය යුතු ය.

(7) වලංගු අභියාචන පෙත්සමක් ලැබීමෙන් පසු කොමසාරිස් ජනරාලවරයා විසින් අභියාචනය ඉදිරිපත් කර ඇතතේ යම් තක්සේරුකරුවකුගේ තක්සේරුවකට එරෙහිව ද, ඒ තක්සේරුව කළ තක්සේරුකරු හැර වෙනත් තක්සේරුවකුගේ මාර්ගයෙන් වැඩිදුර පරීක්ෂණ කිරීමට සැලැස්විය හැකි අතර, අභියාචන පෙත්සමෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඒ පරීක්ෂණයේ දී එකඟ වීමකට එළඹුණහොත් තක්සේරුවෙහි අවශ්‍ය සකස් කිරීම කළ යුතු ය.

(8) (7) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අභියාචක හා තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක, 168 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ යුතු ය.

(9) සෑම අභියාචකයකුම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයේ කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතුය. පුද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකුගේ

මාර්ගයෙන් හෝ අභියාචක විභාගයට පෙනී සිටිය හැකි ය. අභියාචන විභාගය අඩාලව කල් තැබීම යෝග්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සිතන්නේ නම්, නියම කරනු ලබන වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්වීම පිණිස එය ඔහු විසින් එසේ කලින් කල අඩාලව කල් තැබිය හැකි ය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩාලව කල් තැබිය හැකි අතර අභියාචනය විභාග කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ නම්, අවාලව කල් තැබූ අභියාචනයේ විභාගය සඳහා නියමිත වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පුද්ගලිකව පැමිණ සිටිය යුතු යයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය. අභියාචනයේ විභාගය සඳහා හෝ අඩාලව කල් තැබූ විභාගය සඳහා හෝ නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිම අභියාචක විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් නැතහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලිකව පැමිණ සිටීමට අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත ඒ අභියාචන විභාගයේ දී හෝ අඩාලව කල් තැබූ යම් විභාගයක දී හෝ ඔහු හෝ ඔහුගේ බලය ලත් නියොජිතයා නිසි පරිදි පැමිණ සිටීම වළක්වනු ලැබුයේ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුර භාවය හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බවට අභියාචක විසින් කොමසාරිස් ජනරාල්වරයි සෑහීමකට පත්කරනු ලැබුවහොත් කොමසාර්ස් ජනරාල් විසින් නිෂ්ප්‍රභ කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකි ය.

(10) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස් ජනරාල්වරයාට තිබිය යුතු අතර ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකිය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්තිසහගත වියදමක් ලබාගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකිය.

(11) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකතොත් යම් තැනැත්තකු වෙත ලියවි ල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූද එම දැන්වීමෙහි නිශ්චය කරනු ලබන්නා වූද යම් ඔප්පු, පිඹුරු, සාදන

පත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, නාම ලේඛන, චෙක් පත්, ගෙවීම්, පත්‍රිකා, විගණක වාර්තා හෝ වෙනත් ලේඛනද ඒ දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව ඇතුළත පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත එවන ලෙස හෝ ඒ තැනැත්තාට නියම කළ හැකි ය.

(12) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබාගැනීම හෝ තබාගැනීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කල යුතු ය.

(13) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට විරුද්ධව ද එම තක්සේරුව, මේ වගන්තිය යටතේ අභියාචනයක් තීරණය කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්ථිර කරනු ලැබිය හැකි ය; නැතහොත් අඩු කරනු ලැබිය හැකි ය, නැතහොත් වැඩි කරනු ලැබිය හැකි ය, නැතහොත් අවලංගු කරනු ලැබිය හැකි ය. තව ද අභියාචනය පිළිබඳ තීරණය ලියවිල්ලක් මගින් අභියාචකට දන්වනු ලැබිය යුතු ය.

(14) මේ වගන්ති යටතේ ඉදිරිපත් කරන ලද සෑම අභියාචනා පෙත්සමක් ම, එම අභියාචනය පිළිබඳ එකඟත්වය අදාළ හෝ සම්බන්ධ හෝ තීරණය–

(අ) එම අභියාචනයට අදාළ හෝ සම්බන්ධ එයින් උපචිත වූ ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ අභියාචන විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරනයක් වෙත යොමු කරනු ලැබුවා වූ ද, යම් කාරණයක් පිළිබඳව එම අධිකරණයේ තීරණය ; හෝ

(ආ) (i) (අභියාචන පෙත්සම කොමසාරිස් ජෙනරාල්වරයා වෙත ලැබුන දින සිට අවුරුදු දෙකක් ඉකුත්වීමට මාස හයකට නොඅඩු කාළයකට පෙරාතුව දෙන ලද දැන්වීමක් වූ) තක්සේරුකරුවකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස හෝ යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ලිඛිතව දෙනු ලබන දැන්වීමක් මගින් අභියාචකට නියම කරනු ලැබීමේ දී අභියාචක විසින් එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ යම් ක්‍රියාමාර්ගයක් ගැනීම මිස ;

(ii) කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරුකරුවකු හැර වෙනත් යම් තැනැත්තකු විසින් යම් ලෙඛනයක් ඉදිරිපත් කිරීම හෝ යම් ක්‍රියාමාර්ගයක් ගැනීම

මත රඳා පවතින්නේ නම් මිස, එම අභියාචනා පෙත්සම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුනු දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත එම අභියාචනා පෙත්සම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා එකඟවිය යුතුය; නැතහොත් ඒ පිළිබඳව තීරණය කල යුතු ය.

එම කාලසීමාව ඇතුළත දී එම අභියාචනය එකඟත්වයකට පත් කරනු නොලබන්නා වූ හෝ තීරණය කරනු නොලබන්නා වූ හෝ යම් අවස්ථාවක, එම අභියාචනයට ඉඩ දෙනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බදු අයකරගනු ලැබිය යුතු ය.

(15) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තීරකවරයන්ගේ මූල මණ්ඩලයක් විය යුතු ය. තීරකවරයන්ගේ මූල මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය. මේ පරිච්ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති බලතලවලින් බලය දීමේ දී සඳහන් කරනු ලබන කවර හෝ බලයක්, එවැනි යම් තීරකයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය.

ආ- සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචන

සමාලෝචන මණ්ඩලයෙහි සංයුතිය.

**166**. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට අභියාචන විභාග කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් විසි දෙනකුට වැඩි නොවන ගණනකින් සමන්විත (මෙහි මින් මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) සමාලෝචන මණ්ඩලයක් විය යුතු ය. එසේ පත් කරන ලද මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(2) මණ්ඩලයේ ලේකම්වරයකු විය යුතු අතර ඔහු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ නීති උපදේශකයන් තුන්දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වන මණ්ඩලයක් තිබිය යුතු අතර ඔවුන් මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතු ය.

(4) අභියාචන විභාග කරන රැස්වීම්වලට සහභාගිවීම සඳහා මණ්ඩලයේ සාමාජිකයන් තුන්දෙනකු හෝ ඊට වැඩි ගණනක් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු අතර ඔහු ලේකම්වරයා විසින් කැඳවනු ලැබිය යුතු ය. එවැනි රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(5) මණ්ඩලයේම රැස්වීමක් කැඳවීම කොමසාරිස් ජනරාල්වරයාගේ ඉල්ලීම පිට මණ්ඩලයේ ලේකම්වරයා විසින් කළ යුතු ය. එවැනි රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(6) මණ්ඩලයේ සාමාජිකයන්ගේ, ලේකම්වරයාගේ සහ නීති උපදේශකයන්ගේ පාරිශ්‍රමික, අමාත්‍යවරයා විසින් නියම කළ යුතු ය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන කිරීම.

**167**. (1) 165 වන වගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද තීරණයක් පිළිබඳව සෑහීමට පත් නොවූ යම් අභියාචකයකු හෝ අභියාචකයේ බලය ලත් නියෝජිතයකු හෝ විසින් ඒ තීරණය පිළිබඳව තමා සෑහීමට පත් නොවන බව කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය හැකි ය. එවැනි සෑම දැනුම් දීමක්ම, තීරණයේ දින සිට සතියක් ඇතුළත දී කළ යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා ගේ තීරණයෙන් තමා සෑහීමට පත්නොවන බව (1) වන උපවගන්තියට අනුව අභියාචක විසින් දැනුම් දී ඇති අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ එම තීරණයට හේතු ඒ තීරණයේ දින සිට එක් මාසයක් ඇතුළත අභියාචක වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත හෝ ලියවිල්ලකින් දන්වා යැවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්වකීය තීරණයට හේතු දක්වා යැවූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව, අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ මණ්ඩලය වෙත යොමු කරන ලද ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් අභියාචනයක් කළ හැකි අතර -

(අ) අභියාචනය කරනු ලබන්නේ කොමසාරිස් ජනරාල්වරයා ගේ යම් තීරණයකට හා හේතුවලට විරුද්ධව ද ඒ තීරණයෙහි හේතුවල පිටපතක් එවැනි සෑම පෙත්සමක් සමඟ විය යුතු ය ;

(ආ) එවැනි සෑම පෙත්සමකම අභියාචනයට හේතු පැහැදිලිව දක්වා තිබිය යුතු ය ; තව ද,

(ඇ) එවැනි සෑම පෙත්සමක්ම මණ්ඩලයේ ලේකම්වරයා වෙත භාරදිය යුතු ය.

කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන යොමු කළ හැකි බව.

**168**. 165 වන වගන්තයෙහි විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරන ලද යම් වලංගු අභියාචනයක් ඔහු විසින් සමාලෝචන මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් එවැනි අභියාචනයක් විභාග කොට තීරණය කළ යුතු අතර, එසේ යොමු කරනු ලබන යම් අභියාචනයක් විභාග කර තීරණය කිරීම සම්බන්ධයෙන් 169 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

සමාලෝචන මණ්ඩලය විසින් අභියාචන විභාග කිරීම සහ තීරණය කිරීම.

**169**. (1) අභියාචනයක් ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අභියාචනය විභාග කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් මණ්ඩලයේ ලේකම්වරයා විසින් නියම කළ යුතු අතර ඒ පිළිබඳව අභියාචක සහ කොමසාරිස් ජනරාල්වරයා යන දෙදෙනාටම දින දහ හතරක දැනුම්දීමක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට, 165 වන වගන්තියේ (12) වන උපවගන්තිය යටතේ තබාගන්නා ලද සාක්ෂි වාර්තාවෙහි පිටපතක් මණ්ඩලය වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් යැවිය යුතු ය.

(3) අභියාචනය විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමක දී සෑම අභියාචකයකු ම පුද්ගලිකව හෝ බලය ලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් පෙනී සිටිය යුතු ය :

එසේ වුව ද අභියාචනයක් විභාග කිරීමේ දී අභියාචක විසින් බලය පවරන ලද නියෝජිතයා පැමිණ සිටින අවස්ථාවක අභියාචකට පුද්ගලිකව පැමිණ සිටීමට හැකි වීම පිණිස අවශ්‍ය යයි මණ්ඩලය සලකන කාලයකට විභාගය කල් තැබිය හැකි ය.

(4) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව කළ තක්සේරුකරු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද වෙනත් තැනැත්තකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව සනාථ කිරීම පිණිස, ඒ අභියාචනය විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමට පැමිණ සිටිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, අභියාචනය මත කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරන ලද හෝ 168 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් යොමුකරන ලද හෝ තක්සේරුව අධික යයි හෝ වැරදි යයි ඔප්පු කිරීමේ භාරය අභියාචක සතු විය යුතු ය.

(6) සියලුම අභියාචන රහසිගතව විභාග කළ යුතු ය.

(7) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි මණ්ඩලය සලකන යම් තැනැත්තකු විභාගයේ දී පැමිණ සිටීම සඳහා කැඳවීමට මණ්ඩලයට බලය තිබිය යුතු අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ සාක්ෂිකරුවකු ලෙස විභාග කරනු ලැබිය හැකි ය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්ති සහගත වියදමක් ලබාගැනීමට මණ්ඩලය විසින් ඔහුට ඉඩ සැලසිය හැකි ය.

(8) මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමයන්ට අනුව මණ්ඩලය විසින් පවත්වනු ලබන විභාගයකදී කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ ඉදිරිපත් කරනු නොලැබූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ සාක්ෂි මෙහෙයවනු නොලැබූ හෝ විභාගයේදී සාක්ෂි එවකටවත් සටහන් කරගනු ලැබ ඇති සාක්ෂිකරුවකුගේ සාක්ෂි මෙහෙයවීමට අභියාචකට ඉඩ නොදිය යුතුය.

(9) අභියාචනය විභාග කිරීමේ දී ඉදිරිපත් කරනු ලැබූ වාචික හෝ ලේඛනමය යම් සාක්ෂියක් (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් පිළිගත හැකි ය. නැතහොත් ප්‍රතික්ෂේප කළ හැකි ය. තව ද සාක්ෂිවල අවේශ්‍යතාව සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(10) අවස්ථාවෝචිත පරිදි, අභියාචනය මත කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබ හෝ 168 වන වගන්තිය යටතේ ඔහු විසින් යොමු කරනු ලැබූ තක්සේරුව, මණ්ඩලය විසින් අභියාචනය විභාග කිරීමෙන් පසු, ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම නැතහොත් අවලංගු කිරීම කළ යුතු ය. නැතහොත් ඒ සම්බන්ධයෙන් මණ්ඩලයේ නිර්දේශය ද සමඟ එය කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු යැවිය හැකි ය. මණ්ඩලය විසින් තක්සේරුව සහ නිර්දේශ එසේ ආපසු යවනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් මණ්ඩලයේ නිර්දේශයට අනුව තක්සේරුව අවශ්‍ය පරිදි ප්‍රතිශෝධනය කළ යුතු ය. මණ්ඩලයේ තීරණය අභියාචක සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය :

එසේ වුව ද, ඒ අභියාචනයක් විභාග කිරීම ආරම්භ කළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත මණ්ඩලය විසින් අවස්ථාවෝචිත පරිදි එම අභියාචනය පිළිබඳ තීරණය දීම හෝ එහි මතය ප්‍රකාශ කිරීම කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, තවදුරටත් යම් අභියාචනයක් විභාග කිරීම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම ආරම්භ කර ඇති අවස්ථාවක, එම අභියාචනය පිළිබඳ තීරණය දීම හෝ ඒ පිළිබඳව මතය ප්‍රකාශ කිරීම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ සිට අවුරුදු දෙකක් ඇතුළත කරනු ලැබිය යුතු ය.

(11) (10) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ඒ තක්සේරුව අඩු නොකළ විට හෝ අවලංගු නොකළ විට රුපියල් පන්සියයක් නොඉක්මවන මුදලක් මණ්ඩලයේ ගාස්තු වශයෙන් ගෙවන ලෙස මණ්ඩලය විසින් අභියාචකට නියම කළ හැකි අතර තක්සේරුව මගින් ගෙවීමට නියම කරනු ලැබූ බද්දට එය එකතු කොට බද්ද සමග අය කරගත යුතු ය.

ඈ - අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනය.

**170**. (1) මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතුය :

එසේ වුව ද නීති ප්‍රශ්නයක් ගැන තීරණයක් සඳහා අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස අභියාචක විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් මණ්ඩලයෙන් ඉල්ලීමක් කළ හැකි ය. මණ්ඩලයේ තීරණය අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙන ලද දිනයෙහි සිට මාසයක් ඇතුළත රුපියල් එක්දහස් පන්සියයක ගාස්තුවක් ද සමග ලියවිල්ලක් මගින් මණ්ඩලයේ ලේකම්වරයා වෙත භාර දෙනු ලැබුවහොත් මිස, එවැනි ඉල්ලීමක් භාර නොගත යුතු ය.

(2) මණ්ඩලය විසින් ඉදිරිපත් කරන කරුණු සැලකිරීමෙහි, අදාළ කාරණය ද මණ්ඩලයේ තීරණය ද ආරාවුලට හේතු වූ බදුවල ප්‍රමාණය රුපියල් පන්දහසකට වැඩි නම් ඒ බදු ප්‍රමාණය ද දක්වා තිබිය යුතු අතර එම කරුණු සැලකිරීම ඉදිරිපත් කරන ලෙස මණ්ඩලයෙන් ඉල්ලා සිටින පාර්ශ්වකරු විසින් කරුණු සැලකිරීම, සැලකිරීමෙන් සහ අත්සන් කිරීමෙන් පසු තමා වෙත ලැබීමෙන් දින දහ හතරක් ඇතුළත අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

(3) 1982 අංක 43 දරන මුද්දර ආඥා පනතේ විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා -

(අ) අභියාචනාධිකරණය වෙත මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමක් පිළිබඳව හෝ එබඳු කරුණු සැලකිරීමක් විභාග කිරීමට, නිශ්චය කිරීමට හෝ එබඳු කරුණු සැලකිරීමකට සුදුස්සක් කිරීමට අදාළව අභියාචනාධිකරණය ඉදිරියේ පවත්වනු ලබන රුපියල් පන්දහසක හෝ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි ආරාවුලට හේතු වූ බදු ප්‍රමාණය වශයෙන් මණ්ඩලය විසින් දක්වනු ලබන වැඩි මුදලක හෝ වටිනාකම ඇති, අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සියලු නඩු කටයුතු සිවිල් නඩු කටයුතු ලෙස සැලකිය යුතු ය ;

(ආ) එසේ ඉදිරිපත් කරන ලද සෑම කරුණු සැලකිරීමක් ම මණ්ඩලය විසින් අමුණනු ලැබූ පොත්, ලේඛණ සහ කඩදාසි සමඟ අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුත්තක තනි ඉදිරිපත් කිරීමක් ලෙස සැලකිය යුතු ය ; තව ද

(ඇ) කොමසාරිස් ජනරාල්වරයා අභියාචක නම් නිල බලයෙන් වූ නඩුවක, නඩු පවරන රජයේ නිලධරයකු වශයෙන් ද, ඔහු අභියාචනයෙහි වග උත්තරකරු නම්, නිල බලයෙන් වූ නඩුවක, තමාට විරුද්ධව නඩු පවරන ලද රජයේ නිලධරයකු වශයෙන් ද ඔහු සලකනු ලැබිය යුතු ය.

(4) අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින පාර්ශ්වකරු විසින් ඒ කරුණු සැලකිරීම එසේ ඉදිරිපත් කරන වේලෙහි හෝ ඊට පෙර, ස්වකීය ඉල්ලීම පරිදි කරුණු සැලකිරීමක් කරනු ලැබූ බව දන්වමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් අනෙක් පාර්ශ්වකරු වෙත යැවිය යුතු අතර, ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි පිටපතක් ද ඒ පාර්ශ්වකරු වෙත සැපයිය යුතු ය.

(5) ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමක්, සංශෝධනය කිරීම පිණිස, අභියාවානාධිකරණයෙහි යම් විනිශ්චයකාරවරයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් මණ්ඩලය වෙත ආපසු එවනු ලැබිය හැකි ය. ඒ අනුව මණ්ඩලය විසින් කරුණු සැලකිරීම සංශෝධනය කළ යුතු ය.

(6) ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙන් උද්ගත වන යම් නීති ප්‍රශ්නයක් අභියාචනාධිකරණයෙහි විනිශ්චයකාරවරයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් හෝ විසින් විභාග කොට නිශ්චය කළ යුතු ය. ඒ ප්‍රශ්නය පිළිබඳව අධිකරණයෙහි තීරණයට අනුව, මණ්ඩලය විසින් කරන ලද තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩිකිරීම හෝ අවලංගු කිරීම ඒ විනිශ්චයකාරවරයන් විසින් කළ හැකි ය. නැතහොත් ඒ පිළිබඳ

අධිකරණයෙහි නිර්දේශ සමග, කරුණු සැලකිරීම, මණ්ඩලය වෙත යැවිය හැකිය. අධිකරණය විසින් කරුණු සැලකිරීමෙන් එසේ යවනු ලැබූ කල්හි අධිකරණයේ නිර්දේශයට අනුව මණ්ඩලය විසින් ඒ තක්සේරුව ප්‍රතිශෝධණය කළ යුතු ය.

(7) අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩුවේ තීරණයක් කරනතුරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක පදනම මත, ආරාවුලට තුඩු දී ඇති බදු ප්‍රමාණය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් අයකර ගත හැකි බදු ප්‍රමාණය සම්බන්ධයෙන්, අතුරු තීරණයක් කළ හැකිය.

(8) අභියාචනාධිකරණයට ඉදිරියේ මේ වගන්තිය යටතේ වූ යම් නඩුවකදී අභියාචනාධිකරණයේ ගාස්තු සම්බන්ධයෙන් ද (1) වන උපවගන්තිය යටතේ ගෙවනු ලැබූ මුදල සම්බන්ධයෙන් ද සුදුසු යයි අධිකරණයට පෙනීයන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(9) (6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරුනු ලැබූ යම් ආඥාවකට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කිරීමට හැකි කරවීමේ කාර්යය සඳහාත් අභියාචනාධිකරණයේ තීරණය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහාත් -

(අ) (6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥාවක් සහ (8) වන උපවගන්තිය යටතේ ඒ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවක් කොමසාරිස් ජනරාල්වරයා හා ඒ අනෙක් පාර්ශ්වකරු අතර සිවිල් නඩුවක දී අභියාචනාධිකරණය විසින් කළ අවසාන නඩු තීන්දුවක් ලෙස සැලකිය යුතු ය:

(ආ) එවැනි සිවිල් නඩුවක, ආරාවුලට තුඩුදුන් කාරණයෙහි වටිනාකම රුපියල් පන්දහසක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද මණ්ඩලය විසින් ආරාවුලට හේතු වූ බදු ප්‍රමාණය වශයෙන් රුපියල් පන්දහසකට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහිලා දක්වා ඇති අවස්ථාවක, එවැනි සිවිල් නඩුවක ආරාවුලට තුඩුදුන් කාරණයෙහි වටිනාකම, එසේ දක්වා ඇති වැඩි ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ඇ) එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් එවැනි යම් ලිඛිත නීතියකින් නියමිත යම් මුදලක් තැන්පත් කරන ලෙස හෝ, යම් ගාස්තුවක් ගෙවන ලෙස හෝ යම් ඇපයක් තබන ලෙස කොමසාරිස් ජනරාල්වරයාට නියම කරනු නොලැබිය යුතු ය.

XXIV වන පරිච්ඡේදය

## තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩන

**171**. තක්සේරු කළ හැකි ආදායම් ප්‍රමාණය සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවකට විරුද්ධ 165 (1) වන වගන්තියෙහි නිශ්චිත කාලය ඇතුළත වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, හෝ එබඳු තක්සේරුවකට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් 165 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ නිෂ්ප්‍රභා කර ඇති අවස්ථාවක හෝ 165 (7) වන වගන්තිය යටතේ ඒ තක්සේරු කළ හැකි ආදායම පිළිබඳව එකඟත්වයක් ඇති කර ගනු ලැබූ අවස්ථාවක හෝ ඒ තක්සේරු කළ හැකි ආදායම අභියාචනයේ දී තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක හෝ අවස්ථාවෝචිත පරිදි තක්සේරු කරනු ලැබූ හෝ එකඟ වනු ලැබූ හෝ අභියාචනයේදී නිශ්චය කරනු ලැබූ තක්සේරුව, අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරු කළ හැකි ආදායමේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්යයන් සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය: (තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව.)

එසේ වුව ද යම් තක්සේරු වර්ෂක් සඳහා අභියාචනයකින් නිශ්චය කරනු ලැබූ කාරණාවක් නැවත සලකා බැලීමක් සිදුනොවන යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් යම් තක්සේරුවකු විසින් 163 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව කරනු ලැබීම මේ පනතෙහි කිසිවකින් වැළැක්වෙතැයි නොසැලකිය යුතු අතර එසේ වැළැක්වෙතැයි තේරුම් නොගත යුතු ය.

**172**. (1) යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් කරනු ලැබූ තක්සේරුවක, තක්සේරු කළ හැකි ආදායමෙහි හෝ බදු අය කළ හැකි ප්‍රමාණය 106 වන වගන්තියේ (1)වන උපවගන්තිය හෝ 106 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඔහු විසින් සපයන ලද වාර්තාවෙහි තමාගේ තක්සේරු කළ හැකි ආදායම හෝ බදු අය කළ හැකි හෝ ලෙස නිශ්චය කොට ඇති ප්‍රමාණයට වඩා වැඩි වන්නා වූ ද, ඒ තක්සේරුව 171 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ වාර්තාවෙහි ආදායම හෝ යම් අඩුකිරීමක් පිළිබඳ යම් ඉල්ලීමක් හෝ එම තැනැත්තා පිළිබඳ යම් සහනයක් හෙළි කිරීමේ දී වංචා කිරීමක් හෝ චුවමනාවෙන්ම අතපසු කිරීමක් සිදු වී නැති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, සාවද්‍ය වාර්තාවක් සැපයීම ගැන දණ්ඩනයක් වශයෙන් එකතුව රුපියල් දෙදහසකට වැඩි නොවන මුදලක් සහ අතිරික්ත ප්‍රමාණයට අදාළ බද්දෙහි දෙගුණයකට (සාවද්‍ය වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනය.)

වැඩි නොවන මුදලක් නියම කරනු ලබන දිනයක හෝ ඊට පෙර ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමක් කරනු ලැබුවේ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා විසින්, නියමය ඔහු වෙත දැනුම් දෙනු ලැබීමෙන් පසු දින විසි එකක් ඇතුළත ඊට විරුද්ධව සමීක්ෂණ මණ්ඩලය වෙත ලියවිල්ලකින් අභියාචනය කළ හැකි ය. නියමයට විරුද්ධ වීමේ හේතු අභියාචනයෙහි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ සෑම අභියාචනයක් විභාග කර ඊට සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හැකිතාක් දුරට 169 වන වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයා ගේ නියමය මගින් පනවනු ලැබුවා වූ ද අභියාචනයට විෂය වූ දණ්ඩන මුදල ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම නැතහොත් අවලංගු කිරීම සමීක්ෂණ මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය. එහෙත් ඒ දණ්ඩන මුදලෙහි යම් වැඩි කිරීමක් ඒ දණ්ඩන මුදල වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පනවනු ලැබිය හැකි උපරිම ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු ය.

(4) යම් තැනැත්තෙකුගේ ආදායම පිළිබඳ වාර්තාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩල මුදලක් ඒ තැනැත්තා කෙරෙහි පනවනු ලැබූ අවස්ථාවක 202 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ හෝ 204 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ හෝ ඒ වාර්තාව සම්බන්ධයෙන් වූ වරදකට නඩු පවරනු ලැබීමට ඔහු යටත් නොවිය යුතු ය.

## XXV වන පරිච්ඡේදය

## පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල්

පැහැර හරිනු ලැබූ බද්ද හා එයට එකතු කරනු ලබන මුදල්

**173**. යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ බද්දක ත්‍රෛමාසික වාරිකය හෝ එවැනි වාරිකයකින් කොටසක් හෝ ගෙවීම සඳහා 113 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි නිශ්චිත දිනයෙහි හෝ ඒ දිනයට පෙර හෝ බද්දෙහි එම වාරිකය හෝ වාරිකයකින් කොටස ගෙවා නොමැති අවස්ථාවක හෝ යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරුකරුවෙකු විසින් තක්සේරු කරනු ලැබුවා වූ ද, තක්සේරු දැන්වීමෙහි නිශ්චිත දිනයෙහි (එම දිනය 113 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන යම් බද්දක් සම්බන්ධයෙන් වූ විට එම බද්ද හෝ එහි කොටස ගෙවිය යුතු වන්නේ යම් දිනකට පෙර ද ඒ දිනයට පූර්වයෙන් වූ

දිනයක් විය යුතු ය.) හෝ ඒ දිනයට පෙර ගෙවීමට නියමව ඇත්තා වූ ද බද්දක් හෝ බද්දකින් කොටසක් ගෙවා නොමැති අවස්ථාවක එම බද්ද හෝ බද්දෙහි කොටස ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර –

(අ) එම බද්ද එක් තැනැත්තකු විසින් ගෙවිය යුතු වන අවස්ථාවක ඒ තැනැත්තා ද ;

(ආ) ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතු වන අවස්ථාවක ඒ එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු ද,

මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 113 වන වගන්තියේ (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ සඳහන් බද්ද ගෙවීම සඳහා නිශ්චිතව සඳහන් දිනයෙහි හෝ එදිනට පෙර සමාගමක් විසින් ගෙවිය යුතු සම්පූර්ණ බද්ද හෝ ඒ බද්දෙන් කොටසක් හෝ එසේ ගෙවා නොමැති අවස්ථාවක, ඒ බද්ද හෝ එහි කොටස පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ කාර්යය සඳහා ඒ සමාගම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් බද්දක් පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින් පැහැර හරිනු ලැබූ බද්දට අතිරේකව –

(අ) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක්; සහ

(ආ) ඒ බද්ද පැහැර හරිනු ලැබීමට පත්ව දින තිහක් ඉකුත්වීමට පෙර බද්ද ගෙවනු නොලබන අවස්ථාවක, පැහැර හරිනු ලැබ පවත්නා කාලය තුළ දින තිහක එක් එක් වැඩිපුර කාලසීමාවක් හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ බද්දෙන් සියයට දෙකකට සමාන මුදලක වැඩිපුර දණ්ඩන මුදලක්,

ගෙවිය යුතු ය :

එසේ වුව ද –

(i) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩන මුදලක් ලෙස ගෙවිය යුතු මුළු මුදල කිසිම අවස්ථාවක ගෙවීම පැහැර හරින ලද බද්දෙන් සියයට පනහක් නොඉක්ම විය යුතු ය ;

(ii) යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් හතරෙන් එකකට අඩු නොවන මුදලක්, ත්‍රෛමාසික බදු වාරික ගෙවිය යුතු වූ තක්සේරු වර්ෂයේ, ත්‍රෛමාසික තක්සේරු වර්ෂය සඳහා ගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තා ඒ ත්‍රෛමාසික වාරිකය වෙනුවෙන් ඒ ත්‍රෛමාසික බදු වාරික ගෙවිය යුතු වූ ඒ තක්සේරු වර්ෂය ඉන් පසු ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, සැප්තැම්බර් මස තිස්වන දින තෙක් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා "ආදායම් බද්ද" යන්න –

(අ) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂය සඳහා 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු බද්ද ඊට ඇතුළත් නොවිය යුතු ය ; තව ද,

(ආ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂයට ඉහතින් වූ තක්සේරු වර්ෂය (එය මෙහි මින් මතු "ඉහතින් වූ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) සඳහා පදිංචි නිවාසයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද යම් සහනාධාරයක් හැර) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ යම් ලාභ සහ ආදායම සම්බන්ධයෙන් කර තිබුණු නිදහස් කිරීමක් ඉහතින් වූ වර්ෂයේ දී නතර කරන ලදුව ඒ ආදායම සහ ලාභ ඒ තැනැත්තාගේ බදු ගෙවිය යුතු ආදායම ආගණනය කිරීමේ දී ඒ තක්සේරු වර්ෂය සඳහා ගණන් ගනු ලැබ තිබුණේ නම්, ඒ ආදායමේ වර්ෂයට ඉහතින් වූ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු ආදායම් බද්ද ඉන් අදහස් වේ ;

(ඇ) කාරණයේ සියලු අවස්ථාගත කරුනු අනුව, අඩු කිරීමක් නැතහොත් අත්හැරීමක් කිරීම සාධාරණ යයි සහ යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම් මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් අඩු කිරීම හෝ අත්හැරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(4) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 96ආ වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට ඉහතින් වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් බද්දක්, 1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින් පැහැර හරින ලද බද්දට අතිරේකව, දණ්ඩනයක් වශයෙන්, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 96ආ වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාර දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් සහ 1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පැහැර හරින ලද මුදලින් සියයට විසිපහකට සමාන වැඩිපුර මුදලක් ගෙවිය යුතු ය.

(5) තක්සේරුවකු විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තක්සේරුවක් කරනු ලැබ ඇති අවස්ථාවක, තක්සේරු දැන්වීමෙහි නිශ්චිත බදු මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු බද්ද ලෙස (3) වන උපවගන්තියේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(6) තක්සේරුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත ද ඒ අභියාචනයේ තීරණය ලැබෙන තෙක් යම් බද්දක් හෝ එහි යම් කොටසක් ගෙවීම අත්හිටුවා තබන ලෙස කොමසාරිස් ජනරාල්වරයා නියම කළහොත් මිස, එය ගෙවිය යුතු ය. එසේ ගෙවීම අත්හිටුවා තබන ලද බද්දෙහි හෝ ඒ කොටසෙහි මුදල ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස නොසැලකිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ, ගෙවීම් අත්හිටුවා තබන ලද බද්ද හෝ එහි යම් කොටසක් අයකර ගත නොහැකි වීමට ඉඩ ඇති බව හෝ අභියාචක තම අභියාචනයේ කටයුතු අයුක්ති සහගත ලෙස ප්‍රමාද කරන බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, තමා ඒ උපවගන්තිය යටතේ කළ නියමය අවලංගු කර කාරණයට අවශ්‍ය යයි ඔහුට පෙනී යා හැකි යම් අලුත් නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයක දී හෝ ඊට පෙර නොගෙවන ලද යම් බද්දක මුදල, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(8) XXIII වන පරිච්ඡේදය යටතේ අභියාචනයක් පිළිබඳ අවසාන තීරණය කරනු ලැබූ විට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ නියමයක් අනුව හෝ, (6) වන උපවගන්තිය යටතේ ගෙවීම අත්හිටුවා තබන ලද යම් බද්දක් ගෙවිය යුතු බවට පත්වන අවස්ථාවක හෝ මුල් තක්සේරුවෙන් නියම කරන ලද බද්ද වැඩිකරනු ලැබූ අවස්ථාවක, යම් බද්දක් හෝ බද්දක ශේෂයක් යම් දිනයක හෝ ඊට පෙර ගෙවිය යුතු ද ඒ දිනය නියම කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචක වෙත ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය. ඒ අනුව ගෙවනු නොලැබූ යම් බද්දක්, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(9) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ ද තක්සේරු දැන්වීමෙහි නිශ්චිත බද්ද ගෙවීම කොමසාරිස්වරයාගේ නියමයක් පිට අත්හිටුවා තබන ලද්දා වූ ද අවස්ථාවක, ඒ තක්සේරුව වෙනුවෙන් තමාගෙන් යම් කිසි මුදලක් අයවිය යුතු ව ඇති බවට හෝ අයවිය යුතු වීමට ඉඩ ඇති බවට, ඒ අභියාචනය පරීක්ෂා කරනු ලබන හෝ විභාග කරනු ලබන අවස්ථාවේ දී අභියාචක එකඟ වුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචක වෙත ලියවිල්ලකින් කරනු ලබන දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි නිශ්චිත දිනයෙහි හෝ එදිනට පෙර හෝ එම මුදල ගෙවන ලෙස අභියාචකට විධාන කළ හැකි ය. එසේ ගෙවනු නොලැබූ යම් මුදලක් ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(10) ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද (3) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ මුදල් එකතු කර ඇත්තා වූ ද යම් බද්දක් XXIII වන පරිච්ඡේදය යටතේ යම් අභියාචනයක් පිළිබඳව වූ අවසාන තීරණයක් අනුව අවකරණය කරනු ලැබූ අවස්ථාවක ඒ මුදල හෝ මුදල් ගණන් එසේ අවකරණය කරනු ලැබූ බද්ද මත ගණන් බලනු ලැබිය යුතු ය.

(11) යම් බද්දක් ගෙවීමට යටත් යම් තැනැත්තකු ආණ්ඩුව විසින් තමාට ගෙවනු ලැබීමට ඇති යම් මුදලකින් හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි තමාගේ බැරට ඇති මුදල්වලින් හෝ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ යම් විශ්‍රාම වැටුපකින් නැතහොත් අර්ථසාධක අරමුදලකින් තමාට ගෙවනු ලැබීමට ඇති මුදල්වලින් හෝ යම් බද්දක් හෝ වාරිකයක් ගෙවීමට කටයුතු පිළියෙළ කර ඇති බවට ඒ බද්ද හෝ වාරිකය ගෙවීමට නියම කර ඇති දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරන්නා වූ අවස්ථාවක එම බද්ද හෝ වාරිකය ගෙවීම් සඳහා වැඩිපුර කාලයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට දෙනු ලැබිය හැකි ය. එම වැඩිපුර දෙන ලද කාලය ඉකුත් වනතුරු ඒ බද්ද හෝ වාරිකය, ගෙවීම් පැහැර හරින ලද බද්දක් ලෙස නොසැලකිය යුතු ය.

(12) මියගිය තැනැත්තකුගේ බූදලයෙන් යම් බද්දක් අයවිය යුතුව ඇත්තා වූ ද, ඒ බද්ද හෝ එහි යම් වාරිකයක් ගොවීමට ඒ මියගිය තැනැත්තාගේ පොල්මංකරුට නියම කරනු ලැබ ඇති දින හෝ එදිනට පෙර එම බද්ද හෝ වාරිකය ගෙවීම, ප්‍රොබෙට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය තමා වෙත නිකුත් කර නොතිබීම නිසා ඒ දිනයෙහි හෝ එදිනට පෙර කළ නොහැකි බවට ඒ පොල්මංකරු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරන්නා වූ අවස්ථාවක, ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය දෙනු ලැබූ දිනයට පසු මාස දෙකක කාලයක් ඇතුළත ඒ බද්ද හෝ වාරිකය ගෙවනු ලැබී නම්, ඒ බද්ද හෝ වාරිකය ගෙවීම පැහැර හරින ලද්දක් සේ නොසැලකිය යුතු ය.

මේ උපවගන්තියෙහි "පොල්මංකරු" යන යෙදුමට මියගිය තැනැත්තකුගේ දේපලෙහි සන්තකය ලබා ගන්නා හෝ ඒ දේපල සම්බන්ධයෙන් අයුතු ලෙස මැදිහත් වන හෝ යම් තැනැත්තෙක් ඇතුළත් නොවේ.

(13) මේ උපවගන්තියෙහි කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හිටුවා තබන ලද යම් බදු මුදලක්, අභියාචනය තීන්දු කරනු ලැබූ විට සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ගෙවිය යුතු වුවහොත් එවිට, එම අභියාචනය හා සම්බන්ධව 170 වන වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් කර ඇත්නම් මිස ගෙවිය යුතුව තිබෙන යම් මුදලක්, අභියාචනය තීන්දු කරනු ලැබූ දින සිට එක් අවුරුද්දක් ඇතුළත අය කර ගත යුතු ය.

(14) මේ වගන්තියෙහි "බද්ද" යන්නෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම හෝ වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බද්ද සහ යම් සුදුසුකම් ලබන බෙදාහැරීමක් සම්බන්ධයෙන් සමාගමක් විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු යම් අත්තිකාරම් සමාගම් බද්ද අදහස් වේ.

බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් දඬුවම්

**174**. අධ්‍යක්ෂවරයකු හෝ සමාගමක ප්‍රධාන නිලධරයකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයක සාමාජිකයකු හෝ කාරක සභිකයකු ඇතුළුව පිළිවෙළින් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් සංස්ථාපිත නොවන මණ්ඩලයක ඇතුළත් යම් කිසි තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බදු සම්බන්ධයෙන් අයවිය යුතු යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක සහ මාස තිස්හයකට නොවැඩි කාලයක් අඛණ්ඩවම ඒ බදු ගෙවීම පැහැර හැර ඇති විටක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පැහැර හැර ඇති බදු ප්‍රමාණය, පැහැර හැරීම කර ඇති කාලය සහ උපචිත වන දණ්ඩන මුදල සහ පොලිය ඇතුළුව අදාළ තොරතුරු අඩංගු කරමින් සහතිකයක් මහෙස්ත්‍රාත්වරයා වෙත භාරදිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන නිලධරයකු, හවුල්කරුවකු, සාමාජිකයකු හෝ කාරක සභිකයකු ඇතුළත් වන්නා වූ යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස තුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට යටත් විය යුතු ය :

එසේ වුව ද, අධ්‍යක්ෂවරයකු, සමාගමක ප්‍රධාන නිලධරයකු සම්බන්ධයෙන් වන විට, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් ඔහු වගකිවයුතු නොවන බවට හෝ ඒ බදු නොගෙවා සිටීම වැළැක්වීමට ස්වකීය බලතලවල ප්‍රකාරව අවශ්‍ය සියලු පියවර ඔහු විසින් ගෙන ඇති බවට හේතු දැක්වීමට ඒ තැනැත්තාට අවසර දිය හැකි ය.

## XXVI වන පරිච්ඡේදය

## බදු අයකර ගැනීම

බද්දට දඩ ආදිය ඇතුළත් විය යුතු බව

**175**. මේ පරිච්ඡේදයේ ''බද්ද'' යන්නට –

(අ) මේ පනත යටතේ අය කරනු ලබන හා නියම කරනු ලබන ආදායම් බද්ද ;

(ආ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ අය කරනු ලබන්නා වූ ද 2000 අප්‍රේල් මස 1 වන දිනට හෝ ඉන් පසුව පැහැර හරිනු ලැබ තිබුණු හෝ පැහැර හරිනු ලබන්නා වූ ද යම් ආදායම් බද්දක් හෝ ත්‍යාග බද්දක් ;

(ඇ) XIV වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ගෙවන ලෙස සේවා යෝජකයකුට නියම කරන ලද යම් ආදායම් බද්දක් ;

(ඈ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තියේ හෝ මේ පනතේ 113 වන වගන්තියේ සඳහන් වන්නා වූ ද යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු වන්නා වූ ද ආදායම් බද්දක ත්‍රෛමාසික වාරිකය සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් ;

(ඉ) මේ පනත යටතේ හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවන ලෙස සමාගමකට නියම කරනු ලබන යම් අත්තිකාරම් සමාගම් බද්දක් ;

සහ මේ පනතේ 173 වන වගන්තිය හෝ ගෙවීම පැහැර හැරීම හේතුවෙන් යම් බද්දකට එකතු කරන ලද යම් මුදලක් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 144 වන වගන්තිය යටතේ යම් බද්දකට එකතු කරන ලද යම් මුදලක් හෝ මුදල්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 125 වන වගන්තියේ (2) වන හෝ (2 අ) වන උපවගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 96ආ වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ඒ ආදායම් බද්දට ධන බද්දට හෝ තෑගි බද්දට එකතු කරන ලද යම් මුදලක් හෝ මුදල් සහ මේ පනත යටතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ දරන ලද යම් දඩ, දණ්ඩන මුදල්, ගාස්තු හෝ කවර වූ හෝ වියදම් ද ඇතුළත් වේ.

බද්ද ප්‍රථම වැය බැරක් විය යුතු බව.

**176**. (1) ගෙවීම පැහැර හරිනු ලැබූ බදු (2) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පැහැර හරින්නකුගේ සියලු වත්කම් විෂයෙහි ප්‍රථම වැය බරක් විය යුතු ය :

එසේ වුව ද –

(අ) 178 වන වගන්තියේ විධිවිධානවලට අනුව තහනම් කරනු ලැබීමට පෙර, පැහැර හරින්නා විසින් වටිනාකම සඳහා සද්භාවයෙන් මිල දී ගන්නකුට විකුණන ලද වත්කම්වලට ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතු ය ;

නැතහොත් එයට බල නොපෑ යුතු ය ;

(ආ) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට, 178 වන වගන්තිය යටතේ දේපල තහනම් කරන ලද දිනයට පෙර, වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව ලියාපදිංචි කරන ලද බදුකරයකට හො බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් බද්දට නොලැබිය යුතු ය ; තව ද,

(ඇ) චංචල දේපළ සම්බන්ධයෙන් වූ විට, තක්සේරු වර්ෂ එකකට වැඩි ගණනක් සඳහා බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරාගත යුතු එක් අවුරුද්දක් පමණක් සඳහා වූ බදුවලට, පැහැර හැරීමේ දිනයට පෙර, වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.

(2) වස්තු භංගත්වයේ, බංකොලොත්භාවයේ නැතහොත් ඈවර කිරීමේ දිනට පෙරාතුව වූ කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරා ගනු ලබන, එක් සම්පූර්ණ තක්සේරු වර්ෂයක් සඳහා නියම කරන ලද හෝ නියම කරනු ලබන බද්ද, දේපල භාරගැනුම්කරුවකු විසින්, තමාගේ පාලනය යටතේ ඇති වත්කම්වලින්, ඒ වත්කම්වල ප්‍රථම වැය බරක් වශයෙන් ගෙවිය යුතු ය ; තව ද, ඒ දිනයට පෙරාතුව වූ කාලසීමාව සඳහා නියම කරන ලද හෝ නියම කරනු ලබන වෙනත් යම් බද්දක්, අනාරක්ෂිත ණයක් විය යුතු ය :

එසේ වුව ද, තමා ගෙවීමට යටත් යම් පැහැර හරින ලද බද්දක් අධික යයි දේපළ භාරගන්නකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක, බද්ද අය කරනු ලබන්නේ යම් තක්සේරුවක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරුව 171 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා විසින් සමීක්ෂණය කර, කාරණයෙහි අවස්ථාවෝචිත සියලු කරුණු අනුව සාධාරණ යයි සහ යුක්තිසහගත යයි ඔහුට පෙනී යන සකස් කිරීම් ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

පැහැර හරින්නා වෙත දැන්වීම.

**177**. (1) පැහැර හැර ඇති යම් බද්දක් මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති යම් ආකාරයකින් අයකර ගැනීමට කටයුතු කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව –

(අ) ඒ බද්ද පිළිබඳ විස්තර ; සහ

(ආ) ඒ බද්ද අයකර ගැනීම සඳහා කටයුතු කිරීමට අදහස් කරන බව

සඳහන් කරමින් පැහැර හරින්නා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(2) පැහැර හැර ඇති යම් බද්දක් අයකර ගැනීම සඳහා (1) වන උපවගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව ක්‍රියා කිරීම අවස්ථානුකූල නොවන බව සහ ඒ බද්ද අයකර ගැනීම සඳහා වහාම කටයුතු කිරීම අවශ්‍ය බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ උපවගන්තියෙන් නියමිත පරිදි, පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් නොකොට, ඒ බද්ද අයකර ගැනීමට ඔහු විසින් කටයුතු කරනු ලැබිය හැකි ය. පැහැර හැර ඇති යම් බද්දක් අයකර ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ උපවගන්තිය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ කටයුතු කිරීමේ දින සිට දින දහහතරක් ඇතුළත කටයුතු කරනු ලැබ ඇත්තේ යම් බද්දක් සම්බන්ධයෙන් ද ඒ බද්ද පිළිබඳ විස්තර සහ ඒ කටයුතුවල ස්වභාවය සඳහන් කෙරෙන දැන්වීමක් පැහැර හරින්නා වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

(3) ඒ බද්ද අයකරනු ලබන්නේ යම් තක්සේරුවක් හෝ තක්සේරු සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට හෝ තක්සේරුවලට විරුද්ධව නිසි කාලසීමාව ඇතුළත පැහැර හරින්නා විසින් අභියාචනයක් ඉදිරිපත් කොට නොමැති නම්, (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ දැන්වීම නිකුත් කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත, එසේ අය කරන ලද බද්ද සම්බන්ධයෙන් ඔහු විසින් යම් විරෝධතාවක් ඉදිරිපත් කළ හැකිය. තව ද 171 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතාව සැලකිල්ලට භාජනය කොට ඒ විරෝධතාව පිළිබඳ ඔහුගේ තීරණය දිය යුතු අතර එය අවසානාත්මක විය යුතු ය :

එසේ වුව ද, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත අභියාචනය කිරීමෙන් පැහැර හරින්නා වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීමක් ඔහු විසින් දෙනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කරන ලද කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් අයකර ගන්නා ලද බද්ද, යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් පැහැර හරින්නා විසින් (3) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බවට නිශ්චය කරනු ලබන බද්දේ ප්‍රමාණය ඉක්මවන අවස්ථාවක, 200 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද ඒ අතිරික්තය පැහැර හරින්නාට ආපසු ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ වූ කිසිම ආපසු ගෙවීමක්, (2) වන උපවගන්තිය යටතේ කරන ලද කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් අයකර ගන්නා ලද බද්ද නොඉක්මවිය යුතු ය.

**178.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් බදු එකතු කරන්නන් ලෙස යම් තැනැත්තන් පත්කළ හැකිය.

තහනම් කොට විකිණීමෙන් බද්ද අය කර ගැනීම.

(2) (අ) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැරි තැනැත්තාගේ නම ද ඒ සහතිකය නිකුත් කළ නිලධාරියා ද ඇතුළත් සහතිකයක් දිසාපතිවරයා වෙත හෝ උප දිසාපතිවරයා වෙත හෝ පිස්කල් වෙත, නියෝජ්‍ය පිස්කල් වෙත හෝ බදු එකතු කරන්නා වෙත හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැර හැරි තැනැත්තාගේ චංචල දේපළ තහනම් කොට විකිණීමෙන් ඒ තැනැත්තාගේ බද්ද අයකර ගැනීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට බලය ඇතිවිය යුතු වුවත් හැර එය එසේ කරනු ලෙස ද ඒ නිලධරයාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) ඉතාමත් යෝග්‍ය යැයි එකී නිලධරයා කල්පනා කරන අකාරයකට තහනම් සිදු කළ යුතු අතර එම නිලධරයා විසින් යම් චංචල දේපලක් තහනම් කල විගස එම දේපළවල ලැයිස්තුවක් වහාම පිළියෙල කොට ඔහු විසින් එය අත්සන් කර බද්ද පැහැර හැරිය තැනැත්තාට දී එහි පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතුය.

(ඇ) එසේ තහනම් කරනු ලැබූ දේපළ -

(i) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, තහනමට ගැනීමේ වියදම් සහ ගාස්තු ගෙවීමෙහි ලා ඒ මුදල් පළමුවෙන් අදාළ කළ යුතු අතර, යම් ශේෂයක් වෙතොත් පැහැර හැරිය බද්ද පියවීම සඳහා එය අදාළ කළ යුතු ය ;

(ii) විදේශීය ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, ඒ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි හෝ වෙළෙඳ බැංකුවක තැන්පත් කළයුතු අතර, එයින් ලැබෙන මුදල් තහනමට ගැනීමේ වියදම සහ ගාස්තු ගෙවීමෙහිලා අදාළ කළයුතු අතර, යම් ශේෂයක් වෙතොත් පැහැර හැරිය බද්ද පියවීම සඳහා එය අදාළ කළ යුතු ය ;

(iii) මුදල් නොවන දේපළක් වන අවස්ථාවක, පැහැර හැරිය තැනැත්තා විසින් අය කිරීම හා ගාස්තු ගෙවීමට යටත්ව, ඒ දේපළ දින පහක කාලයක් තබාගත යුතු ය, පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින පහ ඇතුළත හා ගාස්තු හා අයකිරීමේ ද සමඟ නොගෙවුවහොත් දිසාපතිවරයා, උපදිසාපතිවරයා, පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතුය. ඒ දේපළ ගනුදෙනු කළ හැකි සාධක පත්‍රයක් හෝ යම් සංස්ථාවක නැතහොත් පොදු සමාගමක කොටසක් වූ අවස්ථාවක බ්‍රෝකර් කෙනකු මගින් එදින පවතින වෙළෙඳ පොළ අගයට ඒ දේපළ විකිණීමට සැලැස්විය යුතු ය.

(ඇ) (ඇ) ඡේදයේ (iii) වන අනුඡේදයේ සඳහන් විකිණීමෙන් ලැබෙන මුදල් -

(i) පළමුව, දේපළ තහනම් කිරීමේ, තබා ගැනීමේ හා විකිණීමේ ගාස්තු හා අයකිරීම් ගෙවීම සඳහා ද ;

(ii) දෙවනුව, නොගෙවා පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා ද යෙදිය යුතු ය. ශේෂයක් වෙතොත් එය, තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

(ඉ) කිසිම දේපළ තහනමට ගැනීමක් ක්‍රියාත්මක කරනු නොලැබුව ද යම් පැහැර හරින්නකුට විරුද්ධව යම් නිලධරයකු විසින් දරන ලද යුක්ති සහගත වියදම් ඔහු විසින් ඒ පැහැර හරින්නාගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(ඊ) මේ උපවගන්තියෙහි “චංචල දේපළ” යන යෙදුමෙහි කර්මාන්තශාලාවක බිමට සවිකරන ලද යම් පිරියතක් හෝ යන්ත්‍රයක් ඇතුළත් වේ.

(3) යම් බද්දක් නොගෙවා පැහැර ඇති ඇත්තා වූ ද (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල්වරයා

ගේ මතය වන්නා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැරි තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි හෝ යම් දිස්ත්‍රික්කයක් විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ හෝ නම නැතහොත් නම් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින්, ගෙවීම පැහැර හරින තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල් සලකන ඉන් යම් කොටසක් හෝ තහනම් කොට විකිණීමට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතු ය. තව ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක් ඇති වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනම් කිරීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන කවර හෝ අවස්ථාවක පැහැර හැරිය තැනැත්තා වාසික වුව ද නිර්වාසික වුවද, ඒ තැනැත්තා වෙත ඒ වේලාවෙහිම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපෑලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතු ය. එහෙත් පැහැර හැරිය තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම, මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බලරහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය.

**179**. (1) නොගෙවා පැහැර හැරිය බද්ද, තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයා ගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයා ගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අය කර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බද්දේ විස්තර ද පැහැර හැරිය තැනැත්තාගේ නම අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකිය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම් පැහැර හැරිය තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා වෙත කැඳවිය යුතුය. ප්‍රමාණවත් හේතු නොපෙන්වූවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද දඩයකින් පමණක් දඬුවම් කළ යුතු වරදක් සඳහා, ඒ පැහැර හැරිය තැනැත්තාට ඒ

මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර එවිට එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතුය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත්වරයා විසින් නියම කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකිය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කිරීම නොකළ යුතු අතර ඒ අනුව ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව සලකා බැලීමට හෝ තීරණය කිරීමට හෝ ගෙවීම පැහැර හැරිය බද්ද අයකර ගනු ලැබ ඇත්තේ යම් තක්සේරු සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට විරුද්ධව අභියාචනයක් විභාග වීමට තිබීමේ හේතුව මත පමණක් ඒ නඩු කටයුත්ත තිස් දවසකට වැඩි කාලයක් කල් දැමීමට හෝ පමා කිරීමට ඒ උපවගන්තියෙහි වූ කිසිවක් මහෙස්ත්‍රාත්වරයකුට බලයට පැවරෙන්නේ යැයි කියවා තේරුම් නොගත යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන කිසිවක්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් වූ ද පැහැර හැරිය තැනැත්තා වෙත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරිය තැනැත්තා බන්ධනාගාරගත කිරීමට නියම කරනු ලැබූ ද යම් අවස්ථාවක ඒ දඩ මුදල ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කල දිය හැකි ය. නැතහොත් ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කළ හැකි ය.

(5) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උප වගන්තිය යටතේ කල්දීමෙහි හෝ (4) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල්දීමෙහි හෝ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකි ය. තව ද පැහැර හැරිය තැනැත්තාට එලෙස ඇප දීමට නියම කළ විටෙක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදළ විය යුතුය.

(6) යම් ගෙවීමක් වාරික මගින් ගෙවීමට මහේස්ත්‍රාත්වරයකු විසින් (4) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබ තිබිය දී ඉන් යම් වාරිකයක් නොගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ වන විට නොගෙවා ඉතිරි ව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු කටයුතු පැවරිය හැකි ය.

(7) (1) වන උපවගන්තිය යටතේ යම් නඩු කටයුත්තක දී බද්ද යථා පරිදි තක්සේරු කරනු ලැබූ බවට හා එය නොගෙවා පැහැර හැරිය බවට කොමසාරිස් ජනරාල්වරයාගේ සහතිකය, ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, බද්ද අධික බවට හෝ සාවද්‍ය බවට හෝ එයට විරුද්ධව අභියාචනය කොට ඇති බවට කරනු ලබන කිසිම උත්තරවාදයක් පිළිනොගත යුතුය.

**180**. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද නොගෙවා පැහැර හැර ඇත්තා වූද.– ණය ආදියෙන් බද්ද අයකර ගැනීම.

(අ) යම් තැනැත්තකු, පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ණයගැතිව සිටීමේ හෝ ඔහු මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවක් ඇති බව ;

(ආ) යම් තැනැත්තකු, පැහැර හරින්නා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ සඳහා, නැතහොත් වෙනුවෙන්, මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව ;

(ඇ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම් සඳහා වෙන යම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව ; හෝ

(ඈ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට යම් තැනැත්තකු අන්කිසි තැනැත්තකුගේ බලය ලබාසිටීමේ ශක්‍යතාවක් ඇති බව,

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ද, අවස්ථාවක, නොගෙවා පැහැර හැරිය මුදල් ප්‍රමාණයට වැඩි නොවන මුදලක් දැන්වීමේ නම් කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හරින්නා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු) ලියවිල්ලකින් වූ ද දැන්වීමක්, ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දිය හැකි ය. ඒ දැන්වීම ලැබුණු දිනයෙහිදී ඔහු අතෙහි හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ මුදල්වලට ද, දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලට ද, ඒ දැන්වීම අදාළ විය යුතු ය.

(2) (මේ වගන්තියේ " හවුල් ගිණුම් ධාරක හෝ ධාරකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පැහැර හරින්නා සහ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා හා වෙනුවෙන් එක්ව, යම් තැනැත්තකු මුදල් දරන අවස්ථාවක, පැහැරි හරින්නා විසින් දායක වූ මුදල්වලට ආරෝපණය කරනු ලැබිය යුතු බවට, කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්ව ඇත්තා වූ සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් එලෙස සහතික කරනු ලැබ ඇත්තා වූ හවුල් ගිණුමෙහි ඇති මුදල්වලින් හෝ ඒ මුදල්වල ඒ කොටසින්, දැන්වීමේ නම් කරන ලද නිලධරයාට, පැහැර හැර ඇති බද්දේ මුදල් හෝ එකී කොටස හෝ ගෙවන ලෙස නියම කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබිය හැකි ය :

එසේ වුව ද –

(අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීම අනුව ක්‍රියා කිරීමෙහිලා මුදල් ප්‍රේෂණය කරන සෑම තැනැත්තකුම, ඒ සිද්ධිය පිළිබඳව වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකුට ම දැනුම් දිය යුතු ය ;

(ආ) පැහැර හරින්නා හැර වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකු විසින්ම (අ) වන ඡේදය යටතේ දැනුම්දීමක් තමා වෙත ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමේ දිනට ඒ හවුල් ගිණුමෙහි ශේෂයට ඔහුගේ ශුද්ධ දායක මුදල නියෝජනය කෙරෙන යම් ප්‍රේෂණයක කොටසක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හිමිකම් පෑමක් කරනු ලැබිය හැකි අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ හිමිකම් පෑම සැලකිල්ලට භාජනය කොට ඒ පිළිබඳ ම තම නියමය කළ යුතු ය ;

(ඇ) (ආ) වන ඡේදය යටතේ කරන ලද කොමසාරිස් ජනරාල්වරයා ගේ නියමකින් අතෘප්තියට පත් සෑම හවුල් ගිණුම් ධාරකයකුම, ඔහු විසින් කරන ලද දායකවීම්වලට ආරෝපනය කරනු ලැබිය හැකි බවට ඔහු හිමිකම් පා සිටින යම් මුදලක් හෝ ඒ මුදලේ කොටස් හෝ අයකර ගැනීම සඳහා ආඥාවක් ඉල්ලමින්, දිසා අධිකරණයෙහි නඩු පවරනු ලැබිය හැකි ය.

(68 වන අධිකාරය වූ) කලාපගමන ආඥාපනතේ යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට නිකුත් කරන ලද දැන්වීමේ දින සිට මාස තුනක් ඉකුත්වීමෙන් පසු, ඒ මුදලේ කොටස හෝ අයකර ගැනීම සඳහා කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ ද, සම්බන්ධතාවක් ඇති අන් සියලු තැනැත්තන්ගේ ද බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු ය. තව ද, යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක කවර විධිවිධානයක් තිබුණ ද, සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලදී ඒ ගෙවීම සම්බන්ධ වගකීමෙන්, ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ උපවගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට නොලැබීමේ හෝ ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි මුදල් ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රිය කිරීමට නොහැකි වූ විට, ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත්වීමෙන් දහහතර දිනක් ඇතුළත ඒ කරුණු දන්වා, කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව කියා කිරීමට නොහැකි වී ඇත්තා වූ ද, (4) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, නැතහොත් දැන්වීම හා සම්බන්ධ බද්ද හෝ ඉන් කොටසක් හෝ ඒ තැනැත්තා විසින් අඩුකර ගනු ලැබ හෝ අඩුකර ගැනීමට හැකිව තිබී ඒ බද්ද හෝ ඉන් කොටස (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලසීමාව ඉකුත් වීමෙන් දින දහහතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ පරිදි ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම්, ඒ තැනැත්තා ද, ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම්, ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ ප්‍රධාන නිලධාරියා ද, අඩුකර ගැනීමට ඔහුට නියම කරනු ලැබූ සම්පූර්ණ බද්ද සඳහා පුද්ගලිකව වගකිව යුතුය. ඒ මුදල මේ පනතින් සලස්වනු ලැබූ සෑම මාර්ගයකින් ම අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයාගෙන්, ලේකම් ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් අයකර ගත හැකි ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හරින්නා" යන යෙදුමට නොගෙවා පැහැර හැරිය තැනැත්තකුගේ අනුයෝජිතයකු ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර, යම් තැනැත්තකු ජීවත්ව සිටියේ නම්, ඔහු විසින් ගෙවිය යුතු විය හැකිය තිබූ බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. තව ද, එබඳු අවස්ථාවක මේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා (1) වන උපවගන්තියේ "පැහැර හරින්නා" යන යෙදුමෙන් –

(අ) නැසීගිය තැනැත්තකුගේ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු ;

(ආ) නැසීගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය භාරගන්නා වූ, එබන්දකුගේ දේපළ පාලනයට මැදිහත් වන්නා වූ, යම් තැනැත්තෙක් ; හෝ

(ඇ) නැසීගිය තැනැත්තකුගේ බුදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති හෝ තැනැත්තෙක්,

අදහස් වේ.

බද්ද මුදලින් ගෙවීම වෙනුවට ආණ්ඩුවට නිශ්චල දේපළ පැවරීම

**181**. (1) මේ පනතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ යම් බද්දක් ගෙවීමට යටත් මේ තැනැත්තකු විසින්, ඒ බද්ද මුදලින් ගෙවීම වෙනුවට ඒ තැනැත්තාට අයත් නම් නිශ්චල දේපළක් ඒ තැනැත්තා සහ කොමසාරිස් ජනරාල්වරයා අතර එකඟතාවයෙන් ඒ දේපළ මත තබනු ලබන වටිනාකම අනුව ආණ්ඩුවට පැවරීමට කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ දේපළ ආණ්ඩුව වෙත පැවරීමෙන් පසු එය කළමනාකරණය කිරීමේ සක්‍යතාව සැලකිල්ලට ගෙන, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ඉල්ලීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවක, ඉල්ලීම් කරනු ලැබුවේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම වශයෙන්, ඒ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එකඟ වූ මුදල ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු බද්දේ මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූලව ඉල්ලුම්කරු විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට කරන ලද පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පැහැර හරින ලද බදු සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අය කර ගත යුතු බව.

**182**. (1) යම් සේවා නියුක්තියකුගේ සේවා යෝජකයකු වෙත හෝ සේවා නියුක්තියකුගේ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමකින්, ඒ සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු වූ ද ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද යම් බදු මුදලක්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලපරිච්ඡේදයක් තුළ දී, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් මාසික වාරික ගණනකින්, ඒ සේවා

නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අඩු කරන ලෙස ඒ සේවා යෝජකයාට හෝ ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකිය. එක් එක් මාසයේදී සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් එසේ අඩු කරගනු ලබන මුදල, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවා යෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ඔහුගේ සේවා යෝජකයා විසින් හෝ ඒ පාරිශ්‍රමික ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා විසින් හෝ යම් බද්දක් අඩු කරනු ලැබූ අවස්ථාවක, ඒ අඩු කිරීම කරනු ලැබූ දිනයෙහි ඒ සේවා නියුක්තයා විසින් ඒ බද්ද හෝ එහි කොටසක් හෝ ගෙවනු ලැබූ ලෙස, මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) ගෙවීම පැහැර හරිනු ලැබූ බද්ද කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අයුරු ගෙවීමට සේවා නියුක්තයා විසින් කටයුතු සලස්වනු ලැබුවේ නම්, (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ විධානයෙන් පසු යම් අවස්ථාවක, සේවා යෝජකයාට හෝ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට දෙනු ලබන ලිඛිත දැන්වීමකින්, ඒ විධානය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(4) සේවා යෝජකයා විසින් හෝ ඒ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිය යුතු තැනැත්තා විසින් මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් බද්දක් අඩු කළ යුතු අවස්ථාවක දී, ඒ සේවා නියුක්තයා ඔහුගේ සේවා නියුක්තියෙන් අස්වීමට ආසන්න නම් හෝ අස්ව යන්නේ නම්, ඔහු එසේ තම සේවා නියුක්තියෙන් අස්ව යන බව හෝ අස් වූ බව ඒ සේවායෝජකායට හෝ පාරිශ්‍රමික ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාට හෝ දැනගන්නට ලැබුණු පසු, ඔහු විසින් ඒ සේවා නියුක්තයාට ගෙවනු ලබන සියලුම ගෙවීම්වලින් හෝ යම් ගෙවීමකින් අඩු කර ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට දෙනු ලැබූ දැන්වීමෙන් විධාන කරනු ලැබූ බද්දේ සම්පූර්ණ මුදල් හෝ එහි යම් ඉතිරි කොටසක්, ඒ සේවා යෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් අඩු කළ යුතු ය.

(5) සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් බද්දක් අඩු කිරීම පිණිස (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ සේවා යෝජකයා වෙත හෝ ඔහුට පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා වෙත විධානයක් කරනු ලැබුවේ යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන්ද, ඒ

සේවා නියුක්තයා ඔහුගේ සේවා නියුක්තියෙන් ඉවත්ව ගොස් ඇති නිසා හෝ වෙන යම් හේතුවක් නිසා ඒ සේවායෝජකයාට හෝ එකී තැනැත්තාට ඒ බද්ද සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් අඩුකර ගැනීමට නොහැකි වූ අවස්ථාවක, ඒ සිද්ධියේ කරුණු දක්වමින්, ඒ සේවා යෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ම ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. එහි සේවා යෝජකයා විසින් හෝ එකී තැනැත්තා විසින් අඩු කර ගනු නොලැබූ හෝ එකී සේවා යෝජකයා හෝ එකී තැනැත්තා විසින් අඩුකර ගත නොහැකි වූ යම් බද්දක්, සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු බද්දක් බවට එකෙනෙහිම පත් විය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් අඩුකර ගන්නා ලෙස සේවා යෝජකයාට හෝ ඒ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාට විධාන කරනු ලැබූ යම් බද්දක් අඩුකර ගැනීමට ද, (5) වන උපවගන්තියෙන් නියමිත පරිදි ඒ අඩු කිරීම කළයුතු දිනයේ සිට දින දහහතරක් ඇතුළත ඒ බවට කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමක් කිරීමට ද, ඒ සේවා යෝජකයා හෝ තැනැත්තා අපොහොසත් වූ අවස්ථාවක හෝ, (1) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක් අනුව යම් පාරිශ්‍රමිකයකින් යම් මාසයක දී ඒ සේවා යෝජකයා හෝ තැනැත්තා විසින් අඩුකරගෙන හෝ අඩුකර ගත හැකිව තිබුණු නමුත් ඊළඟ මාසයේ පහළොස්වන දිනට පෙර ඒ බද්දෙහි මුදල කොමසාරිස් ජනරාල්වරයාට නොගෙවනු ලැබූ අවස්ථාවක, ඒ සේවා යෝජකයා හෝ තැනැත්තා තනි පුද්ගලයෙක් නම්, ඔහු හෝ ඒ සේවායෝජකයා හෝ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් නැතහොත් පුද්ගල මණ්ඩලයක් නම්, ඒ සමාගමේ හෝ මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු ද, මේ වගන්තිය යටතේ අඩුකර ගැනීමට ඒ සේවා යෝජකයාට හෝ ඒ තැනැත්තාට විධාන කරනු ලැබූ සම්පූර්ණ බද්ද ගෙවීමට පෞද්ගලික වශයෙන් යටත් විය යුතුය. ඒ බද්ද ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධාරයකුගෙන් මේ පනතෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති සියලුම මාර්ගවලින් අයකර ගත හැකි අතර, ඒ බද්ද පැහැරහැර ඇති බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ වූ විධානයකට අනුකූලව, යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් බදු අඩුකරන සෑම සේවා යෝජකයකුම හෝ සෑම අන් තැනැත්තකුම විසින්, ඒ සේවා නියුක්තයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ අඩු කළ බද්දෙහි මුදල සඳහන් සහතිකයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කොට ඇති ආකෘතිය අනුසාරයෙන්, නිකුත් කරනු ලැබිය යුතුය.

හවුල්කරුවකුගේ පැහැර හරිනු ලැබූ හවුල් බද්ද ව්‍යාපාරයේ වත්කම් වලින් අයකර ගත යුතු බව.

**183**. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වූ යම් තැනැත්තකුගේ යම් තක්සේරු වර්ෂයකට ව්‍යවස්ථාපිත ආදායමට හවුල් ව්‍යාපාරයේ ඔහුගේ බෙදිය හැකි ලාභවල කොටස ඇතුලත් වන්නා වූ ද, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බද්ද ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා ගේ මතය අනුව, බෙදිය හැකි ලාභවල ඔහුගේ කොටසට, එසේ ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දෙන් ආරෝපනය කළ හැකි කොටස හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් අයකර ගත හැකි අතර, එපරිද්දෙන්, 178 වන වගන්තියේ කාර්ය සඳහා හවුල් ව්‍යාපාරයේ වත්කම්, ඒ හවුල්කරුගේ වත්කම් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එසේ අය කර ගනු ලබන මුදල ඒ හවුල්කරුට ඒ හවුල් ව්‍යාපාරයේ ඇති අයිතිය නොඉක්මවිය යුතු ය.

දරුවකුගේ ආදායමෙන් බදු අයකර ගැනීම

**184**. දරුවකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම, ඒ දරුවාගේ මවුපිය දෙදෙනාගෙන් කෙනෙකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට එකතු කරනු ලැබූ ද, එම ආදායමේ කොටසක් වන්නා වූ ද, ඒ මවගෙන් නැතහොත් පියාගෙන් ආදායම් බදු එකතු කරගත නොහැකි වන්නා වූ ද අවස්ථාවක, ඒ දරුවාගේ ආදායමට ආරෝපණය කළ යුතු යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන ආදායම් බද්දේ යම් කොටසක්, ඒ දරුවා සම්බන්ධයෙන් කිසිම තක්සේරුවක් කරනු නොලැබුව ද, ඒ දරුවාගෙන් අයකර ගනු ලැබිය යුතු අතර, බදු එකතු කර ගැනීම හා අයකර ගැනීම පිළිබඳව මේ පනතේ ඇති විධිවිධාන ඒ අනුව අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අර්ථලාභියකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද භාරකරුවකුගෙන් අයකර ගැනීම

**185**. යම් ඒකක භාරයක් නොවන භාරයක අර්ථලාභියකුට ඒ භාරයෙන් හිමිවන ආදායම සම්බන්ධයෙන් ඔහුගෙන් අයකර ගත යුතු ආදායම් බද්ද හෝ ඉන් යම් කොටසක්, භාරකරු සම්බන්ධයෙන් තක්සේරුවක් කර නොතිබුණේ වුව ද ඒ ගැන නොතකා, ඒ භාරයේ භාරකරුගෙන් අයකර ගනු ලැබිය හැකි අතර, බදු එකතු කිරීමට හා අයකර ගැනීමට අදාළ වූ මේ පනතේ විධිවිධාන ඒ භාරකරු විෂයෙහි ලා අදාළ විය යුතු ය. ඒ භාරයෙන්, ඒ අර්ථලාභියාට ගෙවිය යුතු වන ආදායමෙන් ඒ බදු ප්‍රමාණය හෝ එහි කොටස අඩුකර ගැනීමට, ඒ භාරකරුට හිමිකම තිබිය යුතු ය.

අර්ථලාභියෙකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද පොල්මඃකරුගෙන් අයකර ගැනීම.

**186**. මියගිය තැනැත්තාගේ බූදලයෙන් තමාට ලැබීමට හිමිකම් ඇති ආදායම සම්බන්ධයෙන් අර්ථලාභියකුගෙන් අයකර ගතයුතු ආදායම් බද්ද හෝ එහි යම් කොටසක්, මියගිය තැනැත්තාගේ පොල්මඃකරු සම්බන්ධයෙන් තක්සේරුවක් කර නොතිබුණේ වුව ද ඒ නොතකා, ඒ

පොල්මඃකරුගෙන් අය කරගනු ලැබිය හැකි අතර, බදු එකතු කිරීම හා අය කිරීම සම්බන්ධයෙන් මේ පනතේ ඇති විධිවිධාන ඒ අනුව ඒ පොල්මඃකරු විෂයෙහි ලා අදාළ විය යුතු ය. තව ද, යටකී මියගිය තැනැත්තාගේ බූදලයේ ආදායමෙන් ඒ අර්ථලාභියාට ගෙවනු ලැබිය යුතු මුදලින් ඒ බදු ප්‍රමාණය හෝ ඒ කොටස හෝ අඩු කිරීමට, ඒ පොල්මඃකරුට හිමිකම් තිබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල ද ත්‍යාග බද්ද ත්‍යාග ලාභියාගෙන් අය කර ගත යුතු බව.

187. 1978 අංක 28 දරන දේශීය ආදායම් පනතේ XI වන පරිච්ඡේදය යටතේ අයකරගත හැකි ත්‍යාග බද්ද, ත්‍යාග දායකයාගෙන් අයකර ගත නොහැකි අවස්ථාවක, ත්‍යාගලාභියා සම්බන්ධයෙන් කිසි කත්සේරුවක් කර නොතිබුණේ වුව ද, ඒ නොතකා ඒ බද්ද ත්‍යාගලාභියාගෙන් අයකර ගත හැකි ය. තවද ත්‍යාග බද්ද එකතු කිරීම හා අයකර ගැනීම පිළිබඳව මේ පනතෙ ඇති විධිවිධාන ඒ අනුව ඊට අදාළ විය යුතුය :

එසේ වුව ද, ත්‍යාගලාභියාගෙන් අයකර ගත් මුදල් ප්‍රමාණය, ත්‍යාගදායක විසින් ත්‍යාගලාභියා වෙත ත්‍යාගය දුන් දිනයෙහි ඒ ත්‍යාගයේ වටිනාකමට ආරෝපණය කළ හැකි යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ත්‍යාග බද්දේ කොටසට වැඩි නොවිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් බදු අය කර ගැනීම.

188. (1) ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබූ හෝ එසේ නොකරනු ලැබ ගෙවීම පැහැර හරින ලද සියලුම ආදායම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු නොගෙවා, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩ ඇති බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක, ඒ බදුවල විස්තර ද ඒ තැනැත්තාගේ නම ද අඩංගු සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත එය ලැබුණු විට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයක ඇප තැබීම හෝ නොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට විධානයක් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා වෙත තමාගේ සහතිකය නිකුත් කරන වේලාවෙහි, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ඒ පිළිබඳව නිවේදනයක් පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ ලියාපදිංචි කරනු ලැබූ ලිපියකින්, තැපෑලෙන් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කරනු ලැබිය යුතු ය. එහෙත් එවැනි යම් නිවේදනයක් ඒ තැනැත්තාට නොලැබීමේ හේතුවෙන්, මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත නොවිය යුතු ය.

(3) බදු ගෙවූ බවට හෝ බදු ගෙවීම සඳහා ඇප තැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම නැතහොත් පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධරයකුට ඒ බදු මුදල ගෙවීම, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ඉඩ හැරීම සඳහා ප්‍රමාණවත් බලයක් විය යුතුය. යම් බදු මුදලක් යම් පොලිස් නිලධරයකුට ගෙවනු ලැබූ විට, ඒ පොලිස් නිලධරයා විසින් ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ගෙවනු ලැබිය යුතු ය.

බදුඅයකර ගැනීමේ මාර්ගවලින් එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම.

**189**. මේ පනත යටතේ සෑම තැනැත්තකුගෙන් අය විය යුතු සම්පූර්ණ බද්ද හෝ ඉන් යම් කොටසක් හෝ මේ පරිච්ඡේදයේ යම් විධිවිධානයක් අදාළ කිරීමෙන් අයකර ගත නොහැකි බව හෝ නොහැකි විය හැකි බව හෝ කොමසාරිස් ජනරාල්වරයා ගේ මතය වූ අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් 179 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර එය ක්‍රියාත්මක කර තිබුණ ද, එ නොතකා එසේ නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් අයකර ගැනීම සඳහා මේ පරිච්ඡේදයෙන් විධිවිධාන සලස්වනු ලැබූ බදු අයකර ගැනීමේ වෙනත් යම් මාර්ගයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නිත්‍යානුකූල විය යුතු ය.

බදුඅයකර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සතු බලය

**190**. යම් තැනැත්තකුගෙන් හෝ වෙන යම් තැනැත්තකුගෙන් හෝ අය විය යුතු ආදායම් බදු අයකර ගැනීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

ඈවර කරනු ලබන පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරයන්ගේ වගකීම.

**191**. (1) 1982 අංක 17 සමාගම් පනතෙහි කුමක් සඳහන් වුව ද, පුද්ගලික සමාගමක් ඈවර කරනු ලැබ ඒ සමාගම විසින් ගෙවිය ලැබිය යුතු ආදායම් බදු අයකර ගත නොහැකි වූ අවස්ථාවක, ඒ බද්ද ගෙවිය යුත්තේ යම් කත්සේරු වර්ෂයක් සඳහා ද ඒ වර්ෂය තුළ යම් අවස්ථාවක, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු වූ සෑම තැනැත්තකු ම, ඒ බදු ගෙවීම පැහැර හැරීම සිදුවූයේ ඒ සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ දැඩි නොසැලකිල්ල, බලය නොනිසි ලෙස පාවිච්චි කිරීම හෝ යුතුකම් පැහැර හැරීම නිසා නොවන බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ බදු ගෙවීම සඳහා එක්ව හා වෙන් වෙන්ව වගකිව යුතු ය.

(2) මේ වගන්තියේ "පුද්ගලික සමාගම" යන යෙදුමට 1982 අංක 17 දරන සමාගම් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම

**192**. (1) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරුණු හෝ පිරිනැමුණු බලතල හෝ කර්තව්‍ය කිසිවක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් යම් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබූ සෑම තක්සේරුකරුවකු විසින් ම, ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කොමසාරිස් ජනරාල්වරයා ගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථානුගත කරුනුවලදී වසර පහක් ඉකුත්වීමෙන් පසුව නඩු පවරනු නොලැබිය යුතු බව.

**193**. 2004 අංක 10 දරන දේශීය ආදායම් (සමාවදීම විධිමත් කිරීමේ) පනතේ, 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 171 වන වගන්තිය යටතේ එම බදු තක්සේරුව අවසාන හා තීරණාත්මක භාවයට එළඹුණා වූ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වසර පහකට පසුව, පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා මේ පනතේ 178 වන, 179 වන, 180 වන, 181 වන හෝ 182 වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ආරම්භ නොකළ යුතු ය.

## XXVII වන පරිච්ඡේදය

## විවිධ කරුණු

අත්සන හා දැන්වීම භාර දීම

**194**. (1) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ කත්සේරුකරුවකු විසින් දිය යුතු සෑම දැන්වීමකම, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා ගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමක්ම, කොමසාරිස් ජනරාල්වරයා ගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම එහි නිසි පරිදි මුද්‍රනය කර හෝ අත්සන් කර තිබුණහොත්, වලංගු විය යුතුය.

(2) මේ පනතේ බලය ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක් ම, පුද්ගලිකව භාරදීමෙන් හෝ යම් තැනැත්තකුගේ අන්තිමට දැන සිටි වාසස්ථානයට නැතහොත් දැන්වීම අදාළ වන අවුරුද්ද ඇතුළත ඔහු ව්‍යාපාරයේ නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට භාරදීමෙන් නැතහොත් තැපෑලෙන් යැවීමෙන් හෝ, ඔහු වෙත භාර දිය හැකි ය :

එසේ වුව ද 163 වන වගන්තිය යටතේ වූ තක්සේරු කිරීමේ දැන්වීමක් පුද්ගලිකව හෝ ඉහත සඳහන් කරනු ලැබූ යම් ස්ථානයකට ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් යැවීමෙන් භාර දිය යුතු ය.

(3) තැපෑලෙන් යවනු ලැබූ දැන්වීමක්, තැපෑලට ගතවන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙහි භාරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) තැපෑලෙන් භාරදීම ඔප්පු කිරීමේ දී, දැන්වීම ඇතුළත් ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

(5) මේ පනතේ කාර්ය සඳහා වූ යම් දැන්වීමක් හෝ සහතිකයක් හෝ දීමට නැතහොත් නිකුත් කිරීමට බලය ඇති තැනැත්තාගේ නම යයි සලකනු ලැබිය යුතු නමක්, එවැනි යම් දැන්වීමක් මුද්‍රණය කර හෝ අත්සන් කර හෝ තිබේ ද නැතහොත් එවැනි යම් සහතිකය අත්සන් කර තිබේ ද, ඒ සෑම නමක්ම අධිකරණමය වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

දැන්වීම, තක්සේරු කිරීම් ආදියෙහි වලංගුතාවය

**195**. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූල යයි සලකනු ලබන දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක්, එහි සාරය හා බලපෑම් අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් සහ තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ තක්සේරුව බලපාන හෝ තැනැත්තා පොදු අධ්‍යාශයට වැටහීමට අනුව, ඒ දැන්වීමෙහි තක්සේරුවෙහි, සහතිකයෙහි හෝ වෙනත් කටයුත්තෙහි නම් කර තිබේ නම්, එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභා කරනු නොලැබිය යුතු ය, නැතහොත් ශුන්‍ය ලෙස හෝ ශුන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය. එසේම එහි ඇති යම් වරදක් හෝ දෝෂයක් හෝ අඩුපාඩුවක් එය කෙරෙහි බල නොපෑ යුතු ය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම ආදායම් බදු ගෙවීමට යටත් තැනැත්තා වෙත යථා පරිදි භාර දී ඇත්නම් සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තර සාරානුකූල ව ඒ දැන්වීමේ අඩංගුව ඇත්නම් හා ඒ ඡේදයේ සඳහන් බලපෑම ඒ දැන්වීමේ ඇත්නම්, (1) උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක් –

(අ) ආදායම් බදු අයකරනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ තක්සේරු කරනු ලැබූ ආදායමේ ප්‍රමාණය පිළිබඳව හෝ අය කරනු ලැබූ බදුවල ප්‍රමාණය පිළිබඳව හෝ වරදක්, ඒ තක්සේරුවෙහි තිබීම ; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර යම් වෙනසක් තිබීම,

ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර, එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතු ය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල් කරු ක්‍රියා කල යුතු බව.

**196**. (1) හවුල් ව්‍යාපාරයක තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු භාරකරුවන් නැතහොත් පොල්මඃකරුවන් වශයෙන් හෝ අනුයෝජිතයන් නැතහොත් සේවායෝජකයන් වශයෙන් හෝ ක්‍රියා කරන්නා වූ, එසේ නැතහොත් 109 වන වගන්තිය අදාළ වන මුදල්, වටිනාකම හෝ ලාභ ලබන තැනැත්තන් වන්නා වූ හෝ තමන් වෙනුවෙන් ම නැතහොත් අන් තැනැත්තකු වෙනුවෙන් කිනම් තත්ත්වයකින් වුව ද ක්‍රියා කරන්නා වූ කවර වුව ද අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ එවැනි යම් තත්ත්වයකින් ක්‍රියා කරන පුද්ගලයකු විසින් කරනු ලැබීමට නියමිත සියලු කාර්ය, කාරණා හෝ දේවල් සම්බන්ධයෙන්, ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වගකිය යුතු ය ;

එසේ වුව ද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ දැන්වීම් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු නොවේ යයි හෝ ශ්‍රී ලංකාවේ වාසික වෙන යම් තැනැත්තකු එහි ප්‍රමුඛ හවුල්කරු යයි හෝ ඔප්පු කරතහොත් මිස, ඔහු ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) හවුල් ව්‍යාපාරයට සම්බන්ධ නොවූ තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු (1) වන උපවගන්තියේ සඳහන් යම් තත්ත්වයකින් එක්ව ක්‍රියා කරන අවස්ථාවක, එබඳු යම් තත්ත්වයකින් ක්‍රියා කරන යම් පුද්ගලයකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ කරනු ලැබීමට නියමිත සියලු කාර්ය, කාරණා හා දේවල් කිරීම සඳහා, ඔවුන් එක්ව ද වෙන්ව ද වගකිවයුතු ය.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියාකල යුතු බව.

**197**. (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා, මේ පනතේ විධිවිධාන යටතේ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීම සම්බන්ධයෙන් වගකිය යුතු ය :

එසේ වුව ද, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ පනත යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමඟ තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසික අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරතොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරන ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනුදැනුම නොමැතිව බව සහ එම තනතුරේ තම කර්තව්‍යවල ස්වභාවය සහ යෙදී ඇති වෙනත් සියලු කරුණු ගැන සැලකිලිමත්ව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරතොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

**198**. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ එය යටතේ හෝ නියමිත යම් ක්‍රියාවක් නැතහොත් දෙයක් ඉටුකිරීම, ඒ තැනැත්තා බෙලහීන වූ හෝ නිර්වාසික හෝ තැනැත්තකු වේ නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ බෙලහීන තැනැත්තාගේ භාරකරුවන් විසින් හෝ ඒ නිර්වාසික තැනැත්තාගේ අනුයෝජිතයා විසින් හෝ, කළ යුතු ලෙස සලකනු ලැබිය යුතු ය.

බෙලහීන වූ හෝ නිර්වාසික තැනැත්තෙක් වෙනුවට කවරකු විසින් ක්‍රියාකළ හැකිද යන බව.

**199**. (1) භාරකරුවකු, පොල්මංකරුවකු හෝ අනුයෝජිතයකු වශයෙන් මේ පනත යටතේ බද්ද හෝ මුදල් බද්ද හෝ ගෙවීමට යටත් වන හෝ වෙනත් යම් තැනැත්තකුගේ ආදායම හෝ බූදලය වෙනුවෙන් බද්ද අයකර ගනු ලැබීමට යටත් වන සෑම තැනැත්තකු විසින්, ඒ වෙනත් යම් තැනැත්තා වෙනුවෙන් හෝ, භාරකරු, පොල්මංකරු නැතහොත් අනුයෝජිතයා වශයෙන් හෝ තම සන්තකයට හෝ පාලනය යටතට පත්වන වත්කම්වලින්, බද්දේ මුදල ලබාගැනීමට හැකි තරම් වූ ප්‍රමාණයක වත්කම් කොටසක් රඳවා ගත හැකි ය. තව ද, ඒ වත්කම් රඳවා ගැනීම හෝ එම මුදල ගෙවීම සම්බන්ධයෙන් කවර හෝ තැනැත්තකුගෙන් ඔහු ආරක්ෂා කරනු ලැබිය යුතු අතර, ඔහුට එම ආරක්ෂාව මෙයින් සලකනු ලැබේ.

නියෝජිතයා ආරක්ෂා කිරීම.

(2) භාරකරු වශයෙන් හෝ පොල්මංකරු වශයෙන් හෝ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් බද්ද ගෙවා ඇත්තා වූ ද, ඒ ගෙවනු ලැබූ බද්ද රඳවා ගැනීමට හැකිවන පරිදි භාරයේ හෝ බූදලයේ වත්කම් ඔහුගේ සන්තකයට හෝ පාලනයට පත්ව නොමැත්තා වූ අවස්ථාවක, ඒ බද්ද භාරයෙහි හෝ බූදලයෙහි අර්ථලාභීන් විසින් භාරකරුට හෝ පොල්මංකරුට ගෙවිය යුතු ණයක් විය යුතු ය.

(3) වෙනත් යම් තැනැත්තකුගේ ආදායම වෙනුවෙන් බදු ගෙවීමට යටත් වන හෝ බදු අයකර ගනු ලැබීමට යටත් වන තැනැත්තකු, ඒ බදු ගෙවන්නා වූ ද, එසේ ගෙවනු ලැබූ බද්දේ මුදල රඳවා ගැනීමට හැකිවන පරිදි වෙනත් යම් තැනැත්තගේ වත්කම් කිසිවක් ඔහුගේ සන්තකයට හෝ පාලනයට පත්ව නැත්තා වූ ද අවස්ථාවක, එසේ ගෙවන ලද බද්ද, ඒ වෙනත් යම් තැනැත්තාගෙන් ඔහුට අය විය යුතු ණයක් විය යුතු ය.

## XXVIII වන පරිච්ඡේදය

### ආපසු ගෙවීම

වැඩිපුර ගෙවනු ලැබූ බද්ද ආපසු ගෙවිය යුතු බව.

**200**. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් බදු වශයෙන් ගෙවිය යුතු ගණනට වඩා වැඩි මුදලක්, ඔහු විසින් අඩු කර ගැනීම මගින් හෝ අන් ලෙසකින් යම් ආදායම් බදු වශයෙන් ගෙවා ඇති බව ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට තුන් වර්ෂයක් ඇතුළත ඒ තැනැත්තා විසින් යථා පරිදි ලියවිල්ලකින් කරනු ලැබූ හිමිකම් පෑමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කළහොත්, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබාගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.:

එසේ වුව ද –

(අ) අභියාචනයක් කිරීම සඳහා හෝ ආපසු ගෙවීම සඳහා හෝ වෙනත් යම් වගන්තියකින් නියමිත කාලසීමාවක් දීර්ඝ කිරීම හෝ අඩු කිරීම නැතහොත් අන්‍යාකාරයකින් බල රහිත වූ විරෝධතාවක් හෝ අභියාචනයක් බල සහිත කිරීම, එසේත් නැත්නම් අවසානාත්මක වූ හෝ තීරණාත්මක වූ යම් තක්සේරු කිරීමක් හෝ අවසාන හා තීරණාත්මක වන්නා වූ වෙනත් කාරණයක් ප්‍රතිශෝධනය කිරීම සඳහා අවකාශ ලැබීමේ වරම, මේ වගන්තියෙන් නොලැබිය යුතු ය: තව ද

(ආ) 65 වන වගන්තිය අනුව ලාභාංශයක් සම්බන්ධයෙන් හෝ 95 වන වගන්තිය අනුව පොලිය, බදු, කුලිය, බිම් කුලිය, රාජ්‍ය භාගය හෝ වෙනත් වාර්ෂික ගෙවීමක් වෙනුවෙන් අඩු කිරීම් මගින් ආදායම් බදු ගෙවූ තැනැත්තකුට 65 වන වගන්තියේ (3) වන, (4) වන හෝ (5) වන උපවගන්ති යටතේ හෝ 95 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ හෝ හිමිකම් ලැබිය යුතු යම් සහනයකට වඩා වැඩි සහනයකට, මේ වගන්තිය ප්‍රකාර හිමිකම් නොලැබිය යුතු ය: තව ද

(ඇ) අඩුකර ගැනීම මගින්, යම් ආදායම් බද්දක්, ගෙවූ තැනැත්තකු විසින්, ඉහත සඳහන් අවුරුදු තුන ඇතුළත දී හිමිකම පෑමක් කළ හැකිව නොතිබුණු බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අවස්ථාවකදී, එම අඩුකර ගැනීම කරනු ලැබූ තක්සේරු වර්ෂය අවසානයේ එක් අවුරුද්දක් ඇතුළත දී, එවැනි ඉල්ලීමක් කරනු ලැබුවහොත්, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබාගැනීමට ඒ තැනැත්තා හිමිකම තිබිය යුතු ය.

(2) (1) උපවගන්තිය යටතේ හිමිකම් පෑමක් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකුට මරණය, අශක්‍යතාව, බුන්වත් බව, ගනුදෙනු බේරා වසා දැමීම හෝ වෙනත් හේතුවක් නිසා හිමිකම් පෑමක් කිරීමට නොහැකි වූ අවස්ථාවක, (1) වන උපවගන්තියේ අර්ථානුකූලව වැඩිපුර ගෙවනු ලැබූ යම් බද්දක්, එම තැනැත්තාගේ හෝ ඔහුගේ බූදලයේ වාසිය සඳහා ආපසු ලබාගැනීමට, අවස්ථාවෝචිත පරිදි ඔහුගේ පොල්මඃකරුට, භාරකරුට හෝ දේපළ ලබන්නාට හිමිකම් තිබිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවීමට යටත් ආදායම් බදු මුදලට වැඩිපුර ප්‍රමාණයක් ඒ තැනැත්තා විසින් ගෙවා ඇති බවට ද, ඒ අතිරික්තය ගෙවීමට සිදුවූයේ (තක්සේරු කිරීමේ දී හෝ ප්‍රතිශෝධනය කිරීමේ දී මේ පනතේ යම් විධිවිධානයක් අදාළ කිරීමේ හෝ තේරුම් ගැනීමේ ලා සිදු වූ දෝෂයක් හැර) ඒ තැනැත්තාගේ ආදායම තක්සේරු කිරීමේ හෝ ඒ තැනැත්තා ගේ ආදායම් වාර්තාවේ දෝෂයක් නිසා බවට ද, කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත ලියවිල්ලකින් කරනු ලබන හිමිකම් පෑමක් මගින් ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබාගැනීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

(4) 173 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් යම් දඩ මුදලක් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ බව ද, එය 173 වන වගන්තියේ (8) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණන් බලන ලද නම් ඔහු විසින් ගෙවිය යුතු මුදලට වැඩි බව ද, ලියවිල්ලකින් වූ හිමිකම් පෑමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, ඒ හිමිකම්පෑම ඉහත කී 173 වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දඩ මුදල ගෙවනු ලැබූ තක්සේරු වර්ෂයෙහි අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත කරනු ලැබුවහොත්, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබාගැනීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

(5) තක්සේරු වර්ෂයක් සඳහා යම් සේවායෝජකයකු විසින් ගෙවිය යුතුව තිබූ මුදලට වැඩිපුර මුදලක් ඒ සේවායෝජකයා විසින්, XIV පරිච්ඡේදයෙහි විධිවිධාන යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට ගෙවා ඇති බව ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ හිමිකම් පෑමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබාගැනීමට ඒ සේවායෝජකයාට හිමිකම තිබිය යුතුය :

එසේ වුවද, 125 වන වගන්තිය යටතේ සේවා යෝජකයකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවක් මත ආදායම් බදු ගෙවන ලද අවස්ථාවක, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(6) 63 වන වගන්තියේ සහ 61 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ කොටස් හිමියා වැසියකු වන රටේ ආණ්ඩුව අතර 97 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ගිවිසුමක, නිශ්චිත ලාභාංශ මත වූ බදු අනුප්‍රමාණය ඉක්මවමින් වාසික සමාගමක් විසින් නිර්වාසික කොටස් හිමියකුට ගෙවන ලද ලාභාංශයක් සම්බන්ධයෙන් 65 වන වගන්තියට අනුකූලව අඩු කරන ලද යම් බද්දක්, ඒ බද්ද අඩු කරනු ලැබුවේ යම් වර්ෂයක දී ද, ඒ වර්ෂය අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත නැතහොත් ඒ ගිවිසුම බලාත්මක වූයේ යම් දිනයක දී ද ඒ දින සිට එක් වර්ෂයක් ඇතුළත යන, මේ දෙකින් පසුව එළඹෙන කාලය ඇතුළත යථා පරිදි ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මත, ඒ කොටස් හිමියාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(7) යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම 8 වන වගන්තියේ (අ) වන ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද එවැනි තැනැත්තකුට, නේවාසික සමාගමක් විසින් බෙදාහරින ලද සහ ගෙවන ලද ලාභාංශයක් සම්බන්ධයෙන් 65 වන වගන්තියට අනුකූලව අඩු කර ගනු ලැබූ යම් බද්දක්, 63 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වී ඇත ද ඒ නොතකා, ඒ බද්ද අඩු කර ගන්නා ලද තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත දී ඒ තැනැත්තා විසින් යථා පරිදි ලිඛිතව කරනු ලබන හිමිකම් පෑමක් මත, ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(8) පහත දැක්වෙන අඩුකිරීම්වලට අදාළ ව මෙම වගන්තියේ ඉහත විධිවිධානවල සඳහන් කිසිවක් ක්‍රියාත්මක නොවිය යුතු යː–

(අ) ප්‍රාථමික වෙළෙඳපළ ගණුදෙනුවලදී 134 වන වගන්තිය යටතේ වූ යම් පොලියක් මත අඩු කිරීමක් ලෙස ප්‍රාථමික ගණුදෙනුකරුවකු විසින් ගෙවන ලද ආදායම් බදු ;

(ආ) 133 වන වගන්තිය යටතේ වූ යම් පොලියක්, යම් පුද්ගලයකු විසින් ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමේ 65 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ වූ යම් ලාභාංශයක අඩංගු නොවන අවස්ථාවක දී, එකී පොලියෙන් අඩු කිරීමක් ලෙස ගෙවන ලද ආදායම් බදු ;

(ඈ) 36 වන වගන්තිය යටතේ සලසා ඇති විධිවිධානවලට අදාළව හෝ ලබන ලද ත්‍යාග මුදල්, හෝ දඩ මුදල් කොටස මත හෝ 157 වන වගන්තිය යටතේ බදු අය කළ හැකි ලොතරැයි ත්‍යාග හෝ ඔට්ටු ඇල්ලීමේ දිනුම හෝ සුදු දිනුම මත, යම් තැනැත්තකු විසින් ගෙවන ලද ආදායම් බදු.

**201**. යම් තක්සේරු වර්ෂයක් සඳහා අඩුකර ගැනීමකින් හෝ අන්‍යාකාරයකින් තමා විසින් ගෙවූ යම් ආදායම් බද්දක, මුදල ආපසු ලබාගැනීමට යම් තැනැත්තකුට හිමිකම් ඇත්තා වූ ද – ඇතැම් අවස්ථාවලදී ආපසු ගෙවන මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලිය.

(අ) එම ආපසු ගෙවීම උද්ගත වන්නේ 165 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ තක්සේරුකරු සමග වූ එකඟත්වයක් අනුව හෝ එම තක්සේරුව සම්බන්ධයෙන් කරන ලද අභියාචනයක් පිළිබඳ තීරණය අනුව හෝ තක්සේරුවක මුදල අඩු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නම්, ඒ එකඟත්වයේ දින සිට හෝ එම තීරණය එම තැනැත්තා හට දන්වනු ලැබූ දින සිට මාස හයක කාලයක් ඇතුළත ; හෝ

(ආ) වෙනත් යම් අවස්ථාවක දී, එම ආපසු ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට එම තැනැත්තා විසින්, ලියවිල්ලකින් වූ හිමිකම් කරනු ලැබූ දිනය හෝ එම තක්සේරු වර්ෂයේ මාර්තු මස තිස්එක්වන දිනය යන දින දෙකින් පසුව එළඹෙන කවර හෝ දිනයක සිට, මාස හයක් ඇතුළත,

එම මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබ නොමැත්තා වූ ද අවස්ථාවක, (අ) හෝ (ආ) ඡේදවලින් සඳහන් මාස හයක කාලසීමාවෙන් පසුව එකී ආපසු ගෙවිය යුතු මුදලෙන් නොගෙවා ඉතිරිව ඇති මුදල නොගෙවා ඉතිරිව පවතින එක් එක් සම්පූර්ණ මාසයක කාලයක් සඳහා එකී නොගෙවා ඉතිරිව පවතින මුදල වෙනුවෙන් සියයට එකක අනුප්‍රමාණය මත ගණන් බලනු ලැබූ පොලියකට, එම තැනැත්තා හට හිමිකම් තිබිය යුතු ය.

## XXIX වන පරිච්ඡේදය

## වැරදි සහ දණ්ඩන

**202**. (1) (අ) 70 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 73 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 76 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 95 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 106 වන වගන්තියේ (7) වන උපවගන්තිය හෝ 106 වන වාර්තා සැපයීම පැහැර හැරීම, සාවද්‍ය වාර්තා සැපයීම ආදිය සම්බන්ධයෙන් දඬුවම්.

වගන්තියේ (12) වන උපවගන්තිය හෝ 106 වන වගන්තියේ (13) වන උපවගන්තිය හෝ 106 වන වගන්තියේ (14) වන උපවගන්තිය හෝ 107 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 109 වන වගන්තිය හෝ 110 වන වගන්තිය හෝ 111 වන වගන්තිය හෝ 190 වන වගන්තිය යටතේ තමාට කරන ලද දැන්වීමක නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නාවූ: හෝ

(ආ) 112 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ii) වන අනුඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාට කරන ලද නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ: හෝ

(ඇ) 106 වන වගන්තියේ (13) වන උපවගන්තිය හෝ 106 වන වගන්තියේ (14) වන උපවගන්තිය හෝ 165 වන වගන්තියේ (9) වන උපවගන්තිය හෝ 169 වන වගන්තියේ (7) වන උපවගන්තිය හෝ යටතේ තමාට කරන ලද දැන්වීමකට අනුකූලව පැමිණ නොසිටින්නා වූ හෝ එවැනි යම් දැන්වීමකට අනුකූලව පැමිණ සිට, නීත්‍යානුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නවලට පිළිතුරු දීම සෑහෙන හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ: හෝ

(ඇ) 70 වන වගන්තියේ (3) වන උපවගන්තියේ හෝ 73 වන වගන්තියේ (3) වන උපවගන්තියේ හෝ 76 වන වගන්තියේ (4) වන උපවගන්තියේ හෝ 106 වන වගන්තියේ (1) (2) (3) හෝ (4) වන උපවගන්තිවල හෝ 107 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 108 වන වගන්තියේ හෝ 176 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 182 වන වගන්තියේ (7) වන උපවගන්තියේ හෝ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ,

සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු, කරනු ලැබූ විට, 106 වන වගන්තියේ (1) වන වගන්තිය අනුව හෝ 106 (7) වන වගන්තිය යටතේ දෙන ලද දැන්වීමක නියමයක් අනුව හෝ කටයුතු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවකදී, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට සහ වෙනත් යම් අවස්ථාවකදී රුපියල් හත්දහස් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය:

(2) XIV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා යෝජකයකුව සිටිමින් –

(අ) 115 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 115 වන වගන්තියේ (2) වන උපවගන්තිය අනුව කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීම පැහැර හරින; හෝ

(ආ) 114 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අඩුකර ගනු ලැබීමට නියමිත සම්පූර්ණ ආදායම් බද්ද හෝ ඉන් යම් කොටසක් අඩුකර ගැනීම පැහැර හරින; හෝ

(ඇ) 112 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 118 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 119 වන වගන්තියේ (අ), (ආ), හෝ (ඇ), ඡේදවල හෝ 120 වන වගන්තියෙහි (අ), (ආ), (ඇ), (ඈ), හෝ (ඉ) ඡේදවල හෝ 133 වන වගන්තියේ (7) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින,

සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ, ඔහු යටත් විය යුතුය.

(3) XIV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා නියුක්තයකුව සිටිමින් 122 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ විට, රුපියල් හත්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(4) සාධාරණ නිදහසට කරුණක් නොමැතිව –

(අ) තමා වෙනුවෙන් ම හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් හෝ ආදායම පිළිබඳව තමා විසින් සැපයීමට හෝ ඉදිරිපත් කිරීමට මේ පනතින් නියමිත වාර්තාවක යම් ආදායමක්, අත්හැර දැමීමෙන් නැතහොත් අඩුවෙන් සඳහන් කිරීමෙන් සාවද්‍ය වාර්තාවක් සපයන්නා වූ හෝ ඉදිරිපත් කරන්නා වූ;

(ආ) VII වන පරිච්ඡේදය යටතේ අඩුකර ගැනීමක් හෝ දීමනාවක් සඳහා වූ හිමිකම් පෑමක් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශයක් සපයන්නා වූ ; හෝ

(ඇ) බදුවලට තමා යටත්වීම හෝ වෙනත් තැනැත්තකු යටත්වීම හෝ හවුල් ව්‍යාපාරයක් යටත්වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ,

සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට –

(i) එම සාවද්‍ය වාර්තාව, ප්‍රකාශය හෝ තොරතුර හේතු කොටගෙන අඩුවෙන් අය කරනු ලැබූ බද්ද හෝ එම වාර්තාව, ප්‍රකාශය හෝ තොරතුර නිවැරදි ලෙස පිළිගන්නා ලද නම්, එසේ අඩුවෙන් අය කරනු ලැබිය හැකි වූ බදු මුදලට සමාන මුදලකින් ; සහ

(ii) රුපියල් දස දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට ද,

නැතහොත් මාස හයක් නොඉක්මවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(5) XIV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා යෝජකයකුව සිටිමින්, තමා විසින් සේවයේ නියුක්ත කර ඇති යම් සේවා නියුක්තියකුගේ වේතන මුදල අත්හැරීමෙන් හෝ අඩුවෙන් දැක්වීමෙන් යුක්ති සහගත හේතුවක් නොමැතිව, සාවද්‍ය ප්‍රකාශයක් කරන, නැතහොත් යම් සේවා නියුක්තියකුගේ වේතනයෙන් අඩු කර ගන්නා ලද ආදායම් බදු මුදල අත්හරින හෝ අඩුවෙන් දක්වන සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වදරකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ, ඔහු යටත් විය යුතු ය.

(6) XIV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා නියුක්තියකුව සිටිමින් 122 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයාට දෙනු ලැබූ යම් දැන්වීමක සාවද්‍ය ප්‍රකාශයක් කරන සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු වි භාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ, ඔහු යටත් විය යුතු ය.

(7) වරද සිදු කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද නැතහොත් යම් තක්සේරු වර්ෂයක් ඇතුළත ද, ඒ තක්සේරු වර්ෂයෙහි දී හෝ ඒ තක්සේරු වර්ෂය ඉකුත්වීමෙන් පසු වර්ෂ පහක් ඇතුළත හෝ ඒ වරද පිළිබඳව පැමිණිලි කළහොත් විනා, මේ වගන්තිය යටතේ යම් දඬුවමකට කිසිම තැනැත්තකු යටත් නොවිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වූ වරදක් කොමසාරිස් ජනරාල්වරයා විසින් සමථයකට පත්කළ හැකි ය. තව ද, එය යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවකට පෙර නතර කිරීම හෝ සමථයකට පත්කිරීම ඔහු විසින් කළ හැකි ය.

රහස්‍යතාවය කඩකිරීම හා වෙනත් කාරණා වැරදි වන බව.

**203**. (අ) 209 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම දීමට නියමිත තැනැත්තකුව සිටියදී එම දිවුරුම නොදී මේ පනත යටතේ කටයුතු කරන්නා වූ ;

(ආ) 209 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන හෝ 209 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දෙන ලද දිවුරුම් කඩකරමින් කටයුතු කරන්නා වූ ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන කඩකරමින් කටයුතු කිරීමට වෙන යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙන යම් තැනැත්තකු පොළඹවන්නා වූ,

සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

වංචාව ආදිය සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන.

**204**. (1) (අ) මේ පනත යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රකාශයක හෝ වාර්තාවක, ඔහු විසින් ඇතුළත් කළ යුත්තා වූ ආදායමක්, ඒ වාර්තාවක ඇතුළත් නොකර අත්හරින්නා වූ ;

(ආ) මේ පනත යටතේ සපයනු ලබන හෝ ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය ප්‍රකාශයක් හෝ සටහනක් කරන්නා වූ ;

(ඇ) VII වන පරිච්ඡේදය යටතේ අඩු කිරීමක් හෝ දීමනාවක් සඳහා කරනු ලබන හිමිකම් පෑමක් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් කරන්නා වූ ;

(ඈ) මේ පනත යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රකාශයක් හෝ වාර්තාවක් සත්‍ය යයි විශ්වාස කිරීමට යුක්තිසහගත හේතු නොමැතිව ඊට අත්සන් තබන්නා වූ ;

(ඉ) මේ පනතෙහි විධිවිධාන අනුව අසනු ලැබූ ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට වාචිකව හෝ ලියවිල්ලක් මාර්ගයෙන් අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ ;

(ඊ) අසත්‍ය ගණන් පොත් හෝ වෙනත් වාර්තා පිළිවෙල කරන්නා වූ හෝ පවත්වාගෙන යන්නා වූ, හෝ එබන්දක් පිළියෙල කිරීමට හෝ පවත්වාගෙන යාමට බලය දෙන්නා වූ නැතහොත් ගණන් පොත් හෝ වාර්තා වරදවා පෙන්වන්නා වූ හෝ එසේ වරදවා පෙන්වීමට බලය දෙන්නා වූ ; හෝ

(උ) කවර අන්දමක හෝ වංචාවක්, ප්‍රයෝගයක් හෝ උපක්‍රමයක් ප්‍රයෝජනයට ගන්නා වූ හෝ එබඳු වංචාවකින්, ප්‍රයෝගයකින් හෝ උපක්‍රමයකින් ප්‍රයෝජන ගැනීමට බලය දෙන්නා වූ ද,

එමගින් ආදායම් බදු, ගෙවීම මගහරින්නා වූ හෝ මගහැරීමට තැත්කරන්නා වූ වෙනත් තැනැත්තකුට ඒ බදු මගහැරීමට ආධාර කරන්නා වූ නැතහොත් ඒ බදු මගහැරීමට තැත් කිරීමට ආධාර කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට –

(i) වරද කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද නැතහොත් ඇතුළත ද, ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා හෝ සහාය ලැබූ අන් තැනැත්තා හෝ මේ පනත යටතේ යටත් විය යුතු වූ ද මගහැරියා වූ හෝ මගහැරීමට තැත් කළා වූ ද ආදායම් බදු ප්‍රමාණයට සමාන මුදලකින් ; සහ

(ii) රුපියල් දස දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට,

හෝ, ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) XIV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා යෝජකයකුව සිටිමින් –

(අ) 120 වන වගන්තියේ (අ) ඡේදය හෝ (ඈ) ඡේදය හෝ (ඉ) ඡේදය යටතේ කරන ලද ප්‍රකාශයකින් ස්වකීය සේවයෙහි නියුක්ත සේවා නියුක්තයකුගේ යම් වේතනයක් අත්හරින හෝ එම ප්‍රකාශනයේ එම වේතනයෙන් අඩු කරන ලද ආදායම් බදු ප්‍රමාණය අත්හරින හෝ අඩුවෙන් දක්වන ; නැතහොත්

(ආ) 120 වන වගන්තියෙහි (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ වූද ආදායම් බදු අඩුකිරීම පිළිබඳව ව්‍යාජ සහතිකයක් දෙන,

සහ, එසේ කිරීමෙන් ආදායම් බද්ද මගහරින, මගහැරීමට තැත්කරන නැතහොත් එම බද්ද මගහැරීමට හෝ මගහැරීමට තැත් කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර කරන සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හො ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ වරදක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් සමථයකට පත්කළ හැකි ය. තව ද (1) වන උපවගන්තියේ (i) වන සහ (ii) වන අනුඡේද යටතේ පනවනු ලැබිය හැකි දඩයකින් තුනෙන් එකකට නොඅඩු වන්නා වූ යම් ප්‍රමාණයක් අයකර ගැනීමට යටත්ව, එය යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයකට පත්කිරීම ඔහු විසින් කළ හැකි ය. අයකරගත් ඒ දඩය, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක් හෝ වරදකරු කිරීමක් නොතකා බදු ගෙවිය යුතු බව.

**205**. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් නඩුපැවරීමක් කිරීම හෝ එවැනි යම් වරදක් සම්බන්ධයෙන් දණ්ඩනයක්, දඩයක් නැතහොත් බන්ධනාගාරගත කිරීමක් නියම කිරීම හේතුකොටගෙන, තක්සේරු කරනු ලැබීමට හෝ ගෙවීමට යම් තැනැත්තකු යටත් වන්නේ හෝ යටත් විය හැක්කේ යම් බද්දකට ද ඒ බද්ද තක්සේරුකරනු ලැබීමට හෝ ගෙවීමට ඒ තැනැත්තාට ඇති බැදීමෙන් ඔහු නිදහස් නොවිය යුතු ය.

නඩු පැවරීම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ඇතිව විය යුතු බව.

**206**. 202 වන වගන්තිය හෝ 204 වන වගන්තිය හෝ යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස් ජනරාල්වරයා ගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය හැකි ය.

ප්‍රකාශ සහ ලේඛන සාක්ෂ්‍යයේදී ආවේශ්‍ය කිරීම.

**207**. මේ පනත යටතේ බදු අයකර ගනු ලැබීමට යටත් තැනැත්තකු විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින්, මේ පනත යටතේ නැගෙන යම් කාරණයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ කොමසාරිස්වරයකු වෙත හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ තක්සේරුකරුවකු වෙත හෝ යම් ප්‍රකාශයක් කරනු ලැබූ හෝ ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනතේ 202 වන වගන්තියෙහි හෝ 203 වන වගන්තියෙහි හෝ 204 වන වගන්තියෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව වූ යම් නඩු කටයුතුවල දී, ඒ ප්‍රකාශය හෝ ලේඛනය සාක්ෂියේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

## XXX වන පරිච්ඡේදය

## පරිපාලනය

නිලධරයෝ.

**208**. (1) මේ පනතේ කාර්ය සඳහා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයකු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයකු ද, ජ්‍යෙෂ්ඨ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයකු ද, අවශ්‍ය විය හැකි දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයන් ද, ජ්‍යෙෂ්ඨ දේශීය ආදායම් කොමසාරිස්වරයන්, දේශීය ආදායම් කොමසාරිස්වරයන්, දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයන්, දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන්, දේශීය ආදායම් තක්සේරුකරුවන් සහ දේශීය ආදායම් බදු නිලධරයන් යම් සංඛ්‍යාවක් ද, පත්කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති, නියම කොට ඇති හෝ භාර කොට ඇති යම් බලයක්, ක්‍රියාත්මක කරන හෝ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටුකරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් හෝ ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබනතෙක්, ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට, එම කොමසාරිස්වරයාට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාට බලය දෙනු ලැබූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ යම් විධිවිධානයක් මගින් දේශීය ආදායම් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබූ යම් බලයක් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ අනිකුත් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමතිය නොමැතිව, දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු හෝ දේශීය ආදායම් තක්සේරුකරුවකු විසින් යම් බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම නොකළ යුතු ය.

(5) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් හෝ දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයන් වශයෙන් හෝ ජ්‍යෙෂ්ඨ දේශීය ආදායම් කොමසාරිස්වරයන් වශයෙන් හෝ දේශීය ආදායම් කොමසාරිස්වරයකු වශයෙන් හෝ දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු වශයෙන් හෝ දේශීය ආදායම් කොමසාරිස්වරයකු වශයෙන් හෝ දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු වශයෙන් හෝ දේශීය ආදායම් තක්සේරුකරුවකු වශයෙන් හෝ ධුර දරන සෑම තැනැත්තකුම, (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**209**. (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමෙහි ලා හැර, මේ පනත යටතේ පත්කරනු ලැබූ හෝ පත්කරන ලදැයි සලකනු ලබන සෑම තැනැත්තකු ම හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැනගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහාය වීම, කළ යුතු ය. තව ද, ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර යම් තැනැත්තකුට, එවැනි යම් කාරණයක් නොදැන්විය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයෙහි , භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිත් ලබාගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය. නිල රහස්‍යතාවය

(2) මේ පනත යටතේ පත්කරනු ලැබූ හෝ පත්කරන ලදැයි සලකනු ලබන හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ සෑම තැනැත්තකු විසින්, මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර, සමාදාන විනිශ්චකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ හැකි ය.

(3) මේ පනත යටතේ පත්කරනු ලැබූ හෝ පත්කරන ලදැයි සලකනු ලබන හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට, මේ පනතෙහි හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, යම් වාර්තාවක්, ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ මෙ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේදී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළිදරව් කිරීමට නැතහොත් දැන්වීමට හෝ, නියම කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන් ව ඇත ද, මේ පනත යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනයෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් –

(අ) මේ පනත යටතේ හෝ එකී වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයක් ඉටුකිරීම සඳහා ඒ කාරණය දැනුම්දීම අවශ්‍ය නම්, ඒ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට ;

(ආ) යම් පළාත් සභාවක් පිහිටුවා ඇත්තේ යම් පළාතක් සඳහා ද, ඒ පළාත ඇතුළත යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන යම් තොග හෝ ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන යම් තොග හෝ සිල්ලර වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් 1991 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා පිරිවැටුමට අදාළ කාරණයක් සම්බන්ධයෙන්, ඒ පිරිවැටුම නිශ්චය කිරීමට පළාත් සභා ආදායම් කොමසාරිස්වරයාට හැකි කිරීම පිණිස අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන ප්‍රමාණයට, ඒ කොමසාරිස්වරයාට.

මේ ඡේදයේ කාර්ය සඳහා පිරිවැටුම යන යෙදුමෙහි 26 වන වගන්තියේ (1) වන අපවගන්තියේ (ඩ) ඡේදයෙන් ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

(ඇ) පොදු රාජ්‍ය මණ්ඩලයේ යම් දේශයක අය කළ යුතු ආදායම් බද්දෙන්, ශ්‍රී ලංකාවෙහි ගෙවන ලද ආදායම් බදු වෙනුවෙන් දිය යුතු සහනය දීමට, ඒ දේශයේ ආදායම් බදු අධිකාරියකට හැකිවීම පිණිස අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන ප්‍රමාණයට ඒ අධිකාරියට ;

(ඈ) ද්විත්ව බදු අය කිරීමෙන් සහන සැලසීම සඳහා ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් රටක ආදායම් බදු අධිකාරියකට,

දැනුම් දිය හැකි අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනත යටතේ හෝ ඔහු විසින් පරිපාලනයෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමා වෙත සපයනු ලැබූ හෝ අන්‍යාකාරයකින් තම සන්තකයෙහි ඇති, යම් වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක්, එය ඒ විස්තරවල සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය. තවද ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන් ව ඇත ද, ඒ පිටපත සාක්ෂියේදී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක, එසේ ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය :

එසේම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක හෝ පිටපතක හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටෙක දී කොමසාරිස් ජනරාල්වරයාට බල කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද –

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන පරීක්ෂණ සඳහා විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන් සභාවක් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ

කටයුතුවලට අදාළ, තමා වෙත ඇති සියලු තොරතුරු හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ හෝ, කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලබන වෙන යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළ සියලු තොරතුරු, එම කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ දැන්වීමක සඳහන් පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති, අවස්ථාචෝචිත පරිදි ඒ තැනැත්තාට, ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට හෝ පුත්‍රයාට හෝ දුව හෝ වෙනත් තැනැත්තාට අදාළ වන්නා වූ යම් ලේඛනයක්, එසේ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් වන පරිදි ඉදිරිපත් කළ යුතු ය ; නැතහොත් සැපයිය යුතු ය ;

(ආ) යම් තැනැත්තකුට විරුද්ධව අල්ලස් චෝදනාවක් විමර්ශනය කරන අතරතුර දී, අල්ලස් ගැනීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව වූ නඩුවක් හෝ යම් තැනැත්තකු විනිශ්චයට භාජන කිරීමක් ආරම්භ වීමෙන් පසු නීතිපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ කටයුතුවලට අදාළව තමා වෙත ඇති සියලු තොරතුරු, තමාට නිකුත් කරනු ලැබූ දැන්වීමෙහි සඳහන් පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති ඒ තැනැත්තා, ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව, පුත්‍රයා හෝ දුව සම්බන්ධයෙන් වූ යම් ලේඛනයක් හෝ යම් ලේඛනයක සහතික පිටපතක්, දැන්වීමේ සඳහන් කරනු ලැබූ පරිදි ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය ; නැතහොත් සැපයිය යුතු ය ;

(ඇ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවක් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ කටයුතුවලට අදාළ තමා වෙත ඇති සියලු තොරතුරු, තමා වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක සඳහන් පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය

යටතේ ඇති ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ, පුත්‍රයකුගේ හෝ දුවකගේ හෝ කටයුතුවලට අදාළ, යම් ලේඛනයක් හෝ යම් ලේඛනක සහතික පිටපතක්, ඒ දැන්වීමෙහි සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතු ය ; නැතහොත් සැපයිය යුතු ය ;

(ඈ) යම් තැනැත්තකු අල්ලස් ගැනීමේ වරදක් කර ඇති බව තමා වෙත ඇති තොරතුරක් අනුව තමා සැකකරන අවස්ථාවකදී, පරීක්ෂා කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නීතිපතිවරයාට ඒ කාරණය වාර්තා කළ යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව විසින් ඉල්ලා සිටි විට, ඒ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය වන්නා වූ ද, මේ පනත යටතේ තම කාර්ය කිරීමේදී තමාට දැනගැනීමට ලැබෙන්නා වූ ද, යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළ යම් තොරතුරු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුගේ යම් නිලධරයකු විසින් කොමිෂන් සභාවට හෙළිදරව් කළ යුතු ය.

(7) මේ වගන්තියේ කුමක් සඳහන් වුවද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා නිසියාකාරව බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට, ස්වකීය නිල කාර්ය කිරීමට අවශ්‍ය විය හැකි යම් පොත්, වාර්තා හෝ වාර වාර්තා හෝ වෙනත් ලේඛන ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසර දිය හැකි ය.

විගණකාධිපතිවරයා හෝ මේ වගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු මේ පනතේ විධිවිධාන ඉෂ්ට කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ තැනැත්තකු වශයෙන්, (2) වන උප වගන්තියෙහි කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්ය සඳහා බලය පවරනු ලැබූ වෙන යම් තැනැත්තකු විසින් –

(අ) සියලුම බදු ගෙවන්නන්ගේ නම් සහ ලිපිනයන් ද, යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ බදු ගෙවන්නන්ගේ වාර්තාවල ප්‍රකාශ කොට ඇති මුළු ආදායම ද, අවශ්‍ය යයි

කොමසාරිස් ජනරාල්වරයා අදහස් කරන අවස්ථාවක, ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග ද ඇතුළත් ලැයිස්තුවක් ; සහ

(ආ) මේ පනත යටතේ යම් වරදක් සඳහා යම් අධිකරණයක දී වරදකරු කරනු ලැබූ තැනැත්තකුට හෝ 112 වන වගන්තිය යටතේ හෝ 172 වන වගන්තිය යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් දණ්ඩනයක් පනවනු ලැබූ තැනැත්තකුට අදාළ තොරතුරු.

කොමසාරිස් ජනරාල්වරයා විසින් සුදුසු යයි අදහස් කරන ආකාරයට කලින් කල පළ කරවිය හැකි ය.

(9) රක්ෂණ ව්‍යාපාරයක් වෙනුවෙන් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතියට හානිකර වන ආකාරයකින් ක්‍රියා කොට සිටින ඒ රක්ෂණ ව්‍යාපාරයේ යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට හෝ වෙනත් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට විරුද්ධව නඩු පැවරීමේ කාර්ය සඳහා, ඒ අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුගේ, වෙනත් නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ වත්කම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා සන්තකයේ තිබෙන යම් තොරතුරු සපයන ලෙස නීතිපතිවරයා විසින් ලිඛිත දැන්වීමකින් කොමසාරිස් ජනරාල්වරයාට නියම කරන අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් නීතිපතිවරයා වෙත ඒ තොරතුරු සැපයිය යුතු ය.

(10) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, විනිමය පාලන පනත හෝ රේගු ආඥාපනත යටතේ යම් තැනැත්තකු විසින් වරදක් කර ඇති බව, මේ පනත යටතේ තමාගේ කාර්ය ඉටුකිරීමේදී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයකින් කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, ඒ වරද කිරීම හා සම්බන්ධ යම් වරදක් හෝ ඒ වරද සිදුකරනු ලැබූ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් යම් භාණ්ඩ, ගණන් පොත් හෝ අන්කිසි ලේඛන පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලකට හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඔහු විසින් දැනුම් දීම හෝ ඒවා භාරදීම කළ හැකි ය.

(11) විනිමය පාලන පනත හෝ රේගු ආඥා පනත යටතේ යම් තැනැත්තකු විසින් වරදක් සිදු කිරීම පිළිබඳ යම් තොරතුරක් හෝ ඒ වරද කරනු ලැබූ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් යම් භාණ්ඩ, ගණන් පොත් හෝ වෙනත් ලේඛන පිළිබඳව (10) වන

උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලකට හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දී හෝ ඒවා භාරදී ඇති අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ වරද සඳහා ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් නඩු කටයුත්තකදී, ඒ තොරතුරු, භාණ්ඩ, ගණන් පොත් හෝ වෙනත් ලේඛන, පිළිබඳව සාක්ෂි දීමට ද, ඉදිරිපත් කරන ලෙස ඒ නඩු කටයුත්තේදී තමාට නියම කරනු ලැබිය හැකි වාර වාර්තා, ගණන් පොත් හෝ වෙනත් ලේඛන හෝ භාණ්ඩ කිසිවක් ඉදිරිපත් කිරීම හෝ කරනු ලැබීමට සැලැස්වීම ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අන්කිසි නිලධරයකු විසින් කළ හැකිය. ඒ නඩු කටයුතුවල කාර්යය සඳහා යම් වාර වාර්තාවක, ගණන් පොත්වල හෝ වෙනත් ලේඛනවලට ඇතුළත් යම් තොරතුරුවල පිටපතක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ එවැනි වෙනත් නිලධරයකු විසින් අධිකරණයට ඉදිරිපත් කළ හැකි හෝ ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය හැකි අතර, ලේඛන ඔප්පු කිරීමට අදාළ වූ සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද, ඒ පිටපත සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය :

එසේ වුව ද, කොමසාරිස් ජනරාල්වරයාට හෝ වෙනත් නිලධරයාට –

(අ) ඒ වාර වාර්තාව, ගණන් පොත් හෝ වෙනත් ලේඛන ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීම අවශ්‍ය වන යම් අවස්ථාව, ඒ වාර වාර්තාවේ, ගණන් පොත්වල හෝ වෙනත් ලේඛනයෙහි මුල් පිටපත ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ වෙනත් නිලධරයා විසින් කළ හැකිය. එහෙත් එය ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක් විය යුතු ය ;

(ආ) එම වාර වාර්තාවෙහි, ගණන් පොත්වල හෝ වෙනත් ලේඛනයෙහි මුල් පිටපත හෝ ඒ වාර වාර්තාවෙහි, ගණන් පොත්වල හෝ ලේඛනයෙහි ඇතුළත් විස්තරවල පිටපතක් හෝ අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කිසිම අවස්ථාවක, බල නොකළ යුතු ය.

(12) යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළව කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ, භාරයේ හෝ පාලනය යටතේ ඇති යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලබාගැනීමට හෝ පරීක්ෂා කිරීමට අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ බලයක් පැවරෙන විධිවිධාන කිසිවක්, මේ වගන්තියේ අඩංගු ලෙස කියවා තේරුම් නොගත යුතු ය.

(13) ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් දේශයක ආණ්ඩුව අතර ඇති කරගන්නා ලද සහ මේ පනතේ 97 වන වගන්තියෙහි සඳහන් යම් ගිවිසුමක් අනුව කටයුතු කිරීමේදී තොරතුරු හුවමාරු කරගැනීම මගින් තමාගේ දැනගැනීමට ලැබෙන යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළ යම් විස්තර, ගිවිසුමේ විෂය කාරණය වන බදු තක්සේරු කිරීමට හෝ එකතු කිරීමට හෝ බලාත්මක කිරීමට හෝ ඊට අදාළ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමට සම්බන්ධ වූ යම් තැනැත්තෙක් හෝ අධිකාරයක් නොවන යම් තැනැත්තකුට හෝ අධිකාරයකට හෙළි කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට නියම කෙරෙන්නේ යයි, මේ වගන්තියේ ඉහතින් වූ කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල.

**210**. (1) මේ වගන්තියේ (මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එක් එක් වර්ෂය වෙනුවෙන් අරමුදලේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන යම් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් පනතක් ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යක්ෂමතාව සහතික කරනු පිණිස අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් පංතියකට හෝ වර්ගයකට අයත් නිලධරයන්ට සමූහ දිරිගැන්වීමේ දීමනා.

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ, නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.

**211**. වෙනත් යම් තැනැත්තකු විසින් එළිදරව් කරනු නොලැබුවා වූ යම් ආදායමක තක්සේරු කිරීම සහ ඒ තැනැත්තාගේ බද්දක් රැස්කර ගැනීම ප්‍රතිඵලය වන තොරතුරක් සපයන්නා වූ කවර හෝ පුද්ගලයකුට අවස්ථානුගත කරුණු අනුව යුක්තිසහගත යයි තමා විසින් කලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, පාර්ලිමේන්තුව විසින් තත්කාර්යය සඳහා විසර්ජන කොට ඇති මුදල්වලින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගෙවිය හැකි ය.

කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු සපයන්නන්ට ත්‍යාග පිරිනැමිය හැකි බව.

XXXI වන පරිච්ඡේදය

පොදු කාරණා

**212**. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලගැන්වීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

නියෝග

(2) (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, විශේෂයෙන් ම පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය :-

(අ) ආදායම් ප්‍රමාණය, ඒකාන්ත ලෙස නිශ්චය කළ නොහැකි අවස්ථාවල දී, බදු අය කිරීමට යටත් ආදායමේ ඇස්තමේන්තුවක් පිළියෙල කරනු ලැබිය හැකි ක්‍රම ;

(ආ) මේ පනත යටතේ ගෙවනු ලැබූ යම් බද්දක් ආපසු ගෙවීම සඳහා හෝ මේ පනත යටතේ ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් දීමනාවක් හෝ අඩු කිරීමක් සඳහා කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඇ) නියම කිරීමට මේ පනතින් නියමිතව හෝ බලය ලැබී ඇති යම් කාරණයක් ;

(ඈ) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝග කඩකිරීම සඳහා හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සඳහා නියම කරනු ලබන්නා වූ ද, එක් එක් අවස්ථාව සම්බන්ධයෙන් රුපියල් පන්සියයකට වැඩි නොවිය යුතු වූ ද, දණ්ඩන.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයක් කඩ කිරීම සම්බන්ධයෙන් හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් –

(අ) දණ්ඩනයක් නියම කිරීමේ ; හෝ

(ආ) නියම කරන ලද දණ්ඩනයක් වැඩි කිරීමේ,

නියෝගයක් හැර, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයක් එය ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබූ දිනයට වඩා කලින් වූ දිනයක සිට බලපැවැත්වෙන ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(4) නියෝගයක් කඩ කිරීම හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සඳහා දඩුවමක් නියම කරන නියෝගයක්, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන තුරු ද, ඒ අනුමතය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරන තුරු ද, ක්‍රියාත්මක නොවිය යුතු ය.

(5) (4) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ නියෝගයක් නොවන, අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි එය පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් දිනයක් දී ක්‍රියාත්මක විය යුතු ය.

(6) (5) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලබන සෑම නියෝගයක්ම ඒ අනනුමතයේ දින සිට, එහෙත් එය යටතේ ඊට කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ආකෘති

**213**. මේ පනතේ කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා භාවිතා කළ යුතු ආකෘති කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කළ නිශ්චය කොට දක්වනු ලැබිය හැකිය ; එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘතියක් කලික් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘතියක් වෙනුවට වෙනයම් ආකෘතියක් ආදේශ කිරීම, කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ හැකිය. තවද, කොමසාරිස් ජනරාල්වරයා විසින් එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘතියක්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය හැකි ය.

ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය.

**214**. (1) මේ පනතේ කාර්ය සඳහා පත්කරනු ලැබූ ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබුව ද යම් නිලධරයකු විසින්, සාම නිලධරයකු සමඟ ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටුකළ හැකි ය.–

(අ) මේ පනත යටතේ වූ කටයුත්තක් සඳහා ප්‍රයෝජන වන්නේ ය හෝ කටයුත්තකට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන ඇතැයි විශ්වාස කිරීමට ඔහුට

හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ එවැනි යම් භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන සොයා ගනු ලැබුවහොත්, ඒවා පරීක්ෂා කිරීම;

(ආ) එබඳු භාණ්ඩ, ගිණුම් පොත් හා වෙනත් ලේඛන තහනමට ගෙන කොමසාරිස් ජනරාල්වරයාට භාරදීම හෝ එහි අඳුනා ගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම ;

(ඇ) එසේ භාරදීමේ කාර්ය සඳහා එබඳු යම් භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම ;

(ඈ) මේ පනත යටතේ පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ එබඳු යම් භාණ්ඩවල, ගිණුම් පොත්වල හෝ වෙනත් ලේඛනවල අයිතිය සම්බන්ධයෙන්, එම ගොඩනැගිල්ලෙහි දී හෝ ඒ ස්ථානයෙහි දී හමුවන යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම ;

(ඉ) මේ වගන්තිය යම් සෝදිසියක් කිරීමේදී සොයාගනු ලැබූ මේ පනත යටතෙහි වූ යම් කටයුතුවලට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන වෙන යම් සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තවද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම්වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ සෝදිසි කිරීම්වලට ද හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය පැවරීමට පෙර, ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වීමට තුඩුදුන් හේතු, කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තා කළ යුතු ය.

(3) (අ) මේ වගන්තිය යටතේ සෝදිසි කිරීමක් කරන නිලධරයා විසින් යම් භාණ්ඩයක් තහනමට ගෙන –

(i) කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරන යම් ලිඛිත නීතයක් යටතේ ඒ භාණ්ඩයේ අයිතිකරු විසින් ගෙවිය යුතු යම් බද්දක් ගෙවීම පැහැර හැර තිබේ නම්, නැතහොත් ;

(ii) ඒ අයිතිකරු විසින් ගෙවිය යුතු නමුදු ඔහු විසින් එසේ ගෙවා නැති බද්දට අදාළ වූ ලාභවලින් සහ ආදායමෙන් ඒ භාණ්ඩය එහි අයිතිකරු විසින් මිලදී ගෙන ඇතැයි හෝ ඒ භාණ්ඩය ඒ ලාභ හා ආදායම වෙතැයි තමා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරීක්ෂණයකින් පසු ඒ නිලධරයා සෑහීමට පත් වුවහොත්,

පමණක් එය කොමසාරිස් ජනරාල්වරයාට භාරදිය යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ සෝදිසි කිරීමක් කරන නිලධරයකු විසින් යම් භාණ්ඩයක් තහනමට ගනු ලැබුවහොත්, එසේ තහනමට ගනු ලැබූ භාණ්ඩය පිළිබඳව ලදුපතක් එම නිලධරයාගෙන් ලබා ගැනීමට එම භාණ්ඩයේ අයිතිකරුට හිමිකම් තිබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ යම් භාණ්ඩයක් තහනමට ගෙන කොමසාරිස් ජනරාල්වරයා වෙත භාරදී ඇති අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් –

(අ) එම භාණ්ඩය මුදල් නම් සහ ඒ මුදල් ගෙවීම පැහැර හැර ඇති බදු මුදලට හෝ ඒ භාණ්ඩ සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස් පරිදි ගෙවිය යුතු බදු මුදලට අඩු හෝ සමාන නම්, ඒ මුදල් ඒ බද්දේ කොටසක් හෝ සම්පූර්ණ බද්ද හෝ පියවීම සඳහා හිලව් කළ හැකිය ;

(ආ) ඒ මුදල හිලව් කළයුතු බදු මුදලට වඩා වැඩි නම්, ඒ බද්ද සම්පූර්ණයෙන් පියවීම සඳහා අවශ්‍ය ඒ බදු මුදලට සමාන තරම් මුදලක් හිලව් කර, ඉතිරි මුදල් ඒ භාණ්ඩයේ අයිතිකරුට ආපසු දිය හැකිය :

එසේ වුව ද, ඒ මුදල් විදේශීය ව්‍යවහාර මුදලින් වූ අවස්ථාවක දී, ඒ ඉතිරි මුදල් බැංකුවක ඒ භාණ්ඩයේ අයිතිකරුගේ ගිණුමට බැර කළ යුතු ය ; නැතහොත්

(ඇ) ඒ භාණ්ඩය මුදල් නොවේ නම් –

(i) අවස්ථාවෝචිත පරිදි, ගෙවීම් පැහැර හැරිය බද්ද හෝ ඒ භාණ්ඩය මිලදී ගැනීමට යෙදවූ ලාභ සහ ආදායම සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස පරිදි ගෙවිය යුතු බද්ද ගෙවන තෙක් ; හෝ

(ii) කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට ඒ ආදායම් බද්ද ගෙවීමට කටයුතු පිළියෙල කරන තෙක්,

(5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ භාණ්ඩය තම භාරයේ තබාගත හැකි ය.

(5) ඒ භාණ්ඩය තහනමට ගැනීමේ දිනයෙන් පසු මාස හයක් ඇතුළත ඒ භාණ්ඩයේ අයිතිකරු විසින්, (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි නිශ්චිතව සඳහන් ලෙස බද්ද, නොගෙවූ හෝ ගෙවීමට කටයුතු පිළියෙල නොකළ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ භාණ්ඩය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ යම් භාණ්ඩයක් විකිණීමෙන් ලබාගත් මුදල –

(අ) පළමුව, ඒ භාණ්ඩය තහනමට ගැනීමට, තබා ගැනීමේ සහ විකිණීමේ ගාස්තු සහ අයකිරීම ගෙවීම සඳහා ; සහ

(ආ) දෙවනුව, ඒ භාණ්ඩය අයිතිකරු විසින් ගෙවිය යුතු ආදායමේ බද්ද පියවීම සඳහා,

යෙදවා, ඉතිරි මුදලක් ඇත්නම්, එය ඒ භාණ්ඩයේ අයිතිකරු වෙත ගෙවිය යුතු ය.

(7) මේ වගන්තියේ –

"භාණ්ඩය" යන්නට ශ්‍රී ලංකාවේ ව්‍යවහාර වන හෝ නොවන මුදල්, තැපැල් ඇණවුමක්, මුදල් ඇණවුමක්, සංචාරක චෙක්පතක්, ණයවර ලිපියක්, විනිමය බිල් පත්‍රයක, පොරොන්දු නෝට්ටුවක්, රත්රන්, ආභරණ, මැණිකක් සහ අතේ ඇති යම් බඩු තොගයක් ඇතුළත් වේ ;

"ලේඛනය" යන්නට යම් පරිගණක වැඩසටහනක් හෝ දත්ත සංකේතකාරයෙන් හෝ විද්‍යුත් කාන්දම් හෝ වෙනත් මාධ්‍යකින් ගබඩා කර ඇති හෝ සටහන් කර ඇති යම් ඩිස්කටයක්, පටියක්, සුසංහිත ඩිස්කටයක් හෝ එවැනි වෙනත් යම් දෙයක් ඇතුළත් වේ ;

"සාම නිලධරයා" යන්නට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

**215**. (1) කොමසාරිස් ජනරාල් විසින් හෝ තත් කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ පහත දැක්වෙන සියලු ක්‍රියා හෝ ඉන් කිසිවක් කළ හැකි ය :- ව්‍යාපාර ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය.

(අ) යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට මේ පනතේ කාර්ය සඳහා ඇතුළුවී පරීක්ෂා කිරීම ;

(ආ) යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලේඛනයක්, එහි තිබී සොයා ගත හැකි යම් බඳුනක් විවෘත කොට පරීක්ෂා කිරීම සහ එහි සොයා ගනු ලැබූ භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වෙන්ටරියක් සෑදීම;

(ඇ) ඒ ස්ථානයේ දී හෝ ගොඩනැගිල්ලෙහි දී සොයා ගනු ලැබූ යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලේඛනයක් පරීක්ෂා කිරීම සහ ඉන් පිටපත් හෝ උධෘත ගැනීම;

(ඈ) එවැනි යම් ගොඩනැගිල්ලක තිබී හමුවන යම් පරිගණකයක ක්‍රියාත්මක කිරීම සහ එහි වාර්තා කර ඇති හෝ ගබඩා කර ඇති සටහන් වල මුළුමණින්ම හෝ එහි කොටසක මුද්‍රිත ගැනීම;

(ඉ) එවැනි යම් ගිණුම් පොතක්,රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් සන්තකයට ගැනීම හෝ ඒ මත හඳුනා ගැනීමේ සලකුණු තැබීම;

(ඊ) ඒ ස්ථානයේ හෝ ගොඩනැගිල්ලෙහි සොයා ගනු ලැබූ මුදල් වහාම ගණන් කිරීම සහ ඒ පිළිබඳ වාර්තාවක් සකස් කිරීම;

(උ) එවැනි යම් ස්ථානයක දී හෝ ගොඩනැගිල්ලක දී ඔහු විසින් සොයා ගනු ලබන යම් තැනැත්තකුට මේ පනත යටතේ යම් කාරණයක් සම්බන්ධයෙන් තම බලය ඇතුළත වූ යම් තොරතුරක් දීමට නියම කිරීම;

(ඌ) මේ පනත යටතේ යම් කාරණයක් පිළිබඳව යම් ස්ථානයක හෝ ගොඩනැගිල්ලක ඔහු විසින් සොයාගනු ලබන යම් තැනැත්තකු සුදුසු යයි තමා අදහස් කරන පරිදි තනිවම හෝ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හෝ පරීක්ෂා කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින්, යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක, ඒ නිලධරයා විසින්, තම සන්තකයට ගනු ලැබූ පොත, රෙජිස්ටරය, වාර්තාව හෝ වෙනත් ලේඛනය සඳහන් කෙරෙන සටහන් පත්‍රයක් අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නිකුත් කළ යුතු ය.

(3) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් ඒ පොත, රෙජිස්ටරය, වාර්තාව හෝ වෙනත් ලේඛනය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන තාක්කල් හෝ ඒ පොත, රෙජිස්ටරයට, වාර්තාව හෝ වෙනත් ලේඛනය අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා ඒ නිලධරයාගේ සන්තකයෙහි රඳවා ගනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා-

"භාණ්ඩ" සහ "ලේඛනය" යන යෙදුම්වලට 214 වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

**216**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

## XXXII වන පරිච්ඡේදය

## අර්ථ නිරූපණය

**217**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි- අර්ථ නිරූපනය

"අත්කර ගනු ලැබූ" යන්න දේපළ සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, මිලදී ගැනීමක්, ත්‍යාගයක් වශයෙන් උරුමවීමෙන් හෝ හුවමාරු කර ගැනීමෙන් නැතහොත් වෙනත් යම් ආකාරයකින් අත්කර ගනු ලැබූ බව ඉන් අදහස් වන අතර, "අත්කර ගැනීම" යන යෙදුම ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය;

"සක්‍රීය හවුල්කරු" යන්න, හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ හවුල් ව්‍යාපාරයේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය පාලනය කිරීම, කළමනාකරණය කිරීම හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සක්‍රීය කොටස් ඉටුකරන හවුල්කරුවෙක්, ඉන් අදහස් වේ;

"අනුයෝජිතයා" යන්න, නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් හෝ නිර්වාසික තැනැත්තකු යම් හවුල්කරුවකු වන හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් හෝ යෙදෙන විට-

(අ) ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ සිටින අනුයෝජිතයා, ඇටෝර්නි බලකරු, වෙළෙඳ නියෝජිතයා, දේපළ භාරගන්නා හෝ කළමනාකරු; සහ

(ආ) ශ්‍රී ලංකාවෙහි උද්ගත වන හෝ ශ්‍රී ලංකාවේදී ලබා ගනු ලබන යම් ලාභ හෝ ආදායම් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු මගින් ලබාගන්නේ ද, ඒ තැනැත්තා ඊට ඇතුළත් වේ ;

"කෘෂිකාර්මික ව්‍යවසාය" යන්නෙන්, යම් කෘෂිකාර්මික නිෂ්පාදන, උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන හෝ යම් සත්ව නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා වූ යම් ව්‍යවසායක් අදහස් වන අතර, පශු සම්පත් හෝ කුකුළන් ඇති කිරීමේ කාර්යය සඳහා වූ යම් ව්‍යවසායක් ද ඊට ඇතුළත් වේ ;

"කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන්න, අර්ථ සාධක හෝ විශ්‍රාම වැටුප අරමුදලක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ අරමුදල් සම්බන්ධයෙන් දායකයන්ගේ පොලිය ආරක්ෂා කිරීම සහ ආදායම ආරක්ෂා කිරීම කෙරෙහි සැලකිලිමත්ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් සඳහන් කරනු ලබන යම් කොන්දේසිවලට අනුකූල වන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද බව ඉන් අදහස් වේ;

"අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ" යන්න, ව්‍යවසායක් හෝ සමාගමක් හෝ රාජ්‍ය සංස්ථාවේ හෝ ආයතනයක් නැතහොත් යම් අරමුදලක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ බව ඉන් අදහස් වේ;

"තක්සේරු කළ හැකි ආදායම" යන්නෙන්, 32 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු හිමිකම් ලබන අඩුකිරීම්වල සමස්ත අඩුකිරීමෙන් පසු ඒ තැනැත්තා ගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙහි ශේෂය අදහස් වේ ;

"තක්සේරුකරු" යන්නෙන්, මේ පනත යටතේ පත්කරනු ලැබූ හෝ පත්කරනු ලැබුවේ යයි සලකනු ලබන දේශීය ආදායම් තක්සේරුකරුවකු අදහස් වන අතර, දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ද ඊට ඇතුළත් වේ ;

"බලයලත් නියෝජිතයා" යන්නෙන් -

(1) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් දෙනු ලැබුවා වූ ද -

(අ) (i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු වන්නා වූ ද ;

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ ගණකාධිකාරීවරයෙක් වන්නා වූ ද ;

(iii) නීතිඥවරයකු වන්නා වූ ද ;

(iv) ඒ තැනැත්තා විසින් නිතිපතා සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තියකු වන්නා වූ ද ;

(v) 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරන කාර්යායතන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනයේ සාමාජිකයකු වන්නා වූ ද ;

(ආ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඔහුගේ ඥාතියකු වන්නා වූ ද ;

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයා වන්නා වූ ද ;

(ඈ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වන්නා වූ ද ;

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නා වූ ; නැතහොත්,

(2) බලය දීමේ ලියවිල්ලෙහි සඳහන් තක්සේරු වර්ෂයට අදාළ කාරණා සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස යම් තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබූ සහ -

(අ) සමාගම් (විගණකවරයන්ගේ) නියෝග යටතේ විගණකවරයකු ලෙස ලියාපදිංචිව සිටින පුද්ගලයකුව කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ; හෝ

(ආ) තත්කාර්ය සඳහා සාදන ලද නියෝගය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ පුද්ගලයකු වන්නා වූ හෝ පුද්ගලයෙක්,

අදහස් වේ ;

"බැංකුව" යන්නෙන්, බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, ඊට 1988 අංක 30 දරණ බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්ද ඇතුළත්වේ ;

"පුද්ගල මණ්ඩලය" යන්නට, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය අධිකාරියක්, යම් සංස්ථාගත මණ්ඩලයක් හෝ විද්‍යායතනයක්, යම් සහෝදරත්වයක් මිත්‍ර සංගමයක්, සංගමයක් හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක් සහ යම් ඒකාබද්ධ හින්දු පවුලක් ද ඇතුළත් වන නමුත්, සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් ඊට ඇතුළත් නොවේ ;

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ ;

"ව්‍යාපාරය" යන්නට, කෘෂිකාර්මික ව්‍යවසායක්, තුරඟ තරඟ පැවැත්වීම, සමාගමක් විසින් යම් ඉඩමක් ඇතුළුව යම් පරිශ්‍රයක් කුලියට හෝ බද්දට දීම, සහ වනාන්තර වගාවක් ඇතුළත් වේ ;

"ලංකා සංචාරක මණ්ඩලය" යන්නෙන්, 1996 අංක 10 දරන ලංකා සචාරක මණ්ඩල පනතින් පිහිටුවන ලද ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ ;

"ලංකා වෙළඳ මණ්ඩලය" යන්නෙන්, වෙළෙඳ මණ්ඩල ආඥා පනතින් සංස්ථාගත කරන ලද ලංකා වෙළෙඳ මණ්ඩලය අදහස් වේ ;

"පුන්‍යායතනය" යන්නෙන්, පුන්‍ය කාර්යයක් සඳහා පමණක් පිහිටුවනු ලැබූ හෝ හුදෙක් පුන්‍ය කාර්යයක් කරගෙන යාමෙහිලා යෙදී සිටින භාරයක භාරකරුවකු හෝ භාරකරුවන් නැතහොත් සංස්ථාවක් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

"පුන්‍ය කාර්යය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර මහජනයාගේ හෝ මහජනයාගෙන් කොටසක යහපත සඳහා වූ පහත දැක්වෙන කාර්ය වර්ග අතුරින් යම් කාර්ය වර්ගයක් අදහස් වේ—

(අ) දරිද්‍රතාවට සහනය වීම ;

(ආ) අධ්‍යාපනය හෝ දැනුම දියුණු කිරීම ;

(ඇ) ආගම දියුණු කිරීම හෝ ආගම් චාරිත්‍ර හා පිළිවෙත් පවත්වාගෙන යාම හෝ පොදු පූජනීය ස්ථානයක් පරිපාලනය කිරීම ;

(ඈ) ඉහතින් වූ වර්ග අතුරින් කිසිවකට අයත් නොවන්නා වූ ද මනුෂ්‍ය වර්ගයාට ප්‍රයෝජනවත් වූ හෝ ඔවුන්ගේ යහපත සඳහා වූ වෙනත් යම් කාර්යයක් ;

"දරුවා" යන්න මේ පනත අදාළ වන පුද්ගලයකු සම්බන්ධයෙන් යෙදෙන විට, වයස අවුරුදු දහඅටට අඩු දරුවකු ඉන් අදහස් වන අතර, ඒ පුද්ගලයා විසින් ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ දරුකමට හදාගනු ලැබූ දරුවකු ද, ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන අවස්ථාවක, ඔහු යටත් වැසියකු හෝ පුරවැසියකු වන්නේ යම් රටක ද, ඒ රටෙහි නීතිය අනුව ඔහු විසින් දරුකමට හදාගනු ලැබූ දරුවකු ද ඊට ඇතුළත් වන නමුත්–

(අ) වෙනත් යම් නීතියක් යටතේ දරුකමට හදාගනු ලැබූ යම් දරුවකු ;

(ආ) විවාහක දරුවකු ;

(ඇ) අවජාත දරුවකු ;

ඊට ඇතුළත් නොවේ ;

"වාණිජ බැංකුව" යන්නට, මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් මේ පනත යටතේ පත්කරනු ලැබූ හෝ පත්කරනු ලැබූ ලෙස සැලකෙන හෝ දේශී ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර, ඊට –

(අ) මේ පනතේ යම් විධිවිධානයක් සම්බන්ධයෙන් පොදුවේ හෝ නිශ්චිත කාර්යයක් සඳහා හෝ වැඩ බැලීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂයෙන්ම බලය දෙනු ලැබූ ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු, ජ්‍යෝෂ්ඨ කොමසාරිස්වරයකු සහ නියෝජ්‍ය කොමසාරිස් වරයකු ඇතුළත් වේ, තව ද

(ආ) XXIII වන පරිච්ඡේදය සම්බන්ධයෙන්වූ විට, අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබ ඒ පරිච්ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ තීරකවරයකු ඇතුළත් වේ ;

"සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ අන්කිසි තැනක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ යම් සමාගමක් අදහස් වන අතර, යම් රාජ්‍ය සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ ;

"විනිමය පාලක" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලක දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස නාමෝද්දිෂ්ට කරනු ලැබූ නිලධරයා අදහස් වේ ;

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන් මේ පනත යටතේ පත්කරනු ලැබූ හෝ පත්කරනු ලැබූ ලෙස සලකනු ලබන දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් අදහස් වේ ;

"ලාභාංශ" යන්නට –

(අ) සමාගමක් විසින් ස්වකීය කොටස්කරුවන්ට දෙනු ලබන –

(i) මුදල් හෝ මුදල් ගෙවීම සඳහා වූ ඇණවුමක් ; හෝ

(ii) වෙනත් යම් සමාගමක කොටස් ; හෝ

(iii) ඒ සමාගමේ හෝ වෙනත් සමාගමක ඍණ පත්‍ර ස්වරූපයෙන්වූ යම් ලාභ බෙදා දීමක්ද ;

(ආ) යම් ප්‍රාග්ධනයක මුදල ආපසු දෙන ලද හෝ බෙදා දෙන ලද දිනයට ඉහතින් වූ අවුරුදු හය ඇතුළත සමාගම විසින් ස්වකීය කොටස්කරුවන්ට බෙදා දෙන ලද යම් කොටස්වල සමාගමේ මුල් ලාභ ප්‍රමාණය හෝ එයින් යම් කොටසක් ප්‍රාග්ධනය බවට හැරවීම දක්වන ගෙවා නිමි අගයෙහි ප්‍රමාණයට ආපසු දෙන ලද හෝ බෙදා දෙන ලද යම් ප්‍රාග්ධන මුදලක් ද ;

ඇතුළත් වේ ;

"ත්‍යාගලාභියා" යන්නෙන්, තෑගි කිරීමක් යටතේ යම් දේපළක් අත්කරගත් යම් තැනැත්තකු අදහස් වන අතර, යම් තැනැත්තකුගේ අර්ථලාභය සඳහා භාරකරුවකුට ත්‍යාගයක් දෙනු ලැබූ අවස්ථාවක, භාරකරු හා අර්ථලාභියා යන දෙදෙනාම එයට ඇතුළත් වේ ;

“ ත්‍යාගදායකයා” යන්නෙන්, ත්‍යාගයක් කරන යම් තැනැත්තෙක් අදහස් වේ ;

“විධායක නිලධරයා” යන්නෙන්, සමාගමක හෝ සංස්ථාවක අධ්‍යක්ෂවරයෙක් හෝ (සියලු දීමනා ඇතුළුව) රුපියල් විසිදහසකට අඩු නොවන මාසික පඩිනඩි ලබන, යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක නියුක්ත යම් සේවා නියුක්තයෙක් අදහස් වේ ;

“පොල්මෑකරු” යන්නෙන්, මියගිය තැනැත්තකුගේ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු අදහස් වන අතර–

(අ) මියගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය ලබාගන්නා හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත්වන යම් තැනැත්තෙක් ;

(ආ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ නැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයට ඉල්ලුම් කර ඇති හෝ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක් ; හෝ

(ඇ) භාරය පිහිටුවන තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයෙන් පිහිටුවනු ලැබූ භාරයක් යටතේ ක්‍රියාකරන භාරකරුවෙක් ;

එයට ඇතුළත් වේ ;

“විදේශීය ව්‍යවහාර මුදල්” යන්නට විනිමය පාලන පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

“විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකය” යන්නෙන්, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙන ලද වාණිජ බැංකුවක ඒකකයක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වේ ;

“මැණික්” යන්නට 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"ත්‍යාගය" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 52 වන වගන්තියේ අර්ථානුකූල වූ ත්‍යාගයක් අදහස් වේ ;

"ආණ්ඩුවේ ආයතනය" යන්නෙන්, ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවසායක් අදහස් වේ ;

"අශක්නුතාවට පත් තැනැත්තා" යන්නෙන්, බාලවයස්කරුවෙක්, උන්මත්තකයෙක්, මුග්ධයෙක් හෝ සිහිවිකල් තැනැත්තෙක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල කර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් හෝ සභාවක් ඊට ඇතුළත් වේ ;

"වෙළෙඳ පොළ අගය" යන්නෙන්, එය යම් දේපළක් හා යම් දිනයක් සම්බන්ධයෙන් යෙදෙන විට, විවෘත වෙළෙඳ පොළකදී, ඒ දිනයෙහිදී ඒ දේපළ සඳහා තක්සේරුකරුගේ මතය අනුව ලබාගත හැකි මිල ඉන් අදහස් වේ ;

"අන්‍යොන්‍ය අරමුදල" යන්නෙන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අන්‍යොන්‍ය අරමුදලක් වශයෙන් බලපත්‍රයක් දෙන ලද යම් අන්‍යොන්‍ය අරමුදලක් අදහස් වේ ;

"නිර්වාසික හෝ නේවාසික නොවන" යන්නෙන්, 79 වන වගන්තියේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ වාසික නොවූ බව අදහස් වේ ;

"අයිතිකරු" යන්න, ඉඩමක් හා එ හි වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යෙදෙන විට, බිම් බද්දකට හෝ වෙනත් වාර්ෂික ගාස්තුවකට යටත්ව ඒ ඉඩම සහ එහි වැඩි දියුණු කිරීම භුක්ති විඳින තැනැත්තෙක් ඉන් අදහස් වේ ;

"හවුල් ව්‍යාපාරය" යන්නට, යම් හවුල් ව්‍යාපාරයක් හවුල්කරුවකුගේ බෙදිය හැකි ලාභයේ හෝ බෙදිය හැකි අලාභයේ කොටස වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සමඟ හවුලේ බෙදා ගනු ලැබීම පිණිස වූ යම් නියාදනය කිරීමක්, භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක්, පැවරීමක්, බේරුම් කිරීමක් හෝ වෙනත් වැඩපිළිවෙළක් ඇතුළත් නොවන්නේය ;

"තැනැත්තා" යන්නට, සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවක් ඇතුළත් වේ ;

"ප්‍රමුඛ හවුල්කරු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රීය හවුල්කරුවන් ඇතුරින්–

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති ;

(ආ) එවැනි ගිවිසුමක් නොමැති නම්, හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිවම හෝ අනික් හවුල්කරුවන්ට ප්‍රමුඛව නමින් හෝ මුලකුරුවලින් සඳහන් කොට ඇති ; හෝ

(ඇ) 1987 අංක 7 දරන ව්‍යාපාර නාම පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයෙහි පළමුවෙන් නම් කොට ඇති,

හවුල්කරු අදහස් වේ ;

"නියමිත, යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලින් නියමිත බව අදහස් වේ ;

"ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන්, ශ්‍රී ලංකා මුදල් මණ්ඩලය විසින් (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත ආඥාපනත යටතේ හෝ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ පත්කරන ලදුව, භාණ්ඩාගාර, බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ලියාපදිංචි ස්කන්ධ හෝ වෙනත් සුරැකුම්පත් සඳහා ප්‍රාථමික අලෙවි කරුවකු ලෙස ක්‍රියා කරන, මූල්‍ය සම්පාදකයකු හෝ බැංකුවක් අදහස් වේ ;

"ලාභ" හෝ "ආදායම්" යන්නෙන් යම් කාලසීමාවකදී කවර හෝ ප්‍රභවයකින් ලැබෙන, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ආගමනය කරනු ලැබූ ශුද්ධ ලාභ හෝ ආදායම අදහස් වේ ;

"දේපළ" යන්නට, යම් චංචල හෝ නිශ්චල දේපළක යම් සම්බන්ධතාවක් ද ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව යටතේ පළාතක් සඳහා පිහිටුවන ලද යම් පළාත් සභාවක් අදහස් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවනු ලැබුවා හෝ ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"නිල ලැයිස්තුගත පොදු සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් අදහස් වන අතර, එය යම් තක්සේරු වර්ෂයකට අදාළව ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේම කොටස් නිල ලැයිස්තුගත කෙරුණු සමාගමක් බවට හෝ ඒ තක්සේරු වර්ෂය තුළ එම සමාගම සංස්ථාගත කරනු ලැබ ඇති අවස්ථාවක, සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ තක්සේරු වර්ෂයේ අවසානය දක්වා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලයක් දෙන ලද, යම් නිල ලැයිස්තුවක ලැයිස්තුගත කෙරුණු බවට හෝ තක්සේරුකරු සෑහීමට පත්වන්නා වූ සමාගමක් අදහස් කෙරේ ;

"වරිපනම්" යන්නෙන්, දේපළ වෙනුවෙන් යම් පළාත් පාලන ආයතනයක් විසින් නියම කරනු ලැබූ යම් බදු අදහස් වේ ;

"භාරගැනුම්කරු" යන්නට යම් ඇවරකරුවකු ද, යම් පැවරුම්ලාභියකු, භාරකරුවකු හෝ වස්තුභංගත්වයට හෝ බංකොළොත්භාවයට පත්වීමේ හේතුවෙන් යම් තැනැත්තකුගේ දේපළවල සන්තකය හෝ පාලනය සතුව සිටින වෙනත් තැනැත්තකු ද, ඇතුළත් වෙති ;

"පරිපාලිත අර්ථසාධක අරමුදල" යන්නෙන් –

(අ) ස්වකීය ලාභ හා ආදායම යම් ලිඛිත නීතියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද සංස්ථාවක් විසින් පිහිටුවනු ලැබූ ; සහ

(ආ) ඒ සංස්ථාව සංස්ථාපනය කරනු ලැබූ ලිඛිත නීතිය යටතේ පරිපාලිත කොට පවත්වනු ලබන,

යම් අර්ථසාධක අරමුදලක් අදහස් වේ ;

"වාසික" හෝ ශ්‍රී "ලංකාවේ වාසික" යන්නෙන් 79 වන වගන්තියෙහි අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින බව අදහස් වේ ;

"සුරැකුම් පත් සහ විනිමය කොමිෂන් සභාව" යන්නෙන් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අදහස් වේ ;

"කොටස්කරු" යන්නට සමාගමක ප්‍රාග්ධනය කොටස්වලට බෙදනු ලැබුව ද නොලැබුවා වූ ද, ඒ සමාගමේ ප්‍රාග්ධනයෙහි හෝ ලාභවල හෝ ආදායමෙහි කොටසක් හෝ එහිලා සම්බන්ධතාවක් හෝ ඇති ඒ සමාගමේ යම් සාමාජිකයෙක් ඇතුළත් වේ ;

"කොටස" යන්නට, සමාගමක ප්‍රාග්ධනයෙහි හෝ ලාභවල හෝ ආදායමෙහි යම් සම්බන්ධතාවක් ඇතුළත් වේ ;

"ව්‍යවස්ථාපිත ආදායම" යන්නෙන්, 28 වන වගන්තිය අනුව ආගණනය කරනු ලැබූ කවර හෝ ප්‍රභවයකින් ලැබුණු ආදායම අදහස් වේ ;

"බදු අය කළ හැකි ආදායම" යන්නෙන්, 33 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු හිමිකම් ලබන දීමනාවල සමස්තය අඩු කිරීමෙන් පසුව ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ ශේෂය අදහස් වේ ;

"වෙළෙඳාම" යන්නට, සෑම වෙළෙඳාමක් හා නිෂ්පාදනයක් ද වෙළෙඳ ස්වාභාවය ඇති සෑම ප්‍රයත්නයක් හා ආයතනයක් ද ඇතුළත් වේ ;

"දේපළ පැවරීම" යන්නෙන්, යම් බැහැර කිරීමක්, සමර්පණය කිරීමක්, වෙන්කර පැවරීමක්, නිරවුල් කිරීමක්, භාරදීමක්, ගෙවීමක් හෝ වෙනත් අන්දමකින් දේපළ අන්සතු කිරීමක් අදහස් වන අතර–

(අ) දේපළ සම්බන්ධයෙන් භාරයක් ඇති කිරීම ; සහ

(ආ) යම් දේපලක යම් සම්බන්ධතාවක් ප්‍රදානය කිරීම හෝ ඇති කිරීම ද ;

එයට ඇතුළත් වේ ;

"භාරකරු" යන්නට, යම් භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමනාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් දේපලක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය සතුව ඇති වෙනත් තැනැත්තකු ද ; යම් ඒකක භාරයක් ඇති කරන සාධන පත්‍රය මගින් ඒ ඒකක භාරයේ භාරකරු වශයෙන් පත්කරන ලද තැනැත්තා ද, ඇතුළත් වන නමුත්, පොල්මෑකරුවෙක් ඊට ඇතුළත් නොවේ ;

"ඒකක භාරය" යන්නෙන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඒකක භාරයක් වශයෙන් බලපත්‍රයක් දෙන ලද යම් ඒකක භාරයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව" යන්න ගිණුමක් ආරම්භ කිරීම හෝ ආයෝජනයක් කිරීම සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ ගිණුම ආරම්භ කිරීම හෝ ඒ ආයෝජනය කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වන හෙයින් ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇති වූ බව ඉන් අදහස් වේ ;

"තක්සේරු වර්ෂය" යන්නෙන්, යම් වර්ෂයක අප්‍රේල් මස පළමුවන දිනයෙන් ආරම්භ වී ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ මාර්තු මස තිස්එක්වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය අදහස් වේ ;

"තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය" යන්නෙන්, තක්සේරු වර්ෂයකට පෙරාතුවම වූ මාර්තු මස තිස්එක්වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය අදහස් වේ.

## XXXIII වන පරිච්ඡේදය

## 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම

2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම.

**218**. (1) 2006 වර්ෂයේ අප්‍රේල් 01 වන දිනයෙන් හෝ ඉන් පසුව හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ යම් ආදායම බද්දකට, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදාළ නොවන්නේ ය.

(2) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ යම් විධිවිධානයක් යටතේ, ඒ විධිවිධානයේ නිශ්චිතව සඳහන් කාලසීමාවක් සඳහා තැනැත්තකුගේ සම්පූර්ණ ලාභ සහ, ආදායම හෝ එහි යම් කොටසක් ආදායම් බද්දෙන් නිදහස් කර ඇති සහ 2000 මාර්තු 31 වන දිනදී යම් තැනැත්තකුට අදාළව ඒ කාලසීමාවෙන් කොටසක් නොගෙවී ඉතිරිව ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ සම්පූර්ණ ලාභ සහ ආදායම හෝ එහි යම් කොටසක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවේ (1) වන උපවගන්තියේ විධිවිධාන නිසා නොවන්නට, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ ඒ කාලසීමාව සඳහා වූ සම්පූර්ණ ලාභ සහ ආදායම හෝ එහි කොටසක් (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, ඒ විධිවිධාන අඛණ්ඩව අදාළව පවතින්නක් මෙන් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා සේ අඛණ්ඩව පැවතිය යුතු ය :

එසේ වුව ද 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 22 ඇ ඇ ඇ වගන්තියේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සමාගමකට අනුමැතිය දී ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද, ඒ කොන්දේසි අනුව ක්‍රියා නොකිරීමට ඒ සමාගම තීරණ කරන බවට 2000 දෙසැම්බර් 31 වන දිනට ප්‍රථම, ඒ සමාගම විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමක් කළහොත්, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ඒ සමාගමේ යම් ව්‍යවසායක 2000 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා වන ලාභ සහ ආදායම, ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ කවර විධිවිධානක් තිබුන ද බදු අය කරනු ලැබීමට යටත් විය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ යම් ව්‍යවසායක් විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බද්දෙන්, ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක්, නිශ්චිත කාලසීමාවක් සඳහා නිදහස් කිරීම පිණිස විධිවිධාන සලසන ගිවිසුමකට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඒ ව්‍යවසාය සමඟ 2006 අප්‍රේල් මස 1 වන දිනට ප්‍රථම ඇතුළත් වී ඇත්තා වූ ද, 2006 මාර්තු මස 31 වන දිනට ඒ නිශ්චිත කාලසීමාවෙන් යම් කොටසක් නොගෙවී ඉතිරිව ඇත්තා වූ ද අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන නිසා නොවී නම්, ආදායම් බද්දෙන් නිදහස් විය හැකිව තිබුණු, අවස්ථාවෝචිත පරිදි ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම් සම්පූර්ණයෙන් හෝ එහි කොටස, එකී නිශ්චිත කාලසීමාවෙන් නොගෙවී ඉතිරිව ඇති කොටස සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ–

(අ) තක්සේරු කළ හැකි ආදායම ගණන් බැලීමේ දී යම් අලාභයක් ;

(ආ) බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමේ දී යම් දීමනාවක්,

අඩු කිරීම සඳහා 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ යම් විධානයක් මගින් විධිවිධාන සලසා ඇති සහ 2006 මාර්තු 31 වන දිනදී, අවස්ථාවෝචිත පරිදි, ඒ අලාභයේ හෝ දීමනාවේ යම් ශේෂයක් ඉතිරිව තිබෙන අවස්ථාවක, ඒ ශේෂය (1) වන උපවගන්තියේ විධිවිධාන නිසා නොවන්නට, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමින් හෝ බදු අය කළ හැකි ආදායමින් 2000 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී අඩු කරනු ලැබිය

හැකිව තිබුණේ නම්, ඒ ශේෂය (1) වන උපවගන්තියේ කුමක් සඳහන්ව තිබුණේ වී නමුත්, ඒ අඩු කිරීම හැකි කරවන විධිවිධානයෙන් නිශ්චිතව සඳහන් යම් කොන්දේසිවලට යටත්ව, ඒ විධිවිධානය අඛණ්ඩව අදාළව පවතින්නාක් මෙන් 2006 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ තක්සේරු කළහැකි හෝ බදු අය කළ හැකි ආදායමින් අඩු කරනු ලැබිය හැකිය.

(5) 2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, පුද්ගලයකු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉඉ) ඡේදයේ සඳහන් යම් ආයතනයකට, ඒ ඡේදයේ සඳහන්–

(අ) යම් ණය මුදලක මුල් මුදල ආපසු ගෙවීම වශයෙන් ; හෝ

(ආ) යම් කුලී සින්නක්කර ගිවිසුමක මාසික ගෙවීම වශයෙන්,

යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, (1) වන උපවගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, එහෙත් ඉහත කී ඡේදයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව, ඒ මුදල, 2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී, එකී පනත තවදුරටත් බලාත්මක පවතින්නාක් සේ, ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය හැකි ය.

(6) 2000 අප්‍රේල් 1 වන දිනට පෙර අත්කර ගන්නා ලද යම් ප්‍රාග්ධන වත්කමක් හෝ 2000 අප්‍රේල් 1 වන දිනට පෙර ඉදිකරන ලද යම් සුදුසුකම් ලත් ගොඩනැගිල්ලක් හෝ සම්බන්ධයෙන්ම ක්ෂයවීම සඳහා ඉඩ දෙනු ලබන දීමනාම (1) වන උපවගන්තියේ සඳහන් අදාළ නොවීම ගැන නොතකා, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලැබිය යුතු ය.

(7) යම් ව්‍යවසායක්, සමාගමක්, රාජ්‍ය සංස්ථාවක්, ආයතනයක් හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් අරමුදලක් හෝ අවස්ථාවෝචිත පරිදි, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ යම් විධිවිධානයක් යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරීවරයකු හෝ (බලයලත් නියෝජිතයා යන්නෙහි අර්ථ නිරූපණයේ කාර්ය සඳහා) යම් පුද්ගලයකු හෝ යම් අර්ථ සාධක අරමුදලක් හෝ විශ්‍රාම අරමුදලක්, මේ පනතේ අදාළ විධිවිධාන යටතේ, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ අනුමත කරනු ලැබ ඇත්තාක් සේ හෝ අනුමත කරනු ලබන්නාක් සේ සලකනු ලැබිය යුතු ය.

පළමුවන උපලේඛනය (35 සහ 40 වන වගන්ති)

ආදායම් බදු අනුප්‍රමාණයෙහි යම් දේපළ භාරගන්නන්, භාරකරුවන්, පොල්මඃකරුවන්, හෝ ඇවරකරුවන් නොවන පුද්ගලයන්

I වන කොටස

II වන කොටසේ හෝ III කොටසේ සඳහන් කළ පුද්ගලයන් හැර අනෙක් පුද්ගලයන් -

| | |
|---|---|
| බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන 300,000 | සියයට 05 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ 200,000 මත | සියයට 10 |
| බදු අය කළ හැකි ආදායම ඊළඟ 200,000 මත | සියයට 15 |
| බදු අය කළ හැකි ආදායම ඊළඟ 200,000 මත | සියයට 20 |
| බදු අය කළ හැකි ආදායම ඊළඟ 200,000 මත | සියයට 25 |
| බදු අය කළ හැකි ආදායම ඊළඟ 500,000 මත | සියයට 30 |
| බදු අය කළ හැකි ආදායමේ ඉතිරි වන | සියයට 35 |

II වන කොටස

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 79 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසිකයකු ලෙස සලකනු ලබන්නා වූ ද පුද්ගලයකුට.

බදු අයකළ හැකි ආදායමෙන් සියයට 15

III වන කොටස

40 වන වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට අවුරුදු දෙකක කාලයක් සඳහා හෝ 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට අවුරුදු පහක කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකු.

බදු අය කළ හැකි ආදායම මත සියයට 20

IV වන කොටස

35 වන වගන්තියේ (2) වන උප වගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද සේවා නියුක්තියකින් උපයාගත් ඇතැම් ලාභ වලට අදාළ කර ගත හැකි ආදායම් බදු අනුප්‍රමාණ

35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) හෝ (ඊ) යන ඡේදවල සඳහන් යම් ගෙවීම් වර්ගයකට අදාළ වූ දායක කාලසීමාව හෝ සේවා කාලය අවුරුදු 20ට වඩා අඩු නොවන්නේ නම්, පළමුවන රුපියල් 2,000,000 සම්බන්ධයෙන් : කිසිවක් නැත

35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදවල සඳහන් යම් ගෙවීම් වර්ෂයකට අදාළ වූ දායක කාල සීමාව හෝ සේවා කාලය අවුරුදු 20 ට වඩා අඩු වන්නේ නම්, පළමුවන රුපියල් 1,000,000 සම්බන්ධයෙන් කිසිවක් නැත.

| | |
|---|---|
| ඊළඟ රු. 500,000 | සියයට 05 |
| ඊළඟ රු. 500,000 | සියයට 10 |
| ඉතිරිය සම්බන්ධයෙන් | සියයට 15 |

දෙවන උපලේඛනය (61 වන 75 වන වගන්ති)

ආදායම් බදු අනුප්‍රමාණ - සමාගම්

2006 අප්‍රේල් මස 01 වන දින හෝ ඊට පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම අදාල වන ආදායම් බදු අනුප්‍රමාණ

අ කොටස

1. යම් බදු අයකළ හැකි ප්‍රාග්ධන සමාගමක් එම තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම මත සියයට 20

2. යම් ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය භාරයක්—

(අ) එම තක්සේරු වර්ෂය සඳහා වූ බදු අයකල හැම ආදායමෙන් 75 වන වගන්තියේ (4) වන උප වගන්තියේ සඳහන් යම් නිශ්චිත ක්ෂේත්‍රවල යම් ආයෝජනයකින් ලැබෙන ලාභ සහ ආදායමෙන් සංයුක්ත වන සියයට 10

(ආ) එම තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායමෙන් ඉතිරි කොටස වන — සියයට 20

ආ කොටස

1. යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි අදායම රු. 5,000,000 නොඉක්මවන (අ) කොටසෙහි සඳහන් නොවන සමාගමක් වන යම් සමාගමක්

   එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ බදු අයකල හැකි ආදායම මත — සියයට 15

2. යම් සමාගමක්, ලැයිස්තුගත පොදු සමාගමක් බටව පත්වූ (මෙහි මින්මතු පළමුවන තක්සේරු වර්ෂය යනුවෙන් සඳහන් කරනු ලබන) තක්සේරු වර්ෂය සඳහ සහ බදු අයකළ අදායම රු. 50,000,000 ඉක්මවන,

   පළමුවන, තක්සේරු වර්ෂයකට ඉක්බිතිව එළඹෙන අවුරුදු හතර ඇතුලත එක් එක් තක්සේරු වර්ෂය සඳහා එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ බදු අය කළ හැකි ආදායම මත — සියයට 33 1/3

   එසේ වුවද එම පළමුවන තක්සේරු වර්ෂය 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, සියයට 33 1/3 අනුපාතය අදාල වනුයේ එම අවුරුදු හතරක කාලය ඇතුලත වන්නාවූද 2006 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන්නනාවූ ද යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙනි

3. යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ උපලේඛනයේ මින්පෙර සඳහන් යම් සමාගමක් හැර වෙනත් සමාගමක්

   එම තක්සේරු වර්ෂය සඳහා එම සමාගමේ බදු අයකළ හැකි ආදායම මත — සියයට 35

4. යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමකට අදාලව අවස්ථාවෝචිත පරිදි මේ උපලේඛනයේ 2

වන අයිතමය හෝ 3 වන අයිතමයට අනුකූලව,
නමුත් බලනු ලබන බද්ද රුපියල් හත්ලක්ෂ
පනස් දහසක් ඉක්මවන අවස්ථාවක, එසේ
බලනු ලබන බද්ද රුපියල් හත් ලක්ෂ
පනස්දහස ඉක්මවන මුදල, එම තක්සේරු
වර්ෂය රුපියල් මිලියන පහට වඩා වැඩි
වන මුදල නොඉක්ම විය යුතුය.

තුන්වන උපලේඛනය (35 වන වගන්තිය)

ආදායම් බදු අනුප්‍රමාණය - පළමුවන උපලේඛනය
අදාළ වන පුද්ගලයන් සහ සමාගම් නොවන වෙනත්
තැනැත්තන්

| | | |
|---|---|---|
| 1. | ඒකාබද්ධ හින්දු පවුල් | සියයට 30 |
| 2. | (සංස්ථාපිත මණ්ඩල ඇතුළු) පුණ්‍යායතන | සියයට 10 |
| 3. | (අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මඃකරුවන් සහ (ඈවරකරුවන් නොවන) දේපළ භාරගන්නන් | සියයට 30 |
| 4. | (අන්තිම කැමති පත්‍රය යටතේ භාරකරුවන් ඇතුළුව) භාරකරුවෝ | සියයට 30 |
| 5. | හවුල් ව්‍යාපාර | සියයට 30 |
| 6. | හවුල් ව්‍යාපාර (යම් තක්සේරු කිරීමක් මත) | සියයට 30 |
| 7. | ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන සමුපකාර සමිතියක් | සියයට 5 |
| 8. | බදුඅයකළ හැකි ආදායම මත 101 වගන්තියේ සඳහන් කරන ලද සමාජශාල හෝ සමිති | සියයට 20 |
| 9. | අන්‍යොන්‍ය ජීවිත රක්ෂණ සමාගම | සියයට 20 |
| 10. | සමාගම්වල ඈවරකරුවෝ | අදාළ සමාගම සම්බන්ධයෙන් අය කළ බද්දෙහි අනුප්‍රමාණය |

11. (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන) ආණ්ඩුවල — සියයට 30

12. 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව සතු කරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර

(i) බදු අය කළ හැකි ආදායම මත — සියයට 30

(ii) (i) වන ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද ඉන් අඩු කිරීමෙන් පසුව ලාභවල ඉතිරි කොටස් මත — සියයට 25

13. සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සහ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදල් — සියයට 10

14. සේවා නියුක්තියන් සඳහා පමණක් දායක මුදල් ගෙවනු ලබන යම් සකසුරුවම්, ඉතිරි කිරීමේ හෝ ගොඩනැගිලි සමිතියක් හෝ සුභසාධක අරමුදලක් හෝ 25 (1) (ච) ඡේදයේ කාර්ය සඳහා අනුමත කරන ලද යම් පාරිතෝෂික අරමුදලක් — සියයට 10

15. (ඉහත සඳහන් පළමුවන සහ දෙවන උපලේඛනවල සඳහන් නොවන) තැනැත්තන් — සියයට 30

හතරවන උපලේඛනය (95 වන වගන්තිය)

ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙනු ලැබූ හෝ බැර කරනු ලැබූ පොලී, ගෙවල් කුලී, බිම් කුලී, රාජ්‍ය භාග හෝ වාර්ෂික සම්බන්ධයෙන් ආදායම් බද්ද අඩු කිරීමේ අනුප්‍රමාණය

ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ පොලී, ගෙවල් කුලී, බිම් කුලී රාජ්‍ය භාග හෝ වාර්ෂික සම්බන්ධයෙන් ආදායම් බද්ද අඩු කිරීමේ අනුප්‍රමාණය — සියයට 20

පස්වන උපලේඛනය

පළමුවන, දෙවන හා තුන්වන උපලේඛනවල කවර අනුප්‍රමාණයක් නියමිතව තිබුණ ද මෙහි පහත දැක්වෙන අනුප්‍රමාණ අදාළ විය යුතු ය-

1. ආණ්ඩුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් වෙත සතු කරන ලද දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු වන වන්දිය මත වූ සම්පූර්ණ පොලී මුදල මත අය කළ යුතු ආදායම් බදු අනුප්‍රමාණය (36 වන වගන්තිය) සියයට 10

2. ඇතැම් බැංකු තැන්පත්වලින් ලැබෙන සම්පූර්ණ පොලී මුදල මත අය කළ යුතු ආදායම් බදු ප්‍රමාණය (37 වන වගන්තිය) සියයට 10

3. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම හවුල් ව්‍යාපාර සහ පුද්ගල මණ්ඩල විසින් දෙන ලද ණය පිළිබඳ දළ පොලිය මත ආදායම් බදු අනු ප්‍රමාණය(38 වන වගන්තිය) සියයට 15

4. ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවිය යුතු රාජ්‍ය භාගය මත ආදායම් බදු අනුප්‍රමාණය (39 වන වගන්තිය) සියයට 15

5. යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක විදේශ ව්‍යවහාර මුදලින් සිදු කෙරෙන අක්වෙරළ ගනුදෙනුවකින් උපදින ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ආදායම් බද්දේ අනුප්‍රමානය (41 වගන්තිය) සියයට 20

6. ශ්‍රී ලංකාවේ ආකරයකින් කණිනු නොලැබූ යම් මැණික් ගල්, ලෝහ හෝ ඛනිජතෙල් ගෑස් හෝ ඛනිජතෙල් නිෂ්පාදන හෝ වෙනත් යම් අනුමත නිෂ්පාදන ක්‍රියාවලියකට එම භාණ්ඩ යටත් නොකර අපනයනය කිරීමෙන් ප්‍රතිකරුවකුට හෝ ප්‍රතිලාභියකු උපදින ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ආදායම් බද්දේ අනුප්‍රමාණය (42 වගන්තිය) සියයට 10

7. භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ගබඩා කිරීම සඳහා පහසුකම් සැලසීම සහ පවත්වාගෙන යාම සඳහා වූ යම් අනුමත ව්‍යවසායකින් කිසියම් තැනැත්තකුට උපදින පොළිය සහ ආදායම සම්බන්ධයෙන් ආදායම් බද්දේ අනුප්‍රමාණය (43 වගන්තිය) සියයට 10

8. සමාගම් කොටස්, කොටසකට ඇති අයිතිය හෝ කොටස් බලපත්‍ර බැහැර කිරීම සම්බන්ධයෙන් වූ ලාභ හෝ ලැබීම් කිසිවකට අදාළ කළ හැකි ආදායම් බද්දේ අනුප්‍රමාණය (44 වගන්තිය)

ඒ තැනැත්තා සියයට 10 කට
පමණක් යටත් වන්නේ
නම් මිස, සියයට 15

9. සමාගමක් නොවන තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන්නා වූද 217 වන සහ 45 වන වගන්තිවල අර්ථ නිරූපණය කර ඇති පරිදි කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් ලැබෙන ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය (45 වන වගන්තිය)

පළමුවන උපලේඛනයට අනුව
එහෙත් සියයට 15ක
උපරිමයකට යටත්ව

10. සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූද 217 වන සහ 46 වන වගන්තිවල අර්ථ නිරූපණය කර ඇති පරිදි කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් ලැබෙන ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය (46 වන වගන්තිය) සියයට 15

11. විශේෂිත නිවාස බැංකුවලට අදාළ ආදායම් බදු අනුප්‍රමාණ (47 වගන්තිය) සියයට 20

12. 17 වගන්තිය හෝ 19 වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ඇතැම් සමාගම්වලට එම බද්දෙන් නිදහස් කාලසීමාවට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය (48 වගන්තිය) සියයට10

13. ආදායම් බද්දෙන් නිදහස් කිරීම 18 හෝ 22 වගන්තිය යටතේ වන අවස්ථාවක, එම බද්දෙන් නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසුව ඇතැම් සමාගම්වලට අදාළ වන ආදායම් බදු අනු ප්‍රමාණය (48 වගන්තිය) සියයට 15

14. ආදායම් බද්දෙන් නිදහස් කිරීම 17 හෝ 19 වගන්ති යටතේ වන සහ සියයට 10 හෝ සියයට 15 අනුප්‍රමාණය අදාළ නොවන අවස්ථාවකදී බද්දෙන් නිදහස් කාලසීමාව ඉකුත් වූ පසුව ඇතැම් සමාගම්වලට අදාළ වන යම් ආදායම් බදු අනු ප්‍රමාණය (48 වගන්තිය) සියයට 20

15. 46 වන වගන්තියට අනුකූලව බදු අය කළ හැකි ලාභ සහ ශ්‍රී ලංකාවට බැහැරින් ලැබී ඇති යම් ලාභාංශවලට සහ 54 වගන්තියේ සඳහන් වෙනත් ලාභාංශවලට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය (49 වන වගන්තිය 54 සහ 55 වගන්ති)

2003 අප්‍රේල් මස 1 වන දින
හෝ ඉන් පසුව ආරම්භ
වන යම් තක්සේරු
වර්ෂයක් සඳහා
සියයට 10

16. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක් නොවන තැනැත්තකුගේ සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය (50 වන වගන්තිය)

පළමුවන උපලේඛනයට අනුව
එහෙත් සියයට 15 ක
උපරිමයකට යටත් ව-

17. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය (51 වගන්තිය) සියයට 15

18. 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ආදායම් බදු අනුප්‍රමාණය (52 වන වගන්තිය) සියයට 15

19. අපයනයන ලාභ සහ ආදායම්වලින් ලැබෙන ලාභාංශ සම්බන්ධයෙන් ආදායම් බදු අනුප්‍රමාණය (53 වන වගන්තිය)

2003 අප්‍රේල් මස 1 වන දින හෝ
එදිනට පසුව යම් තක්සේරු
වර්ෂයක් සඳහා
සියයට 10

20. යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සැලකුණු අපනයන සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය (56 වන වගන්තිය)

පළමුවන උපලේඛනය අනුව
සෑම පුද්ගලයකු සඳහා
සියයට 15 ක උපරිමයට යටත්ව
සහ සමාගමක් සඳහා සියයට 15

21. වාසික සමාගමක 57 වන වගන්තියේ දැක්වෙන ආදායම් සහ ලාභ සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය සියයට 15

22. 58 වන වගන්තියේ දැක්වෙන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් වූ ආදායම් බදු අනුප්‍රමාණය සියයට 15

23. නැවකින් නැවකට මාරුකිරීමේ නියෝජ්‍යාතන ගාස්තුවලින් උපචිත වන ලාභ හා ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය (59 වන වගන්තිය) සියයට 15

24. බෙදිය හැකි ලාභ සහ වෙනත් ආදායම් මත, යම් තක්සේරු කිරීමක් මත හැර, කිසියම් හවුල් ව්‍යාපාරයකට අදාළ කළ හැකි ආදායම් බද්දේ අනුප්‍රමාණය (78 වගන්තිය) සියයට 10

25. විනෝදාස්වාදය සපයන්නකුගේ හෝ ශිල්පියකුගේ වෘත්තිය හෝ රැකියාව කරගෙන යන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකුට අදාළ කළ හැකි ආදායම් බද්දේ අනුප්‍රමාණය (96 වන වගන්තිය) සියයට 15

26. 105 වගන්තියේ සඳහන් පරිදි යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු ඛනිජ තෙල් කැනීමෙන් ලබාගත් කිසියම් ලාභයකට සහ ආදායමකට අදාළ කළ හැකි ආදායම් බද්දේ අනුප්‍රමාණය (105 වගන්තිය) සියයට 15

27. රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පිහිටුවන ලද අරමුදලකට ලැබුණු හෝ ලබාගන්නා ලද අරමුදල්වලින් වූ ලැබීම් මත වූ ලාභවලට අදාළ කරගත හැකි ආදායම් බදු අනුප්‍රමාණය (102 වගන්තිය) සියයට 30

28. 159 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යන යම් ලොතරැයියකින් හෝ ඔට්ටු ඇල්ලීමකින් හෝ සූදුවකින් ලැබෙන ලාභ හෝ ආදායම සංයුක්ත වන එම තැනැත්තන්ගේ හෝ හවුල් ව්‍යාපාරයේ බදු අයකල හැකි ආදායමේ අදාළ කොටස සියයට 40

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.